බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 37(ii)

සූත්‍රාන්තපිටකයෙහි

32 වන ග්‍රන්ථය

# අපදානපාළි

ද්විතීය භාගය (2 කාණ්ඩය)

## ථෙරීඅපදාන

---

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ සම්මතයෙන් හෙරලියාවල සුධර්මාරාම
විහාරාධිපති ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත,
වෙඩරුවෙ සිරි අනොමදස්සාභිධාන
සියම් මහානිකාය–ජයවර්ධනපුර කෝට්ටෙ පාර්ශ්වයෙහි
අනුනායක ස්ථවිරයන් වහන්සේ විසින් කරන ලද
සිංහල පරිවර්තනයෙන් යුක්ත යි.

---

ශ්‍රී බු. ව. 2550
රාජ්‍ය වර්ෂ. 2006

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

Buddha Jayanti Tripitaka Series, Volume 37 (ii)

The Thirty-second Book in the

**Suttanta-Pitaka**

**Khuddaka-Nikāya (15)**

**32**

# APADĀNA PĀLI (II-2)

## THERI APADANA

With the Sinhala translation by

**The Venerable Vidyāvisārada,**

**Pandit Wendaruwe Siri Anomadassi Thera** M.A.

The Anunāyaka Thera of Jayawardhanapura (Kotte)

Chapter of Siyam Nikāya

and

The Incumbent of Sudharmārāma Heraliyawala,

According to the assent of Tripitaka Editorial Board

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.



නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

මෙම බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව,
නිවනේ සැනසීම සොයන සෑම ලොවසියෙකුටම
පරිහරණය කළහැකි ලෙස සැකසීමට නන් අයුරින් දායකත්වය දැක්වූ
සෑම උතුමන්ටම පළමුව ස්තූතිය පුදකරන අතරම
යමෙක් මෙම බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව පරිහරණයෙන්,
යම් සත් කටයුත්තක් කරන්නේනම් එහි ද,
නිවනේ සැනසීම ලාබනම් එහි ද
සියලු ආනිසංසයෝ මෙම බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව
මේ අයුරින් සැකසීමට දායකත්වය දැක්වූ
ඔවුන් සෑම දෙනාටම අනුමෝදන් වෙත්වා!!!
නිවන් දකින තුරු අභිවූර්ධියක්ම වෙත්වා!!!
පතනා බෝධියකින් වහා වහා නිවනේ සැනසීම ම අත්වේවා!!!

ඔබ සැමට යහපතක්ම වෙත්වා!!!

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

**සැලකිය යුතුය :**

මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත. එහි පටුන මත ඇති මාතෘකා මත click කිරීම මඟින් ඊට අදාල පිටුව වෙතට යොමුවේ.
නැවත පටුන වෙතට යොමුවීමට Table of Contents හෝ පිටු අංකය (12) සටහන් කර යොමු වන්න.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

සුත්තන්තපිටකෙ ඛුද්දකනිකායෙ

# අපදානපාළි

(ථෙරී අපදානං)

දුතියො භාගො

(දුතියො ඛණ්ඩො)

සූත්‍රාන්තපිටකයෙහි කුද්‍රගන්ථසඟිය

# අපදානපාළි

(ස්ථවිරාවදානය)

ද්විතීය භාගය

(2 වැනි කාණ්ඩය)

*  මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

# පටුන
# CONTENTS


| | පිටු |
|---|---|
| සංස්කාරක නිවේදනය ... .. ... | xv |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය ... ... ... | xvii |
| සංකේත නිරූපණය .. .. ... | xix |
| පාළි හෝඩිය ... ... ... | xxi |
| විෂය සූචි ... ... ... | xix-xx |
| පෙළ හා පරිවර්තනය ... ... ... | 2-219 |
| ගාථාදිපාද - අනුක්කමණිකා ... ... ... | 221-243 |
| සඤ්ඤානාම - අනුක්කමණිකා ... ... ... | 245-247 |
| විසෙසපදානුක්කමණිකා ... ... ... | 249-259 |
| ශුද්ධාශුද්ධි නිරූපණය ... .. ... | 261 |
| බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා .. ... | 263 |




* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

# සංස්කාරක නිවේදනය

සුත්‍රාන්ත පිටකයෙහි කුදුගත් සඟියට අයත් ඛුද්දකපාඨාදි පසළොස් ග්‍රන්ථයන් කෙරෙහි අපදනපාළිය තෙළෙස්වැනි ග්‍රන්ථය යි. බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි ලා අපදනපාළිය කාණ්ඩ දෙකක් වශයෙන් ගෙන 36–37 වැනි ග්‍රන්ථයන් ලෙස මුද්‍රණය කරවීමට සම්මත කරන ලද්දේ ය. ලඞ්කාබෞද්ධ මණ්ඩලයේ ආරාධනායෙන් රාජකීය පණ්ඩිත තලල්ලේ ධම්මානන්ද නායක ස්ථවිරයන් වහන්සේ විසින් අපදන පාළිය සපුරා හෙළ බසින් පරිවර්තන කොට ඇතැයි කියතුදු යසථෙරා-පදනයෙහි පටන් අවසාන කොටස ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයට නො ලැබුණු හෙයින් ථෙරාපදනයෙහි යසඅපදනය ද ථෙරී අපදනය ද නැවත පරිවර්තන කරන්නට සිදුවිය. එහෙයින් ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ සම්මතය පරිදි එකී ග්‍රන්ථශෙෂය පරිවර්තන කරනු සඳහා වේඩරුවේ සිරි අනොමදස්සාභිධාන අනුනායක ස්ථවිරයන් වහන්සේට පවරා දෙන ලද්දේ ය.

සම්පාදකමණ්ඩලයේ සම්මතය ඉතා සතුටින් පිළිගත් අනුනායක ස්ථවිරයන් වහන්සේ පාඨ ශොධනය ද කරමින් අටුවාවක් හෝ ටීකාවක් වැනි පරිවාර ග්‍රන්ථයකුදු නැති ථෙරීඅපදන පාළිය මැනැවින් සිංහල භාෂාවට පරිවර්තන කළහ. එහිදු අවසානයෙහි අපදන කිහිපයක් අපගේ පරිවර්තන වෙයි.

සංස්කෘතික අමාත්‍යාංශයේ අතිරේක ලේකම් තැන්පත් සෝමපාල ජයවර්ධන මහතාණන්ගේ ක්‍රියා සංවිධානය ඇති වැ සමාජවාදී ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ අනුග්‍රහයෙන් දෙහිවල තිසර මුද්‍රණාලයෙහි මුද්‍රණය කරවන ලද්දේ විය. සම්බුද්ධ ශාසනයාගේ උද්දීප්තියට කාරණ වූ ත්‍රිපිටක ධර්ම ප්‍රචාරයෙන් ජනිත වූ කුශලය මෙ මැ අධිකාරයෙහි සහාය වූ හැම දෙනකුන්ට මැ ආයුරාරොග්‍යාදි සම්පත් හා සගමොක් සුව පිණිස පවතීවා යි ආශංසනය කරම්හ.

මෙ වගට, ශාසනොදයකාරී,

**ලබුගම ලඞ්කානන්ද**
මහානායක ස්ථවිර
ත්‍රිපිටක මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක

2526/1983 ජූලි 10 වැනි දින

ත්‍රිපිටක කාර්යාලය
මහානායක චාරිකාරාමය
115, විජේරාම මාවත,
කොළඹ 7.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

උපදෙශක :

අග්ගමහාපණ්ඩිත, බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

සභාපති :

අභංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, කෝදාගොඩ ශ්‍රී ඥානාලෝක දක්ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

ප්‍රධාන සම්පාදක :

මොල්ලිගොඩ ප්‍රවචනොදය පරිවෙණාධිපති ශ්‍රී මහාවිහාරවංශාලඞ්කාර විමල කීර්ති ශ්‍රී ත්‍රිපිටකවාගීශ්වර, රාජකීය පණ්ඩිත ලබුගම ශ්‍රී ලඞ්කානන්ද — කෝට්ටෙ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි මහානායක ස්ථවිරයන් වහන්සේ.

සම්පාදක :

කිරුළපන පූර්වාරාමයෙහි හා නාරාහේන්පිට අභයාරාමයෙහි අධිපති අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දල්ලේ ශ්‍රී ප්‍රඥාලෝක — කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

මහරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ ශ්‍රී අනවමදර්ශී–කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ, මාකඩවර විහාරාධිපති, ශ්‍රී රේවත පරිවෙණාධිපති, රාජකීය පණ්ඩිත, කරගම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශෝකාරාමාධිපති, රාජකීය පණ්ඩිත, කරදන ශ්‍රී ප්‍රඥාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි ත්‍රිපිටක අංශයෙහි මහාචාර්ය, ශාස්ත්‍රාචාර්ය, රාජකීය පණ්ඩිත, ත්‍රිපිටකාචාර්ය උඩුවේ ඥානානන්ද ස්ථවිරයන් වහන්සේ.

ලේකම් :

කොළඹ බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල – කොළඹදිශායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.



* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## සංකෙත නිරූපණය

සී.මු. - සීහළක්ඛරමුද්දිත ථෙරී-අපදානපාළි

ම.ඡ.සං. - මරම්ම ඡට්ඨසංගීතිපිටකපොත්ථකං

ස්‍යා. - තායාක්ඛරමුද්දිත ථෙරී අපදානපාළි

PTS. - Pali Text Society Edition



* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ a | ආ ā | ඉ i | ඊ ī | උ u | ඌ ū | එ e | ඔ o |

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං aṃ |
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ ke | කො ko |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khe | ඛො kho |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ ge | ගො go |

### CONJUNCT-CONSONANTS

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ඤ්හ ñha | ද්ද dda | ම්බ, ම්බ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ් ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ ñja | ද්ව, ද්ව dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය, ය්ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඞ්ඛ ṅkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ණ්ඩ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ත්ත tta | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ථ ttha | බ්භ bbha | ව්හ vha |
| ජ්ජ jja | ත්ව tva | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | | ම්ප mpa | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ා ā | ි i | ී ī | ු u | ූ ū | ෙ e | ො o |



* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

# අපදානපාළි - දුතියභාගො

## (2) දුතියඛණ්ඩ

## ථෙරී අපදාන විසය සූචි

### 1. සුමෙධාවග්ගො 2 – 25


| | | |
|---|---|---|
| 1. | සුමෙධාපදානං | 2–5 |
| 2. | මෙඛලාදායිකාපදානං | 6–7 |
| 3. | මණ්ඩපදායිකාපදානං | 6–7 |
| 4. | සඞ්කමනත්ථාපදානං | 8–9 |
| 5. | නළමාලිකාපදානං | 8–11 |
| 6. | එකපිණ්ඩපාතදායිකාපදානං | 10–13 |
| 7. | කටච්ඡුභික්ඛාදායිකාපදානං | 12–15 |
| 8. | සත්තුප්පලමාලිකාපදානං | 14–17 |
| 9. | පඤ්චදීපිකාපදානං | 18–21 |
| 10. | උදකදායිකාපදානං | 22–25 |


### 2. එකූපොසථිකවග්ගො 26 – 107


| | | |
|---|---|---|
| 1. | එකූපොසථිකාපදානං | 26–29 |
| 2. | සළලපුප්ඵිකාපදානං | 30–31 |
| 3. | මොදකදායිකාපදානං | 30–33 |
| 4. | එකාසනදායිකාපදානං | 32–35 |
| 5. | පඤ්චදීපදායිකාපදානං | 36–39 |
| 6. | සාලමාලිකාපදානං | 40–41 |
| 7. | මහාපජාපතිගොතමීඅපදානං | 40–71 |
| 8. | ඛෙමාපදානං | 72–87 |
| 9. | උප්පලවණ්ණාපදානං | 86–101 |
| 10. | පටාචාරාපදානං | 100–107 |


### 3. කුණ්ඩලකෙසීවග්ගො 108 – 183


| | | |
|---|---|---|
| 1. | කුණ්ඩලකෙසාපදානං | 108–117 |
| 2. | කිසාගොතමීඅපදානං | 116–123 |
| 3. | ධම්මදින්නාපදානං | 122–129 |
| 4. | සකුලාපදානං | 128–133 |
| 5. | නන්දජනපදකල්‍යාණීඅපදානං | 134–143 |
| 6. | සොණාපදානං | 142–147 |
| 7. | භද්දාකාපිලානීඅපදානං | 146–157 |
| 8. | යසොධරාපදානං | 158–171 |
| 9. | දසභික්ඛුනීසහස්සාපදානං | 170–173 |
| 10. | අට්ඨාරසභික්ඛුනීසහස්සාපදානං | 174–183 |




* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## විසය සූචි

### 4. ඛත්තියාවග්ගො 184 – 219


| | | | |
|---|---|---|---|
| 1. | යසවතීපමුඛභික්ඛුනීනං අපදානං | .. | 184–185 |
| 2. | බ්‍රාහ්මණකඤ්ඤාභික්ඛුනීනං අපදානං | .. | 186–193 |
| 3. | උප්පලදායිකාපදානං | .. .. | 192–197 |
| 4. | සිගාලමාතාපදානං | .. .. | 196–201 |
| 5. | සුක්කාපදානං | .. .. | 200–205 |
| 6. | රූපනන්දාපදානං | .. .. | 206–209 |
| 7. | අඩ්ඪකාසිඅපදානං | .. .. | 208–211 |
| 8. | පුණ්ණාපදානං | .. .. | 212–215 |
| 9. | අම්බපාලිඅපදානං | .. .. | 214–217 |
| 10. | පෙසලාපදානං | .. .. | 216–219 |




* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## සුත්තන්තපිටකෙ ඛුද්දකනිකායෙ

# අපදානපාළි

### තතියො භාගො

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

# සුත්තන්තපිටකෙ ඛුද්දකනිකායෙ

# අපදානපාළි

### තතියො භාගො

## ථෙරීඅපදාන පාළි

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

## 1. සුමෙධාවග්ගො

### 1. 1 සුමෙධාපදානං

1. භගවති කොණාගමනෙ සඞ්ඝාරාමම්හි නවනිවෙසම්හි[1]
සඛියො තිස්සො ජනියො විහාරදානං අදාසිම්හ.

2. දසක්ඛත්තුං සතක්ඛත්තුං දසසතක්ඛත්තුං සතානං ච සතක්ඛත්තුං[2]
දෙවෙසු උපපජ්ජිම්හ කො වාදෙ මානුසකෙ භවෙ.

3. දෙවෙ මහිද්ධිකා අහුම්හ මානුසකම්හි කො වාදෙ
සත්තරතනස්ස මහෙසී[3] ඉත්ථිරතනං අහං ආසිං.[4]

4. ඉධ[5] සඤ්චිතකුසලා සුසමිද්ධකුලප්පජා
ධනඤ්ජානී ච ඛෙමා ච අහම්පි ච තයො ජනා.

5. ආරාමං සුකතං කත්වා සබ්බාවයවමණ්ඩිතං
බුද්ධප්පමුඛසඞ්ඝස්ස නිය්‍යාදෙත්වා පමොදිතා.[6]

6. යත්ථ යත්ථූපපජ්ජාමි තස්ස කම්මස්ස වාහසා
දෙවෙසු අග්ගතං පත්තා මනුස්සෙසු තථෙව ච.

7. ඉමස්මිංයෙව කප්පම්හි බ්‍රහ්මබන්ධු මහායසො
කස්සපො නාම ගොත්තෙන උප්පජ්ජි වදතං වරො.

8. උපට්ඨාකො මහෙසිස්ස තදා ආසි නරිස්සරො
කාසිරාජා කිකී නාම බාරාණසිපුරුත්තමෙ.

---

1. නිවෙසනම්හි – සිමු, මජසං.
2. සතානි ච සතක්ඛත්තුං – ස්‍යා.
සතක්ඛත්තුං සතානං – PTS.
3. සත්තරතනමහෙසී – මජසං.
4. භවිං – මජසං, PTS.
5. තත්ථ – ස්‍යා.
6. සම්මොදිතා – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

# සූත්‍රාන්තපිටකයේ ඛුද්දකනිකායයෙහි

# අපදානපාළි

## නවවන භාගය

# ථෙරී අපදාන පාළි

ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුද්ධරජාණන් වහන්සේට
නමස්කාර වේවා.

## 1. සුමේධා වර්ගය

### 1. 1 සුමේධා අපදානය

1. කෝණාගමන බුදුරජාණන් වහන්සේ අභිනවයෙන් කරවන ලද සඞ්ඝාරාමයෙකැ වැඩවසන සමයෙහි යෙහෙළි වූ ධනඤ්ජානී යැ, ඛෙමා යැ, මා (සුමේධා) යැ යන අපි තිදෙන ඒ බුදුරදුනට විහාරයක් කරවා දුන්නුම්හ.

2. (එ පිනෙන්) දසවර සියවර දහස්වර දසදහස්වර දෙවියන් කෙරෙහි උපනුම්හ. මිනිසත්බවහි උපන්වාර කියනු කිම.

3. දෙවියන් කෙරෙහි උපන් කලැ මහත් සෘද්ධි ඇති වූම්හ. මිනිසුන් කෙරෙහි (උපන් කලැ) කවර කථා යැ. මම සක්විති රජක්හුගේ ස්ත්‍රීරත්නය වූ මෙහෙසි වූමු.

4. ධනඤ්ජානී යැ, ඛෙමා යැ, මා යැ යන අපි තිදෙන මෙලොවහි රැස්කළ කුසල් ඇත්තමෝ මහත් ඉසුරුමත් කුලහන වූමු.

5. සියල් අඟින් පිරිපුන් අරමක් මොනොවට කරවා බුදු පාමොක් සඟනට පවරා දී ප්‍රමුදිත වූම්හ.

6. (මම) යම් යම් තෙනෙකට උපත් විසින් යෙම් ද, එ කුසල් බෙලෙන් දෙවියන් අතරැ අගතැන් පැමිණියමු. මිනිසුන් අතරැ ද එසේ මැ යි.

7. මේ (භද්‍ර) කල්පයෙහි බ්‍රාහ්මණවංශික මහායශස් ඇති ගෝත්‍ර විසින් කාශ්‍යප නම් වූ දේශකයන් අතරැ ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණ කෙනෙක් පහළ වූ සේක.

8. එකලැ බරණැස් පුරවරයෙහි මහර්ෂි බුදුරදුනට උපස්ථායක වූ නරෙශ්වර කිකී නම් කසීරජෙක් වූයේ යැ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

9. තස්සාසුං සත්ත ධීතරො රාජකඤ්ඤා සුඛෙධිතා[1]
බුද්ධුපට්ඨානනිරතා[2] බ්‍රහ්මචරියං චරිංසු තා.

10. තාසං සහායිකා හුත්වා සීලෙසු සුසමාහිතා
දත්වා දානානි සක්කච්චං අගාරෙව වතං[3] චරිං.

11. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසූපගා අහං.

12. තතො චුතා යාමමගං[4] තතො'හං තුසිතං ගතා
තතො ච නිම්මාණරතිං වසවත්තිපුරං තතො.

13. යත්ථ යත්ථූපපජ්ජාමි පුඤ්ඤකම්මසමොහිතා[5]
තත්ථ තත්ථෙව රාජූනං මහෙසිත්තමකාරයිං.

14. තතො චුතා මනුස්සත්තෙ රාජූනං චක්කවත්තිනං
මණ්ඩලීනඤ්ච රාජූනං මහෙසිත්තමකාරයිං.

15. සම්පත්තිමනුභොත්වාන දෙවෙසු මානුසෙසු ච
සබ්බත්ථ සුඛිතා හුත්වා නෙකජාතීසු සංසරිං.

16. සො හෙතු ච සො පභවො තං මූලං සා ච සාසනෙ ඛන්ති[6]
තං පඨමං[7] සමොධානං තං ධම්මරතාය නිබ්බානං.

17. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා
නාගීව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවා.

18. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස[8] සන්තිකෙ
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

19. පටිසම්භිදා චතස්සො ච[9] විමොක්ඛාපි ච අට්ඨිමෙ
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං සුමෙධා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

සුමෙධාථෙරියාපදානං පඨමං.

---

1. සුඛෙ ඨිතා - සයා.
2. බුද්ධොපට්ඨානනිරතා - මජසං.
3. වත්තං - සයා.
4. යාවසග්ගං - සයා.
5. පුඤ්ඤකම්මසමාහිතා - සිමු.
6. ඛමං - මජසං.
7. පඨමං තං - මජසං.
8. මම බුද්ධස්ස - මජසං.
9. චතස්සො - මජසං. (සබ්බත්ථ)

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

9. ඒ රජුට සත් දූ කෙනෙක් වූහු. සුවසෙ වැඩුණු ඒ රාජකන්‍යාවෝ බුදුවටන්හි නිරත වූහ. උහු තුමූ බඹසර සැරූහු.

10. මම ඔවුනට සහාය වැ සිල්හි මොනොවට පිහිටියා සකසා දන් දී ගිහිගෙහි ම (රැඳී) වත් සපුරාලිමි.

11. ඒ කුශලකර්මහේතුයෙන් ද, චෙතනාප්‍රණිධි හේතුයෙන් ද මම මිනිස්කය හැරපියා (උත්පත්ති වශයෙන්) තව්තිසා දෙව්ලොවට පැමිණියමු.

12. මම එයින් සැවැ යාමදෙව්ලොවට ගියමු, එයින් සැවැ තුෂිතයට ගියමු, එයින් සැවැ නිර්මාණරතියට ද, එයින් සැවැ වශවර්තිපුරයට ද ගියමු.

13. පින්කම්හි මොනොවට පිහිටි මම යම් යම් තෙනෙකැ උපන්මු ද, ඒ ඒ තෙනැ (දෙව්) රජුනට මෙහෙසිබව කළමු.

14. එයින් ච්‍යුත වූවා මිනිසත්බව්හි සක්විතිරජුනට ද, පෙදෙස් රජුනට ද මෙහෙසිබව කළමු.

15. (මෙසෙයින්) දෙවියන් කෙරෙහි දූ මිනිසුන් කෙරෙහි දූ සැපත් වළඳා සියලු තන්හි සුවපත් වැ නොයෙක් ජාතිවලැ (උපත් විසින්) හැසුරුණමු.

16. (යථොක්ත දෙව්මිනිස් සැපත් ලැබීමට) ඒ විහාර දනය හේතු වියැ, එය ප්‍රභවය වියැ, එය මුල් වියැ, එය මැ බුදුසසුන්හි නිධ්‍යාන ක්‍ෂාන්තිය වියැ, එය ප්‍රථම සමාගමය වියැ, එය දම්හි ඇලුණ සුමෙධාවගේ නිර්වාණපදප්‍රාප්තිය වී.

17. මා විසින් කෙලෙස්හු දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. බැඳුම් සිඳ සරණ ඇත්රැජිනක සෙයින් ආස්‍රව රහිත වැ වාස කෙරෙමි.

18. බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේගේ හමියෙහි මට ඒකාන්තයෙන් යහපතක් වූයේ යැ. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්ත (පිළිවෙළින් පැමිණි) යහ. බුදුසසුන් කොට නිමවන ලදී.

19. මෙ සිව්පිළිසිඹියාවෝ ද, අෂ්ටවිමොක්‍ෂයෝ ද, ෂඩ් අභිඥාවෝ ද පසක් කරන ලදහ. බුදුසසුන් කොට නිමවන ලදී.

මෙසෙයින් සුමෙධා භික්‍ෂුණී තොමෝ මේ ගාථා පැවැසූ යැ.

පළමුවැනි සුමෙධා ථෙරිය අපදන යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 1. 2 මෙඛලාදයිකාපදානං

20. සිද්ධත්ථස්ස භගවතො ථූපං කාරාපිකා[1] අහුං,
මෙඛලිකා මයා දින්නා නවකම්මාය සත්ථුනො.

21. නිට්ඨිතෙ ච මහාථූපෙ මෙඛලං පුන'දසහං,
ලොකනාථස්ස මුනිනො පසන්නා සෙහි පාණිහි.

22. චතුනවුතෙ ඉතො[2] කප්පෙ යං මෙඛලමදං තදා,
දුග්ගතිං නාභිජානාමි ථූපකාරස්සිදං ඵලං.

23. කිලෙසා ඣාපිතා මය්හං –පෙ– විහරාමි අනාසවා.

24. ස්වාගතං වත මෙ ආසි –පෙ– කතං බුද්ධස්ස සාසනං.

25. පටිසම්භිදා චතස්සො ච –පෙ– කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං මෙඛලාදයිකා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

මෙඛලාදයිකාථෙරීඅපදානං දුතියං.

## 1. 3 මණ්ඩපදායිකාපදානං

26. කොණාගමනස්ස මුනිනො මණ්ඩපො කාරිතො මයා
ධුවං ච චීවරමදං[3] බුද්ධස්ස ලොකබන්ධුනො.

27. යං යං ජනපදං යාමි නිගමෙ රාජධානියො
සබ්බත්ථ පූජිතා හොමි පුඤ්ඤකම්මස්සිදං ඵලං.

28. කිලෙසා ඣාපිතා මය්හං –පෙ– විහාරාමි අනාසවා.

29. ස්වාගතං වත මෙ ආසි –පෙ– කතං බුද්ධස්ස සාසනං.

30. පටිසම්භිදා චතස්සො ච –පෙ– කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං මණ්ඩපදායිකා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

මණ්ඩපදායිකාථෙරීඅපදානං තතියං.

---

1. ථූපකාරාපිකා – මජසං, සිමු.
ථූපකාරමකාසහං – සතා.
2. චතුනවුතිතො – මජසං.
3. එවං තිචීවරංදසිං – සිමු, මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 1. 2 මෙඛලාදයිකා අපදානය

20. **සිද්ධාර්ත්ථ** භගවත්හට ස්තූප කරන්නෝ වූහ. ශාස්තෘහු පිණිස (කරනු ලබන) නවකම් සඳහා මා විසින් මේඛලාවක් දෙන ලදී.

21. මහසෑ (නවකම්) නිමී කල්හි ද මම යළි මෙවුලක් දුනිමු. ලෝකනාථ වූ මුනිඳුන්හට සියදිවියෙන් (දිවි හිමි කොට) ප්‍රසන්න වූවා වෙමි.

22. මෙයින් සූඅනූවන කප්හි, එකලැ යම් මෙවුලක් දුන්නෙම් ද, (එ හෙතුයෙන්) දුගතිය නො මැ දනිමි. මෙ වූකලි සෑයක් කරවීමෙ විපාක යි.

23. මා විසින් කෙලෙස්හු දවන ලද ... අනාස්‍රව වැ වෙසෙමි.

24. මාහට එකැතින් යහපතෙක් වියැ ... බුදුසසුන් කරන ලද.

25. සිවුපිළිසිඹියා ද ... බුදුසසුන් කරන ලදී.

**මෙසෙයින් මෙඛලාදයිකා භික්‍ෂුණී මේ ගාථා ප්‍රකාශ කළායැ.**

**දෙවැනි මෙඛලාදයිකා ථෙරීඅපදාන යි.**

## 1. 3 මණ්ඩපදායිකා අපදානය

26. **කෝණාගමන** බුදුරදුන්හට මා විසින් ම**ණ්**ඩපයක් කරවන ලදි. ලෝකබන්ධු වූ භාග්‍යවතුන්හට නිරන්තරයෙන් සිවුරු ද දුන්මු.

27. යම් යම් දනව්වකට යන්නෙම්ද, නියම්ගම්–රජදහනකට යන්නෙම්ද එ හැමතන්හි පුදනලද වෙමි. මෙ වූකලි පින්කම්හි ඵල යි.

28. මා විසින් කෙලෙස්හු දවන ලදහ ... ආස්‍රව රහිත වැ වාස කෙරෙමි.

29. **ඒකාන්තයෙන්** මාහට **ස්වාගතයෙක්** වී යැ ... බුදුසසුන් කරන ලද.

30. සිවු පිළිසිඹියාවෝ ද ... බුදුසසුන් කරන ලදී.

**මෙසේ මණ්ඩපදායිකා භික්‍ෂුණී තොමෝ මෙ ගාථා ප්‍රකාශ කළා යැ.**

**තෙවැනි මණ්ඩපදායිකා ථෙරීඅපදාන යි.**

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 1. 4 සඞ්කමනත්ථාපදානං

31. විපස්සිස්ස[1] භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො
රථියං පටිපන්නස්ස කාරයන්තස්ස පාණිනො.

32. ඝරතො නික්ඛමිත්වාන අවකුජ්ජා නිපජ්ජ'හං
අනුකම්පකො ලොකනාථො සීසන්තෙ[2] අක්කමී මම[3]

33. අක්කමිත්වාන සිරසි[4] අගමා ලොකනායකො
තෙන චිත්තප්පසාදෙන තුසිතං උපපජ්ජහං[5]

34. කිලෙසා ඣාපිතා මය්හං –පෙ– විහරාමි අනාසවා.

35. ස්වාගතං වත මෙ ආසි –පෙ– කතං බුද්ධස්ස සාසනං.

36. පටිසම්භිදා චතස්සො ච –පෙ– කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං සඞ්කමනත්ථා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

සඞ්කමනත්ථාථෙරියාපදානං චතුත්ථං.

## 1. 5 නළමාලිකාපදානං

37. චන්දභාගානදීතීරෙ අහොසිං කින්නරී තදා,
අද්දසං විරජං බුද්ධං සයම්භුං අපරාජිතං.

38. පසන්නචිත්තා සුමනා වෙදජාතා කතඤ්ජලී,
නළමාලං ගහෙත්වාන සයම්භුං අභිපූජයිං.

39. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා කින්නරීදෙහං අගච්ඡිං තිදසං ගතිං.[6]

40. ඡත්තිංසදෙවරාජූනං මහෙසිත්තමකාරයිං,
දසන්නං චක්කවත්තීනං මහෙසිත්තමකාරයිං,
සංවෙජෙත්වාන මෙ චිත්තං[7] පබ්බජිං අනගාරියං.

---

1. කොණ්ඩඤ්ඤස්ස – ස්‍යා, PTS.
2. සිරසි – PTS.
3. තදා – PTS.
4. සිරස්මිං – ස්‍යා.
5. අගමාස'හං – මජසං.
6. ගණං x ස්‍යා, PTS.
7. සංවෙදයිත්වා කුසලං – ස්‍යා, PTS.
සංවෙජයිත්වා මෙ චිත්තං – සීමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 1. 4. සඞ්කමනත්ථ අපදානය

31. ලෝකජ්‍යෝෂ්ඨ වූ තාදී (අකම්ප්‍ය) ගුණයුක්ත, ප්‍රාණීන් (සසරකතරින්) එතෙර කරවන විදර්ශි භාග්‍යවතුන් වහන්සේ වීථියට පිළිපන්නවුන් හමියෙහි --

32. මම ගෙන් නික්මැ යටිහුරු වැ වැද වැටුණුමු. ලෝකනාථයන් වහන්සේ අනුකම්පා කරන සේක් මාගේ ශීර්ෂාන්ත (කෙහෙ) ඇක්මැවූ සේක.

33. (මා) හිස ඇක්මැ ලෝකස්වාමී වූ බුදුරජාණන් වහන්සේ වැඩිසේකි. මම ඒ චිත්ත ප්‍රසාදහේතුයෙන් උත්පත්ති වශයෙන් තුෂිත දෙව්ලොවට (උපත් විසින්) පැමිණියමු.

34. මා විසින් කෙලෙස්හු දවන ලදහ ... ආස්‍රව රහිත වැ වාස කෙරෙමි.

35. ඒකාන්තයෙන් මට ස්වාගතයෙක් වියැ ... බුදුසසුන් කරන ලද යැ.

36. සිවුපිළිසිඹියා ද ... බුදුසසුන් කරන ලද්දේයි.

මෙසේ සඞ්කමනත්ථ භික්‍ෂුණී මේ ගාථා ප්‍රකාශ කළා යැ.

සිවුවැනි සඞ්කමනත්ථා ථෙරීඅපදාන යි.

## 1. 5 නළමාලිකා අපදානය

37. එක්කලෙක මම චන්ද්‍රභාගා නදී තීරයෙහි කිඳුරියක් වූමු. ස්වයම්භූ වූ අපරාජිත වූ විරජ වූ (සිද්ධාර්ථ) බුදුරදුන් දුටුමු.

38. පහන් සිතැති (එහෙයින් මැ) සොම්නස් වූ උපන් ප්‍රීති ඇති මම බදදිලි වැ නළමාලාවක් (හුණ මල්දමක්) ගෙන (එයින්) සම්බුදුරදුන් ගරුබුහුමනින් යුතු වැ පිදූමු.

39. එ කුශලකර්මහේතුයෙන් ද චේතනාප්‍රණිධි හේතුයෙන් ද කිඳුරු සිරුර හැරපියා (උපත් විසින්) දේවගතියට ගියමු.

40. (එහි) සතිසක් දෙව්රජුනට මෙහෙසිබව කරවූයෙමි. (පසුව) දස සක්විති රජුනට ද මෙහෙසි වූමු. (මෙ අත්බව්හි) මා සිත සංවෙගයට පමුණුවා බුදුසසුන්හි පැවිදි වූවා වෙමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

41. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි පුප්ඵපූජායිදං ඵලං.

42. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.*

43. කිලෙසා ඣාපිතා මය්හං –පෙ– භවා සබ්බෙ සමූහතා,

44. ස්වාගතං වත මෙ ආසි –පෙ– කතං බුද්ධස්ස සාසනං.

45. පටිසම්භිදා චතස්සො ච –පෙ– කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං නළමාලිකා භික්ඛුනී[1] ඉමා ගාථායො අභාසිත්ථාති.

නළමාලිකාථෙරියාපදානං පඤ්චමං.

## 1. 6 එකපිණ්ඩපාතදායිකාපදානං

46. නගරෙ බන්ධුමතියා බන්ධුමා නාම ඛත්තියො
තස්ස[2] රඤ්ඤො අහුං භරියා එකජ්ඣං චාරයාමහං.[3]

47. රහොගතා නිසීදිත්වා එවං චින්තෙස'හං තදා,
"ආදාය ගමනීයං හි කුසලං නත්ථි මෙ කතං.

48. මහාභිතාපං කටුකං ඝොරරූපං සුදාරුණං,
නිරයං නූන ගච්ඡාමි එත්ථ මෙ නත්ථි සංසයො."

49. රාජානං උපසඞ්කම්ම ඉදං වචනමබ්‍රවිං,
"එකං මෙ සමණං දෙහි භොජයිස්සාමි ඛත්තිය."

50. අදාසි මෙ මහාරාජා සමණං භාවිතින්ද්‍රියං,
තස්ස පත්තං ගහෙත්වාන පරමන්නෙන පූරයිං.[4]

51. පූරයිත්වා පරමන්නං ගන්ධාලෙපමකාසහං,
සහස්සග්ඝනකෙනෙව[5] වත්ථයුගෙන[6] ඡාදයිං.

1. ථෙරී – සිමු, මජසං.
2. යස්ස – සිමු.
3. එකච්චං වාදයාමහං – සයා.
4. තප්පයිං – සයා, PTS.
5. ජාලෙන පිදහිත්වාන – මජසං, සයා, PTS.
6. පීතචොළෙන – සයා.
මහාචොළෙන – PTS.
* සිමු. පොත්ථකෙසු අයං ගාථා න දිස්සතෙ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

41. මෙයින් සුඅනුවනකප්හි යම් පුෂ්ප පූජාවක් කරන ලද ද, (එ පිනෙන්) දුගතිය නො මැ දනිමි, මෙ පුෂ්පපූජායෙහි විපාක යි.

42. මා විසින් කෙලෙස්හු දවන ලදහ, සියලු භවයෝ නසන ලදහ, සියලු ආශ්‍රවයෝ ක්ෂීණයහ, දන් (මට) පුනර්භවයෙක් නැති.

43. මා විසින් කෙලෙස්හු දවන ලදහ ... සියලු භවයෝ නසන ලදහ.

44. මට ඒකාන්තයෙන් යහපතෙක් මැ වියැ ... බුදුසසුන් කරන ලද.

45. සිවුපිළිසිඹියා ද ... බුදුසසුන් කරන ලදී.

මෙසේ නළමාලිකා භික්‍ෂුණී මෙ ගාථා ප්‍රකාශ කළා යැ.

පස්වැනි නළමාලිකා ථෙරිඅපදන යි.

## 1. 6 ඒකපිණ්ඩදයිකා අපදනය

46. බන්ධුමතී නගරයෙහි බන්ධුමත් නම් රජෙක් වියැ. මම ඒ රජහට භාය්‍යා වූමු, නිරතුරු ඉඳුරන් පිනවා වාස කළමු.

47. එකලැ මම රහසිගත වැ හිඳැ මෙසේ සිතුමු: "(පරලොව) රැගෙන යායුතු, මා විසින් කළ කුශලකර්මයෙක් නැත.

48. මහත් බිහිසුනු තැවිම් ඇති කටුක වූ භයානක සභාව ඇති අතිශයින් දරුණු වූ නිරයට ඒකාන්තයෙන් යමු, තෙල කරුණෙහි ලා මට සැකයෙක් නැති."

49. රජු කරා එළඹැ මම මෙ වදන් කීමු: "රජතුමනි, මා හට එක් මහණ කෙනකුන් දෙනු මැනැවැ, (මම ඔවුන්) වළඳ වමු" යි.

50. මහරජ මාහට භාවිතෙන්ද්‍රිය මහණ කෙනකුන් දුන්නේ යැ. ඔබ පාත්‍රය ගෙන උතුම් බොජුනෙන් (එය) පුරවා ලීමු.

51. මම උතුම් බොජුනෙන් (පාත්‍රය) පුරවා සුවඳ විලවුන් ද දුනුමු දහසක් අගනා පිළිසඟළෙකින් (සිරුර) වැස්වූමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

52. ආරම්මණං මම[1] එතං සරාමි යාවජීවිතං,
තස්ස චිත්තං පසාදෙත්වා තාවතිංසං අගච්ඡහං.

53. තිංසානං දෙවරාජූනං මහෙසිත්තමකාරයිං,
මනසා පත්ථිතං මය්හං නිබ්බත්තති යථිච්ඡිතං[2]

54. වීසානං චක්කවත්තීනං මහෙසිත්තමකාරයිං,
ඔචිතත්තාව[3] භුත්වාන සංසරාමි භවෙස්වහං.

55. සබ්බබන්ධනමුත්තාහං අපෙතා මෙ උපාදිකා,
සබ්බාසවා පරික්ඛීණා[4] නත්ථිදානි පුනබ්භවො.

56. එකනවුතෙ ඉතො කප්පෙ – යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි පිණ්ඩපාතස්සිදං ඵලං.

57-59. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං එකපිණ්ඩපාතදායිකා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

එකපිණ්ඩපාතදායිකාථෙරියාපදානං ඡට්ඨං.

## 1. 7 කටච්ඡුභික්ඛාදායිකාපදානං

60. පිණ්ඩචාරං චරන්තස්ස තිස්ස නාමස්ස සත්ථුනො,
කටච්ඡුභික්ඛං පග්ගය්හ බුද්ධසෙට්ඨස්ස'දාස'හං.

61. පටිග්ගහෙත්වා සම්බුද්ධො තිස්සො ලොකග්ගනායකො,
වීථියා සණ්ඨිතො සත්ථා අකා මෙ අනුමොදනං.

62. "කටච්ඡුභික්ඛං දත්වාන තාවතිංසං ගමිස්සසි,
ඡත්තිංසදෙවරාජූනං මහෙසිත්තං කරිස්සසි.

63. පඤ්ඤාස[5] චක්කවත්තීනං මහෙසිත්තං කරිස්සසි,
මනසා පත්ථිතං සබ්බං පටිලච්ඡසි සබ්බදා.

64. සම්පත්තිං අනුභොත්වාන පබ්බජිස්සසි'කිඤ්චනා,[6]
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සසි'නාසවා."[7]

---

1. මමං – මජසං.
2. යථිච්ඡකං – සයා.
   යදිච්ඡකං – PTS.
3. උපචිතත්තා – සයා.
4. සබ්බාසවපරික්ඛීණා – මජසං.
5. පඤ්ඤාසං – මජසං.
6. පබ්බජිස්සසකිඤ්චනා – සීමු.
7. නිබ්බායිස්සසනාසවා – සීමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

52. මාගේ තෙල අරමුණ දිවිහිමියෙන් සිහි කෙරෙමි, මම එහි (එ මහණුන් කෙරෙහි) සිත පහදවා උපත් විසින් තව්තිසාවට ගියමු.

53. තිසක් දෙව්රජුනට මෙහෙසිබව කරවූයෙම, මනසින් පැතූ ද සිතැඟි යෙ මට නිපැයෙයි.

54. විසි සක්විතිරජුනට මෙහෙසි වූමු, මම තමා මැ රැස්කළ පින් ඇති වැ (සුගති) භවයන්හි (උපත් විසින්) හැසුරණුමු.

55. මම සියලු භවබන්ධනයෙන් මුක්ත වෙමි, මාහට උපාදනයෝ පහවැ ගියහ, සියලු ආස්‍රවයෝ ක්ෂීණයහ, දැන් මට පුනර්භවයෙක් නැති.

56. මෙයින් එකානූවන කප්හි එකලැ යම් දනක් දුනුම ද, (එතැන් පටන්) දුගතිය නො දනිමි, මෙ පිණ්ඩදනයාගේ විපාක යි

57.–59. මා විසින් කෙලෙස් දවන ලද ... බුදුසසුන් කරන ලදී.

මෙසෙයින් ඒකපිණ්ඩදයිකා මෙහෙණ මෙ ගාථා ප්‍රකාශ කළා යැ.

සවැනි ඒකපිණ්ඩදයිකා ථෙරිඅපදන යි.

## 1. 7 කටච්ඡුභික්ඛාදයිකාපදනය

60. පිඩු පිණිස හැසිරෙන ශාස්තෘ වූ තිස්ස නම් බුදුරජාණන් වහන්සේට මම් කෙණෙසි අහරක් සපයා ගෙන දුනුමු.

61. ශාස්තෘ වූ ලෝකාග්‍රනායක තිස්ස සම්බුදුරජාණන් වහන්සේ (එ අහර) පිළිගෙන වීථියෙහි වැඩසිටිසේක් මට අනුමෝදනා කළ සේක.

62. "(තෝ) කෙණෙසි අහරක් දී තව්තිසායෙහි උපදනෙහි (එහි) සතිස් දෙව්රජුනට මෙහෙසිබව කරන්නෙහි.

63. පනසක් සක්විත්තනට ද මෙහෙසිබව කරන්නෙහි, මනසින් පැතුතාක් සියල්ල හැම කල්හි ලබන්නෙහි.

64. සැපත් වළඳ කොට පළිබොධ රහිත වැ පැවිදිවන්නෙහි, සියලු ආස්‍රව (පහාන පරිඥා විසින්) පිරිසිඳ දැන අනාස්‍රව වැ පිරිනිවෙන්නෙහි" යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

65. ඉදං වත්වාන සම්බුද්ධො තිස්සො ලොකග්ගනායකො,
නභං අබ්භුග්ගමී ධීරො[1] හංසරාජාව අම්බරෙ.

66. සුදින්නං මෙ දානවරං සුයිට්ඨො යාගසම්පදා,
කටච්ඡුභික්ඛං දත්වාන පත්තාහං අචලං පදං.

67. එක නවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි භික්ඛාදානස්සිදං ඵලං.

68–70. කිලෙසා ඣාපිතා මය්හං –පෙ– කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං කටච්ඡුභික්ඛාදායිකා භික්ඛුනී ඉමා ගාථායො
අභාසිත්ථාති.

කටච්ඡුභික්ඛාදායිකා ථෙරියාපදානං සත්තමං.

## 1. 8 සත්තුප්පලමාලිකාපදානං

71. නගරෙ අරුණවතියා අරුණවා[2] නාම ඛත්තියො,
තස්ස රඤ්ඤො අහුං භරියා වාරිකං වාරයාමහං[3].

72. සත්තමාලා[4] ගහෙත්වාන උප්පලා දෙවගන්ධිකා,
නිසජ්ජපාසාදවරෙ එවං චින්තෙසි තාවදෙ.

73. "කිං මෙ ඉමාහි මාලාහි සිරසාරොපිතාහි මෙ,
වරං මෙ බුද්ධසෙට්ඨස්ස ඤාණම්හි අභිරොපිතං."

74. සම්බුද්ධං පතිමානෙන්තී ද්වාරාසන්නෙ නිසීද'හං,
"යදා එහිති[5] සම්බුද්ධො පූජයිස්සං මහාමුනිං."

75. කකුධො විලසන්තොව මිගරාජාව කෙසරී,
භික්ඛුසඞ්ඝෙන සහිතො ආගඤ්ඡි වීථියං ජිනො.

76. බුද්ධස්ස රංසිං දිස්වාන හට්ඨා සංවිග්ගමානසා,
ද්වාරං අවාපුරිත්වාන[6] බුද්ධසෙට්ඨං අපූජයිං.

1. වීරො – මජසං.
2. අරුණො – මජසං.
3. වාරිතං වාරයාමහ – මජසං.
4. සත්තමාලං – මජසං.
5. එතිහ – PTS.
6. අපාපුණිත්වා – සයා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

65. ලෝකාග්‍රනායක ධීර වූ සම්බුද්ධරජාණන් වහන්සේ මෙය වදරා අහසට (වදනා) හංසරාජයකු සෙයින් නභෝගර්භයට පැන නැංගසේක.

66. මා විසින් උතුම් දනක් දෙනලද යැ, යාගසම්පත් මොනොවට යාග විසින් කරන ලදයැ, කෙණෙසි අහරක් දී මම අචල වූ නිවනට පැමිණියෙම් වෙමි.

67. මෙ කපින් දෙයානූවන කප්හි (උපන් මම) එකලැ යම් දනක් දුනුම් ද, (ඒ හෙතුයෙන්) දුගතිය නො දන්මි. මේ වූකලි භික්‍ෂාදනයෙහි විපාක යි.

68–70. මා විසින් කෙලෙස් දවන ලද ... බුදුසසුන් කොට නිමවන ලදී.

මෙ සෙයින් කටච්ඡුභික්ඛාදයිකා මෙහෙණ මේ ගාථා පැවසූ යැ.

සත්වැනි කටච්ඡුභික්ඛාදයිකා ථෙරිඅපදන යි.

## 1. 8 සත්තුප්පලමාලිකා අපදනය

71. අරුණවතී නගරයෙහි අරුණවත් නම් රජෙක් වියැ. මම එරජහට භාය්‍ය්‍යා වූමු. ඉඳුරන් පිනවීමෙහි ලා (රජු) මෙහෙයවා ලූමු.

72. එකල්හි දෙව්සුවඳවහන උපුල්මල්දම් සතක් ගෙන උතුම් පහා මතුයෙහි හිඳ මෙසේ සිතුමු.

73. "මෙ මල්දම් (මා) හිසෙහි පළඳවාලීමෙන් මට කවර නම් වැඩෙක් ද ? (මෙය) බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේගේ ඤාන (ශීර්ෂ) යෙහි අභිරෝපණය කරන ලද්දේ වඩා ලා මට උතුම් වෙයි.

74. යම් විටෙකැ සම්බුදුරජාණන් වහන්සේ වඩනා සේක් ද, එවිටැ (ඒ සිව්) මහාමුනීන්ද්‍රයන් වහන්සේ පුදන්නෙමි" යි මම සම්බුදුරදුන් බුහුමන් සහිත වැ අපේක්‍ෂා කෙරෙමින් දෙර වෙතැ හුන්නමු.

75. දිලියෙන පර්වතකූටයක් සෙයින්, කේශර සිංහරාජයකු සෙයින් ජිනෙන්ද්‍රයන් වහන්සේ භික්ඛුසඞ්ඝයා සහිත වැ වීථියෙහි වැඩම කළසේක.

76. බුදුරැස් දැක හර්ෂ (සතුටු) වූයෙම සංවිග්නමනස් ඇතියෙම් දෙර හැරපියා බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේ පිදූමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

77. සත්තඋප්පලපුප්ඵානි පරිකිණ්ණන්ති[1] අම්බරෙ,
ඡදං[2] කරොන්තා බුද්ධස්ස මත්ථකෙ ධාරයන්ති තෙ.

78. උදග්ගචිත්තා සුමනා වෙදජාතා කතඤ්ජලී,
තත්ථ චිත්තං පසාදෙත්වා තාවතිංසං අගඤ්ඡ'හං.[3]

79. මහානෙලස්ස ඡදනං ධාරෙන්ති මම මුද්ධනි,
දිබ්බගන්ධං පවායාමි සත්තුප්පලානිදං ඵලං.

80. කදචි නීයමානාය ඤාතිසඞ්ඝෙන මෙ තදා,
යාවතා පරිසා මය්හං මහානෙලං ධරීයති.

81. සත්තති දෙවරාජූනං මහෙසිත්තමකාරයිං,
සබ්බත්ථ ඉස්සරා හුත්වා සංසරාමි භවාභවෙ.

82. තෙසට්ඨිචක්කවත්තීනං මහෙසිත්තමකාරයිං,
සබ්බෙ මං අනුවත්තන්ති[4] ආදෙය්‍යවචනා අහුං.

83. උප්පලස්සෙව මෙ වණ්ණො ගන්ධො චෙව පවායති
දුබ්බණ්ණියං න ජානාමි[5] බුද්ධපූජායිදං ඵලං.

84. ඉද්ධිපාදෙසු කුසලා බොජ්ඣඞ්ගභාවනාරතා,
අභිඤ්ඤාපාරමිප්පත්තා බුද්ධපූජායිදං ඵලං.

85. සතිපට්ඨානකුසලා සමාධිජ්ඣානගොචරා,
සම්මප්පධානමනුයුත්තා බුද්ධපූජායිදං ඵලං.

86. විරියං මෙ ධුරධොරය්හං යොගක්ඛෙමාධිවාහනං,
සබ්බාසවා පරික්ඛීණා[6] නත්ථිදානි පුනබ්භවො.

87. එකතිංසෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා[7]
දුග්ගතිං නාභිජානාමි පුප්ඵදානස්සිදං[8] ඵලං.

88–90. කිලෙසා ඣාපිතා මය්හං – කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං සත්තුප්පලමාලිකා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

සත්තුප්පලමාලිකාථෙරියාපදානං අට්ඨමං.

---

1. සුවිත්ථිණ්ණානි – සයා.
පවිත්ථිණ්ණානි – PTS.
2. ඡදිං – මජසං.
3. අගච්ඡහං – මජසං.
4. මමනුවත්තන්ති – මජසං.
5. දුග්ගතිං නාභිජානාමි – සයා, PTS.
6. සබ්බාසවපරික්ඛීණා – මජසං.
7. පුප්ඵමභිපූජයිං – මජසං.
8. බුද්ධපූජායිදං – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

77. සත් උපුල්මල් අහස්කුසැ විසිරිණ. ඒ උපුල්හු සෙවෙණියක් කෙරෙමින් බුදුරදුන් මතුයෙහි ධරා සිටුනාහ.

78. ඔදවැඩී සිතැති සුමනස් වූ ප්‍රීතිමත් වූ කෘතාඤ්ජලී වූ මම ඔබ කෙරෙහි සිත් පහදවා තව්තිසා දෙව්ලොව උපනුමු.

79. මා මුදුන්හි මහනෙල් සියනක් ධරත්. (මම) දෙව්සුවඳ වහන කෙරෙමි. මේ වනාහි සත් උපුලක් පිදීමෙ විපාක යි.

80. කිසිවිටෙකැ නෑ සමූහයා විසින් ගෙන යනු ලබන මට යම් පමණ පිරිස් වේ ද, (එ පිරිස්) එකල්හි මට මහනෙල් ධරනු ලැබෙයි.

81. සැත්තෑවක් දෙව්රජුනට මෙහෙසිබව කරවූමු. (මෙසේ) සියලු තන්හි ඉසුරු වැ කුදුමහත් බෙවෙහි හැසිරෙමි.

82. තෙසැටක් සක්විතිරජුනට මෙහෙසිබව කරවූමු. සියල්ලෝ මා අනු වැ වැටෙති, (මම) හැදහියයුතු වදන් ඇතිවූමු.

83. මාගේ පැහැය උපුලක පැහැය මෙන් වෙයි. (උපුල්) සුවඳ (මගේ කයින්) හමා යෙයි. දුර්වර්ණ බවක් නො දනිමි, මේ බුද්ධ පූජායෙහි විපාක යි.

84. ඍද්ධිපාදයන්හි නිපුණ වෙමි. බොධ්‍යඞ්ගභාවනායෙහි ඇලුනෙම අභිඥපාරයට පැමිණියෙම (ද) වෙමි. මෙ වූකලි බුද්ධපූජායෙහි විපාක යි.

85. සතිපට්ඨානයෙහි දක්‍ෂ වෙමි. සමාධි-ධ්‍යාන ගෝචර කොට ඇත්තෙමි. සම්‍යක්ප්‍රධන්හි පුන පුනා යෙදුණමු. මෙ වනාහි බුද්ධ පූජායෙහි එල යි.

86. මාගේ වීර්‍ය්‍යය (යොගක්‍ෂෙමසංඛ්‍යාත නිවනට පමුණුවන) ධුරවාහක (ගැල අදනා) ගවයා යි, (මාගේ) සියලු ආස්‍රවයෝ ගෙවී ගියහ, දැන් (මට) පුනර්භවයෙක් නැති.

87. මෙයින් එක්තිස්වන කප්හි යම් කුශල කර්මයක් කළමු ද, (එ හෙතුයෙන්) දුගතිය නො දන්මි, මෙ වූකලී පුෂ්පදනයාගේ එල යි.

88, 90. මා විසින් කෙලෙස්හු දවන ලදහ ... බුදුසසුන් කරන ලදී.

මෙසෙයින් සත්තුප්පලමාලිකා මෙහෙණි මෙ ගාථා පැවසූ යැ.

අටවැනි සත්තුප්පලමාලිකා ථෙරීඅපදන යි.



* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 1. 9 පඤ්චදීපිකාපදානං

91. නගරෙ හංසවතියා චාරිකී[1] ආස'හං තදා,
ආරාමෙන ච ආරාමං චරාමි කුසලත්ථිකා.

92. කාළපක්ඛම්හි දිවසෙ අද්දසං බොධිමුත්තමං,
තත්ථ චිත්තං පසාදෙත්වා බොධිමූලෙ නිසීදහං.

93. ගරුචිත්තං උපට්ඨපෙත්වා සිරෙ කත්වාන අඤ්ජලිං,
සොමනස්සං පවෙදෙත්වා එවං චින්තෙසි තාවදෙ.

94. "යදි බුද්ධො අමිතගුණො අසමප්පටිපුග්ගලො,
දස්සෙතු පාටිහීරං මෙ බොධි ඔභාසතු අයං."

95. සහ ආවජ්ජිතා[2] මය්හං බොධි පජ්ජලි තාවදෙ,
සබ්බසොණ්ණමයො[3] ආසි දිසා සබ්බා විරොචයුං.[4]

96. සත්තරත්තින්දිවං තත්ථ බොධිමූලෙ නිසීද'හං,
සත්තමෙ දිවසෙ පත්තෙ දීපපූජං අකාස'හං.

97. ආසනං පරිවාරෙත්වා පඤ්චදීපානි පජ්ජලුං,
යාව උදෙති සුරියො දීපා මෙ පජ්ජලුං තදා.

98. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

99. තත්ථ මෙ සුකතං ව්‍යම්හං පඤ්චදීපීති[5] වුච්චති
සට්ඨියොජනමුබ්බෙධං[6] තිංසයොජනවිත්ථතං.

100. අසඞ්ඛියානි දීපානි පරිවාරෙ ජලන්ති මෙ
යාවතා දෙවභවනං දීපාලොකෙන ජොතති.[7]

101. පරම්මුඛා නිසීදිත්වා යදි ඉච්ඡාමි පස්සිතුං,
උද්ධං අධො ච තිරියං සබ්බං පස්සාමි චක්ඛුනා.

102. යාවතා අභිකඞ්ඛාමි දට්ඨුං සුගතදුග්ගතෙ,
තත්ථ ආවරණං නත්ථි රුක්ඛෙසු පබ්බතෙසු වා.

---

1. චාරිණී – ස්‍යා.
2. ආවජ්ජිතෙ – මජසං, ස්‍යා, PTS.
3. සබ්බසොවණ්ණමයා – සීමු.
4. විරොචයී – සීමු, මජසං.
5. පඤ්චදීපානි – මජසං.
6. සතයොජනමුබ්බිධං – සීමු, ස්‍යා, PTS.
7. ජොතයී – සීමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 1. 9 පඤ්චදීපිකාපදානය

91. එකල්හි මම හංසවතී නගරයෙහි හැසිරෙන්නක් වූමු. කුසල් කැමැති වැ අරමින් අරමැ හැසුරුණුමු.

92. (එක්) කළුවර පොහෝ දිනෙකැ උතුම් බෝරුක දුටුමු. එහි සිත් පහදවා මම බෝමුල්හි හුන්මු.

93. එකල්හි බුහුමන් සිත් එළවා හිස් මුදුන්හි ඇඳිලි බැඳ සොම්නස් ලැබ මෙසේ සිතුවෙමු.

94. " ඉදින් (පියුමතුරා) බුදුහු අපමණ ගුණ ඇතියේක් නම් අසම වූ අප්‍රතිපුද්ගල සේක් නම් මට පෙළහර දක්වන සේක්වා ! මේ බෝරුක බබළාවා '' ! යි.

95. මාගේ ආවර්ජනාව හා සමග එකෙණෙහි බෝරුක දිලුණේ ය සියල්ල රන්මුවා මෙන් විය. සියලු දිශාවෝ බැබළුණාහ.

96. මම ඒ බෝමුල්හි සත්රැදවලක් හුන්නමු. සත්වැනි දවස පැමිණි කල්හි මම දීප පූජාවක් කළමු.

97. ආසනය පිරිවරා ප්‍රදීප පසෙක් දිලුණේ ය. එදවස හිරු උදවන තාක් මාගේ ප්‍රදීපයෝ දිලුණාහ.

98. එ පුණ්‍යකර්ම හේතුයෙන් ද, චේතනාප්‍රණිධි හේතුයෙන් ද, මම මිනිස්කය හැර පියා තව්තිසා දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියමූ.

99. එහි මට මොනොවට කරන ලද විමනෙක් වියැ. සැට-යොදුන් උස් වූ තිස්යොදුන් පුළුල් වූ එ විමන 'පඤ්චදීපි' යි කියනු ලැබෙයි.

100. දෙව්විමන යම් තාක් ප්‍රදීපාලෝකයෙන් දිලියේ ද (එ තාක්) අසංඛ්‍යසංඛ්‍යාත ප්‍රදීපයෝ හාත්පස දිලියෙන්නාහ.

101. ඉදින් (මම) පරාම්මුඛ වැ හිඳ දක්නට රිසියුම් නම් උඩ ද යට ද සරසැ ද (වූ) සියල්ල මසැසින් දකිමි.

102. සුගත දුර්ගතයන් දක්නට යම් පමණින් රිසියුම් ද රුක්හි වේවයි පවුහි වේවයි එහිලා ආවරණයෙක් නැති,

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

103. අසීති දෙවරාජූනං මහෙසිත්තමකාරයිං,
සත්තානං චක්කවත්තීනං මහෙසිත්තමකාරයිං.

104. යං යං යොනූපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
දීපසතසහස්සානි පරිවාරෙත්වා ජලන්ති මං.[1]

105. දෙවලොකා චවිත්වාන උපපජ්ජිං මාතුකුච්ඡියං,
මාතුකුච්ඡිගතං සන්තිං[2] අක්ඛි මෙ න නිමීලති.

106. දීපසතසහස්සානි පුඤ්ඤකම්මසමඞ්ගිතා,
සූතිඝරෙ පජ්ජලන්ති[3] පඤ්ඤදීපානිදං ඵලං.

107. පච්ඡිමෙ භවෙ[4] සම්පත්තෙ මානසං විනිවට්ටයිං,
අජරාමරං[5] සීතිභාවං නිබ්බානං ඵස්සයිං[6] අහං.

108. ජාතියා සත්තවස්සා'හං අරහත්තමපාපුණිං,
උපසම්පාදයී බුද්ධො ගුණමඤ්ඤාය ගොතමො.

109. මණ්ඩපෙ රුක්ඛමූලෙ වා පාසාදෙසු ගුහාසු වා,
සුඤ්ඤාගාරෙ ච ඣායන්ත්‍යා[7] පඤ්ඤදීපා ජලන්ති මෙ.

110. දිබ්බචක්ඛු විසුද්ධං මෙ සමාධිකුසලා අහං,
අභිඤ්ඤාපාරමිප්පත්තා පඤ්ඤදීපානිදං ඵලං.

111. සබ්බවොසිතවොසානා කතකිච්චා අනාසවා,
පඤ්ඤදීපා මහාවීර පාදෙ වන්දති[8] චක්ඛුම.

112. සතසහස්සෙ ඉතො[9] කප්පෙ යං දීපමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි පඤ්ඤදීපානිදං ඵලං.

113–115. කිලෙසා ඣාපිතා මය්හං –පෙ– කතං
බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං පඤ්ඤදීපිකා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

පඤ්ඤදීපිකාථෙරියාපදානං නවමං.

---

1. පරිවාරෙ ජලන්ති මෙ – මජසං.
2. ගතා ජනන්ති – මජසං, PTS.
3. ජලන්ති සූතිකාගෙහෙ – මජසං.
4. පච්ඡිමභවෙ – සීමු.
5. අජරාමතං – මජසං.
6. පස්සයිං – ස්‍යා.
7. ඣායතෙන – සීමු.
ඣායන්තා – PTS.
වජ්ජන්තියා – මජසං.
8. වන්දාමි – මජසං, PTS
9. සතසහස්සිතො – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

103. අසූවක් දෙව්රජුනට මෙහෙසිබව කරවීමි. සියක් ගණන් සක්විත්තනට ද මෙහෙසිබව කරවූයෙමි.

104. දෙව් අත්බව යැ, යළි මිනිසත් බව යැ යන යම් යම් අත්බවකට (උපත් විසින්) එළැඹෙම් ද, මා පිරිවරා සියදහස් ගණන් පහන්හු දිලියෙත්.

105. දෙව්ලොවින් සැව (මනුලොවැ) මවුකුස්හි උපන්මී; මවුකුසට ගියා වූ ම මාගේ ඇස් (පිය) නිමීලනය නො වෙයි.

106. (මම) පුණ්‍යකර්මසමන්වාගත යෙමි, (එහෙයින්) සියක් දහසක් පහන්හු තිඹිරි ගෙහි දිලියෙත්නාහ. මෙ දීපදනයාගේ ප්‍රතිඵල යි.

107. පශ්චිමභවය පැමිණි කල්හි මනස කෙලෙසුන්ගෙන් මුදවා ලීමි. ජරාමරණ නැති සිහිල්බව වූ නිවන මම ස්පර්ශ කළෙමු.

108. ජාතියෙන් සත්හැවිරිදි වූ මම රහත්බවට පැමිණියෙමු, ගෞතම ගෝත්‍ර ඇති බුදුහු ගුණ සලකා (මා) උපසපන් කළහ.

109. මණ්ඩපයෙහි වේවයි, රුක්මුල්හි වේවයි, පහයෙහි වේවයි, ගුහායෙහි වේවයි, ශූන්‍යාගාරයෙහි වේවයි ධ්‍යාන කරන මාහට ප්‍රදීප පසෙක් දිලියෙත්තේ ය.

110. මට දිවැස විශුද්ධ වියැ, මම සමාධියෙහි නිපුණ වීමි. අභිඥාපාරයට පැමිණියෙම් වෙමි. මෙ වූකලි පඤ්චප්‍රදීපදනයාගේ ප්‍රතිඵල යි.

111. චක්ෂුර්මත් මහාවීරයන් වහන්ස, සියලු බ්‍රහ්මචර්‍ය්‍යවාස වැස නිම වූ කෘතකෘත්‍ය වූ අනාස්‍රව වූ පඤ්චදීපා මෙහෙණ (ඔබ) පා වඳියි.

112. මෙයින් සුවහස්වන කප්හි, එකලැ යම් ප්‍රදීපදනයක් ප්‍රදනය කළෙමු ද, (එ හෙතුයෙන්) දුර්ගතිය නො මැ දනිමි, මෙ වනාහි පඤ්චප්‍රදීපදනයාගේ ප්‍රතිඵල යි.

113–115. මා විසින් ක්ලේශයෝ දවන ලදහ ... බුද්ධශාසනය කරන ලදී.

මෙසෙයින් පඤ්චදීපිකා මෙහෙණ මෙ ගාථා පැවැසූ යැ.

නවවැනි පඤ්චදීපිකා ථෙරීඅපදන යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 1. 10 උදකදායිකාපදානං

116. නගරෙ බන්ධුමතියා අහොසිං උදහාරිකා,
උදහාරෙන ජීවාමි තෙන පොසෙමි දාරකෙ.

117. දෙය්‍යධම්මො ච මෙ නත්ථි පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ,
කොට්ඨකං උපසඞ්කම්ම උදකං පට්ඨපෙස'හං.

118. තෙන කම්මෙන සුකතෙන තාවතිංසමගච්ඡ'හං,
තත්ථ මෙ සුකතං ව්‍යම්හං උදහාරෙන නිම්මිතං.

119. අච්ඡරානං සහස්සස්ස[1] අහං හි පවරා තදා,
දසට්ඨානෙහි තා සබ්බා අභිභොමි සදා අහං.

120. පඤ්ඤාසං දෙවරාජූනං මහෙසිත්තමකාරයිං,
වීසතිචක්කවත්තීනං මහෙසිත්තමකාරයිං.

121. දුවෙ භවෙ සංසරාමි දෙවත්තෙ අථ මානුසෙ,
දුග්ගතිං නාභිජානාමි දකදානස්සිදං[2] ඵලං.

122. පබ්බතග්ගෙ දුමග්ගෙ වා අන්තලික්ඛෙ ච භූමියං,
යදා උදකමිච්ඡාමි ඛිප්පං පටිලභාමහං.

123. අවුට්ඨිකා දිසා නත්ථි සන්තත්තා කුථිතා න ච,[3]
මම සඞ්කප්පමඤ්ඤාය මහාමෙඝො පවස්සති.

124. කදචි නීයමානාය ඤාතිසඞ්ඝෙන මෙ තද
යදා ඉච්ඡාමහං වස්සං මහාමෙඝො පවස්සති[4]

125. උණ්හං වා පරිළාහො වා සරීරෙ මෙ න විජ්ජති,
කායෙ ච මෙ රජො නත්ථි දකදානස්සිදං ඵලං.

126. විසුද්ධමනසා අජ්ජ අපෙතමලපාපිකා[5],
සබ්බාසවා පරික්ඛීණා[6] නත්ථිදානි පුනබ්භවො.

---

1. සහස්සානං – සයා.
2. උදකදානස්සිදං – සිමු.
3. සන්තත්තා කුථිතාපි ච – මජසං.
4. අජාගර – මජසං.
5. අපෙතමනප පිකා – මජසං, PTS.
6. සබ්බාසවපරික්ඛීණා – සිමු, මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 1. 10. උදකදායිකාපදානය

116. බන්ධුමතී නගරයෙහි (පෙර මම) දිය අදනා කළදාසක් වූමු. දිය ඇදීමෙන් ජීවත් වෙමි, එයින් දරුවනුදු පෝෂණය කෙරෙමි.

117. අනුත්තර වූ පුණ්‍යක්ෂෙත්‍රයෙහි මාහට දේයධර්මයෙක් (පුදනට තිසි දයෙක්) නැත. (එ හෙයින්) නහන කොටුව වෙත එළැඹැ මම දිය එළවා තැබූයෙමි.

118. එ කුශලකර්මයෙන් මම (උපත් විසින්) තව්තිසා දෙව්ලොවට ගියමු. එහි මාහට දිය ඇදීමෙ පිනෙන් නිර්මිත වූ මොනොවට කළ විමනෙක් විය.

119. එකල්හි මම දහසක් අප්සරාවනට අග්‍ර වූමු. හැම කල්හි දස කරුණෙකින් ඒ සියල්ලන් අභිභවා සිටිමි.

120. පනසක් දෙව්රජුනට මෙහෙසිබව කරවූයෙමි. විසිසක්විති රජුනට ද මෙහෙසිබව කරවූයෙමි.

121. දෙව්බව යැ, යළි මිනිසත්බව යැ යන භවද්වයයෙහි සැරිසරමි, දුගතිය නො ම දනිමි. උදකදානයාගේ මෙ විපාක යි:

122. පවු අග්හි වෙවයි, රුක් අග්හි වෙවයි, අහස්හි වෙවයි, පොළොවහි වෙවයි යම් විටෙකැ දිය රිසියෙම ද, (එවිටැ) මම වහා (දිය) ලබමි.

123. වැසි නොවටනා දිශායෙක් (මට) නැත. තැවිමෙක් කැකෑරුණු බවෙක් දු නැති. මාගේ අදහස් දැන (මෙන්) මහාමෙඝය වෙසෙසින් වස්නේ යි.

124. යම් විටෙකැ මම වැසි රිසි වන්නෙම් නම් එවිටැ නෑ සමූහයා විසින් ගෙන යනු ලබන මට මහවැසි වසී.

125. මාගේ සිරුරෙහි උණුසුමෙක් වෙවයි, දහයෙක් වෙවයි නැත, මාගේ කයෙහි රජස් ද නැති. මෙ වූකලි උදකදානයාගේ විපාක යි,

126. අද (මම) විශුද්ධ මනස් ඇති වෙමි, පහ වැ ගිය කෙලෙස්-මල ඇති වෙමි, සියලු ආස්‍රව ගෙවී ගියේ යැ, දන් පුනර්භවයෙක් නැති.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

127. එකනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං[1] තදා,
දුග්ගතිං නාභිජානාමි දකදානස්සිදං ඵලං.

128–130. කිලෙසා ඣාපිතා මය්හං –පෙ– බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං උදකදායිකා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

උදකදායිකාථෙරියාපදානං දසමං.

තස්සුද්දානං:

සුමේධා මෙඛලාදායී මණ්ඩපසඞ්කමං දදා,
නළමාලී පිණ්ඩදදා කටච්ඡු උප්පලප්පදා.

දීපදා දකදා චෙව ගාථායො ගණිතා ඉහ,
එකං ගාථාසතං චෙව තිංසති ච තදුත්තරිං.

සුමේධාවග්ගො පඨමො.

1. යමුදකමදදිං – සිමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

127. මෙයින් එකානූවන කප්හි, එකලැ යම් පුණ්‍යකර්මයක් කළමු ද, (එ හේතුයෙන්) දුගතිය නො දනිමි. මේ උදකදනයාගේ විපාක යි.

128-130. මා විසින් ක්ලේශයෝ දවන ලදහ ... බුද්ධශාසනය කරන ලද්දේ යි.

මෙසෙයින් උදකදයිකා මෙහෙණ මේ ගාථා පැවැසූ යැ.

දසවැනි උදකදයිකා ස්ථවිරීඅපදන යි.

**එහි උද්දනය :**

සුමෙධා යැ, මෙඛලාදයිකා යැ, මණ්ඩපදයිකා යැ, සංකමනත්ථා යැ, නළමාලිකා යැ, පිණ්ඩපාතදයිකා යැ, කටච්ඡුභික්ඛාදයිකා යැ, උප්පල-මාලිකා යැ,

දීපදයිකා යැ, උදකදයිකා යැ යන මොවුන් පිළිබඳ අපදන දසය යි. මෙහි ගාථා එක්සිය තිසෙකි.

පළමුවැනි සුමෙධා වර්ග යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 2. එකූපොසථික වග්ගො

### 2.1 එකූපොසථිකාපදානං

131. නගරෙ බන්ධුමතියා බන්ධුමා නාම ඛත්තියො,
දිවසෙ පුණ්ණමායං[1] සො උපවසි[2] උපොසථං.

132. අහං තෙන සමයෙන කුම්භදාසී අහුං තහිං,
දිස්වා සරාජිකං[3] සෙනං එවාහං චින්තයිං තදා.

133. "රාජාපි රජ්ජං ඡඩ්ඩෙත්වා උපවසි[2] උපොසථං,
සඵලං නූන තං කම්මං ජනකායො පමොදිතො."

134. යොනිසො පච්චවෙක්ඛිත්වා දුග්ගච්චඤ්ච[4] දලිද්දතං,[5]
මානසං සංපහංසෙත්වා[6] උපවසිං උපොසථං.

135. අහං උපොසථං කත්වා සම්මාසම්බුද්ධසාසනෙ,
තෙන කම්මෙන සුකතෙන තාවතිංසං අගච්ඡහං[7]

136. තත්ථ මෙ සුකතං ව්‍යම්හං උද්ධං[8] යොජනමුග්ගතං,
කූටාගාරවරූපෙතං සයනාසනභූසිතං.[9]

137. අච්ඡරා සතසහස්සා උපතිට්ඨන්ති මං සදා,
අඤ්ඤෙ දෙවෙ අතික්කම්ම අතිරොචාමි සබ්බදා.

138. චතුසට්ඨිදෙවරාජූනං මහෙසිත්තමකාරයිං,
තෙසට්ඨිචක්කවත්තීනං මහෙසිත්තමකාරයිං.

139. සුවණ්ණවණ්ණා හුත්වාන භවෙසු සංසරාමහං,
සබ්බත්ථ පවරා හොමි උපොසථස්සිදං ඵලං.

140. හත්ථියානං අස්සයානං රථයානඤ්ච සිවිකං[10]
ලභාමි සබ්බමෙතම්පි උපොසථස්සිදං ඵලං.

1. පුණ්ණමාය – මජසං.
2. උපපජ්ජි – සතා, PTS
3. සරාජකං – මජසං
4. දුග්ගතිඤ්ච – සතා
5. දලිද්දතං – මජසං
6. සංපහංසිත්වා – මජසං
7. තාවතිංසමගච්ඡහං – මජසං
8. උද්ධ – මජසං
9. මහාසනසුභූසිතං – මජසං
මහාසයන භූසිතං – PTS
10. කෙවලං – සීමු, සතා, PTS

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

# 2. ඒකූපොසථික වර්ගය.

## 2.1 ඒකූපොසථිකාපදානය

131. බන්ධුමතී නුවර බන්ධුමත් නමැති රජෙක් විය. හේ පුණුපොහෝ දිනැ පෙහෙවස් විසී.

132. එසමයෙහි මම එනුවර කළදූස්සක් වූමු. (පෙහෙවස් වසන) රජු සහිත සෙනග දැක මම මෙසේ සිතූමු:

133. "රජ ද රජය හැරපියා පෙහෙවස් විසී යැ. එකැතින් ඒ ක්‍රියාව එල සහිත යැ, ජනසමූහයා ප්‍රමුදිත වූයේ වෙයි'' යනු යි.

134. (මම ද) දුගී බව ද දිළිඳුබව ද නුවණින් මෙනෙහි කොට සිත පහදවා පෙහෙවස් වුසුමු,

135. මම (විපස්සී) සම්බුදුසසුනෙහි පෙහෙවස් වැස ඒ කුශල කම්යෙන් තව්තිසා දෙව්ලොව උපන්මු.

136. එහි මට විමනෙක් මැනැවින් කරනලද වෙයි. (එ විමන) යොදුනක් උස් යැ, මනාකුළුගෙවලින් යුතු යැ, (හැඳපුවු ඇ) සෙනසුනෙන් සැරහුණේද වේ.

137. සියදහසක් අප්සරාවෝ සැම කල්හි මට උවටැන් කෙරෙති. (මම) සැමද සෙසු දෙවියන් ඉක්මවා අතිශයින් බබළමි.

138. සූසැටක් දෙව්රජුනට මෙහෙසි වූමු. තෙසැටක් සක්විති රජුනට ද මෙහෙසි වූවා වෙමි.

139. මම රන්වන් සිවිපැහැ ඇති වැ භවයන්හි හැසිරෙමි. සියලු තන්හි උතුම වෙමි, මේ වූකලි පෙහෙවස් විසීමේ විපාක යැ.

140. හස්තියාන - අශ්වයාන - රථයාන - සිවිගෙවල් යන තෙල සියල්ල ලබමි. මේ වනාහී පෙහෙවස් විසීමේ විපාක යැ,

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

141. සොවණ්ණමයං රූපිමයං අථොපි ඵලිකාමයං,
ලොහිතඞ්කමයඤ්චෙව සබ්බං පටිලභාම'හං.

142. කොසෙය්‍යකම්බලියානි ඛොමකප්පාසිකානි ච,
මහග්ඝානි ච වත්ථානි සබ්බං පටිලභාම'හං.

143. අන්නං පානං ඛාදනීයං වත්ථසෙනාසනානි ච,
සබ්බමෙතං පටිලභෙ උපොසථස්සිදං ඵලං.

144. වරගන්ධඤ්ච මාලඤ්ච චුණ්ණකඤ්ච විලෙපනං,
සබ්බමෙතං පටිලභෙ උපොසථස්සිදං ඵලං.

145. කූටාගාරඤ්ච පාසාදං මණ්ඩපං හම්මියං ගුහං,
සබ්බමෙතං පටිලභෙ උපොසථස්සිදං ඵලං.

146. ජාතියා සත්තවස්සා'හං පබ්බජිං අනගාරියං,
අඩ්ඪමාසෙ අසම්පත්තෙ අරහත්තං අපාපුණිං,[1]

147. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො

148. එකනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි උපොසථස්සිදං ඵලං.

149. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

150. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං එකූපොසථිකා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

එකූපොසථිකාථෙරියාපදානං පඨමං.

1. අරහත්තමපාපුණිං – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

141. මම රන්මුවා වූ ද, රිදීමුවා වූ ද, පිළිමිණිමුවා වූ ද, රත්-මිණිමුවා වූ ද (උපභොග පරිභොග වස්තු) සියල්ල පිළිලබමි.

142. තිහිරිපිළි යැ, එළලොමපිළි යැ, කොමු පිළි යැ, කපු පිළි යැ (අන්‍ය වූත්) මහාර්හ වස්ත්‍ර ද යි යන සියල්ල පිළිලබමි.

143. ආහාර පාන හා කැයුතු දෑ ද, වස්ත්‍ර හා ශයනාසන ද යන මෙල සියල්ල ලබමි. මේ පෙහෙවස් විසීමේ විපාක යි,

144. මහඟු සුවඳ ද, මල්දම් ද, වත්සුණු හා විලවුන් ද යන මෙල සියල්ල ලබමි. මේ පෙහෙවස් විසීමේ විපාක යි.

145. කුළුගෙවල් යැ, මහපහා යැ, මණ්ඩප යැ, සඳලු සහිත ගේ යැ, ගුහා යැ යන මෙල සියල්ල ලබමි. මේ පෙහෙවස් විසීමේ විපාක යි.

146. උපතින් සත්හැවිරිදි වූ මම බුදුසසුන්හි පැවිදි වූමු. (පැවිද්දෙන්) අඩමසක් නො පැමිණි කල්හි රහත්බවට පැමිණියා වෙමි.

147. මා විසින් කෙලෙස්හු දවන ලදහ, සියලු භවයෝ නසන ලදහ සියලු ආස්‍රවයෝ ක්ෂීණ වූහ, දැන් (මට) පුනර්භවයෙක් නැති.

148. මෙයින් එක්අනූවන කප්හි යම් කුශලකර්මයක් කළමු ද, (ඒ හෙතුයෙන්) දුගතිය නො හඳුනමි, මේ පෙහෙවස් විසීමේ ඵල යි.

149. බුදුරදුන් වෙතැ එළැඹීම මට ස්වාගත (=යහපත්) වියැ, ත්‍රිවිද්‍යා අනුප්‍රාප්ත යැ, බුදුසසුන් කරන ලද යැ.

150. මේ සිවුපිළිසිඹියා ද, අෂ්ටවිමොක්ෂ ද, ෂට් අභිඥා ද මා විසින් පසක් කරන ලද යැ. බුදුසසුන් කරන ලදී.

මෙසෙයින් ඒකූපොසථිකා මෙහෙණ මේ ගාථා පැවසූ යැ.

පළමුවැනි ඒකූපොසථිකා ස්ථවිරාපදාන යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 2. 2 සලලපුප්ඵිකාපදානං

151. චන්දභාගානදීතීරෙ අහොසිං කින්නරී තදා,
අද්දසාහං[1] දෙවදෙවං චඞ්කමන්තං නරාසභං.

152. ඔචිනිත්වාන සලලං බුද්ධසෙට්ඨස්ස'දාස'හං,
"උපසිඞ්ඝ මහාවීර[2] සලලං දෙවගන්ධිකං."

153. පටිග්ගහෙත්වා සම්බුද්ධො විපස්සී ලොකනායකො,
උපසිඞ්ඝි මහාවීරො පෙක්ඛමානාය මෙ තදා.

154. අඤ්ජලිං පග්ගහෙත්වාන වන්දිත්වා දිපදුත්තමං,[3]
සකං චිත්තං පසාදෙත්වා තතො පබ්බතමාරුහිං.

155. එකනවුතෙ ඉතො[4] කප්පෙ යං පුප්ඵමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

156. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- විහරාමි අනාසවා

157. ස්වාගතං වත මෙ ආසි -පෙ- කතං බුද්ධස්ස සාසනං.

158. පටිසම්භිදා චතස්සො ච -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං සලලපුප්ඵිකා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

සලලපුප්ඵිකා ථෙරියාපදානං දුතියං.

## 2. 3 මොදකදායිකාපදානං

159. නගරෙ බන්ධුමතියා කුම්භදාසී අහොස'හං,
මම භාගං ගහෙත්වාන ගච්ඡිං උදකහාරිකා.[5]

160. පන්ථම්හි සමණං දිස්වා සන්තචිත්තං සමාහිතං,
පසන්නචිත්තා සුමනා මොදකෙ තීණි'දාස'හං.

161. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
එකනවුතිං[6] කප්පානි විනිපාතං න ගච්ඡ'හං.

---

1. අද්දසං - PTS.
2. උපසිඞ්ඝි මහාවීරො - මජ්සං, PTS.
3. පදවිදුත්තමං - මජ්සං.
4. එකනවුතිතො - මජ්සං.
5. ගච්ඡං උදකහාරිකං - සීමු.
උදකහාරකෙ - ස්‍යා.
6. එකූනතිංස - ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුළත් කර ඇත.

## 2. 2 සලලපුෂ්පිකාපදානය

151. (පෙර) මම චන්ද්‍රභාගා නදීතීරයෙහි කිඳුරියක් වූමු. එකලැ දෙවියන්ට දෙව් වූ නරශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේ සක්මන් කරනු දුටුමු.

152. මම සලල මල් නෙලා "මහාවීරයන් වහන්ස, දිව්‍යමය සුවඳැති සලල මල් සුඹුනා සේක්ව"යි බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේට දුන්මු:

153. එවිට මහාවීර වූ ලෝකනායක **විපස්සී** සම්බුදුරජාණන් වහන්සේ මා බලා සිටිය දී මැ (එමල්) සිඹ වදාළසේක.

154. ද්විපදෙත්තම බුදුරදුන් ඇඳිලි බැඳ වැඳ සිය සිත පහදවා ගෙන එතැනින් නික්මැ පර්වතයට නැගුණෙමු.

155. මෙයින් එක්අනූවන කප්හි යම් මලක් (පූජා විසින්) දිනිම් ද, (එ පිනෙන්) දුගතිය නො දනිමි. පුෂ්පපූජායෙහි මේ එල යි.

156. මා විසින් කෙලෙස්හු දවන ලදහ... අනාස්‍රව වැ වාස කෙරෙමි.

157. මට යහපතක් වියැ ... බුදුසසුන් කරන ලද යැ.

158. සිවුපිළිසිඹියා ද ... බුදුසසුන් කරන ලදී.

මෙ සෙයින් සලලපුෂ්පිකා මෙහෙණ මේ ගාථා පැවසූ යැ.

දෙවැනි සලලපුෂ්පිකා ස්ථවිරීඅපදාන යි.

## 2. 3 මෝදකදායිකාපදානය

159. මම බන්ධුමතී නගරයෙහි කළඳාස්සක් වූමු. දිය අදනා මම මගේ (අහර) කොටස රැගෙන (දිය අදනට) ගියමු.

160. මගැ (වඩනා) ශාන්ත සිත් ඇති සත්හුන්ගමන් ඇති මහණ කෙනකුන් දැක මම පහන් සිතැති වැ සොම්නස් වැ මොදක (–රසකැවිලි) තුනක් ඔබට දුන්මු.

161. එ කුශලකර්මහේතුයෙන් ද, චේතනාප්‍රණිධියෙන් ද මම එක්අනූ කපක් මුළුල්ලෙහි දුගතියකට (උපත් විසින්) නො ගියමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

162. සම්පත්තිං[1] තං කරිත්වාන සබ්බං අනුභවාමහං,[2]
මොදකෙ තීණි දත්වාන පත්තා'හං අචලං පදං.

163–165. කිලෙසා ඣාපිතා මය්හං –පෙ– කතං
බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං මොදකදායිකා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

**මොදකදායිකා ථෙරියාපදානං තතියං.**

## 2.4 එකාසනදායිකාපදානං

166. නගරෙ හංසවතියා අහොසිං බාලිකා[3] තදා.
මාතා ච මෙ පිතා චෙව කම්මන්තං අගමංසු තෙ.

167. මජ්ඣන්තිකම්හි සූරියෙ අද්දසං සමණං අහං,
වීථියං[4] අනුගච්ඡන්තං ආසනං පඤ්ඤපෙස'හං.

168. ගොණකචිත්තකාදීහි[5] පඤ්ඤපෙත්වා'හමාසනං,[6]
පසන්නචිත්තා සුමනා ඉදං වචනමබ්‍රවිං.

169. "සන්තත්තා කුථිතා භූමි සූරො මජ්ඣන්තිකෙ ඨිතො,
මාලුතා ච න වායන්ති කාලො චෙත්ථ උපට්ඨිතො.[7]

170. "පඤ්ඤත්තමාසනමිදං තවත්ථාය මහාමුනි,
අනුකම්පමුපාදාය නිසීද මම ආසනෙ."

171. නිසීදි තත්ථ සමණො සුදන්තො සුද්ධමානසො,
තස්ස පත්තං ගහෙත්වාන යථාරන්ධමදාසහං.

172. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

173. තත්ථ මෙ සුකතං ව්‍යම්හං ආසනෙන සුනිම්මිතං,
සට්ඨියොජනමුබ්බෙධං තිංසයොජනවිත්ථතං.

---

1. සම්පත්ති – මජ්ඣං., සම්පත්තිඤ්ච – සျා.
2. අනුභවිං අහං – මජ්ඣං.
3. මාලිකා – සျා, PTS
4. වීථියා – මජ්ඣං.
5. ගොණකචිත්තිකාහි – මජ්ඣං, PTS
6. මමාසනං – මජ්ඣං, මහාසනං - PTS
7. චෙවෙත්ථමෙහිති – මජ්ඣං, චෙත්ථමෙති - PTS

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

162. මම ඒ කුශලය කොට සියලු සැපත් අනුභව කරමි. මම මොදක තුනක් දන් දී අචලපදය වූ නිවනට පැමිණියා වෙමි.

163-165. මා විසින් කෙලෙස්හු දවන ලදහ... බුදුසසුන් කරන ලදී.

මෙසේ මොදකදයිකා මෙහෙණ මේ ගාථා පැවසූ යැ.

තෙවැනි මොදකදයිකා ස්ථවිරාපදන යි.

## 2.4 ඒකාසනදයිකාපදනය

166. එක්කලෙක මම හංසවතී නගරයෙහි බාලිකාවක් වූමු, මාගේ මවත් පියාත් කර්මාන්තස්ථානයට ගියාහු යැ.

167. හිර මුදුන් සමයෙහි වීථියෙහි වඩනා මහණ කෙනෙකුන් මම දුටුමු. (මම ඔබට හිඳුනා සඳහා) අස්නක් පැනවූමු.

168. මම කොඳුපලස්, විසිතුරු එළලොම් ඇතිරි, ආදියෙන් අසුනක් පනවා පහන් සිත් ඇති වැ සොම්නස් වැ මෙ වදන් කීමි.

169. පොළොව රත්වී ඇත, කවඊත (-කැකෑරුණක් මෙන්) යැ, හිර මධ්‍යාහ්නයෙහි සිටියේ යැ, සුළං ද නො හමයි, වළඳනා කාලය ද එළැඹැ සිටියේ යැ.

170. (මම මෙසේ කීමි.) "මහමුනිතුමනි, මෙ අස්න ඔබ සඳහා පනවන ලද යැ, මාගේ අස්නෙහි අනුකම්පා කොට වැඩ හිඳිනු මැනැවි."

171. මොනොවට දමුණු පිරිසුදු මනස් ඇති ශ්‍රමණයන් වහන්සේ එහි වැඩහුන්හ. ඔබගේ පාත්‍රය ගෙන මම (අහරින්) පුරවා දුන්මු.

172. එ කුශලකර්මයෙන් ද, චෙතනාප්‍රණිධියෙන් ද, මිනිස් කය හැරපියා තව්තිසා දෙව්ලොවැ උපන්මු.

173. එහි මට විමනක් කරන ලදී. (එය) අස්නෙන් යුතු කොට මොනොවට තිමවන ලද යැ. සැට යොත්නක් උස් යැ, පනස් යොත්නක් පුළුල් යැ.



* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

174. සොවණ්ණමයා මණිමයා අථොපි ඵලිකාමයා,
ලොහිතඞ්කමයා චෙව පල්ලඞ්කා විවිධා මම.

175. තුලිකාවිකතිකාහි කට්ටිස්සචිත්තකාහි ච,
උද්දඑකන්තලොමීහි[1] පල්ලඞ්කා මෙ සුසණ්ඨිතා.[2]

176. යදා ඉච්ඡාමි ගමනං හාසඛිඩ්ඩා සමප්පිතං,[3]
සහ පල්ලඞ්කසෙට්ඨෙන ගච්ඡාමි මම පත්ථිතං.

177. අසීතිදෙවරාජූනං මහෙසිත්තමකාරයිං,
සත්තතිචක්කවත්තීනං මහෙසිත්තමකාරයිං.

178. භවාභවෙ සංසරන්ති මහාභොගං ලභාමහං,
භොගෙ මෙ ඌනතා නත්ථි එකාසනඵලං ඉදං.[4]

179. ද්වෙ භවෙ සංසරාමි දෙවත්තෙ අථ මානුසෙ,
අඤ්ඤෙ භවෙ න ජානාමි එකාසනඵලං ඉදං.

180. ද්වෙ කුලෙ පජායාමි ඛත්තියෙ චාපි බ්‍රාහ්මණෙ,
උච්චාකුලීනා[5] සබ්බත්ථ එකාසනඵලං ඉදං.

181. දොමනස්සං න ජානාමි චිත්තසන්තාපනං මම,
වෙවණ්ණියං න ජානාමි එකාසනඵලං ඉදං.

182. ධාතියො මං උපට්ඨන්ති ඛුජ්ජා චෙළාසිකා[6] බහූ,
අඞ්කෙන අඞ්කං ගච්ඡාමි එකාසනඵලං ඉදං.

183. අඤ්ඤා න්හාපෙන්ති භොජෙන්ති අඤ්ඤා රමෙන්ති මං සදා
අඤ්ඤා ගන්ධං විලිම්පෙන්ති[7] එකාසනඵලං ඉදං.

184. මණ්ඩපෙ රුක්ඛමූලෙ වා සුඤ්ඤාගාරෙ වසන්තියා,
මම සඞ්කප්පමඤ්ඤාය පල්ලඞ්කො උපතිට්ඨති.

185. අයං පච්ඡිමකො මය්හං චරිමො වත්තතෙ භවො,
අජ්ජාපි රජ්ජං ඡඩ්ඩෙත්වා පබ්බජිං අනගාරියං.

186. සතසහස්සෙ ඉතො කප්පෙ යං දනමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි එකාසනඵලං ඉදං.

187–189. කිලෙසා ඣාපිතා මය්හං –පෙ– කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං එකාසනදායිකා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

**එකාසනදායිකා ථෙරියාපදානං චතුත්ථං.**

---

1. උද්දඑකන්තලොමි ච – මජසං
2. සුසණ්ඨිකා – මජසං, සයා
3. හාසඛිඩ්ඩසමප්පිතා – මජසං
4. එකාසනස්සිදං ඵලං – මජසං
5. කුලිකා – සයා, PTS
6. චෙලාපිකා – මජසං, චෙලාසිකා සයා, චෙලාවිකා – PTS
7. විලිම්පන්ති - මජසං

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

174. මාගේ විවිධ වූ පයඞ්ඞකයෝ රන්මුවා යැ, මිණිමුවා යැ, පිළිමිණිමුවා යැ රන්මිණිමුවා ද වෙත්.

175. මාගේ පයඞ්ඞකයෝ පුළුන් මෙට්ටයෙන් හා රූ නඟාකළ එළුලොම් ඇතිරියෙන් ද රත්කම් කළ තිහිරි ඇතිරියෙන් හා විසිතුරු එළුලොම් ඇතිරියෙන් ද දෙ ද ඇතිරි එක් ද ඇතිරියෙන් ද මොණනාවට අතුරන ලද්දහ.

176. හාසයෙන් හා ක්‍රීඩායෙන් සමර්පිත වැ යම් විටෙකැ ගමනක් රිසියෙම් ද, වරපයඞ්ඞකය සහිත වැ මා රිසි තෙනට යෙමි.

177. අසූදෙව්රජුනට මෙහෙසිබව කරවූමු. සැත්තෑවක් සක්විති රජුනට ද මෙහෙයි වූමු.

178. කුදුමහත් භවයෙහි හැසිරෙන මම මහත් භෝග ලබමි. මාගේ භෝගයන්හි අඩුබවෙක් නැති. එක අසුනක එල යි මේ.

179. දෙව් බව යැ මිනිසත් බව යැ යන භව දෙක්හි හැසිරෙමි අන් භවයෙක් නො දනිමි. මේ එක් අසුනක් පිදීමේ එල යි.

180. කැත් කුලෙහි යළි බමුණු කුලෙහි යන දෙකුලෙහි උපදිමි. සැමතන්හි උසස් කුල ඇති වූමු. ඒකාසනදානයේ එල යි මේ.

181. දොම්නස නො දනිමි. මාහට, සිත්තැවිල්ලකුදු නැත. විවර්ණ බව නො දනිමි. මේ වූකලි එක් අසුනක් දීමේ විපාක යි.

182. කුදු වූ ද, කෙළතොලු වූ ද බොහෝ උපමවුහු මට උවටැන් කෙරෙති, (මම ඔවුන්ගේ) ඇකයෙන් ඇකයට යම්, මේ එක් අසුනක් දීමෙහි විපාක යි.

183. සැම කල්හි මා අන්හු නහවති, අන්හු වළඳවති, අන්හු තුටු කරවති, අන්හු ගඳ විලෙවුන් දෙත්. මේ එකාසනදාන එල යි.

184. මණ්ඩපයෙහි වේවයි, රුක්මුලැ වේවයි, ශූන්‍යාගාරයෙහි වේවයි මාගේ සිත්හසර දන පළහ එළැඹැ සිටියි.

185. මේ මාගේ අන්තිම (පැසුලු) භවයයි, අද රජය හැරපියා බුදුසසුන්හි පැවිදි වීමි.

186. මෙයින් සුවහස්වන කප්හි යම් දනක් දුනුමු ද, (එතැන් පටන්) දුගතිය නො දනිමි. මේ වනාහි එක් අස්නක් පිදීමේ විපාක යි.

187.—189. මා විසින් කෙලෙස්හු දවන ලදහ... බුදුසසුන කරන ලදී.

මෙසේ ඒකාසනදායිකා මෙහෙණ මේ ගාථා පැවසූ යැ.

සිවුවැනි ඒකාසනදායිකා ථෙරාපදන යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 2.5 පඤ්චදීපදායිකාපදානං

190. නගරෙ හංසවතියා චාරිකා[1] ආසහං තදා,
ආරාමෙන ච ආරාමං[2] චරාමි කුසලත්ථිකා.

191. කාළපක්ඛම්හි දිවසෙ අද්දසං බොධිමුත්තමං,
තත්ථ චිත්තං පසාදෙත්වා බොධිමූලෙ නිසීදහං.

192. ගරුචිත්තං උපට්ඨපෙත්වා සිරෙ කත්වාන අඤ්ජලිං,
සොමනස්සං පවෙදෙත්වා එවං චින්තෙසිං තාවදෙ:

193. "යදි බුද්ධො අමිතයසො අසමප්පටිපුග්ගලො,
දස්සෙතු පාටිහීරං මෙ බොධි ඔභාසතු අයං."

194. සහ ආවජ්ජිතා මය්හං බොධි පජ්ජලි තාවදෙ,
සබ්බසොණ්ණමයා ආසි දිසා සබ්බා විරොචයි.[3]

195. සත්තරත්තින්දිවං තත්ථ බොධිමූලෙ නිසීදහං,
සත්තමෙ දිවසෙ පත්තෙ දීපපූජං අකාසහං.

196. ආසනං පරිවාරෙත්වා පඤ්චදීපානි පජ්ජලුං,[4]
යාව උදෙති සූරියො දීපා මෙ පජ්ජලුං තදා.

197. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

198. තත්ථ මෙ සුකතං ව්‍යම්හං පඤ්චදීපීති[5] වුච්චති,
සට්ඨියොජනමුබ්බෙධං තිංසයොජන විත්ථතං.

199. අසඞ්ඛියානි දීපානි පරිවාරෙ[6] ජලන්ති මෙ,
යාවතා දෙවභවනං දීපාලොකෙන ජොතති.

200. පරම්මුඛා[7] නිසීදිත්වා යදි ඉච්ඡාමි පස්සිතුං,
උද්ධං අධො ච තිරියං සබ්බං පස්සාමි චක්ඛුනා.

201. යාවතා අභිකඞ්ඛාමි දට්ඨුං සුගතදුග්ගතෙ[8]
තත්ථ ආවරණං නත්ථි රුක්ඛෙසු පබ්බතෙසු වා.

202. අසීති දෙවරාජූනං මහෙසිත්තමකාරයිං,
සතානං චක්කවත්තීනං මහෙසිත්තමකාරයිං.

---

1. චාරිකී - මජසං
2. ආරාමෙන විහාරෙන - ස්‍යා, PTS
3. විරොචති - ස්‍යා, PTS
4. පජ්ජලිං - සීමු
5. පඤ්චදීපානි - මජසං ස්‍යා.
6. පරිවාරෙත්වා - [illegible]
7. පුබ්බමුඛා - ස්‍යා, PTS
8. සුකතදුක්කතෙ - ස්‍යා, PTS, මෙරී

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 2.5 පඤ්චදීපදයිකාපදානය

190. ඒ සුවහස්වන කප්හි මම හංසවතී නගරයෙහි චාරිකා කරන්නක් වූවා කුසල් කැමැති වැ අරමින් අරමැ හැසුරුණුමු.

191. මම (එක්) කළුවර පොහෝ දිනෙකැ උතුම් බෝරුක දුටුයෙම් එහි සිත පහදවා බෝරුක් මුල්හි හුන්නමු.

192. එවේලෙහි බුහුමන් සිත් එළවා ඇඳිලි බැඳ සොම්නස් ලැබ මෙසේ සිතුවෙමි :

193. "ඉදින් (පියුමතුරා) බුදුහු අපමණගුණ ඇතිසේක් නම් අසම වූ අප්‍රතිපුද්ගල සේක් නම් මට පෙළහර දක්වන සේක්වා. මේ බෝරුක බබළාවා" යි.

194. මාගේ ආවර්ජනාව හා සමග එකෙණෙහි බෝරුක දිලුණේ යැ. සියල්ල රනින් කරනලද මෙන් වියැ. සියලු දිශාවෝ බැබළුණාහ.

195. මම සත්රෑදවාලක් ඒ බෝරුක්මුල්හි හුන්නෙම් සත්වැනි දවස එළැඹි කල්හි පහන් පූජාවක් කළමු.

196. ආසනය පිරිවරා ප්‍රදීප පසෙක් දිලුණේයැ. එදවසැ හිරු උදවනතෙක් මාගේ ප්‍රදීපයෝ දිලුණ හ.

197. මැනැවින් කළ ඒ කුශලකම් හේතුයෙන් ද චෙතනා ප්‍රණිධි හේතුයෙන් ද මිනිස්කය හැරපියා මම දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියා වෙමි.

198. එහි මට මොනොවට කරනලද විමනෙක් වියැ. සැට යොත්නක් උස් වූ තිස්යොත්නක් පුළුල් වූ ඒ විමන පඤ්චදීපි යි කියනු ලැබෙයි.

199. යම්තාක් දෙව්විමන ප්‍රදීපාලොකයෙන් දිලියේද (ඒතාක්) අසඞ්ඛ්‍යසඞ්ඛ්‍යාත ප්‍රදීපයෝ හාත්පස දිලෙත්.

200. ඉදින් (මම) පරාම්මුඛ වැ හිඳැ දක්නට රිසියෙම් නම් උඩ ද යට ද සරස ද වූ සියල්ල මසැයින් දකිමි.

201. සුගත - දුර්ගතයන් දක්නට යම්පමණින් කැමැත්තෙම් නම් එහිලා රුක්හි වේවයි පවුහි වේවයි ආවරණයෙක් නැති.

202. දෙව්රජුන් අසූදෙනකුන්හට මෙහෙසි වූමු. සියගණන් සක්විති රජුන්හට ද මෙහෙසි වූමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

203. යං යං යොනූපපජ්ජාමි දෙවත්තං අථ මානුසෙ,
දීපසතසහස්සානි පරිවාරෙ[1] ජලන්ති මෙ.[2]

204. දෙවලොකා චවිත්වාන උපපජ්ජිං මාතුකුච්ඡියං,
මාතුකුච්ඡිගතා සන්තී[3] අක්ඛි මෙ න නිමීලති.

205. දීපසතසහස්සානි පුඤ්ඤකම්මසමඞ්ගිතා,
ජලන්ති සූතිකාගෙහෙ පඤ්චදීපානිදං ඵලං.

206. පච්ඡිමෙ භවෙ සම්පත්තෙ මානසං විනිවත්තයිං,[4]
අජරාමරං සීතිභූතං[5] නිබ්බානං ඵස්සයිං අහං.

207. ජාතියා සත්තවස්සාහං අරහත්තමපාපුණිං,
උපසම්පාදයී බුද්ධො ගුණමඤ්ඤාය ගොතමො.

208. මණ්ඩපෙ රුක්ඛමූලෙ වා සුඤ්ඤාගාරෙ වසන්තියා,
සද පජ්ජලතෙ දීපං පඤ්චදීපානිදං ඵලං.

209. දිබ්බචක්ඛු විසුද්ධං මෙ සමාධිකුසලා අහං,
අභිඤ්ඤාපාරමිප්පත්තා පඤ්චදීපානිදං ඵලං.

210. සබ්බවොසිතවොසානා කතකිච්චා අනාසවා,
පඤ්චදීපා මහාවීර පාදෙ වන්දති චක්ඛුම.

211. සතසහස්සෙ ඉතො[6] කප්පෙ යං දීපමදදිං තදා,[7]
දුග්ගතිං නාභිජානාමි පඤ්චදීපානිදං ඵලං.

212-214. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- කතං
බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං පඤ්චදීපදායිකා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

පඤ්චදීපදායිකා ථෙරියාපදානං පඤ්චමං.

1. පරිවාරෙන්තා - සිමු.
2. මං - සිමු.
3. මාතුකුච්ඡිගතං සන්තිං - සිමු.
4. විනිවත්තයිං - මජසං.
5. අජරාමතං සීතිභාවං - මජසං.
6. සතසහස්සිතො - මජසං.
7. යං දීපමභිපූජයිං - සිමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

203. දෙව්බව යැ, මිනිස්බව යැ යන යම්යම් ගතියෙකැ උපදනෙම් ද සියදහස්ගණන් පහන් මා අවට දිලියෙයි.

204. දෙව්ලොවින් සැවැ (මනුලොවැ) මවුකුසැ උපන්නෙම්, මවුකුසට ගියා වූ මාගේ ඇස් නිමීලනය (පිය) නො වෙයි.

205. (මම) පුණ්‍යකර්මසමන්වාගතයෙමි. (එහෙයින්) සුවහස් පහන්හු තිඹිරිගෙහි දිලෙන්නාහ. මේ වූකලී පඤ්චදීපදනයාගේ ඵලයි.

206. පශ්චිමභවය පැමිණිකල්හි මනස කෙලෙසුන්ගෙන් මුදවා ලූමු. ජරා – මරණ රහිත සිහිල් වූ නිවන මම ස්පර්ශ කළමු.

207. ජාතියෙන් සත්හැවිරිදි වූ මම රහත්බවට පැමිණියමු. ගෞතම ගොත්‍ර ඇති බුදුහු ගුණ සලකා (මා) උපසපන් කළහ.

208. මණ්ඩපයෙහි වේවයි, රුක්මුල්හි වේවයි, ශූන්‍යාගාරයෙහි වේවයි වෙසෙන මාහට හැමකල්හි පහනක් දිලෙයි. මේ වූකලී පඤ්චප්‍රදීපදනයාගේ ඵලයි.

209. මට දිවැස විශුද්ධ වියැ, මම සමාධියෙහි දක්ෂ වූමු. අභිඥපාරයට පැමිණියා වෙමි. මේ වනාහි පඤ්චප්‍රදීපදනයාගේ ඵලයි.

210. චතුර්මත් මහාවීරයන් වහන්ස, සකල බ්‍රහ්මචර්යවාස වැස නිම වූ කෘතකෘත්‍ය ඇති අනාසුව වූ පඤ්චදීපා මෙහෙණ (ඔබ) පා වඳියි.

211. මෙයින් සුවහස්වන කප්හි යම් පහන් පූජාවක් කළා වෙම් ද, (ඒ හෙතුයෙන්) දුගතිය නො මැ දනිමි. මේ වූකලී පඤ්චදීපදනයාගේ ප්‍රතිඵලයි.

212—214. මා විසින් කෙලෙස්හු දවන ලදහ ... බුදුසසුන් කරන ලදි.

මෙසෙයින් පඤ්චදීපදයිකා භික්‍ෂුණී මේ ගාථා ප්‍රකාශ කළා යැ.

පස්වැනි පඤ්චදීපදයිකා ස්ථවිරාපදන යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 2.6 සාලමාලිකාපදානං

215. චන්දභාගානදීතීරෙ අහොසිං කින්නරී තදා,
අද්දසං විරජං බුද්ධං සයම්භුං අපරාජිතං.

216. පසන්නචිත්තා සුමනා වෙදජාතා කතඤ්ජලී,
සාලමාලං ගහෙත්වාන සයම්භුං අභිපූජයිං.

217. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා කින්නරීදෙහං[1] තාවතිංසමගච්ඡහං.

218. ඡත්තිංස දෙවරාජූනං මහෙසිත්තමකාරයිං,
මනසා පත්ථිතං මය්හං නිබ්බත්තති යථිච්ඡිතං.

219. දසන්නං චක්කවත්තීනං මහෙසිත්තමකාරයිං,
ඔචිතත්තාව[2] හුත්වාන සංසරාමි භවෙස්වහං.

220. කුසලං විජ්ජතෙ මය්හං පබ්බජිං අනගාරියං,
පූජාරහා අහං අජ්ජ[3] සක්‍යපුත්තස්ස සාසනෙ.

221. විසුද්ධමනසා අජ්ජ අපෙතමනපාපිකා,
සබ්බාසවපරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

222. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං බුද්ධමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි සාලමාලායිදං ඵලං.

223-225. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- කතං
බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං සාලමාලිකා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

සාලමාලිකාථෙරියාපදානං ඡට්ඨං.

## 2.7 මහාපජාපතිගොතමීඅපදානං

226. එකදා ලොකපජ්ජොතො වෙසාලියං මහාවනෙ,
කූටාගාරෙ සුසාලායං වසතෙ නරසාරථී.

1. මානුසං දෙහං – සිමු
2. සුචිත්තතාව – PTS
3. අහමජ්ජ – සිමු

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 2. 6 සාලමාලිකාපදනය.

215. එක්කලෙක මම චන්ද්‍රභාගා නදීතීරයෙහි කිඳුරියක් වැ උපන්මු. ඒ (මම) ස්වයම්භූ වූ විරජ වූ (සිද්ධාර්‍ත්ථ) බුදුරදුන් දුටුමු.

216. පහන් සිතැති (එහෙයින් මැ) සොම්නස් වූ උපන් ප්‍රීති ඇතියෙම් බඳුදිලි වැ සාලමාලාවක් (සල්මල්දමක්) ගෙන එයින් සම්බුදුරදුන් පිදූමු.

217. ඒ කුශලකර්‍මයෙන් ද චේතනාප්‍රණිධියෙන් ද කිඳුරු සිරුර හැරපියා දේවත්‍වයට ගියමු.

218. සතිසක් දෙව්රජුනට මෙහෙසි වූමු. මනසින් පැතූ යමක් වේද, ඒ සියල්ල මට සිතැඟි සේ උපදියි.

219. (මිනිස් ලොවැ) දසසක්විත්තනට මෙහෙසි වූමු. පෙර පින් රැස්කළ හෙයින් කුදුමහත් බෙවෙහි හැසිරෙමි.

220. මට කුසල් ඇත. බුදුසසුන්හි පැවිදි වූමු. මම් අද ශාක්‍ය පුත්‍රයන් වහන්සේගේ ශාසනයෙහි පූජාර්හ වෙමි.

221. අද පිරිසිදු මනස් ඇති වෙමි, පහවූ චිත්ත සංක්ලේශ ඇති වෙමි. සියලු ආස්‍රවයෝ ක්‍ෂය වූහ. දැන් (මට) පුනර්භවයෙක් නැති.

222. මෙයින් සිවු අනූවන කප්හි යම්හෙයෙකින් බුදුරදුන් පිදූයෙම් ද එහෙයින් දුගතිය නො මැ දනිමි. මේ වූකලි සාලමාලා පූජායෙහි ඵලයි.

223–225. මා විසින් කෙලෙස්හු දවන ලදහ ... බුදුසසුන් කරන ලදී.

සාලමාලිකා මෙහෙණ මෙසෙයින් මේ ගාථා පැවසුවා යැ.

සවැනි සාලමාලිකා ථෙරිරාපදන යි.

## 2.7 මහාපජාපති ගොතමී අපදනය

226. ලොවට පහනක් වූ වෙනෙයජන දමනයෙහි සාරථී වූ බුදුරජාණන් වහන්සේ එක්සමයෙකැ විශාලා මහනුවර මහාවනයෙහි මැනවින් කරන ලද කුටාගාර ශාලායෙහි වැඩ වසන සේකැ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

227. තදා ජිනස්ස මාතුච්ඡා මහාගොතමි භික්ඛුනී,
තහිං කතෙ[1] පුරෙ රම්මෙ වසී භික්ඛුනුපස්සයෙ.

228. භික්ඛුනීහි විමුත්තාහි සතෙහි සහ පඤ්චහි,
රහොගතාය තස්සෙවං චිත්තස්සාසි[2] විතක්කිතං.

229. "බුද්ධස්ස පරිනිබ්බාණං සාවකග්ගයුගස්ස වා
රාහුලානන්දනන්දානං නාහං ලච්ඡාමි පස්සිතුං*

230. පටිගච්චායුසඞ්ඛාරෙ[3] ඔස්සජ්ජිත්වාන[4] නිබ්බුතිං,
ගච්ඡෙය්‍යං ලොකනාථෙන අනුඤ්ඤාතා මහෙසිනා."

231. තථා පඤ්චසතානම්පි භික්ඛුනීනං විතක්කිතං,
ආසි ඛෙමාදිකානම්පි එතදෙව විතක්කිතං.

232. භූමිචාලො තදා ආසි නාදිතා දෙවදුන්දුභී,
උපස්සයාධිවත්ථායො දෙවතා සොකපීළිතා.
විලපන්තා සකරුණං[5] තත්‍රස්සූනි පවත්තයුං,

233. මිත්තා[6] භික්ඛුනියො තා හි උපගන්ත්වාන ගොතමිං
නිපච්ච සිරසා පාදෙ ඉදං වචනමබ්‍රවුං:

234. "තත්ථ තොයලවාසිත්තා මයමය්‍ය රහොගතා
සාචලා චලිතා භූමි නාදිතා දෙවදුන්දුභී,
පරිදෙවා ච සූයන්ති කිමත්ථං නූන ගොතමී."

235. තදා අවොච සා සබ්බං යථාපරිවිතක්කිතං,
තායොපි සබ්බා ආහංසු යථාපරිවිතක්කිතං.

236. "යදි තෙ රුචිතං අය්‍යෙ නිබ්බාණං පරමං සිවං,
නිබ්බායිස්සාම සබ්බාපි බුද්ධානුඤ්ඤාය සුබ්බතෙ.

237. මයං සහාව නික්ඛන්තා ඝරාපි ච භවාපි ච
සහයෙව ගමිස්සාම නිබ්බාණපුරමුත්තමං."

238. නිබ්බානාය වජන්තීනං කිං වක්ඛාමීති" සා වදං
සහ සබ්බාහි නිග්ගච්ඡි භික්ඛුනීනිලයා තදා.

1. තහිං යෙව - සයා
2. චිත්තයස්සාපි - මජ්ඣං.
3. පටිකච්චායුසඞ්ඛාරං - මජ්ඣං.
4. විස්සජ්ජිත්වාන - මජ්ඣං.
5. සුකරුණං - මජ්ඣං.
6. සබ්බා - සයා, PTS
* ඉමිස්සා ගාථායානන්තරං "සිමු, මජ්ඣං." පොත්ථකෙසු
"බුද්ධස්ස පරිනිබ්බාණං සාවකග්ගයුගස්ස ච
මහාකස්සපනන්දානං ආනන්දරාහුලාන ච:' අයම්පි ගාථා දිස්සතෙ,
න සයාම පොත්ථකෙසු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

227—228. එකල්හි ජිනෙන්ද්‍රයන් වහන්සේගේ සුළුමවූ වූ මහා පජාපති ගොතමී තෙරණියෝ එ නගරයෙහි කරන ලද රම්‍ය වූ මෙහෙණවරෙහි කෙලෙසුන්ගෙන් මිදුණු (-රහත්) මෙහෙණන් පන්සියයක් සමග වාසය කළහ. විවේකී වැ හුන් ඔවුනට මෙබඳු මනොසංකල්පයෙක් පහළ වියැ.

229. "මම බුදුරදුන්ගේ පිරිනිවීම හෝ දෙ අගසව්වන් වහන්දැගේ පිරිනිවීම හෝ රාහුල - ආනන්ද -නන්ද තෙරණුවන්ගේ පිරිනිවීම හෝ දක්නට නො ලබමි.

230. ලෝකනාථ වූ මහර්ෂීන් වහන්සේ විසින් අනුදන්නා ලදු වැ කල් ඇති වැ ආයුසංස්කාරයන් හැර පියා නිවීමට යන්නෙම් නම් මැනැවි."

231. පන්සියයක් මෙහෙණන්හට ද එබඳු ම විතර්කයෙක් වියැ, ඛෙමාදි තෙරණිවරුනට ද තෙල විතර්කයම වූයේ යැ.

232. එකෙණෙහි මහපොළොව කම්පිත වියැ, මෙසගර්ජනා ද වූයේ යැ. මෙහෙණවරට අරක්ගත් දේවතාවෝ ශෝකයෙන් පෙළුණාහු වැලපෙමින් කඳුළු වැගිරවූහු.

233. ඒ (ගොතමී තෙරණිය හා) මිත්‍ර මෙහෙණෝ ද ගොතමිය වෙතැ එළැඹැ පා මත සිරසින් වැද වැටී මෙවදන් බිණූහු:

234. "ආයඞාවනි, දිය පොදකින් (සිය සිරුරු) තෙමාගත් අපි එහි රහොගත (-එකලා) වූම්හ. ඒ අචල වූ පොළොව සැලිණ, මෙසයෝ ගර්ජනා කළහ, වැලපීම් ද ඇසෙයි, ගොතමී උත්තමාවනි, එකැතින් (මේ) කුමක් සඳහා ද ?"

235. එවිට ඕ යම් අයුරකින් විතර්කකරනලද නම් සියල්ල කීවා යැ. ඒ සියලු මෙහෙණෝ ද (තමන්) විතර්කකළ අයුරු (එලෙසින් ම) කීහු.

236. "ආයඞාවෙනි, පරම ශාන්ත වූ නිවන ඉදින් ඔබට රිසි නම් මනා ව්‍රත ඇති උත්තමාවනි, (අපි) සියල්ලෝ ද බුද්ධානුඥයෙන් පිරිනිවෙන්නමු.

237. අපි එක් වැ ම ගෙයිනුදු භවයෙනුදු නික්මුණෝ වමහ උතුම් නිවන්පුරයට එක්වැ ම යන්නමු,"

238. එවිටැ ඕ තොමෝ (ගොතමී) "නිවනට යන්නන්හට කුමක් කියම් ද" යි පවසමින් සියල්ලන් සමග මෙහෙණවරින් බැහැර වැ ගියා යැ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

239. උපස්සයෙ යාධිවත්ථා දෙවතා තා ඛමන්තු මෙ,
භික්ඛුනීනිලයස්සේදං පච්ඡිමං දස්සනං මම.

240. න ජරා මච්චු වා යත්ථ අප්පියෙහි සමාගමො,
පියෙහි විප්පයොගො'ත්ථි[1] තං වජිස්සං[2] අසඞ්ඛතං.

241. අවීතරාගා තං සුත්වා වචනං සුගතොරසා,
සොකට්ටා පරිදෙවිංසු "අහො නො අප්පපුඤ්ඤතා.

242. භික්ඛුනීනිලයො සුඤ්ඤො භූතො තාහි විනා අයං,
පභාතෙ විය තාරායො න දිස්සන්ති ජිනොරසා.

243. නිබ්බානං ගොතමී යාති සතෙහි සහ පඤ්චහි,
නදීසතෙහිව සහ ගඞ්ගා පඤ්චහි සාගරං.

244. රථිකාය වජන්තිං තං[3] දිස්වා සද්ධා උපාසිකා,
ඝරා නික්ඛම්ම පාදෙසු නිපච්ච ඉදමබ්‍රවිං:

245. "පසීදස්සු මහාභොගෙ අනාථායො විහාය නො,
තයා න යුත්තං[4] නිබ්බාතුං" ඉච්චට්ටා[5] විලපිංසු තා.

246. තාසං සොකපහානත්ථං අවොච මධුරං ගිරං,
"රුදිතෙන අලං පුත්තා හාසකාලො'යමජ්ජ වො.

247. පරිඤ්ඤාතං මයා දුක්ඛං දුක්ඛහෙතු විවජ්ජිතො,
නිරොධො මෙ සච්ඡිකතො මග්ගො චාපි සුභාවිතො.

(භාණවාරං පඨමං)

248. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං,
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා.

249. යස්සත්ථාය පබ්බජිතා අගාරස්මානගාරියං,
සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසඤ්ඤොජනක්ඛයො.

250. බුද්ධො තස්ස ච සද්ධම්මො අනූනො යාව තිට්ඨති,
නිබ්බාතුං තාව කාලො මෙ මා මං සොචථ පුත්තිකා.

---

1. පියෙහි න වියොගො'පි - මජසං.
2. වජ්ජිස්සං - සත්‍ථා.
3. වජන්තියා - මජසං.
වජන්තිනං - PTS
4. යුත්තා - මජසං
5. ඉච්චට්ටා - මජසං, සත්‍ථා
ඉච්චවචා - PTS

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

239. "මෙහෙණවර අරක්ගත් යම් දෙවිකෙනෙක් වෙත් නම් උහු තුමූ මට ක්‍ෂමා කෙරෙත් වා. මෙහෙණවර මේ මාගේ පශ්චිම දර්ශනයයි.

240. යම් තැනෙකැ ජරා වේවයි, මරණ වේවයි, අප්‍රියසම්ප්‍රයොග වේවයි, ප්‍රියවිප්‍රයෝග වේවයි නැත්ද අසංස්කෘත වූ (–ප්‍රත්‍යයෙන් සකස් නොවූ) එතැනට යන්නෙමි." යි (කිවූ.)

241. නො රහත් බුද්ධපුත්‍රයෝ එ වදන් අසා සොවින් පෙළුණාහු "අහෝ, අපගේ මඳපින් ඇතිබවැ" යි වැලපුනාහු යි.

242. ඔවුන්ගෙන් වෙන් වැ මේ භික්ෂුණී ආරාමය හිස් වියැ, සූර්‍ය්‍යාදයයෙහි තාරකා මෙන් බුද්ධපුත්‍රී (භික්ෂුණී) හු නො පැණෙත්.

243. ගඞ්ගා නදිය පන්සියයක් නදීන් සමග සයුරට වදනාසේ මහාපජාපති ගොතමී පන්සියයක් මෙහෙණන් සමග නිවනට යෙයි.

244. වීථියෙහි වඩනා ඇය දුක සැදැහැ ඇති උවැසියෝ ගෙයින් නික් මැ පා මතුයෙහි වැද හෙවැ මෙ වදන් බිණූහු.

245. "මහාභාග්‍යවත් උත්තමාවනි, (අප කෙරෙහි) පහදිනු මැනැවි. අනාථ වූ අප හැර පියා ඔබ පිරිනිවන්නට යුතු නැතැ" යි ඔහු මහත්සේ හඬ නගා වැලපුනාහ.

246. ඔවුන්ගේ ශෝකප්‍රහාණය සඳහා (ගොතමී තොමෝ) මිහිරි වදන් පැවසූ යැ : "දරුවෙනි, හැඬීමෙන් කම් නැත, තොපට අද මේ සිනාසීමට කාලයයි.

247. මා විසින් දුක පිරිසිඳ දක්නා ලද යැ, දුකට හේතුව දුරු කරන ලද යැ මා විසින් දුඃඛ නිරොධය පසක් කරන ලද යැ, මාර්ගය ද මැනැවින් වඩනා ලද වෙයි.

(පළමු බණවර යි)

248. මා විසින් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරන ලදහ, බුදුසසුන් කොට නිමවන ලද, ස්කන්ධභාරය බහාලන ලද, තෘෂ්ණාව මුලිනුපුටා නසන ලදී.

249. යම් අර්‍ථයක් සඳහා ගිහිගෙන් නික්මැ බුදුසසුන්හි පැවිදි වූයෙම් ද, සියලු සංයෝජනයන්ගේ ක්‍ෂයයවූ ඒ අර්‍ථය මා විසින් අනුප්‍රාප්තයි.

250. බුදුරජාණන් වහන්සේත් ඔබගේ අනූන වූ සද්ධර්‍මයත් යම්තාක් සිටුනා සේක් ද ඒතාක් පිරිනිවෙන්නට මට කාලය වෙයි. දියණියනි, මා ගැන ශෝක නොකරව.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

251. කොණ්ඩඤ්ඤානන්දනන්දාදී තිට්ඨන්ති රාහුලො ජිනො,
සුඛිතො සහිතො සඞ්ඝො හතදප්පා ච තිත්ථියා.

252. ඔක්කාකවංසස්ස යසො උස්සිතො මාරමද්දනො,
නනු සම්පත්ති කාලො මෙ නිබ්බානත්ථාය පුත්තිකා.

253. චිරප්පභූති යං මය්හං පත්ථිතං අජ්ජ සිජ්ඣතෙ,
ආනන්දභෙරිකාලො'යං කිං වො අස්සූහි පුත්තිකා.

254. සචෙ මයි දයා අත්ථි යදි චත්ථි කතඤ්ඤුතා,
සද්ධම්මට්ඨිතියා සබ්බා කරොථ විරියං දළ්හං.

255. ථීනං අදාසි පබ්බජ්ජං සම්බුද්ධො යාචිතො මයා,
තස්මා යථා'හං නන්දිස්සං තථා තමනුතිට්ඨථ.

256. තා එවමනුසාසිත්වා භික්ඛුනීහි පුරක්ඛතා,
උපෙච්ච බුද්ධං වන්දිත්වා ඉදං වචනමබ්‍රවි:

257. "අහං සුගත මාතා තෙ[1] ත්වං ච වීර පිතා මම,
සද්ධම්මසුඛදෙ[2] නාථ තයා ජාතම්හි[3] ගොතම.

258. සංවඩ්ඪිතො'යං[4] සුගත රූපකායො මයා තව,
අනින්දියො[5] ධම්මකායො[6] මම සංවඩ්ඪිතො[4] තයා.

259. මුහුත්තං[7] තණ්හාසමනං ඛීරං ත්වං පායිතො මයා,
තයා'හං සන්තමච්චන්තං ධම්මඛීරං හි[8] පායිතා.

260. වද්ධනාරක්ඛනෙ[9] මය්හං අනණො[10] ත්වං මහාමුනෙ,
පුත්තකාමා ථියො යා තා[11] ලභන්තු[12] තාදිසං සුතං,

261. මන්ධාතාදිනරින්දානං යා මාතා සා භවණ්ණවෙ,
නිමුග්ගා'හං තයා පුත්ත තාරිතා භවසාගරා.

262. රඤ්ඤො මාතා මහෙසීති සුලභං නාමමිත්ථීනං,
බුද්ධමාතාති යං නාමං එතං පරමදුල්ලභං.

263. තඤ්ච ලද්ධං මයා වීර පණිධානං මමං තයා,
අණුකං වා මහන්තං වා තං සබ්බං පූරිතං මයා.

---

1. තෙමාතා - සමෙබමු.
2. සද්ධම්මසුඛද - මජසං
3. ජාතාම්හි - මජසං.
4. සංවද්ධිතොයං - මජසං.
5. අනින්දිතො - මජසං., ආනන්දියො - සනා.
6. ධම්මතනු - සිමු, PTS
7. මුහුත්තං - මජසං.
8. ධම්මඛීරම්පි - සනා.
9. බන්ධනාරක්ඛිතෙ - මජසං.
10. අණණො - මජසං.
11. තාවං - මජසං.
12. ලභන්ති - මජසං, සනා, ථෙරී.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

251. කොණ්ඩඤ්ඤ – ආනන්ද – නන්ද ආදි තෙරණුවෝ ද, ජිනපුත්‍ර රාහුල තෙරහු ද සිටුනාහ. සඞ්ඝ තෙමේ සුඛිත යැ සහිත යැ තීර්ථිකයෝ නැසුණු දර්ප (–මාන) ඇත්තාහු යි.

252. ඔක්කාක වංසයේ මරුන් මඩනා යශස උස්වැ නැගැ සිටියේ යැ, දූරියනි, නිවන් සඳහා මාහට දූන් කාලය නො වන්නේ ද?

253. බොහෝ කලෙකැ සිට මා විසින් යමක් පතන ලද නම් එය අද සිද්ධ වෙයි, මෙ වනාහි සන්තෝෂජනක භේරිවාදනයට කාලයයි. දූරියනි, තොපගේ කඳුළින් කවර වැඩෙක් ද?

254. ඉදින් මා කෙරෙහි දයායෙක් ඇත් නම් කෘතඥතායෙක් ඇත් නම් (තෙපි) සියල්ලෝ සද්ධර්මස්ථිතිය සඳහා දැඩි වීර්‍ය්‍යය කරව.

255. මා විසින් අයදනා ලද බුදුරජාණන් වහන්සේ මාගමුන්ට ප්‍රව්‍රජ්‍යාව දුන්සේකැ, එහෙයින් යම්සේ මම සතුටු වන්නෙම් නම් එසේ ඒ අනු වැ (තෙපි ද) සිටුව" යි.

256. ඔවුනට මෙසේ අනුශාසනා කොට මෙහෙණන් විසින් පෙරටු කරන ලද්දී බුදුරදුන් වෙතැ එළැඹැ වැඳ මෙ වදන් පැවසූ යැ:

257. "සුගතයන් වහන්ස, මම ඔබගේ මවු වෙමි, වීරයන් වහන්ස, ඔබ ද මාගේ පියා වෙති. නාථයන් වහන්ස, (ඔබ මට) සදහම් සුව දුන්හ, ගෞතමයන් වහන්ස, ඔබ වෙතින් (මම) උපන්නෙම් වෙමි.

258. සුගතයන් වහන්ස, ඔබගේ රූ කය මා විසින් වඩන ලද යැ, මාගේ අනිඥනීය දහම් කය ඔබ විසින් වඩන ලදී.

259. මා විසින් ඔබ මොහොතක් (සා) පිපාසා සන්හිඳුවන කිරි පොවන ලදහු, මම ඔබ විසින් අත්‍යන්ත ශාන්ත වූ දහම් නැමැති කිරි පොවන ලද වෙමි.

260. මහාමුනිවරයාණනි, මා විසින් වැඩීමෙහි රැකීමෙහි ලා ඔබ ණයගැති නො වෙති. පුතුන් කැමැති යම් ස්ත්‍රීහු වෙත් නම් ඔහු ඔබ බඳු පුතකු ලබත්වා.

261. මන්ධාතු ආදි රජුන්ගේ යම් මවක් වූ නම් ඕ බවසයුරෙහි ගිලුණා යැ. පුත්‍රයාණනි, ඔබ විසින් (මම) බවසයුරෙන් තරණය කරන ලද වෙමි.

262. 'රාජ මාතා – රාජ මෙහෙසී' යන නම ස්ත්‍රීන්හට සුලභ යැ, බුද්ධමාතා' යි යම් නාමෙක් ඇද්ද, තෙල නම පරම දුර්ලභයි.

263. මාගේ ඒ ප්‍රණිධිය ද ඔබ වෙතින් මා ලද යැ, කුඩා වේවයි. මහත් වේවයි ඒ සියලු කිස මා විසින් පූරණ ලදී.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

264. පරිනිබ්බාතුමිච්ඡාමි විහායෙමං කලෙබරං,[1]
අනුජානාහි මෙ වීර දුක්ඛන්තකර නායක.

265. චක්කඞ්කුසධජාකිණ්ණෙ පාදෙ කමලකොමලෙ,
පසාරෙහි පණාමං තෙ කරිස්සං පුත්තපෙමසා.[2]

266. සුවණ්ණරාසිසංකාසං සරීරං කුරු පාකටං,
කත්වා දෙහං සුදිට්ඨං තෙ සන්තිං ගච්ඡාමි නායක.''

267. ද්වත්තිංසලක්ඛණූපෙතං සුප්පභාලඞ්කතං තනුං
සඤ්ඣාඝනාව බාලක්කං මාතුච්ඡං දස්සයී ජිනො.

268. ඵුල්ලාරවින්දසඞ්කාසෙ තරුණාදිච්චසප්පභෙ,
චක්කඞ්කිතෙ පාදතලෙ තතො සා සිරසා පති.

269. ''පණමාමි නරාදිච්චං ආදිච්චකුලකෙතුකං,
පච්ඡිමෙ මරණෙ[3] මය්හං න තං ඉක්ඛාමහං පුනො.

270. ඉත්ථියො නාම ලොකග්ග සබ්බදොසකරා මතා,
යදි කො චත්ථි දොසො මෙ ඛමස්සු කරුණාකර.

271. ඉත්ථිකානඤ්ච පබ්බජ්ජං යමහං[4] යාචිං පුනප්පුනං,
තත්ථ චෙ අත්ථි දොසො මෙ තං ඛමස්සු නරාසභ.''

272. මයා භික්ඛුනියො වීර තවානුඤ්ඤාය සාසිතා,
තත්‍ර චෙ අත්ථි දුන්නීතං තං ඛමස්සු ඛමාධිප.[5]

273. ''අක්ඛන්තෙ නාම ඛන්තබ්බං කිං භවෙ ගුණභූසනෙ,
කිමුත්තරං තෙ වක්ඛාමි නිබ්බානාය වජන්තියා.

274. සුද්ධෙ අනූනෙ මම භික්ඛුසඞ්ඝෙ
ලොකා ඉතො නිස්සරිතුං ඛමන්තෙ,[6]
පභාතකාලෙ ව්‍යසනං ගහානං[7]
දිස්වාන නිය්‍යාති ච චන්දලෙඛා.

275. තදෙතරා භික්ඛුනියො ජිනග්ගං
තාරාව චන්දනුගතා සුමෙරුං,
පදක්ඛිණං කත්ව නිපච්ච[8] පාදෙ
ඨිතා මුඛන්තං සමුදික්ඛමානා.

1. කලෙවරං – මජසං
2. පුත්ත උත්තමෙ - මජසං පුත්ත පෙමහං – සයා
3. සරණං – සයා
4. යං තං – මජසං
5. ඛමාමීති – සයා
6. ඛමන්තෙ – මජසං
7. ගතානං – මජසං
8. කච්ච – මජසං

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

264. මේ කය හැර පියා පිරිනිවෙන්නට රිසියෙමි, වීර වූ දුක් කෙළවර කරන නායකයන් වහන්ස, (ඒ සඳහා) මට අනුදැන වදාළ මැනවි.

265. සක් – අකුසු – දද ලකුණින් ගැවැසුණු පියුම් බඳු සියුමැලි පා දිගු කරනු මැනැවි. පුත්‍රප්‍රේමයෙන් ඔබට ප්‍රණාම කරමි.

266. රන්කඳක් බඳු (ඔබ) සිරුර පාළ කරනු මැනැවි. නායකයන් වහන්ස, ඔබගේ කය මැනැවින් දැකීමකොට ශාන්තියට යන්නෙමි'' යි.

267. ජිනේන්ද්‍රයන් වහන්සේ ද්වත්‍රිංශද්වර ලක්‍ෂණොපෙත සුප්‍රභා-යෙන් අලංකෘත සන්ධ්‍යාවලායෙන් ඉවත් වූ බාලාර්ක (ළහිරු) බඳු (ස්‍ව)ශරීරය සුළුමවට දර්ශනය කර වූ සේක.

268. ඉක්බිති ඕ තොමෝ ප්‍රබුද්ධපද්මසදෘශ වූ තරුණ සූර්‍ය්‍යා බඳු ප්‍රභාවත් චක්‍ර ලක්‍ෂණ ඇති ශ්‍රීපාද මතුයෙහි සිරසින් වැද වැටුනා යැ.

269. සූර්‍ය්‍යවංශයට ධවජයක් වූ නරාදිත්‍යයන් (නරශ්‍රෙෂ්ඨයන්) හට මේ පැසුළු මරණයෙහිදී ප්‍රණාම කරමි. මම යළි තොප නො දක්මි.

270. ලෝකාග්‍රයන් වහන්ස, ස්ත්‍රීහු නම් සියලු වරද කෙරෙත් යි දන්නා ලදහ. ඉදින් මාගේ කිසියම් දෙසෙක් ඇත්නම් කරුණාවට ආකරවූ උතුමාණනි, එය ක්‍ෂමා කරනු මැනැවි.

271. යම් හෙයෙකින් මම ස්ත්‍රීනට ද පැවිද්ද පුනපුනා යාඥා කළමු ද. ඉදින් එහිලා මාගේ දෙසෙක් ඇත්නම් නරොත්තමයාණනි, එය ක්‍ෂමා කරනු මැනැවි.

272. වීරයන්වහන්ස. ඔබගේ අනුඥයෙන් භික්‍ෂුණීහු මා විසින් අනුශාසිතයහ. ඉදින් එහිලා වරදවා කළ අනුශාසනයෙක් වේ නම් ක්‍ෂමාධිපයාණනි, එද කමන්න.

273. ගුණාභරණ ඇති තැනැත්තිය, ක්ෂමාවට කරුණු නැති තන්හි ක්‍ෂමා කළයුතු කුමක් නම් වන්නේ ද, පිරිනිවන සඳහා යන තොපට මතුයෙහි කුමක් කියම් ද.

274. පවිත්‍ර වූ අනූන වූ මාගේ භික්‍ෂු සඞ්ඝයා මෙ ලොවින් නිස්සරණයට යන කල්හි, පහන්වන කල්හි ග්‍රහතාරකාවන්ගේ ව්‍යසනය දක චන්ද්‍රලෙඛාව නික්මැ යන්නා මෙනි.

275. මෙරු පර්වතය වටා යන චන්ද්‍රානුගත තාරකා සෙයින් ඒ සෙසු භික්‍ෂුණීහු ජිනෙන්ද්‍රයන් වහන්සේ ප්‍රදක්ෂිණා කොට පාමුල වැද වැටී (බුදුරදුන්) මුවග බලමින් සිටියාහ.

T - 4

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

276. “න තිත්තපුබ්බං[1] තව දස්සනෙන
චක්ඛුං න සොතං තව භාසිතෙන,
චිත්තං මමං කෙවලමෙකමෙව
පප්පුය්‍ය තං ධම්මරසෙන තිත්තිං,

277. නදන්තා පරිසායං තෙ වාදිදප්පාපහාරිනො,[2]
යෙ තෙ දක්ඛන්ති වදනං ධඤ්ඤා තෙ නරපුඞ්ගව.

278. දීඝඞ්ගුලී තම්බනඛෙ සුභෙ ආයතපණ්හිකෙ
යෙ පාදෙ පණමිස්සන්ති[3] තෙපි ධඤ්ඤා ගුණන්ධර.

279. මධුරානි පහට්ඨානි දොසග්ඝානි හිතානි ච,
යෙ තෙ වාක්‍යානි සොස්සන්ති[4] තෙපි ධඤ්ඤා නරුත්තම.

280. ධඤ්ඤා'හං තෙ මහාවීර පාදපූජනතප්පරා,
තිණ්ණසංසාරකන්තාරා සුවාක්‍යෙන සිරීමතො.”[5]

281. තතො සා අනුසාසෙත්වා භික්ඛුසඞ්ඝම්පි සුබ්බතා,
රාහුලානන්දනන්දෙ ච වන්දිත්වා ඉදමබ්‍රවි:

282. “ආසීවිසාලයසමෙ රොගාවාසෙ කළෙබරෙ,
නිබ්බින්නා දුක්ඛසංඝාතෙ[6] ජරාමරණගොචරෙ

283. නානාකලිමලාකිණ්ණෙ[7] පරායත්තෙ නිරීහකෙ,
තෙන නිබ්බාතුමිච්ඡාමි අනුමඤ්ඤථ පුත්තකා.”

284. නන්දො රාහුලභද්දො ච වීතසොකා නිරාසවා,
ඨිතාචලට්ඨිතිථිරා[8] ධම්මතං අනුචින්තයුං.

285. ධිරත්ථු සඞ්ඛතං ලොලං අසාරං කදලූපමං,
මායාමරීචිසදිසං ඉත්තරං අනවට්ඨිතං.

286. යත්ථ නාම ජිනස්සා'යං මාතුච්ඡා බුද්ධපොසිකා,
ගොතමී නිධනං යාති අනිච්චං සබ්බසඞ්ඛතං.'

1. තිත්තිපුබ්බං – මජසං.
2. වාදිතප්පපහාරිනො – මජසං
3. පණමායන්ති – ස්‍යා
4. සුය්‍යන්ති – මජසං
5. සද්ධම්මෙන සිරීමතා – PTS
6. දුක්ඛසඞ්ඝාටෙ – මජසං, දුක්ඛසඞ්ඛතෙ – ස්‍යා
7. කලලමාකිණ්ණෙ - PTS, කුණපමලාකිණ්ණෙ – ස්‍යා
8. ඨිතාචලා ඨිති ථිරා – ස්‍යා, PTS

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

276. (වැළි ද ගෝතමීය මෙසේ පවසයි:) "ඔබගේ දර්ශන යෙන් (අපගේ) ඇස තෘප්ත නොවූ විරූ යැ. ඔබගේ භාෂිතයෙන් කන තෘප්ත නොවූ විරූ යැ. හුදෙක් මාගේ ඒ එකම සිත ධර්ම රසයෙන් තෘප්තියට පැමිණ සිටියි.

277. නරශ්‍රෙෂ්ඨයාණනි. අභීතනාද පවත්වන (පර) වාදීමාන-මථනය කරන ඔබගේ ශ්‍රී මුඛය යම් ඒ කෙනෙක් දකිත් ද, උහු තුමූ භාග්‍යවත් හ.

278. (ලෞකික–ලොකොත්තර) ගුණ ධරණ උතුමාණනි, දිගු ඇඟිලි ඇති, තඹවන් නිය ඇති, දිගු විළුම් ඇති ශුභ වූ (ඔබ) පා යම් කෙනෙක් ප්‍රණාම කෙරෙත් ද, උහු ද ධන්‍ය (පින්වත්) හ.

279. නරොත්තමයාණනි, මිහිරි ප්‍රීතිය ඇති කරන ද්වේෂය නසන (මෛත්‍රීසහගත වූ)හිත වූ ඔබගේ වචන යම් කෙනෙක් ශ්‍රවණ කෙරෙත් ද, ඔහු ද ධන්‍යයෝ යි.

280. මහාවීරයන් වහන්ස, ඔබ පා පිදීමෙහි නිරත වූ තරණය කළ සසරකතර ඇති මම් ශ්‍රීමතාණන්ගේ සුන්දර වාක්‍යයෙන් භාග්‍ය-සම්පන්න වෙමි."

281. ඉක්බිති මනාවූත ඇති භික්ෂුසඞ්ඝයාට ද අනුශාසනා කොට රාහුල–නන්ද–ආනන්ද යන තෙරුණුවන් වැඳ මෙවදන් පැවසූ:

282–283. "සර්පාවාසයක් බඳු රොගයනට වාසස්ථාන වූ දුක් කඳක් වූ නොහොත් දුකින් පෙලුණු ජරා–මරණ දෙකට ගොදුරු වූ නොයෙක් කුණු කසලින් ආකීර්ණ වූ ආත්මායත්ත (තමාසතු) නො වූ අනුත්සුක වූ ශරීරයෙහි කලකිරුණෙම් වෙමි. එහෙයින් පිරිනිවෙන්නට රිසියෙමි. දරුවනි, (එය) අනු දනි වූ".

284. පහ වූ ශෝක ඇති ආස්‍රව රහිත නන්ද තෙරණුවෝ ද රාහුල භද්‍රයෝ ද පවවක් (නොසැලී) සිටුනා සෙයින් තිර වැ සිටියාහු දහම් සැහැවි අනු වැ සිතූ හූ.

285. "ප්‍රත්‍යයෙන් සකැසුණු සැලෙන අසාර (එහෙයින්ම) රඹකදක් වැනි මායාවක් මිරිඟුවක් බඳු බොහෝ කල් නො පවත්නා තිර වැ නො සිටි මෙ කයට නිසඳ වෙව්.

286. මෝ නොමෝ වූකලී ජිනෙන්ද්‍රයන් වහන්සේගේ සුළු මව යැ, බුදුරදුන් පෝෂණය කළ ගෝතමී පිරිනිවීමට යෙයි. සියලු සකර දහම් අනිස යැ."

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

287\. ආනන්දො ච තදා සෙඛො සොකට්ටො ජිනවච්ඡලො,
තත්ථස්සූනි ධරෙන්තො සො කරුණං පරිදෙවති.

288\. "හා සන්තං[1] ගොතමී යාති නූන බුද්ධොපි නිබ්බුතිං,
ගච්ඡති න චිරෙනෙව අග්ගිරිව නිරින්ධනො."

289\. එවං විලපමානං තං ආනන්දං ආහ ගොතමී:
"සුතිසාගර ගම්භීර බුද්ධුපට්ඨානතප්පර.

290\. න යුත්තං සොචිතුං පුත්ත හාසකාලෙ උපට්ඨිතෙ,
තව[2] මෙ සරණං පුත්ත නිබ්බානං සමුපාගතං.[3]

291\. තයා තාත සමජ්ඣිට්ඨො පබ්බජ්ජං අනුජානි නො,
මා පුත්ත විමනො හොහි සඵලො තෙ පරිස්සමො.

292\. යං න දිට්ඨං පුරාණෙහි තිත්ථිකාචරියෙහි පි,
තං පදං සුකුමාරීහි සත්තවස්සාහි වෙදිතං.

293\. බුද්ධසාසනපාලෙතා පච්ඡිමං දස්සනං තව,
තත්ථ ගච්ඡාමහං පුත්ත ගතො යත්ථ න දිස්සතෙ."

294\. කදාචි ධම්මං දෙසෙන්තො ඛිපි ලොකග්ගනායකො,
තදහං ආසිංසවචං[4] අවොචං අනුකම්පිකා:

295\. "චිරං ජීව මහාවීර කප්පං තිට්ඨ මහාමුනෙ,
සබ්බලොකස්ස අත්ථාය භවස්සු අජරාමරො."

296\. තං තථාවාදිනිං බුද්ධො මමං සො එතදබ්‍රවි:
"න හෙවං වන්දියා බුද්ධා යථා වන්දසි ගොතමී."

297\. "කථං චරහි සබ්බඤ්ඤූ වන්දිතබ්බා තථාගතා,
කථං අවන්දියා බුද්ධා තං මෙ අක්ඛාහි පුච්ඡිතො."

298\. "ආරද්ධවිරියෙ පහිතත්තෙ නිච්චං දළ්හපරක්කමෙ,
සමග්ගෙ සාවකෙ පස්ස[5] එසා බුද්ධානවන්දනා."[6]

1. හාසන්තී – ස්‍යා
2. තයා – මජසං, PTS
3. නිබ්බානං සමුපාගතං – සීමූ
4. ආසිංසවාචං – මජසං
5. පස්ස – මජසං, ස්‍යා., PTS
6. එතං බුද්ධානවන්දනං – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

287-288. එකල්හි ආනන්ද තෙරණුවෝ සෙඛ (සෝවාන්) හ, බුදුරදුන් කෙරෙහි ස්නෙහ ඇති සොවින් පෙළුණු ඔබ " අහෝ ! ගොතමී ශාන්තියට යෙයි, නොබෝ දිනකින් බුදුරජාණෝ ද ඉන්ධන (දර) රහිත ගිනි සෙයින් නිවීමට යන්නාහ " යි සානුකම්පික වැ කඳුළු දරමින් වැලපෙති.

289-290. මෙසේ වැලපෙන ඒ ආනන්ද තෙරණුවනට ගොතමී මෙසේ කීවූ : "ශ්‍රැතියට සාගර (බහුශ්‍රැත) වූ, ගැඹුරු ගුණ ඇති බුද්ධොපස්ථානයෙහි නියැළි පුත්‍රයාණනි, ශෝක කරන්නට අයුතු යැ, හාස (සිනහවට) කාලය එළඹැ සිටියේ යැ, පුත, නිවන වෙත එළැඹැ සිටුනා මට නොපගේ පිහිටයි.

291. දරුව, තොප විසින් සමාරාධිත බුදුහු අපට පැවිද්ද අනු දත්හ. පුත, දොම්නස් නො ව, තොපගේ උත්සාහය සඵල යි.

292. පැරණි තීර්ථක ඇදුරන් විසින් යම් ශාන්ත ප්‍රතිෂ්ඨාවක් නො දක්නා ලද ද, ඒ ප්‍රතිෂ්ඨාව සිවුමැලි සත්හැවිරිදි දැරියන් විසිනුදු දක්නා ලද යැ.

293. බුදුසසුන පාලනය කරන පුතණුවනි, මේ තොපගේ පශ්චිම දර්ශනයයි. යම් තැනෙකැ ගියේ නො දක්නා ලැබේ ද, මම එහි යන්නෙමි.

294. ලෝකාග්‍රනායකයන් වහන්සේ කිසිවිටෙකැ දහම් දෙසමින් කිවිසිසේක් ද, එවිට අනුකම්පා ඇති මම ආශීර්වාද වචනයක් කීමි :

295. " මහාවීරයන් වහන්ස, බොහෝ කල් ජීවත්වන සේක්වා. මහාමුනීන්ද්‍රයන් වහන්ස, කපක් වැඩසිටුනා සේක්වා. මුළුලොවට වැඩ පිණිස අජරාමර වන සේක්වා " යි.

296. එසේ කියන ඒ මට බුදුහු තෙල වදළහ : " ගොතමිය, (තෙපි) යම් අයුරකින් වදනාහු ද, ඒ අයුරින් තථාගතයෝ නො වැන්ද යුත්තාහු " යි.

297. " සර්වඥයන් වහන්ස, තථාගතයෝ කිසෙයින් වැන්ද යුතු ද, බුදුහු කිසෙයින් නො වැන්ද යුතු දැයි පුළුවුත් ඔබ එ කරුණ මට කියනසේක් වා."*

298. (බුදුහු) "රුකුළු වැර ඇති නිවනට මෙහෙයූ සිත් ඇති සතනයෙන් දැඩි පැරකුම් ඇති සමග වැ සිටුනා සවුවන් දක්නෙන් නම් තෙලෙ බුදුනට වඳනා වෙයි." වදළහ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

299. තතො උපස්සයං ගන්ත්වා එකිකාහං විචින්තයිං,
සමග්ගං පරිසං නාථො රොචෙති[1] තිභවන්තගො.

300. හන්දහං පරිනිබ්බිස්සං මා විපත්තිං තමද්දසං."[2]
එවාහං චින්තයිත්වාන දිස්වාන ඉසිසත්තමං.

301. පරිනිබ්බානකාලං මෙ[3] ආරොචෙසිං විනායකං,
තතො සො සමනුඤ්ඤාසි "කාලං ජානාහි ගොතමී."

302. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා
නාගීව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවා.

303. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

304. පටිසම්භිද චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

305. ජිනං ධම්මාභිසමයෙ යෙ බාලා විමතිං ගතා,
තෙසං දිට්ඨිපහානත්ථං ඉද්ධිං දස්සෙහි ගොතමී.

306. තද නිපච්ච සම්බුද්ධං උප්පතිත්වාන අම්බරං,
ඉද්ධී අනෙකා දස්සෙසි බුද්ධානුඤ්ඤාය ගොතමී,

307. එකිකා බහුධා ආසි බහුකා චෙකිකා තථා,
ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොනගං.

308. අසජ්ජමානා අගමා භූමියම්පි නිමුජ්ජථ,
අභිජ්ජමානෙ උදකෙ අගඤ්ඡි මහියා යථා.

309. සකුණීව යථාකාසෙ පල්ලඞ්කෙන ගමී තදා,
වසං වත්තෙසි කායෙන යාව බ්‍රහ්මනිවෙසනං.

310. සිනෙරුං දණ්ඩං කත්වාන ඡත්තං කත්වා මහාමහිං
සමූලං පරිවත්තෙත්වා ධාරෙන්ති[4] චඞ්කමී නභෙ.

311. ඡස්සූරොදයකාලෙව ලොකඤ්චාකාසි ධූමිකං,
යුගන්තෙ විය ලොකං සා ජාලාමාලාකුලං අකා.

1. රොචෙසි – මජසං.
2. විපත්තිතමද්දසං – මජසං.
3. මං – සයා
4. ධාරයං - මජසං

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

299. ඉක්බිති මම මෙහෙණවරට ගොස් එකලා වැ සිතුමු: " ත්‍රිවිධ භවයාගේ අන්තයට ගිය නාථයන්වහන්සේ සමගපිරිස් පිරිවන සේකැ.

300-301. මම පිරිනිවෙන්නෙමි, ඒ විපත නො දකිම්වා " යි මම මෙසේ සිතා විනායක මහාර්ෂි බුදුරදුන් දැක, මාගේ පරිනිර්වාණ කාලය ආරෝචනා කළමු, ඉක්බිති ඔබ " ගොතමිය, කල් දනුව " යි අනුදත්හ.

302. (ගොතමී) " මා විසින් කෙලෙස්හු දවන ලදහ. සියලු භවයෝ මුලිනුපුටා නසන ලදහ. බැඳුම් සිඳ සරණ ඇත්රැජිනක සෙයින් ආශ්‍රව රහිත වැ වාස කරමි.

303. බුද්ධශ්‍රේෂ්ඨයන් වෙතැ මට යහපතෙක් වියැ. ත්‍රිවිද්‍යා අනුප්‍රාප්ත යැ, බුදුසසුන් කරන ලද.

304. මා සිවුපිළිසිඹියා ද අෂ්ටවිමොක්ෂ ද ෂඩ්අභිඥ ද පසක් කරන ලද යැ, බුදුසසුන් කරන ලදී.

305. (බුදුහු) " මාගමුන්ගේ ධර්මාභිසමයෙහි යම් අඥානකෙනෙක් විමතියට ගියාහු ද, ඔවුන්ගේ දෘෂ්ටිප්‍රහාණය පිණිස ගෞතමිය, සෘද්ධි දක්වන්න.

306. එකලැ ගොතමී මෙහෙණ සම්බුදුන් ප්‍රණාම කොට අහසට පැන නැගැ බුදුරදුන්ගේ අනුදන්මෙන් නොයෙක් සෘද්ධි දක්වූ.

307-308. එකක් වැ බොහෝ ආකාර වූ, එසෙයින් ම බොහෝ වැ එකක් වූ, ප්‍රකට බවට, අප්‍රකට බවට, පවුරෙන් සරසැ පව්වෙන් සරසැ (නොගැටී) ගියා යැ. (දියෙහි මෙන්) පොළොවෙහි ද ගැලුණා යැ. පොළොවෙහි මෙන් දියෙහි නො බිදිමින් ඇවිද්ද යැ.

309. කිරිල්ලක මෙන් අහසෙහි පයඞ්කයෙන් යුතු වැ ගියා යැ, බඹලොව තෙක් (මුළු ලොව) කයින් වශයෙහි පැවැත් වූ

310. මහමෙර සැත්දණ්ඩ කොටැ මහ පොළොව සතක් කොටැ සහමුලින් පෙරළා ධරමින් නභොගර්භයෙහි සක්මන් කළා යැ.

311. සහිරු උද කල්හි මෙන් ලොව දුම් ඇති කළා යැ. ඕ කල්පාන්තයෙහිදී මෙන් ලොකය අග්නිජාලායෙන් ආකුල කළා යැ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

312. මුචලින්දං මහාසෙලං මෙරු මන්දර දද්දරෙ,[1]
සාසපෙරිව සබ්බානි එකෙනග්ගහි මුට්ඨිනා.

313. අඞ්ගුලග්ගෙන ඡාදෙසි භාකරං සනිසාකරං,
චන්දසූරසහස්සානි ආවෙලම්ව ධාරයි.

314. චතුසාගරතොයානි ධාරයි එකපාණිනා,
යුගන්තජලදකාරං මහාවස්සං පවස්සයි[2]

315. චක්කවත්තිං සපරිසං මාපයී සා නභත්ථලෙ.
ගරුළං ද්විරදං සීහං විනදන්තං ච දස්සයී.

316. එකිකා අභිනිම්මිත්වාප්පමෙය්‍යං භික්ඛුනීගණං,
පුන අන්තරධාපෙත්වා එකිකා මුනිමබ්‍රවි:

317. "මාතුච්ඡා තෙ මහාවීර තවසාසනකාරිකා
අනුප්පත්තා සකං අත්ථං පාදෙ වන්දති[3] චක්ඛුම."

318. දස්සෙත්වා විවිධා ඉද්ධී ඔරොහිත්වා නභත්ථලා,
වන්දිත්වා ලොකපජ්ජොතං එකමන්තං නිසීදි සා.

319. "සා වීසංවස්සසතිකා[4] ජාතියාහං මහාමුනෙ,
අලමෙත්තාවතා වීර නිබ්බායිස්සාමි නායක."

320. තද'තිවිම්හිතා සබ්බා පරිසා සා කතඤ්ජලී,
අවොච'යෙ කථං ආසි අතුලිද්ධිපරක්කමා.

321. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මෙසු චක්ඛුමා,
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

322. තදහං හංසවතියං ජාතාමච්චකුලෙ අහුං,
සබ්බූපකාරසම්පන්නෙ ඉද්ධෙ ඵීතෙ මහද්ධනෙ.

323. කදාචි පිතුනා සද්ධිං දසීගණපුරක්ඛතා,
මහතා පරිවාරෙන තං උපෙච්ච නරාසභං.

---

1. මෙරුමූලනදඩ්ඩරෙ - මජසං.
මෙරුං මන්දරදන්තරෙ - සයා
2. පවස්සථ - මජසං.
3. වන්දමි - මජසං, සයා, PTS.
4. වීසවස්සසතිකා - මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

312. මුචලින්ද මහාශෛලය, මෙරු - මන්දර - දද්දර පර්වත යන සියල්ල අබඇට සෙයින් එක් මිටකින් ගත්තා යැ.

313. නිසයුරු සහිත හිරු ඇඟිලිතුඩින් වැසූ, දහස්ගණන් සඳ හිරු මුදුන් මල්කඩ සෙයින් ධැරූ.

314. සියුසයුරෙහි දිය එක් අත්ලෙන් ධැරූ, යුගාන්ත මෙසයක් බඳු මහවැසි වැස්වූ.

315. ඕ අහස්තෙලෙහි සපිරිස් සක්විතිරජකු මැවූ, ගුරුළකු, ඇතකු ගර්ජනාකරන සිංහයකු දක්වූ.

316. එකලා වැ අපමණ මෙමෙහෙණ ගණයා මවා යළි අතුරුධන් කොට එකක් වැ මුනිරජුනට (මෙසේ) කිවූ:

317. "මහාවීරයන් වහන්ස, (මේ) ඔබගේ අනු සසුන් කරන ඔබගේ සුළුමවයි. චක්ෂුර්මතාණනි, (ඕ) ස්වාජීයට පැමිණියා (ඕබ) පා වඳියි."

318. ඕ නොයෙක් සෘද්ධි දක්වා අහස්තෙලෙන් බැස ලොවට පහනක් වූ බුදුරදුන් වැඳ එකත්පසෙකැ හුන්නා යැ.

319. (ඉක්බිති මහාපජාපතී ගොතමී මෙසේ කිවූ :) "මහා මුනිවරයාණනි, ඒ මම උපතින් එක්සියවිසි හැවිරිදි වෙමි. වීරයාණනී, මෙපමණකින් සෑහෙයි, නායකයාණනි, පිරිනිවෙන්නෙමි" යී.

320. එකලැ අතිවිස්මයට පැමිණි ඒ සියලු පිරිස් කෘතාඤ්ජලි වැ (මෙසේ) කී: "ආයෑාවනි, කෙසේ නම් (මෙබඳු) අසමාන සෘද්ධි පරාක්‍රම ඇති වූයෙහි" ද?

321. සියලු ධර්මයන්හි චක්ෂුර්මත් වූ (ලොවට) නායක වූ පදුමුත්තර ජිනෙන්ද්‍රයන් වහන්සේ මෙයින් ලක්ෂයක් කප්හි (ලොවැ) පහළ වූ සේකි.

322. එසමයෙහි මම හංසවතී නගරයෙහි සියලු උපකරණයෙන් යුත් සමෘද්ධිමත් සර්වසම්පූර්ණ මහාධන ඇති ඇමැතිකුලෙකැ උපන්මි.

323. කිසිවිටෙකැ දසි සමූහයා විසින් පෙරටුකරන ලදු වැ මහ පිරිවරින් පියා සමග ඒ නරශ්‍රෙෂ්ඨයන් වෙතැ එළඹැ-

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

324. වාසවං විය වස්සන්තං[1] ධම්මමෙඝං අනාසවං,
සරදදිච්චසදිසං රංසිමාලාකුලං ජිනං.[2]

325. දිස්වා චිත්තං පසාදෙත්වා සුත්වා චස්ස සුභාසිතං,
මාතුච්ඡං භික්ඛුනිං අග්ගෙ ඨපෙන්තං නරනායකං.

326. සුත්වා දත්වා මහාදානං සත්තාහං තස්ස තාදිනො,
සසඞ්ඝස්ස නරග්ගස්ස පච්චයානි බහූනි ච.

327. නිපච්ච පාදමූලම්හි තං ඨානං අභිපත්ථයිං,
තතො මහාපරිසතිං අවොච ඉසිසත්තමො:

328. "යා සසඞ්ඝං අභොජෙසි සත්තාහං ලොකනායකං,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

329. සතසහස්සෙ ඉතො[3] කප්පෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම ගොත්තෙන[4] සත්ථා ලොකෙ භවිස්සති.

330. තස්ස ධම්මෙසු දායාදා ඔරසා ධම්මනිම්මිතා,
ගොතමී නාම නාමෙන හෙස්සති සත්ථුසාවිකා.

331. තස්ස බුද්ධස්ස මාතුච්ඡා ජීවිතාපාදිකා[5] අයං,
රත්තඤ්ඤූනඤ්ච අග්ගත්තං භික්ඛුනීනං ලභිස්සති."

332. තං සුත්වාන[6] පමුදිතා[7] යාවජීවං තදා ජිනං,
පච්චයෙහි උපට්ඨිත්වා තතො කාලකතා අහං.

333. තාවතිංසෙසු දෙවෙසු සබ්බකාමසමිද්ධිසු,
නිබ්බත්තා දසහඞ්ගෙහි අඤ්ඤෙ අභිභවිං අහං.

334. රූපසද්දෙහි ගන්ධෙහි රසෙහි ඵුසනෙහි ච,
ආයුනාපි ච වණ්ණෙන සුඛෙන යසසාපි ච.

335. තථෙවාධිපතෙය්‍යෙන අධිගය්හ විරොච'හං,
අහොසිං අමරින්දස්ස මහෙසී දයිතා තහිං.

336. සංසාරෙ සංසරන්තීහං කම්මවායුසමෙරිතා,
කාසිස්ස රඤ්ඤො විසයෙ අජායිං දසගාමකෙ.

337. පඤ්චදසසතා'නූනා නිවසන්ති තහිං තදා,
සබ්බෙසං තත්ථ යො ජෙට්ඨො තස්සා ජායා අහොස'හං.

1. වස්සන්තං – මජ්ඣං,
2. රංසිජාලසමුජ්ජලං – මජ්ඣං, ස්‍යා. රංසිජාලාකුලං ජිනං – PTS
3. සතසහස්සිතො – මජ්ඣං.
4. නාමෙන – සිමු
5. ජීවිතපාලිකා – ස්‍යා.
6. සුත්වා'හං – සිමු, ස්‍යා, PTS
7. පමොදිත්වා – මජ්ඣං

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

324-326. ශක්‍රදේවේන්ද්‍රයා වැනි ධම්මෙසය වස්වන ආසුව රහිත සරාහිරු බඳු රශ්මාලා ඇති ජිනේන්ද්‍රයන් දැක සිත පහදවා ඔබගේ සුභාෂිතය ද අසා නරශ්‍රේෂ්ඨයන් වහන්සේ (සිය) සුළුමව වූ මෙහෙණ අගතන්හි (එතදග්‍රයෙහි) තබනු අසා අකම්ප්‍ය ගුණ ඇති ඔබට සත්දිනක් මහදන්දී සඞ්ඝයා සහිත නරෝත්තමයන් වහන්සේට බොහෝ ප්‍රත්‍යය ද ප්‍රදානය කොටැ-

327. (ඔබ) පාමුල්හි වැදහෙවැ එ තනතුර පැතුමු. ඉක්බිති ඍෂිශ්‍රේෂ්ඨයන් වහන්සේ මහපිරිස් මැද මෙසේ වදළ සේක:

328. "යම් කාන්තාවක් සඞ්ඝයා සහිත ලෝකනාථයන් සත් දිනක් මුළුල්ලෙහි වැළඳ වූ ද, මම ඇය කීර්තනය (ප්‍රකාශ) කරමි. (එසේ) කියන මාගේ බස් අසවු:

329. "මෙයින් සියක්දහස්වන කප්හි ඔක්කාක කුලය සම්භව කොට ඇති ගෝත්‍රයෙන් ගෝතම නම්වූ ශාස්තෘ තෙමේ ලොවැ පහළ වන්නේ යැ.

330. (මෙ කාන්තා තොමෝ) ඔබ දහමට හිමි වූ ඖරස වූ ධර්මයෙන් නිර්මිත වූ නමින් ගොතමී නම්වූ ශාස්තෘශ්‍රාවිකාවක් වන්නී යැ.

331. ඒ තථාගතයන්ගේ දිවි වඩාලන සුළුමවූ වන මෝ රාත්‍රඥ (පැවිදි වැ බොහෝකල් ඇති) මෙහෙණන් අතර අග්‍රබව ලබන්නී යැ."

332. එ අසා ප්‍රමුදිත වූ මම එකලැ දිවිහිම් කොට ජිනේන්ද්‍රයන් වහන්සේ (සිවු) පසයෙන් උපස්ථාන කොට එ අත්බැවින් කලුරිය කෙළෙමි-

333. සියලු කාමයෙන් සමෘද්ධ වූ තව්තිසා දෙවියන් අතර උපන්නෙමි සෙසු දෙවියන් දස කරුණකින් අභිභවා සිටියමු.

334. රූපයෙන් ශබ්දයෙන් ගන්ධයෙන් රසයෙන් හා ස්ප්‍රෂ්ටව්‍ය-යෙන් ද, ආයුෂයෙන් ද වර්ණයෙන් සුඛයෙන් හා වැළි යශසින් ද-

335. එසෙයින් ම අධිපතිභාවයෙන් ද (සෙසු දෙවියන්) අභිභවා බැබළුණෙමි මම එහි දෙවරජුගේ ප්‍රේමණීය මෙහෙසි වූමු.

336. සසර සැරිසරන මම කර්මවායුයෙන් මෙහෙයන ලදුයෙම් කාසි රජුගේ විජිතයෙහි දසග්‍රාමයෙකැ උපන්මූ.

337. එකලැ එගම්හි නො අඩු වැ පන්සියයක් දස්හු වෙසෙති. එහි සියල්ලනට යමෙක් දෙටු ද, මම ඔහුගේ භාර්‍යා වූමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

338. සයම්භුනො පඤ්චසතා ගාමං පිණ්ඩාය පාවිසුං,
තෙ දිස්වාන අහං තුට්ඨා සහ සබ්බෙහි ඤාතිහි.[1]

339. කත්වා පඤ්චසතකුටී[2] චතුමාසෙ උපට්ඨිය,[3]
තිචීවරානි දත්වාන පසන්නාම්හ[4] සසාමිකා.

340 තතො චුතා සපතිකා[5] තාවතිංසගතා මයං,
පච්ඡිමෙ ච භවෙ'දානි ජාතා දෙවදහෙ පුරෙ.

341. පිතා අඤ්ජනසක්කො මෙ මාතා මම සුලක්ඛණා,
තතො කපිලවත්ථුස්මිං සුද්ධොදනඝරං ගතා.

342. සෙසා[6] සක්‍යකුලෙ ජාතා සක්‍යානං ඝරමාගමුං,
අහං විසිට්ඨා සබ්බාසං ජිනස්සා'පාදිකා අහුං.

343. මම පුත්තො'භිනික්ඛම්ම[7] බුද්ධො ආසි විනායකො,
පච්ඡාහං පබ්බජිත්වාන සතෙහි සහ පඤ්චහි.

344. සාකියානීහි ධීරාහි සහ සන්තිසුඛං ඵුසිං,
යෙ තදා පුබ්බජාතියං අම්හාකං අහු සාමිනො.

345. සහ පුඤ්ඤස්ස කත්තාරො මහාසමයකාරකා,
ඵුසිංසු අරහත්තං තෙ සුගතෙනානුකම්පිතා.

346. තදෙතරා භික්ඛුනියො ආරුහිංසු නභත්තලං,
සඞ්ගතා[8] විය තාරායො විරොචිංසු මහිද්ධිකා.

347. ඉද්ධී අනෙකා දස්සෙසුං පිළන්ධවිකතිං[9] යථා,
කම්මාරො කනකස්සෙව කම්මඤ්ඤස්ස සුසික්ඛිතො.[10]

348. දස්සෙත්වා පාටිහීරානි චිත්තානි[11] බහූනි ච,
තොසෙත්වා වාදිපවරං මුනිං සපරිසං තදා.

349. ඔරොහිත්වාන ගගනා වන්දිත්වා ඉසිසත්තමං,
අනුඤ්ඤාතා නරග්ගෙන යථාඨානෙ නිසීදිසුං.

350. ''අහො'නුකම්පිකා අම්හං සබ්බාසං වීර ගොතමී,
වාසිතා තව පුඤ්ඤෙහි පත්තා නො ආසවක්ඛයං.

---

1. සබ්බාහි ඤාතිභි – මජසං
2. පූගා භූත්වාව සබ්බායො – මජසං
3. උපට්ඨහුං – මජසං
4. සංසරිම්හා – සිමු, මජසං
5. සබ්බාපි තා – මජසං
6. සබ්බා – සයා
7. ස මෙ පුත්තො... – සයා
8. ඔගතා – සිමු
9. පිළන්ධවිකතිං – මජසං
10. සුවණ්ණකම්මෙසු සික්ඛිතො – සයා
11. විවිධානි – සයා

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

338-339. පන්සියයක් පසේබුදුහු පිඬු පිණිස ගමට පිවිසුණාහ. ඔබ දැක තුටුපත් වැ සියලු නෑයන් සමග පන්සියයක් කුටි තනා සිවුමසක් මුළුල්ලෙහි උවටැන් කොට තුන්සිවුරු දී සැමියන් සහිත වැ ප්‍රසන්න වූම්හ.

340. සැමියන් සහිත අපි එයින් සැවැ තව්තිසාවට ගියම්හ, දූන් පැසුළු බෙවෙහි දු දෙව්දහ නුවර (එක්වැ) උපනුම්හ.

341. මාගේ පිය තෙමේ අඤ්ජන ශාක්‍යරජ යැ, මාගේ මව සුලක්ඛණාදේවී ය. ඒ දෙව්දහ නුවරින් කිඹුල්වත් පුර සුදෙවුන් රජුගේ ගෙට (සරණ) ගියා වෙමි.

342. ශාක්‍ය කුලයෙහි උපන් සෙසු දස්සෝ ශාක්‍යරජුන්ගේ ගෙට ගියහ. (ශාක්‍යරජුන් හා විවාහ වූහ.) සියල්ලන් අතුරෙහි විශිෂ්ට වූ මම ජිනේන්ද්‍රයන්ගේ පොෂක (-කිරි) මව වූමු.

343-344. මාගේ පුත් අභිනිෂ්ක්‍රමණය කොට (තමහට නායක යකු නැති හෙයින්) විනායක බුද්ධ වියැ. පසු කලැ මම පන්-සියයක් ශාක්‍ය කුමරියන් සමග පැවිදි වැ ධීර වූ ඔවුන් හා ශාන්තිසුඛය (-නිවන් සුව) ස්පර්ශ කළමු. ඒ පෙරදැහි යම් කෙනෙක් අපගේ ස්වාමිපුරුෂ වූහු ද-

345. එක් වැ පින් කළ (දූන්) මහාසමයකාරක ඔහු සුගතයන් වහන්සේ විසින් අනුකම්පිත වූවාහු අර්හත්වය ස්පර්ශ කළාහ.

346. ඒ සෙසු මෙහෙණිහු අහස්තලයට නැගුණාහ. මහත් සෘද්ධි ඇත්තාහු එක්රැස්වූ තාරකා සෙයින් බැබළුණාහු යැ.

347-348. (ඔහු) නොයෙක් සෘද්ධි දක්වූහු. රන්කම්හි මොනොවට හික්මුණු කම්මාරපුත්‍රයකු (-රන්කරුවකු) කම්ණාස ස්වර්ණය කින් බොහෝ ආභරණ විශෙෂ (තනා ප්‍රදර්ශනය කරන්නාක්) සෙයින් (එ මෙහෙණිහු) බොහෝ විසිතුරු පෙළහර දක්වා එදිනැ පිරිස් සහිත වාදිවර මුනීන්ද්‍රයන් වහන්සේ සතුටු කොට-

349. අහසින් බැස උත්තම සෘෂි වූ මුනිරජුන් නැමැ ද නරාග්‍ර තථාගතයන් වහන්සේ විසින් අනුදන්නා ලද්දහු සුදුසු තන්හි හුන්හ.

350. වීරයන් වහන්ස, ආශ්චර්යයෙක, ගොතමී තොමෝ අප සියල්ලන්ට අනුකම්පා ඇත්තී යැ, තුඹ වහන්සේගේ කුශලයන් විසින් වාසිත වූ අපි ආස්‍රවක්‍ෂය සංඛ්‍යාත නිවනට පැමිණියම්හ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

351. කිලෙසා ඣාපිතා අම්හං භවා සබ්බෙ සමූහතා
නාගීව බන්ධනං ඡෙත්වා විහරාම අනාසවා.

352. ස්වාගතං වත නො ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

353. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

354. ඉද්ධීසු ච වසී හොම දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී හොම මහාමුනෙ.

355. පුබ්බෙනිවාසං ජානාම දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

356. අත්ථෙ ච ධම්මෙ නෙරුත්තෙ පටිභානෙ ච විජ්ජති
ඤාණං අම්හං මහාවීර උප්පන්නං තව සන්තිකෙ.

357. අස්මාභි පරිචිණ්ණො'සි මෙත්තචිත්තාභි නායක
අනුජානාහි සබ්බාසං[1] නිබ්බානාය මහාමුනෙ.''

358. ''නිබ්බායිස්සාම ඉච්චෙවං කිං වක්ඛාමි වදන්තියො[2]
යස්සදානි ච වො කාලං මඤ්ඤථා''ති ජිනො'බ්‍රවි.

359. ගොතමී ආදිකා තායො තදා භික්ඛුනියො ජිනං
වන්දිත්වා ආසනා තම්හා වුට්ඨාය අගමංසු තා.

360. මහතා ජනකායෙන සහ ලොකග්ගනායකො
අනුසංයායි සො[3] වීරො මාතුච්ඡං යාව කොට්ඨකං.

361. තදා නිපති පාදෙසු ගොතමී ලොකබන්ධුනො
සහෙතරාහි[4] සබ්බාහි පච්ඡිමං පාදවන්දනං.

362. ''ඉදං පච්ඡිමකං මය්හං ලොකනාථස්ස දස්සනං
න පුනො අමතාකරං පස්සිස්සාමි මුඛං තව.

363. න ච මෙ වන්දනං වීර තව පාදෙ සුකොමලෙ
සම්ඵුසිස්සාමි ලොකග්ග අජ්ජ ගච්ඡාමි නිබ්බුතිං.

1. සබ්බාසො – සျා, PTS
2. වදන්තිනං – සීමු
3. අනුසංසාවයි – සျා.
4. සහෙවතාහි – මජසං

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

351. අප විසින් කෙලෙස්හු දවන ලදහ. සියලු භවයෝ මුල් සිඳ නසන ලදහ. බැඳුම් සිඳ සරණ හස්තිරාජිනීන් සෙයින් ආශ්‍රව රහිත වැ වාස කරමු.

352. බුදුරජාණන් වහන්සේ වෙතැ (එළැඹීමෙන්) අපට ස්වාගත යෙක් වියැ. ත්‍රිවිද්‍යා අනුප්‍රාප්ත යැ. බුදුසසුන් කරන ලදී.

353. මෙ සිවුපිළිසිඹියා ද අෂ්ටවිමොක්ෂ ද ෂට් අභිඥා ද ප්‍රත්‍යක්ෂ කරන ලද යැ. බුදුසසුන් කරන ලදී.

354. මහාමුනිතුමනි, ඍද්ධීන්හි වශී වෙමු, දිබ්බසොතධාතුයෙහි (-දිව්කන්හි) ද චේතොපරියඥාණයෙහි (-පරසිත් දන්නා නුවණෙහි) ද වශී වෙමු.

355. පෙර විසූ කඳපිළිවෙළ දනිමු. දිවැස පිරිසුදු කරන ලද යැ. සියලු ආස්‍රව ගෙවී ගියේ යැ. දැන් යළි ඉපැත්මෙක් නැති.

356. මහාවීරයන් වහන්ස, අපට අර්ථයෙහිත් ධර්මයෙහිත් නිරුක්තියෙහිත් ප්‍රතිභානයෙහිත් යම් ඥනයක් වේ ද, (එ ඥනය) තොප හමියෙහි දී උපනැ.

357. නායකයන් වහන්ස, අප විසින් මෙත් සිතැති වැ පුරුදු (-ඇසුරු) කරන ලදහු, (අප) සියල්ලනට පිරිනිවන් පිණිස අනුදන වදළ මැනැවි.

358. "පිරිනිවෙන්නමු යි මෙසේ පවසන්නන්හට කුමක් කියම් ද, යමක් පිණිස (කාලය අපෙක්ෂා කරන්නහු නම්) තෙපි (ඒ කාලය) දනිවු" යි ජිනෙන්ද්‍රයන් වහන්සේ වදළ සේක.

359. එවිට ගොතමී ආදී ඒ භික්ෂුණීහු ජිනෙන්ද්‍රයන් වැඳ එ හුනස්නෙන් නැගැ ගියාහ.

360. ඒ වීර වූ ලෝකාග්‍රනායකයන් වහන්සේ මහාජන සමූහයා සමග දොරකොටුව තෙක් සුළුමව අනුව වැඩම කළ සේක.

361. එකලැ ගොතමී තෙරණියෝ සෙසු සියල්ලන් සමග පැසුළු පා වැඳුම කෙරෙමින් ලෝකබන්ධු බුදුරදුන් පා මුල වැද වැටුණාහ.

362. (ඕ මෙසේ පවසයි :) "ලොකනාථයන් පිළිබඳ මෙ මාගේ පැසුළු දකුම යි, අමෘතයට ආකර වූ තොපගේ මුඛය යළි නො දක්මු.

363. වීරයන් වහන්ස, මුඹ වහන්සේගේ සියුමැලි පා සඟළ නැවත වැඳීමෙක් මට නො ද ඇති, ලෝකාග්‍රයන් වහන්ස, (ඔබ පා) ස්පර්ශ කරමි. අද පිරිනිවනට යමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

364. රූපෙන කිං තවා'නෙන දිට්ඨෙ ධම්මෙ යථාකතෙ
සබ්බං සඞ්ඛතමෙවේතං අනස්සාසිකමිත්තරං.''

365. සා තාහි සහ[1] ගන්ත්වාන භික්ඛුනූපස්සයං සකං
අඩ්ඪපල්ලඞ්කමාභුජ්ජ නිසීදි පරමාසනෙ.

366. තදා උපාසිකා තත්ථ බුද්ධසාසනවච්ඡලා
තස්සා පවත්තිං සුත්වාන උපෙසුං පාදවන්දිකා.

367. කරෙහි උරං පහන්ත්වා ඡින්නමූලා යථා ලතා
රොදන්තා කරුණං රාවං[2] සොකට්ටා භූමිපාතිකා[3]

368. ''මා නො සරණදෙ නාථෙ විහාය ගමි නිබ්බුතිං
නිපතිත්වාන යාචාම සබ්බායො සිරසා මයං.''

369. යා පධානතමා තාසං සද්ධා පඤ්ඤා උපාසිකා
තස්සා සීසං පමජ්ජන්තී ඉදං වචනමබ්‍රවි:

370. ''අලං පුත්තා විසාදෙන මාරපාසානුවත්තිනා
අනිච්චං සඞ්ඛතං සබ්බං වියොගන්තං චලාචලං.''

371. තතො සා තා විස්සජ්ජිත්වා පඨමං ඣානමුත්තමං
දුතියං තතියං චාපි සමාපජ්ජි චතුත්ථකං.

372. ආකාසායතනඤ්ච විඤ්ඤාණායතනං තථා
ආකිඤ්චඤ්ඤං නෙවසඤ්ඤං සමාපජ්ජි යථාක්කමං.

373. පටිලොමෙන ඣානානි සමාපජ්ජිත්ථ ගොතමී
යාවතා පඨමං ඣානං තතො යාව චතුත්ථකං

374. තතො වුට්ඨාය නිබ්බායි දීපච්චිව නිරාසනා[4]
භූමිචාලො මහා ආසි නභසා විජ්ජුතා පති.

375. පනාදිතා දුන්දුභියො පරිදෙවිංසු දෙවතා
පුප්ඵවුට්ඨී ච ගගනා අභිවස්සථ මෙදිනිං.

376. කම්පිතො මෙරුරාජාපි රඞ්ගමජ්ඣෙ යථා නටො
සොකෙනෙවාතිදීනො ච[5] විරවො ආසි සාගරො.

---

1. සා සහ තාහි - මජසං.
2. රවං - මජසං.
3. භූමිපාතිතා - මජසං.
   භුවි පාතිතා - PTS
4. නිරාසවා - මජසං.
5. සොකෙන වාතිදීනොව - මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

364. තොපගේ යථාස්වභාව (සත්‍ය) ධර්මය දුටු කල්හි මේ රූපයෙන් කවර වැඩෙක් ද, තෙල සියල්ල සඬ්ඛත (හේතුයෙන් හටගත්තේ) යැ, ආස්වාද (අස්වැසිලි) රහිත යැ, බොහෝ කල් නො පවත්නේ'' යි.

365. ඕ ඔවුන් සමග සිය මෙහෙණවරට ගොස් අඩ පළඟ බැඳ උතුම් අස්නෙහි හුන්නා යැ.

366. එකලැ එහි බුද්ධශාසනමාමක වූ උවැසියෝ ඇය (ගොතමී) ගේ පුවත් අසා පා වඳිනු රිසියෝ වැ එළැඹුණාහ.

367. (ඔහු) ළෙහි අතින් පැහැර බැගෑ හඬින් හඬමින් සොවින් පෙළුණෝ වැ මුල්සුන් ලියවැල් සෙයින් බිම වැටීම ඇති වූවාහු —

368. ''අපහට ශරණදයක වූ, නාථ වූ උත්තමාවනි, අපි සියල්ලෝ සිරසින් වැඳ වැටී (තොප) අයැදුම්හ : අප හැරපියා නිවනට නහමක් යනු මැනැවි'' යි කීහු.

369. ඔවුනතර ප්‍රධානතම වූ සැදැහැවත් නුවණ ඇති යම් උවැසියක් වූද, (ගොතමී) ඇය හිස පිරිමදිමින් මෙ වදන් පැවැසූ :

370. ''දරුවනි, මාරබන්ධන අනුව වටනා සොවින් කම් නැත, සඞ්ඛත ධර්ම සියල්ල අනිස යැ, වෙන්වීම කෙළවර කොට ඇත, නිරතුරු වෙනස්වනසුලු'' යි (කියා යි.)

371–372. ඉක්බිති ඕ ඔවුන් බැහැර යවා උතුම් වූ ප්‍රථමධ්‍යාන යට සමවැදුණු. දෙවැනි, තෙවැනි, සිවුවැනි ධ්‍යානයනට ද එසෙයින් ම පිළිවෙළින් ආකාසානඤ්චායතන යැ විඤ්ඤාණඤ්චායතන යැ ආකිඤ්චඤ්ඤායතන යැ නේවසඤ්ඤා නාසඤ්ඤායතන යැ යන සමවතට ද සමවැදුණා යැ.

373. ගොතමී තෙරණියෝ පළමුවැනි ධ්‍යානය තෙක් පිළි-ලොම් විසින් ධ්‍යානයනට සමවැදුණාහ. එයින් (අනුලොම් විසින්) සිවුවැනි ධ්‍යානය තෙක් සමවන්හ.

374. එයින් නැගී සිට තෙල් නැති පහන් සිළක් සෙයින් පිරිනිවියාහ. (එකෙණෙහි) මහාභූමිචලනයෙක් වියැ. අහසින් විදුලිධාරා ද පතිත වී.

375. මහාමේඝයෝ ගර්ජනා කළහ. දෙවියෝ වැළපුණාහ. අහසින් පොළොවට මල්වැසි ද වට.

376. රඟමඬලෙහි නළුවකු මෙන් මෙරුපර්වතය ද කම්පිත වියැ, සොවින් දීන වූ සෙයින් මහසයුර ද විරාව (මහත් ඝොෂ) ඇති වී.



* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

377\. දෙවා නාගාසුරා බ්‍රහ්මා සංවිග්ගා'හංසු[1] තක්ඛණෙ:
''අනිච්චා වත සඞ්ඛාරා යථායං විලයං ගතා,

378\. යා චෙ'මං පරිවාරිංසු සත්ථුසාසනකාරිකා
තායො'පි අනුපාදනා දීපච්චී[2] විය නිබ්බුතා.''

379\. ''හා යොගා විප්පයොගන්තා හා'නිච්චං සබ්බසඞ්ඛතං
හා ජීවිතං විනාසන්තං'' ඉච්චාසි පරිදෙවනා.

380\. තතො දෙවා ච බ්‍රහ්මා ච ලොකධම්මානුවත්තනං
කාලානුරූපං කුබ්බන්ති උපෙත්වා ඉසිසත්තමං.

381\. තදා ආමන්තයී සත්ථා ආනන්දං සුතිසාගරං;[3]
''ගච්ඡානන්ද නිවෙදෙහි භික්ඛූනං මාතුනිබ්බුතිං.''

382\. තදා'නන්දො නිරානන්දො අස්සුනා පුණ්ණලොචනො
ගග්ගදෙන සරෙනාහ ''සමාගච්ඡන්තු භික්ඛවො.

383\. පුබ්බදක්ඛිණපච්ඡාසු උත්තරායං වසන්ති යෙ
සුණන්තු භාසිතං මය්හං භික්ඛවො සුගතොරසා.

384\. යා වඩ්ඪයී පයත්තෙන සරීරං පච්ඡිමං මුනෙ
සා ගොතමී ගතා සන්තිං තාරාව සූරියොදයෙ.

385\. බුද්ධමාතාති පඤ්ඤත්තිං ඨපයිත්වා ගතා'සමං
න යත්ථ පඤ්චනෙත්තොපි ගතං[4] දක්ඛති නායකො

386\. යස්සත්ථි සුගතෙ සද්ධා යො ච පියො[5] මහාමුනෙ.
බුද්ධමාතරි[6] සක්කාරං කරොතු සුගතොරසො.''

387\. සුදූරට්ඨාපි තං සුත්වා සීඝමාගඤ්ඡු භික්ඛවො
කෙචි බුද්ධානුභාවෙන කෙචි ඉද්ධීසු කොවිදා.

388\. කූටාගාරවරෙ රම්මෙ සබ්බසොණ්ණමයෙ සුභෙ
මඤ්චකං සමරොපෙසුං[7] යත්ථ සුත්තාසි ගොතමී.

---

1. සංවිග්ගහිංසු – මජසං.
2. දීපසිඛා – සයා.
3. සුතසාගරං – මජසං.
4. ගතිං – මජසං.
5. යො වා සිස්සො – සීමු.
6. බුද්ධමාතුයා – මජසං.
   බුද්ධස්සමාතු – සයා.
7. සමාරොපෙසුං – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

377-378. එකෙණෙහි දෙවියෝ ද නාගයෝ ද අසුරයෝ ද බ්‍රහ්මයෝ ද සංවිග්න වැ (මෙසේ) කීහු : "එකාන්තයෙන් සංස්කාරයෝ අනිත්‍යහ. යම්සේ මෝ නිවීමට ගියා ද, එසේ ශාස්තෘ ශාසනකාරිණී වූ (-බුදුවදන් අනු වැ හැසුරුණු) යම් මෙහෙණ කෙනෙක් මැය පිරිවරා සිටියාහු ද ඔහු ද (තෙල් නැති) පහන් සිළු සෙයින් උපාදන රහිතවැ නිවීමට ගියාහු" යි.

379, "අහෝ ! එක්විම වෙන්වීම අන්තකොට ඇත්තේ යැ, අහෝ ! සියලු සඞ්ඛත ධම්ම අනිත්‍ය යැ, අහෝ ! ජීවිතය විනාශය කෙළවර කොට ඇත්තේ යැ" මෙසේ (ඔවුනතර) පරිදේවනා (වැලපීම්) ද ඇති වූයේ යි.

380. ඉක්බිති දෙවියෝ ද, බ්‍රහ්මයෝ ද සෘෂිශ්‍රේෂ්ඨ බුදුරදුන් කරා එළැඹැ ලෝසිරිත් අනු වැ කටයුතු දැ කාලානුරූප කොට කෙරෙත්.

381. එකලැ ශාස්තෘන් වහන්සේ ශ්‍රැතිසාගර වූ (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආනන්ද තෙරණුවන් ඇමැතූ සේක : "ආනන්ද, යව, මවුගේ පිරිනිවීම භික්‍ෂූන්ට දන්ව" යි.

382. එවිටැ නිරානන්‍ද (සතුටින් තොර) ආනන්‍ද තෙරණුවෝ කඳුළින් පිරුණු නෙත් ඇති වැ "(ආයුෂ්මත්) මහණෙනි, එක්රැස් වෙත්වයි" ගද්ගද (පැකුලුණු) හඬින් කීහ.

383. "පෙර – දකුණු – පැසුළු – දිග්හි ද, උතුරු දිග්හි ද බුද්ධපුත්‍ර යම් භික්ෂු කෙනෙක් වෙසෙත් නම් ඔහු මගේ වචනය අසත්වා.

384. මුනීන්ද්‍රයන් වහන්සේගේ පශ්චිම ශරීරය යම් මවක් ප්‍රයත්නයෙන් වර්ධනය කළා ද, ඒ ගොතමී තොමෝ සූර්‍යොදයෙහි තාරකාවක් සෙයින් ශාන්තියට ගියා යැ.

385. පසැස් ඇති නායකයන් වහන්සේ පවා යම් තෙනෙකැ ගිය ඇය නො දක්නාසේක් ද, (ඕ) 'බුද්ධමාතා' යන අසම වූ ප්‍රඥප්තිය (අප අතර) තබා (නිවීමට) ගියා යැ.

386. සුගතයන් වහන්සේ කෙරෙහි යමකුගේ ශ්‍රද්ධා ඇත් ද, මහාමුනි කෙරෙහි යමෙක් ප්‍රිය ද, (ඒ) බුද්ධ පුත්‍රතෙමේ බුද්ධමාතෘ කෙරෙහි සත්කාර කෙරේවා."

387. ඉතා දුර සිටියාවූ ද භික්‍ෂූහු එ අසා බුද්ධානුභාවයෙන් ඇතැම්හු ද සෘද්ධිවිෂයෙහි නිපුණ ඇතැම්හු ද වහා පැමිණියාහු යි.

388. ගෝතමී තොමෝ යම්තෙනෙකැ සැතැපී සිටියා ද ඒ මඤ්චකය (හැඳ) සියල්ල රනින් නිම වූ ශුභ වූ රම්‍ය වූ උතුම් කූළගෙයකැ ආරෝපණය කළහ,

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

389. චත්තාරො ලොකපාලා තෙ අංසෙහි සමධාරයුං
සෙසා සක්කාදයො දෙවා කූටාගාරෙ සමග්ගහුං.

390. කූටාගාරානි සබ්බානි ආසුං පඤ්චසතානිපි[1]
සරදාදිච්චවණ්ණානි විස්සකම්මකතානි හි.

391. සබ්බාපි තා[2] භික්ඛුනියො ආසුං මඤ්චෙසු සායිතා
දෙවානං ඛන්ධමාරූළ්හා නියන්ති අනුපුබ්බසො.

392. සබ්බසො ඡාදිතං ආසි විතානෙන නභත්ථලං
සතාරා චන්දසූරියා ලඤ්ඡිතා කනකාමයා

393. පතාකා උස්සිතා නෙකා විතතා පුප්ඵකඤ්චුකා
ඔගතාකාසපදුමා මහියා පුප්ඵමුග්ගතං.

394. දිස්සන්ති[3] චන්දසූරියා පජ්ජලන්ති ච තාරකා
මජ්ඣංගතොපි චාදිච්චො න තාපෙති සසී යථා.

395. දෙවා දිබ්බෙහි ගන්ධෙහි මාලෙහි සුරභීහි ච
වාදිතෙහි ච නච්චෙහි සඞ්ගීතීහි ච පූජයුං.

396. නාගා සුරා ච බ්‍රහ්මානො යථාසත්ති[4] යථාබලං
පූජයිංසු ච නීයන්තිං නිබ්බුතං බුද්ධමාතරං.

397. සබ්බායො පුරතො නීතා නිබ්බුතා සුගතොරසා
ගොතමී නීයතෙ පච්ඡා සක්කතා බුද්ධපොසිකා.

398. පුරතො දෙවමනුජා සනාගා'සුරබ්‍රහ්මකා
පච්ඡා සසාවකො බුද්ධො පූජත්ථං යාති මාතුයා.

399. බුද්ධස්ස පරිනිබ්බානං නෙදිසං ආසි යාදිසං
ගොතමී පරිනිබ්බානං අතිවච්ඡරියං අහු.

400. බුද්ධො බුද්ධස්ස නිබ්බානෙ[5] නොපදිස්සති[6] භික්ඛවො
බුද්ධො ගොතමීනිබ්බානෙ සාරිපුත්තාදිකා[7] තථා.

401. චිතකානි කරිත්වාන සබ්බගන්ධමයානි තෙ
ගන්ධචුණ්ණාවකිණ්ණානි ඣාපයිංසු ච තා තහිං.

---

1. පඤ්චසතානි හි - සිමු.
2. සබ්බා තාපි - මජ්සං.
3. දිස්සන්ති - මජ්සං,
4. යථාසත්තිං - සිමු.
5. න බුද්ධො බුද්ධනිබ්බානෙ - මජ්සං., PTS.
6. නොපටියාදි - මජ්සං.
7. සාරිපුත්තාදි - සයා.

389. ඒ ලෝකපාල දෙවියෝ සිවුදෙන (කුළුගෙය) දසරුවෙහි ලා ධැරූහ. සෙසු ශක්‍රාදි දෙවියෝ කුළුගෙවල් ගත්හු.

390. කුළුගෙවල් පන්සියයක් වියැ, එ සියල්ල සරාහිරු බඳු වියැ, විස්කම්හු විසින් කරනලද වී.

391. ඒ සියලු භික්‍ෂුණීහු මඤ්චයන්හි ශයනය කරවන ලද වූහු. දෙවියන්ගේ දසරුවට නංවන ලද්දහු අනුපිළිවෙළින් (ආදහනස්ථානය වෙතැ) ගෙනයනු ලැබෙත්.

392. අහස්තලය හැමදෙසින් වියනින් වසනලද වියැ, තරු සහිත සඳහිරු රන්මුවා වැ ලකුණු කරන ලද වී.

393. නොයෙක් පතාකාවෝ ඔසවන ලදහ, පුෂ්පකඤ්චුකයෝ පතුරුවා හරින ලදහ, අහසෙහි පද්මයෝ එල්බුණාහ, පොළොවෙන් පුෂ්පයෝ උද්ගත වූහු.

394. සඳහිරු දක්නා ලැබෙයි, තාරකා දිලියෙයි, හිරු මධ්‍යාහ්න ගත නමුදු සඳ මෙන් (කිසිවකු) නො තවයි.

395. දෙවියෝ දිව්‍යමය ගන්ධයෙනුදු මනාසුවඳැති මල්දමිනුදු වාදනයෙනුදු නෘත්‍යයෙනුදු සංගීතියෙනුදු පිදූහු.

396. නාගයෝ ද අසුරයෝ ද බ්‍රහ්මයෝ ද පිරිනිවි (සොහොන වෙතැ) ගෙනයනු ලබන බුද්ධමාතාව ශක්ති පමණින් බල පමණින් පූජා කළෝ යි.

397. සුගතෞරස වූ පිරිනිවි සියලු මෙහෙණහු පෙරටු කොට ගෙනයන ලද්දහු ය., බුදුන් (ළදරුකල) පෝෂණය කළ ගොතමී තොමෝ සත්කාර කරනලදුව පසුව ගෙනයනු ලබයි.

398. නාග අසුර බ්‍රහ්ම ගණයා සහිත දෙවමිනිස්හු පෙරටුව ගමන් කළහ. මවට පූජා පිණිස ශ්‍රාවකයන් සහිත වූ බුදුහු පසුවැ වැඩම කළාහු යැ.

399. ගෝතමියගේ පරිනිර්වාණය යම්සේ අතිශයින් ආශ්චර්‍ය්‍ය ජනක වී ද, බුද්ධපරිනිර්වාණය එසේ ආශ්චර්‍ය්‍යජනක නො වී යැ.

400. බුද්ධපරිනිර්වාණයෙහි බුදුහු නො දක්නා ලැබෙති, ගොතමී පරිනිර්වාණයෙහි බුදුහු ද එසේ ම ශාරිපුත්‍රාදි තෙරණුවෝ ද දක්නා ලැබෙත්.

401. ඒ දෙවමිනිස්හු සුවඳ සුණු බහාලූ සියලු සුවඳ දැයින් යුතු සෑ කරවා ඔවුන් (ඒ මෙහෙණන්) එහි තැන්පත් කොට දැවූහු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

402. සෙසභාගානි ඩය්හිංසු අට්ඨිසෙසානි සබ්බසො
ආනන්දො ච තද'වොච සංවෙගජනනං වචො:

403. "ගොතමී නිධනං යාතා දඩ්ඪං වස්සා[1] සරීරකං
සඞ්ඛෙත'හං[2] බුද්ධනිබ්බානං න චිරෙන භවිස්සති."

404. තතො ගොතමීධාතුනි තස්සා පත්තගතානි සො
උපනාමෙසි නාථස්ස ආනන්දො බුද්ධචොදිතො.

405. පාණිනා තානි පග්ගය්හ අවොච ඉසිසත්තමො:
"මහතො සාරවන්තස්ස යථා රුක්ඛස්ස තිට්ඨතො.

406. යො සො මහත්තරො ඛන්ධො පලුජ්ජෙය්‍ය අනිච්චතා,
තථා භික්ඛුනීසඞ්ඝස්ස ගොතමී පරිනිබ්බුතා.

407. අහො අච්ඡරියං මය්හං[3] නිබ්බුතායපි මාතුයා
සරීරමත්තසෙසාය නත්ථි සොකපරිද්දවො.

408. න සොචියා පරෙසං සා තිණ්ණසංසාරසාගරා
පරිවජ්ජිතසන්තාපා සීතිභූතා සුනිබ්බුතා.

409. පණ්ඩිතාසි මහාපඤ්ඤා පුථුපඤ්ඤා තථෙව ච
රත්තඤ්ඤූ භික්ඛුනීනං සා එවං ධාරෙථ[4] භික්ඛවො.

410. ඉද්ධියා ච වසී ආසි දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී ආසි ච ගොතමී.

411. පුබ්බෙනිවාසං අඤ්ඤාසි දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවපරික්ඛීණා නත්ථි තස්සා පුනබ්භවො.

412. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
පරිසුද්ධං අහු ඤාණං තස්මා සොචනියා න සා.

413. අයොඝනහතස්සෙව ජලතො ජාතවෙදසො
අනුපුබ්බූපසන්තස්ස යථා න ඤායතෙ ගති.

414. එවං සම්මා විමුත්තානං කාමබන්ධොඝතාරිනං
පඤ්ඤාපෙතුං ගති නත්ථි පත්තානං අචලං පදං.[5]

415. අත්තදීපා තතො හොථ සතිපට්ඨානගොචරා
භාවෙත්වා සත්තබොජ්ඣඞ්ගෙ දුක්ඛස්සන්තං කරිස්සථා''ති.

ඉත්ථං සුදං මහාපජාපති ගොතමී ඉමා ගාථායො අභා-සිත්ථාති.

**මහාපජාපති ගොතමී ථෙරියාපදානං සත්තමං.**

1. ඩය්හාඤ්චැසා - මජසං.
2. සඞ්කෙතං - මජසං, සහා, PTS.
3. ආනන්ද පස්ස බුද්ධස්ස - සහා.
4. ජානාථ - PTS, විඤ්ඤාථ - සහා.
5. සුඛං - සීමු, මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

402. අස්ථිධාතු ශේෂ කොට ඇති (ශරීරගත) සෙසු කොටස්හු සර්වප්‍රකාරයෙන් දැවුණාහ. එවිට අනඳ තෙරණුවෝ ද සංවේග දනවන වදන් පැවසූහ:

403. "ගොතමී නිවීමට ගියා යැ. ඇගේ සිරුර ද දැවිණ, බුද්ධ පරිනිර්වාණය නොබෝ කලකින් වෙතැයි මම සැක කරමි."

404. ඉක්බිති බුදුරදුන් විසින් මෙහෙයවන ලද ඒ අනඳ තෙරණුවෝ ගොතමී තෙරණියගේ අස්ථිධාතු ඇයගේ පාත්‍රගත කොට නාථ වූ බුදුරදුන්හට එළැවූහ.

405-406 ඒ අස්ථිධාතූන් අතින් පිළිගෙන සෘෂිශ්‍රේෂ්ඨයන් වහන්සේ (මෙසේ) වදාළ සේක: "හරඇති පවත්නා මහරුකෙක යම් ඒ ඉතා මහත්වූ කඳ යම්සේ අනිත්‍යතා හේතුයෙන් වැනසීයේ ද එසේ භික්ෂුණීසඞ්ඝයාගේ මහත්කඳ වූ ගෝතමී පිරිනිවියා යැ.

407. අහෝ ! ආශ්චර්‍ය්‍යයෙකි, සිරුර පමණක් ඉතුරු කොට මව පිරිනිවිකල්හි දු මට ශෝකයෙක් පරිදේවයෙක් නැති.

408. තරණය කළ සසර සයුරු ඇති දුරු කළ සන්තාප ඇති සිහිල් වූ මොනොවට නිවුණු ඕ මෙරමා විසින් ශොක කටයුතු නො වෙයි.

409 මහණෙනි, මෙසේ ධරවූ: ඕ පණ්ඩිත යැ, මහාප්‍රාඥ යැ, පුථුප්‍රාඥ (පැතුරුණු නුවණ ඇති) යැ, මෙහෙණන් අතර රාත්‍රඥ (පැවිදි වැ බොහෝකල් ඇතැ) යි.

410. ගොතමී සෘද්ධියෙහි වශී වූ යැ, දිබ්බසොතධාතුයෙහි (දිව කනෙහි) ද, චෙතොපරියඤාණයෙහි (පරසිත් දන්නා නුවණෙහි) ද වශී වූ.

411. පෙර විසූ කඳ පිළිවෙළ දතු, දිවැස පිරිසිදු කරන ලද, සියලු ආස්‍රවයෝ ගෙවී ගියහ, දැන් ඇයට පුනර්භවයෙක් නැති.

412. අර්ථ - ධර්ම - නිරුක්තියෙහි ද එසේ ම ප්‍රතිභානයෙහි ද (ඇගේ) ඤනය පිරිසිදු වියැ. එහෙයින් ඕ ශොක කටයුතු නො වෙයි.

413. යකුළින් පහළ පිළිවෙළින් නිවුණු දිලියෙන ගින්න ගිය තැන් යම්සේ නො පැනේ ද,

414. එසේ මොනොවට (සමුච්ඡේදප්‍රහාණ විසින් කෙලෙසුන් කෙරෙන්) මිදුණු බන්ධන සඞ්ඛ්‍යාත කාමෞඝය (හා සෙසු ඕඝ ද) තරණය කළ නිර්වාණ පදයට පැමිණි රහතුන්හට පනවන්නට (දෙව්මිනිස් ආදි) ගතියෙක් නැති.

415. එසේ හෙයින් තමා පිහිට කොට ඇති වව, සතිපට්ඨාන විෂය කොට ඇති වව. සප්තබොධ්‍යඞ්ග වඩා දුක් කෙළවර කරව "යි.

මෙසෙයින් මහාපජාපතී ගෝතමී මේ ගාථා ප්‍රකාශ කළා යැ.

**සත්වැනි මහාපජාපතී ගොතමී ථෙරාපදන යි.**

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 18. ඛෙමාපදානං.

416. පදුමුත්තරනාමජිනො සබ්බධම්මෙසු චක්ඛුමා
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

417. තදා'හං හංසවතියං ජාතා සෙට්ඨිකුලෙ අහුං
නානාරතනපජ්ජොතෙ මහාසුඛසමප්පිතා.

418. උපෙත්වා තං මහාවීරං අස්සොසිං ධම්මදෙසනං
තතො ජාතප්පසාදා'හං උපෙසිං සරණං ජිනං.

419. මාතරං පිතරං චාපි ආයාචිත්වා විනායකං
නිමන්තයිත්වා සත්තාහං භොජයිං සහසාවකං.

420. අතික්කන්තෙ ච සත්තාහෙ මහාපඤ්ඤානමුත්තමං
භික්ඛුනිං එතදග්ගම්හි ඨපෙසි නරසාරථී.

421. තං සුත්වා මුදිතා හුත්වා පුනො තස්ස මහෙසිනො
කාරං කත්වාන තං ඨානං පණිපච්ච පණිදහිං.

422. තතො මං ස[1] ජිනො ආහ "සිජ්ඣතං පණිධි තව
සඞ්ඝෙ මෙ කතං කාරං අප්පමෙය්‍යඵලං තයා.

423. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො
ගොතමො නාම ගොත්තෙන[2] සත්ථා ලොකෙ භවිස්සති.

424. තස්ස ධම්මෙසු දායාදා ඔරසා ධම්මනිම්මිතා
එතදග්ගං අනුප්පත්තා ඛෙමා නාම භවිස්සසි."

425. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසූපගා අහං.

426. තතො චුතා යාමමගං තතො'හං තුසිතං ගතා
තතො ච නිම්මානරතිං වසවත්තිපුරං තතො.

427. යත්ථ යත්ථූපපජ්ජාමි තස්ස කම්මස්ස වාහසා
තත්ථ තත්ථෙව රාජූනං මහෙසිත්තමකාරයිං.

428. තතො චුතා මනුස්සත්තෙ රාජූනං චක්කවත්තිනං
මණ්ඩලීනඤ්ච රාජූනං මහෙසිත්තමකාරයිං.

1. තතො මම – සිමු, මජසං.
2. නාමෙන – සිමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 18. ඛෙමාපදානය

416. සියලු (ලෞකික ලොකෝත්තර) දහම්හි චක්ෂුර්මත් වූ (භවත්‍රයට ම) නායක වූ පදුමුත්තර නම් ජිනේන්ද්‍රයන් වහන්සේ මෙයින් සියක් දහසක් වන කප්හි පහළ වූ සේක.

417. එකල මම හංසවතී නගරයෙහි දිලියෙන නන් රුවන් ඇති සිටු කුලයෙක උපන්නෙම් මහත් සුවයෙන් සමර්පිත ද වූමු.

418. ඒ මහාවීරයන් වහන්සේ වෙත එළැඹ දම් දෙසුම් ඇසුමු. එයින් උපන් ප්‍රසාද ඇති මම් ජිනෙන්ද්‍රයන් වහන්සේ සරණ කොට ගියා වෙමු.

419. මව ද පියා ද ආයාචනා කොට බුදුරජාණන් වහන්සේ පවරා ශ්‍රාවකයන් සහිත වූ උන්වහන්සේ සත් දිනක් වැළඳවූමු.

420. සත් දවස ඉක්ම ගිය කල්හි මහනුවණැත්තන් අතුරෙහි අග්‍ර වූ මෙහෙණක නරදම් සැරි තථාගතයන් වහන්සේ එතදග්‍රස්ථානයෙහි තබාලූ සේක.

421. එ අසා ප්‍රමුදිත වැ යළි ඒ මහර්ෂීන් වහන්සේට සත්කාර කොට වැඳ හෙවැ ඒ තනතුර ප්‍රාර්ථනා කළමු.

422. ඉක්බිති ඒ ජිනේන්ද්‍රයන් වහන්සේ "තොපගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වේවා. සඞ්ඝයා සහිත මට තොප විසින් කරන ලද සත්කාරය අප්‍රමෙය විපාක ඇත්තකි.

423. මෙයින් සියක්දහස් වන කප්හි ඔක්කාක වංසය සම්භව කොට ඇති ගොතින් ගෝතම නම් වූ ශාස්තෲන් වහන්සේ ලොවැ පහළ වන සේක.

424. (තෙපි) ඔබ ධර්මයට හිමිවූ ධර්මයෙන් නිර්මිත වූ ඒතදග්‍රයට පැමිණි ඛෙමා නම් ඖරස ශ්‍රාවිකා වන්නහු."

425. ඒ කුශල කර්ම හේතුයෙන් ද චේතනා ප්‍රණිධි හෙතුයෙන් ද මම මිනිස් කය හැරපියා තව්තිසා දෙව්ලොවට පැමිණියා වෙමි.

426. එයින් සැව යාමදෙව්ලොවට ගියමු, මම එයින් තුසිතයට ගියමු, එයින් නිර්මාණරතියට ද එයින් පරනිර්මිතවශවර්ති දෙව් ලොවට ද ගියමු.

427. යම් යම් තෙනෙක උපනුමු ද, ඒ (කුශල) කම් බලයෙන් ඒ ඒ තන්හි රජුනට මෙහෙසිබව කරවූමු.

428. එයින් සැව මිනිසත් බවහි සක්විති රජුනට ද, පෙදෙසි රජුනට ද මෙහෙසි බව කරවූමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

429. සම්පත්තිං අනුභොත්වාන දෙවෙසු මනුජෙසු ච
සබ්බත්ථ සුඛිතා හුත්වා නෙකකප්පෙසු සංසරිං.

430. එකනවුතෙ ඉතො[1] කප්පෙ විපස්සී ලොකනායකො
උප්පජ්ජි චාරුනයනො[2] සබ්බධම්මවිපස්සකො.

431. තමහං ලොකනායකං උපෙච්චා නරසාරථිං
ධම්මං පණීතං සුත්වාන පබ්බජිං අනගාරියං.

432. දසවස්සසහස්සානි තස්ස වීරස්ස සාසනෙ
බ්‍රහ්මචරියං චරිත්වාන යුත්තයොගා බහුස්සුතා,

433. පච්චයාකාරකුසලා චතුසච්චවිසාරදා
නිපුණා චිත්තකථිකා සත්ථුසාසනකාරිකා.

434. තතො චුතාහං තුසිතං උපපන්නා යසස්සිනී
අභිභොසිං තහිං අඤ්ඤෙ බ්‍රහ්මචරියඵලෙන'හං.

435. යත්ථ යත්ථූපපන්නා'හං මහාභොගා මහද්ධනා
මෙධාවිනී රූපවතී[3] විනීතපරිසා'පි ච.

436. භවාමි තෙන කම්මෙන යොගෙන ජිනසාසනෙ
සබ්බා සම්පත්තියො මය්හං සුලභා මනසො පියා.

337. යොපි මෙ භවතෙ භත්තා යත්ථ යත්ථ ගතායපි
විමානෙති න මං කොචි පටිපත්තිඵලෙන මෙ.

438. ඉමස්මිං[4] භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධු මහායසො
නාමෙන කොණාගමනො උප්පජ්ජි වදතං වරො.

439. තදහං[5] බාරාණසියං සුසමිද්ධ[6]කුලප්පජා
ධනඤ්ජානි සුමෙධා ච අහම්පි ච තයො ජනා.

440. සඞ්ඝාරාමමදාසිම්හ දානසහායිකා පුරෙ[7]
සඞ්ඝස්ස ච විහාරම්පි[8] උද්දිස්ස කාරිකා[9] මයං.

---

1. එකනවුතිතො – මජසං.
2. චාරුදස්සනො – මජසං.
3. සීලවතී
4. ඉමම්හි – මජසං
5. තදහි – මජසං.
6. සුසමිද්ධි – සයා.
7. නෙකසහායිකා මුනෙ – සයා.
දානං සහායිකා මුනෙ - PTS.
8. සඞ්ඝස්ස විහාරංහි - සයා, PTS.
9. දායිකා - PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

429. දෙවියන් කෙරෙහි ද මිනිසුන් කෙරෙහි ද සැපත් වළඳා සැම තන්හි සුවපත් වැ නොයෙක් කප්හි හැසුරුණුමු.

430. මෙයින් එක් අනූවන කප්හි මනහර නුවන් ඇති සියලු ධර්මයන් දක්නා විදර්ශී නම් ලොකනාථයන් වහන්සේ උපන් සේක.

431. මම නරසාරථී වූ ඒ ලෝකනාථයන් වහන්සේ වෙත එළැඹැ ප්‍රණීත ධර්මය අසා (ඔබ) සසුන්හි පැවිදි වූමු.

432, 433. දස දහස් වසරක් ඒ වීරයන් වහන්සේගේ සසුන්හි බඹසර සරා ශමථ-විදර්ශනා භාවනානුයොගී වැ බහුශ්‍රුත වැ (පර්‍යාප්ති- ප්‍රතිපත්ති දෙක්හි) නිපුණ වැ චිත්‍ර කථා ඇති වැ ශාස්තෘන් වහන්සේගේ අනුසසුන් කරන්නක් වැ වුසුමු.

434. එ අත් බැවින් සැවැ තුෂිත දෙව්ලොවැ යශස් ඇති වැ උපන්මු. බඹසර බෙලෙන් එහි සෙසු දෙවියන් අභිභවා සිටියා වෙමි.

435, 436. යම් යම් තෙනෙකැ මම් (උපත් විසින්) එළැඹියෙම් ද, ඒ (ඒ තෙනැ) මහාභොග-මහාධන ඇති වූමු, නුවණැති වූමු, රූමත් වූමු, වැළි විනීතපිරිස් ඇති වූමු. ඒ කුශල කර්මයෙන් බුදුසසුන්හි බ්‍රහ්ම-චර්‍යයොග හෙතුයෙන් චිත්තප්‍රිය වූ සියලු සම්පත්තිහු මට සුලභ වූහු.

437. (උත්පත්ති වශයෙන්) යම් යම් තෙනකට ගියා වූ ද මාහට යම් කිසිවෙක් ස්වාමී පුරුෂ වේ ද, හේ මාගේ (පූර්ව) ප්‍රතිපත් ඵල හේතුයෙන් මට අවමන් නො කරයි.

438. මේ භද්‍ර කල්පයෙහි බ්‍රාහ්මණගොත්‍රික මහායශස් ඇති කොණාගමන නම් වූ බුදුරජාණන් වහන්සේ (ලොවැ) පහළ වූ සේක.

439, 440. එකලැ මම බරණැසැ බොහෝ සමෘද්ධිමත් කුල යෙකැ දුහිතෘවක් වූමු. පෙර (අත්බව්හි) දනසභායිකා වූ ධනඤ්ජානී යැ, සුමෙධා යැ මම් යැ යන අපි තිදෙන මහසඟනට අරමක් දුනුම්හ. සඟන උදෙසා වෙහෙරක් ද කරවූම්හ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

441. තතො චුතා මයං සබ්බා තාවතිංසූපගා අහුං
යසසා අග්ගතං පත්තා මනුස්සෙසු තථෙව ච.

442. ඉමස්මිං යෙව කප්පම්හි බ්‍රහ්මබන්ධු මහායසො
කස්සපො නාම ගොත්තෙන[1] උප්පජ්ජි වදතං වරො.

443. උපට්ඨාකො මහෙසිස්ස තදා ආසි නරිස්සරො
කාසිරාජා කිකී නාම බාරාණසිපුරුත්තමෙ.

444. තස්සා'සිං ජෙට්ඨිකා ධීතා සමණී ඉති විස්සුතා
ධම්මං සුත්වා ජිනග්ගස්ස පබ්බජ්ජං සමරොචයිං.

445. අනුජානි න නො තාතො අකාරෙව තදා මයං.
වීසවස්සසහස්සානි විචරිම්හ අතන්දිතා.

446. කොමාරිබ්‍රහ්මචරියං රාජකඤ්ඤා සුඛෙධිතා
බුද්ධූපට්ඨානනිරතා මුදිතා සත්ත ධීතරො.

447. සමණී සමණගුත්තා ච භික්ඛුනී භික්ඛුදාසිකා[2]
ධම්මා චෙව සුධම්මා ච සත්තමී සඞ්ඝදාසිකා[3]

448. අහං උප්පලවණ්ණා ච පටාචාරා ච කුණ්ඩලා
කිසාගොතමී ධම්මදින්නා විසාඛා හොති සත්තමී.

449. කදාචි සො නරාදිච්චො ධම්මං දෙසෙති අබ්භුතං
මහානිදානසුත්තන්තං සුත්වා තං පරියාපුණිං.

450. තෙහි කම්මෙහි සුකතෙහි චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

451. පච්ඡිමෙ ච භවෙදානි සාගලායං පුරුත්තමෙ
රඤ්ඤො මද්දස්ස ධීතාම්හි මනාපා දයිතා පියා.

452. සහ මෙ ජාතමත්තම්හි ඛෙමං තම්හි පුරෙ අහු
තතො ඛෙමාති නාමං මෙ ගුණතො උපපජ්ජථ.[4]

453. යදාහං යොබ්බනං පත්තා රූපලාවඤ්ඤභූසිතා[5]
තදා අදාසි මං තාතො බිම්බිසාරස්ස රාජිනො.

1. තාරෙන - සිමු.
2. භික්ඛුදායිකා – මජසං, PTS.
3. සඞ්ඝදායිකා – මජසං, PTS.
4. ගුණිතං උපපජ්ජථ - PTS.
5. රූපලාවණ්ණ විභූසිතා – සතා.
රූපවන්තා විභූසිතා – PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

441. එයින් සැවැ අපි සියල්ලෝ තව්තිසා දෙව්ලොවැ උපනුම්හ. යශසින් අගතැන් පැමිණියමු, මිනිසුන් කෙරෙහි ද එසේමැ යි.

442. මේ කල්පයෙහි ම බ්‍රාහ්මණවංශික මහායශස් ඇති ගෝත්‍රයෙන් කාශ්‍යප නම් වූ ශාස්තෲන් වහන්සේ (ලොවැ) පහළ වූ සේකැ.

443. එකලැ බරණැස් පුරවරයෙහි මහර්ෂි බුදුරජාණන් වහන්සේ ගේ උපස්ථායක වූ නරේශ්වර කිකී නම් කසී රජෙක් වූයේ යැ.

444. එ රජුහට සමණී යයි විශ්‍රුත වූ දෙවු දියණි වූ මම ජිනේන්ද්‍රයන් වහන්සේගේ ධර්මය අසා පැවිද්ද රිසි වූමු.

445, 446. පිය තෙමේ අපගේ පැවිද්ද නො අනුදත්තේ යැ. එකලැ අපි හවුරුදු විසිදහසක් මුළුල්ලෙහි අනලස් වැ කුමරි බඹසර වුසුම්හ, රාජදුහිතෘ වූ සුවසේ වැඩුණු බුද්ධොපස්ථානයෙහි නිරතුරු ඇලුණු ප්‍රමුදිත වූ (කිකී රජුගේ) සත් දියණිවරු නම්:

447. සමණී යැ සමණගුත්තා යැ භික්ඛුනී යැ භික්ඛුදසිකා යැ ධම්මා යැ සුධම්මා යැ සත්වැනි සඞඝදසී යැ යන මොහු යි.

448. (මෙ කලැ) මම යැ උප්පලවණ්ණා යැ පටාචාරා යැ කුණ්ඩලා (කුණ්ඩල කෙසී) යැ කිසාගොතමී යැ ධම්මදින්නා යැ (යන අපි වෙමු) විශාඛා උවැසි සත්වැනි වෙයි.

449. ඒ නරශ්‍රෙෂ්ඨ (කාශ්‍යප) බුදුරජාණන් වහන්සේ කිසි විටෙකැ ආශ්චර්‍ය ජනක දහම් දෙසන සේකැ, මහානිදන සූත්‍රාන්තය අසා එය ප්‍රගුණ කළමු.

450. ඒ කුශල කර්මහේතුයෙන් ද, චේතනාප්‍රණිධි හේතුයෙන් ද මිනිස් කය හැරපියා තව්තිසාවට (උපත් විසින්) ගියමු.

451. දන් පැසුළු බෙවෙහි උතුම් සාගල නුවර මැද රජගේ මනවඩන දයාජනක ප්‍රිය වූ දුහිතෘ වෙමි.

452. මා උපන් කෙණෙහි ඒ සමග ම එ නුවර ක්‍ෂෙම (-නිර්භය) වියැ, එහෙයින් මට ඛෙමා යන නාම ගුණ වශයෙන් ලැබිණි.

453. රූපලාවණ්‍යයෙන් භූෂිත වූ මා යම් කලෙකැ යොවුන් බවට පැමිණියා ද, එකලැ පිය තෙමේ මා බිම්සර රජහට (මෙහෙසි කොට) දුන්නේ යැ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

454. තස්සාහං සුප්පියා ආසිං රූපකෙලායනෙ රතා
රූපානං දෙසවාදීති න උපෙසිං මහාදයං.

455. බිම්බිසාරො තදා රාජා මමානුග්ගහබුද්ධියා
වණ්ණයිත්වා වෙළුවනං ගායකෙ ගාපයී මමං.

456. “රම්මං වෙළුවනං යෙන න දිට්ඨං සුගතාලයං
න තෙන නන්දනං දිට්ඨං ඉති මඤ්ඤාමසෙ මයං.

457. යෙන වෙළුවනං දිට්ඨං නරනන්දනනන්දනං
සුදිට්ඨං නන්දනං තෙන අමරින්දසුනන්දනං.

458. විහාය නන්දනං දෙවා ඔතරිත්වා මහීතලං[1]
රම්මං වෙළුවනං දිස්වා න තප්පන්ති සුවිම්හිතා.

459. රාජපුඤ්ඤෙන නිබ්බත්තං බුද්ධපුඤ්ඤෙන භූසිතං
කො වත්තා තස්ස නිස්සෙසං වනස්ස ගුණසඤ්චයං.”

460. තං සුත්වා වනසමිද්ධිං මම සොතමනොහරං
දට්ඨුකාමා තමුය්‍යානං රඤ්ඤො ආරොචයිං තදා.

461. මහතා පරිවාරෙන තදා ච[2] සො මහීපති
මං පෙසෙසි[3] තමුය්‍යානං දස්සනාය සමුස්සුකං.

462. “ගච්ඡ පස්ස මහාභොගෙ වනං නෙත්තරසායනං
යං සදා භාති සිරියා සුගතාභානුරඤ්ජිතං.”

463. යදා ච පිණ්ඩාය මුනි ගිරිබ්බජපුරුත්තමෙ
පවිට්ඨො’හං තදායෙව වනං දට්ඨුමුපාගමිං.

464. තදා’හං ඵුල්ලවිපිනං නානාභමරකූජිතං
කොකිලාගීතසහිතං මයූරගණනච්චිතං.

465. අප්පසද්දමනාකිණ්ණං නානාචඞ්කමභූසිතං
කුටිමණ්ඩපසඞ්කිණ්ණං යොගීවරවිරාජිතං.

466. විචරන්තී අමඤ්ඤිස්සං ‘සඵලං නයනං මම.’
තත්ථාපි තරුණං භික්ඛුං යුත්තං දිස්වා විචින්තයිං:

---

1. මහීතලෙ - සයා, PTS.
2. මං - සයා, PTS.
3. සම්පෙසෙසි - සයා,
සම් පාපෙසි' - PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

454. රූපයෙහි මමායනයෙන් ඇලුණු මම ඒ රජුට අතිශයින් ප්‍රිය වූමු. රූපයෙහි දෙස් පවසතැ යි මහාකාරුණික බුදුරදුන් වෙතැ නො එළඹුණෙමු.

455. එකල්හි බිම්සර මහරජ මට අනුග්‍රහ බුද්ධියෙන් වේළුවනය වර්ණනා කරවා ගායකයන් ලවා මා උදෙසා ගායනා කරවී.

456. "බුදුරදුන්ගේ ගඳකිළිය පිහිටි රම්‍ය වූ වේළුවනය යමකු විසින් නො දක්නා ලද නම් ඔහු නන්දන වනය නොදක්නා ලද යි අපි හඟනෙමු.

457. යමක්හු විසින් නරපුත්‍රයන්ට නන්දන වූ සතුටු එළවන (වෙළුවනය) දක්නා ලද ද ඔහු විසින් දෙවියන්ට අතිශයින් සතුටු එළවන නඳුනුයන දක්නා ලද වෙයි.

458. දෙවියෝ නඳුනුයන හැරපියා මිහිතලයට බැස රම්‍ය වූ වේළුවනය දක බෙහෙවින් විස්මිත වූවාහු තෘප්තිමත් නො වෙත්.

459. රජුගේ පිනින් උපන්, බුදුරදුන්ගේ පිනින් මනරම් වූ යම් වනයෙක් වේ ද, ඒ වනයාගේ ගුණසමුදයය කවරෙක් නොඅඩු වැ කියන්නේ ද,"

460. එවිටැ මාගේ කනට මිහිරි වූ ඒ වනසමෘද්ධිය අසා එ උයන දකිනු රිසි වැ රජුට සැලකළමු.

461. එවිටැ ඒ මිහිපල් තෙමෙ එ උයන දක්නට උත්සුක වූ මා මහත් පිරිවරින් (උයනට) යැවී.

462. මහාභෝග ඇත්ත, සුගතයන් වහන්සේගේ ප්‍රභායෙන් යළි යළි රැඳුණු යම් වනයක් සැමද බබළා ද, යා, නෙත්‍රරසායන "නෙත්කලු" එ වනය බල.

463. යම් දිනෙක මුනීන්ද්‍රයන් වහන්සේ පිඬු පිණිස ගිරිව්‍රජ (රජගහ) පුරවරයට වැඩිසේක් ද එදින මම වේළුවනය දක්නට එළඹුණෙමු.

464-466. එදවසැ මම නානා බමරුන්ගේ ගුමු ගුමු රැව් ඇති කෙවිල්ලන්ගේ ගී හඬ සහිත වූ මොනර ගණයාගේ නැටුම් ඇති, විරල මිනිස් හඬ ඇති ජනාකීර්ණ නොවූ නොයෙක් සක්මන් මළුයෙන් ශොභනා කුටිමණ්ඩපයෙන් ගැවසුණු යොගීවරයන්ගෙන් බැබැළුණු පිපුණු උයනට පිවිසැ හැසිරෙනුයෙම් 'මාගේ නෙත් සඵල විණැ''යි සිතුමු. එහි දු යොගාවචර (-භාවනානුයොගී) තරුණ මහණ කෙනෙකුන් දක (මෙසේ) සිතුමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

467. ඊදිසෙ'පි වනෙ[1] රම්මෙ ඨිතො'යං නවයොබ්බනෙ
වසන්තමිව කන්තෙන රූපෙන ච සමන්විතො.

468. නිසින්නො රුක්ඛමූලම්හි මුණ්ඩො සඞ්ඝාටිපාරුතො
ඣායතෙ වත'යං භික්ඛු හිත්වා විසයජං රතිං.

469. නනු නාම ගහට්ඨෙන කාමං භුත්වා යථාසුඛං
පච්ඡා ජිණ්ණෙන ධම්මො'යං චරිතබ්බො සුභද්දකො.

470. සුඤ්ඤකන්ති විදිත්වාන ගන්ධගෙහං ජිනාලයං
උපෙත්වා ජිනමද්දක්ඛිං උදයන්තංව භාකරං.

471. එකකං සුඛමාසීනං වීජමානා[2] වරිත්ථියා
දිස්වානෙවං විචින්තෙසිං 'නායං ලූඛො නරාසභො.'

472. සා කඤ්ඤා කනකාභාසා පදුමානනලොචනා
බිම්බොට්ඨී කුන්දදසනා මනොනෙත්තරසායනා.

473. හෙමදොලාභසවනා කලසාකාර[3]සුත්ථනී
තනුමජ්ඣා ච සුස්සොණී[4] රම්භොරු[5] චාරුභූසනා.

474. රත්තංසුකුපසබ්‍යානා[6] නීලමට්ඨනිවාසනා
අතප්පනෙය්‍යරූපෙන[7] හාවභාවසමන්විතා[8]

475. දිස්වා තමෙවං චින්තෙසිං "අහො'යං අභිරූපිනී
න මයා'නෙන නෙත්තෙන දිට්ඨපුබ්බා කුදාචනං."

476. තතො ජරාභිභූතා සා විවණ්ණා විතතානනා
භින්නදන්තා සෙතසිරා සලාලවදනා'සුචි.

477. සඞ්ඛිත්තකණ්ණා සෙතක්ඛී ලම්බාසුභපයොධරා
වලිවිතතසබ්බඞ්ගී සිරාවිතතදෙහිනී.

478. නතඞ්ගා දණ්ඩදුතියා උප්පණ්ඩුප්පණ්ඩුකා[9] කිසා
පවෙධමානා පතිතා නිස්සසන්තී මුහුං මුහුං.

---

1. ඊදිසෙ විපිනෙ - මජසං.
2. විජමානං - මජසං.
3. කලිකාකාර - මජසං.
4. වෙදිමජ්ඣාව සුස්සොණී - මජසං.
වෙදිමජ්ඣා වරසොණී - ස්‍යා, PTS.
5. රම්භොරූ - ස්‍යා, PTS.
6. රත්තංසුකසුසංවීතා - PTS.
7. අනප්පනෙය්‍යරූපෙන - සීමු.
8. සබ්බාභරණභූසිතා - ස්‍යා.
9. උප්පාසුලිකතා - මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

467. මෙබඳු සිත්කලු වෙනෙහි වසන තව යොවුන් වියෙහි සිටි මේ මහණ රූපයෙන් සමන්විත ද වෙයි, කාන්තියෙන් වසන්තය මෙනි.

468. මුඩු වූ මෙ මහණ සහළ සිවුරු පෙරවැ (රූපාදි) විෂයප රතිය (ඇල්ම) හැරපියා රුක් මුල්හි හුන්නේ ධ්‍යාන කරනුයේ වනැ.

469. ගෘහසථයා විසින් සුවසේ කම් සැප විඳ පසුවැ ජරාවට පැමිණියහු විසින් මෙ ධර්මය සැරියයුතුයැ. එය සුභද්‍ර (යහපත්) නො වන්නේ නො?

470. සිස් යයි (-බුදුරදුන් නැතැ යි) සිතා ජිනාලය (ජිනෙන්ද්‍රයන්ගේ වාසසථානය) වූ ගඳකිළියට එළැඹැ උදහිරු වැනි ජිනෙන්ද්‍රයන් දුටුමු.

471. පවන් සලන වරඟනක සමග එකලා වැ සුවසේ වැඩ හුන් මුනිඳුන් දැක 'මේ නරශ්‍රෙෂ්ඨයා රූක්‍ෂ නො වෙති'යි මෙසේ සිතුමු.

472. එ යුවතිය රන්වන් පැහැ ඇත්තක, පියුම් බඳු මුහුණ හා නෙත් ඇත්තක, බිඹුපල වන් ලවන් ඇත්තක, කොඳවන් දසන් ඇත්තක, මන නුවන් පිනවන්නක.

473. රනෝවිලි වන් සවන් ඇත්තක, කලස් වැනි මනා පියොවුරු ඇත්තක, සිහිනිඟ ඇත්තක, මනා උකුල් පෙදෙස් ඇත්තක, රඹ වන් ඌරු ඇත්තක, මනහර අබරණ ඇත්තක.

474. රතු වස්ත්‍ර පොරෝනා හැඳි නිල්වන් මටසිලුටු වස්ත්‍ර ඇති තෘප්තියට නො පැමිණියහොත් රූපයෙන් යුතු ඕ භාවභාවයෙන් සමන් විත වූ යැ.

475. ඇය දැක මෙසේ සිතුමු. ආශ්චර්‍යයෙකි! මේ අභිරූපිකාව කිසි කලෙකත් මේ ඇසින් මා නුදුටුවීරු යැ.

476. ඉක්බිති ඕ ජරාවෙන් මඩනාලදූ වැ විවණ් වැ පුළුල් මුව ඇති වැ බුන් දත් ඇති වැ සුදු කෙහෙ ඇති වැ කෙලතොලු වැ අපිරිසිදු වැ-

477. හැකුළුණු කන් ඇති වැ සුදුවන් නෙත් ඇති වැ එල්බෙන අශුභ වූ පියොවුරු ඇති වැ රැළි වැටුණු සියලඟ ඇති වැ නහර ඉල්පුණු සිරුරැති වැ-

478. වක්වූ කය ඇති වැ සැරයටිය දෙවැනි වැ බෙහෙවින් පඩුවන් වැ කෘශ වැ වෙවුළුම් ඇති වැ වරින් වර නිශ්වාස කෙරෙමින් ඇද වැටුණා යැ.



* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

479. තතො මෙ ආසි සංවෙගො අබ්භුතො ලොමහංසනො
ධිරත්ථු රූපං අසුචිං රමන්ති යත්ථ බාලිසා.

480. තදා මහාකාරුණිකො දිස්වා සංවිග්ගමානසං
උදග්ගචිත්තො සුගතො[1] ඉමා ගාථා අභාසථ:

481. "ආතුරං අසුචිං පූතිං පස්ස ඛෙමෙ සමුස්සයං
උග්ඝරන්තං පග්ඝරන්තං බාලානං අභිනන්දිතං.

482. අසුභාය චිත්තං භාවෙහි එකග්ගං සුසමාහිතං
සති කායගතා ත්‍යත්ථු නිබ්බිදබහුලා භව.

483. යථා ඉදං තථා එතං යථා එතං තථා ඉදං
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච කායෙ ඡන්දං විරාජය.

484. අනිමිත්තඤ්ච භාවෙහි මානානුසයමුජ්ජහ
තතො මානාභිසමයා උපසන්තා චරිස්සසි.

485. යෙ රාගරත්තානුපතන්ති සොතං
සයං කතං මක්කටකොව ජාලං
එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති
අනපෙක්ඛිනො[2] කාමසුඛං පහාය."

486. තතො කලලිතචිත්තං[3] මං ඤත්වාන නරසාරථී
මහානිදානං දෙසෙසි සුත්තන්තං විනයාය මෙ.

487. සුත්වා සුත්තන්තසෙට්ඨං තං පුබ්බසඤ්ඤමනුස්සරිං
තත්ථ ඨිතාව'හං සන්තී ධම්මචක්ඛුං විසොධයිං.

488. නිපතිත්වා මහෙසිස්ස පාදමූලම්හි තාවදෙ
අච්චයං දෙසනත්ථාය ඉදං වචනමබ්‍රවිං:

489. "නමො තෙ සබ්බදස්සාවි නමො තෙ කරුණාකර
නමො තෙ තිණ්ණසංසාර නමො තෙ අමතංදද.

---

1. සුමනො – සයා.
2. න පෙක්ඛිනො – මජසං,
3. කලලිකචත්තං – සයා.
කලිකචිත්තං – PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

479. ඒ හෙතුයෙන් මාහට "යමෙක්හි අඥබාලයෝ ඇලෙත් ද ඒ අපවිත්‍ර රූපයට නිඥ වේවා"යි නොවූ විරූ ලොමුදහගන්වන සංවේගයෙක් වූයේ යි.

480. එකල්හි මහාකාරුණික වූ උඩුහුරු සිතැති සුගතයන් වහන්සේ සංවිග්න මනසැති මා දැක මෙ ගාථා වදළ සේක.

481. "ධෙමාවති, (රොගාදියෙන්) ආතුර වූ (දෙතිස් කුණප හෙයින්) අපවිත්‍ර වූ කුණු වූ (පූයා) උතුරන වැගිරෙන අඥයන් විසින් (තෘෂ්ණා විසින්) අභිනන්දිත වූ කය බලව,

482. අසුභානුපස්සනා සම්පාදනය පිණිස සිත (උපචාර සමාධි විසින්) එකඟ කොට (අර්පණා සමාධි විසින්) සුසමාහිත කොට වඩව. තොපට කායගතාසතිය වේවා. (පස්කඳෙහි කලකිරීම් සංඛ්‍යාත) නිර්විදව බහුල කොට ඇති වව.

483. මෙ අධ්‍යාත්මකාය යම්සේ ද තෙල බාහිරකයත් එසේ යැ, තෙල බාහිර කය යම්සේ ද මෙ අධ්‍යාත්ම කයත් එසේ යැ යි අධ්‍යාත්ම වූත් බාහිරවූත් කයෙහි කාමච්ඡන්දය දුරු කර.

484. (නිත්‍යනිමිති රහිත හෙයින්) අනිමිත්ත (නම් වූ අනිත්‍ය) සංඥව වඩව, මානානුශය උපුටාලව, ඉක්බිති මානයාගේ ප්‍රහාණාභිසමයෙන් උපශාන්ත වැ හැසිරෙන්නෙහි.

485. යම් කෙනෙක් රාගයෙන් ඇලුණාහු වෙත් ද, තමා කළ දැලෙහි වැටෙන මකුළුවා සෙයින් උහු පුන පුනා ශොකයට වැටෙත්. අපෙක්‍ෂා රහිතයෝ තෙල රාගය සිඳ කම්සුව හැරපියා සසර හැරයෙත්"යි.

486. නරසාරථී වූ සර්වඥයන් වහන්සේ (අශ්‍රද්ධාදියෙන් දුරු වැ මතු දෙශනාවට බඳුන් වැ සිටුනා හෙයින්) කම්ණ්‍ය වූ සිතැති මා දැන හික්මෙනු පිණිස මට මහානිදාන සූත්‍රාන්තය දෙශනා කළ සේක.

487. ඒ උතුම් සූත්‍රාන්තය ශ්‍රවණ කොට පෙර (කසුප් බුදුන් සෙමෙහි භාවිත (මහානිදාන සූත්‍රාන්ත) සංඥව සිහි කළමු. එහි සිටියා වූ මැ මම ධම්වක්‍ෂුස (–සොතාපත්තිමග්ග ඥාණය) පිරිසුදු කළමු.

488. එකෙණෙහි මහර්ෂීන් වහන්සේගේ පාමුල වැඳ වැටී (කළ) වරද දෙසනු පිණිස මෙ වදන් කීමු.

489. සියල්ල දක්නාසුලු උතුමාණනි, තොපට නමස්කාර වේවා. කරුණාකරයාණනි, තොපට නමස්කාර වේවා. සසර තරණය කළ මහතාණනි, තොපට නමස්කාර වේවා. අමෘතදයකයාණනි, තොපට නමස්කාර වේවා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

490. දිට්ඨිගහනපක්ඛන්තා[1] කාමරාගවිමොහිතා
තයා සම්මා උපායෙන විනීතා විනයෙ රතා.

491. අදස්සනෙන විබ්භොගා තාදිසානං මහෙසිනං
අනුභොන්ති මහාදුක්ඛං සත්තා සංසාරසාගරෙ.

492. යද'හං ලොකසරණං අරණං මරණන්තගුං[2]
නාද්දසාසිමදූරට්ඨං දෙසයාමි[3] තමච්චයං.

493. මහාහිතං වරදදං අහිතොති විසඞ්කිතං
නොපෙසිං රූපනිරතා දෙසයාමි තමච්චයං."

494. තදා මධුරනිග්ඝොසො මහාකාරුණිකො ජිනො
අවොච 'තිට්ඨ ඛෙමෙ'ති සිඤ්චන්තො අමතෙන මං.

495. තදා පණමිය සිරසා කත්වා ච නං පදක්ඛිණං
ගන්ත්වා දිස්වා නරපතිං ඉදං වචනමබ්‍රවිං.

496. "අහො සම්මාඋපායො තෙ චින්තිතො'යමරින්දම
වනදස්සනකාමාය දිට්ඨො නිබ්බානදො මුනි.

497. යදි තෙ රුච්චතෙ රාජ[4] සාසනෙ තස්ස තාදිනො
පබ්බජිස්සාමි රූපෙ'හං නිබ්බින්නා මුනිවාණිනා.[5]

**භාණවාරං දුතියං.**

498. අඤ්ජලිං පග්ගහෙත්වාන තදාහ ස මහීපති
"අනුජානාමි තෙ භද්දෙ පබ්බජ්ජා තව සිජ්ඣතු."

499. පබ්බජිත්වා තදාවාහං අඩ්ඪමාසෙ[6] උපට්ඨිතෙ
දීපොදයඤ්ච භෙදඤ්ච දිස්වා සංවිග්ගමානසා.

500. නිබ්බින්නා සබ්බසඞ්ඛාරෙ පච්චයාකාරකොවිදා
චතුරොඝෙ අතික්කම්ම අරහත්තමපාපුණිං.

501. ඉද්ධියා ච වසී ආසිං දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී චාපි භවාමහං.

---

1. පක්ඛන්දා - මජසං.
2. මරණන්තගං - සයා.
3. දෙසෙස්සාමි - සයා.
4. රාජා - සයා.
5. මුනිභාණිනා - සයා, PTS.
6. සත්තමාසෙ - සයා, PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

490. දෘෂ්ටිගහන(-වන)යට වැදුණු කාමරාගයෙන් බෙහෙවින් මුළා වූ මම සම්‍යග්උපායෙන් තොප විසින් හික්මවන ලදුයෙම් විනයෙහි ඇලුණා වෙමි.

491. තොප වැනි මහර්ෂීන්ගේ නො දක්මෙන් (සම්‍යග් මාර්ගයෙන්) වෙන් වූ සත්‍වයෝ සසර සයුරෙහි (ගිලී) මහදුක් විඳිති.

492. යම් කලෙක මම ලොවට පිහිට වූ කෙලෙස් රහිත වූ මරණාන්තයට ගිය නුදුරු අරම්හි වැඩ සිටුනා බුදුරදුන් නුදුටුයෙම් ද ඒ වරද දෙසමි.

493. මහාහිත වූ නිර්වාණදයක වූ (මා විසින්) අහිත යයි හැක කරන ලද බුදුරදුන් වෙතැ රූපලාලනයෙහි නිරත වූ යෙම් නො එළැඹුණුමු. ඒ වරද දේශනා කරමි'යි කියා යි.

494. එකල්හි මහා කාරුණික වූ ජිනේන්ද්‍රයන් වහන්සේ මා අමා දියෙන් ඉසිනසේක් මිහිරි වූ ගැඹුරුඝොස ඇති වැ 'බෙමාවනි, නැඟී සිටුව'යි වදළ සේකැ.

495. එවිටැ මස්තකයෙන් නැමැද ඔබ ප්‍රදක්ෂිණා ද කොට (රජ ගෙට) ගොස් රජු දැක මෙ වදන් පැවසූමු.

496. "රජතුමනි, පුදුමයෙකි. ඔබ විසින් මේ සම්‍යග්උපාය සිතන ලද යැ, උයන දකිනු රිසි ඇත්ත විසින් නිර්වාණදයක මුනිඳු දක්නා ලදී.

497. මහරජ, ඉදින් තොපට රිසි වේ නම් අකම්ප්‍ය ගුණ ඇති ඒ බුදුන්ගේ සසුන්හි පැවිදි වන්නෙමි, බුදු වදනින් මම රූපයෙහි කලකිරුණා වෙමි.

**දෙවැනි බණවර යි.**

498. එවිටැ ඒ මිහිපල් තෙමෙ ඇඳිලි බැඳ "සොඳුර තොපට (පැවිද්ද) අනුදනිමි. තොපගේ පැවිද්ද සිද්ධ වේවා."

499. එකල්හි මම පැවිදි වැ අඩමසක් එළැඹැසිටි කල්හි පහන දැල්වීමත් නිවීමත් දැක සංවිග්නමනස් ඇතියෙම්-

500. සියලු සංස්කාරයෙහි කලකිරුණෙම ප්‍රත්‍යයාකාරයෙහි දක්ෂ වැ වතුරොස ඉක්මැ රහත් බවට පැමිණියමු.

501. මම සෘද්ධියෙහිද දිබ්බසොතධාතුයෙහි ද වශී වූමු. චෙතො පරියඤාණයෙහි (-පරසිත් දන්නා නුවණෙහි) දු වශී වූවා වෙමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

502. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

503. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
පරිසුද්ධං මම ඤාණං උප්පන්නං බුද්ධසාසනෙ.

504. කුසලා'හං විසුද්ධීසු කථාවත්ථු විසාරද
අභිධම්මනයඤ්ඤූ ච වසිප්පත්තා'ම්හි සාසනෙ.

505. තතො භොජනවත්ථුස්මිං[1] රඤ්ඤා කොසලසාමිනා
පුච්ඡිතා නිපුණෙ පඤ්හෙ ව්‍යාකරොන්ති යථාතථං.

506. තද ස රාජා සුගතං උපසඞ්කම්ම පුච්ඡථ
තථෙව බුද්ධො ව්‍යාකාසි යථා තෙ ව්‍යාකතා මයා.

507. ජිනො තස්මිං ගුණෙ තුට්ඨො එතදග්ගෙ ඨපෙසි මං
"මහාපඤ්ඤානමග්ගාති භික්ඛුනීනං නරුත්තමො.

508 – 510. කිලෙසා ඣාපිතා මය්හං –පෙ– කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ඛෙමා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

ඛෙමාථෙරියාපදානං අට්ඨමං.

## 19. උප්පලවණ්ණාපදානං

511. භික්ඛුනී උප්පලවණ්ණා ඉද්ධියා පාරමිංගතා
වන්දිත්වා සත්ථුනො පාදෙ ඉදං වචනමබ්‍රවි.

512. නිත්තිණ්ණා ජාතිසංසාරං[2] පත්තා'හං අචලං පදං
සබ්බදුක්ඛා මයා ඛීණං ආරොචෙමි මහාමුනි.

513. යාවතා පරිසා අත්ථි පසන්නා ජිනසාසනෙ
යෙසඤ්ච[3] මෙ'පරාධො'ත්ථි ඛමන්තු ජිනසම්මුඛා.

514. සංසාරෙ සංසරන්තාය[4] ඛලිතං මෙ සචෙ භවෙ
ආරොචෙමි මහාවීර අපරාධං ඛමස්සු තං[5]

1. තොරණවත්ථුස්මිං – මජසං, සයා, PTS.
2. ජාතිසංසාරා – මජසං.
3. යස්සා ච – මජසං.
4. සංසරන්තියා – මජසං.
සංසරන්තා මෙ – සයා.
5. මෙ – සයා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

502. පෙර විසූකඳපිළිවෙළ දනිමි, දිවැස පිරිසුදු කරන ලද, සියලු ආස්‍රවයෝ ගෙවී ගියහ, දැන් පුනර්භවයෙක් නැති.

503. අර්‍ථ-ධර්‍ම-නිරුත්තියෙහි ද එසෙයින් ම ප්‍රතිභානයෙහි ද මාගේ ඥානය පිරිසුදු යැ, බුදුසසුන්හි ඥානය උපනැ.

504. මම (සප්ත) විශුද්ධියෙහි දක්‍ෂයෙමි, කථාවස්තුවිෂයෙහි විශාරද (—නිර්භය) වෙමි, අභිධර්‍මනය දනිමි, සසුන්හි වශීප්‍රාප්ත වෙමි.

505. ඉක්බිති කොශලාධිපති රජු විසින් භෝජනවස්තුයෙහි පුළුවුත් සියුම් පැන ඇති සැටියෙන් විසඳන්නක් වූමු.

506. එකල්හි ඒ රජ සුගතයන් වහන්සේ වෙතැ එළැඹ විචාළේ ය. ඒ පැන යම් අයුරෙකින් මා විසඳන ලදද, එසෙයින් ම බුදුහු විසඳා වදළහ.

507. නරෝත්තම ජිනේන්ද්‍රයන් වහන්සේ ඒ ගුණයෙහි තුටු වූ සේක් මහා ප්‍රඥා ඇති භික්‍ෂුණීන් අතර අග්‍ර යයි මා එතදග්‍රයෙහි තැබූ සේකැ.

508 – 510. මා විසින් කෙලෙස්හු දවන ලදහ... බුදුසසුන් කරන ලදී.

මෙසෙයින් වනාහි ඛේමා තෙරණියෝ මේ ගාථා පැවසූහ.

අටවැනි ඛේමා ස්ථවිරාපදන යි.

## 19. උප්පලවණ්ණා අපදානය

511. ඍද්ධියෙන් අගතැන්පත් උත්පලවර්ණා භික්‍ෂුණී තොමෝ ශාස්තෲන් වහන්සේගේ පා වැඳ මෙවදන් පැවසූ:

512. ඒ ඒ ජාතිවල (උපත් විසින්) හැසිරීම තරණය කළ මම අචල වූ නිර්වාණපදයට පැමිණියා වෙමි, මා විසින් සියලු දුක් ක්‍ෂය කරන ලද, මහාමුනිතුමනි, (එය) සැලකරමි.

513. බුදුසසුන්හි පහන් වූ යම් පමණ පිරිස් ඇත් ද, යම් කෙනෙකුන් ට මා කළ අපරාධයෙකුත් ඇත් ද, බුදුරදුන් හමුයෙහි (මට) කමත් වා.

514. මහාවීරයන් වහන්ස, ආරොචනා කරමි: සසර සැරිසරන මාගේ ඉදින් (යම්) දෙසෙක් වී නම් ඒ දෙස ක්‍ෂමා කරන සේක්වා.''

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

515. “ඉද්ධිං චාපි නිදස්සෙහි මම සාසනකාරිකෙ
චතස්සො පරිසා අජ්ජ කඞ්ඛං ජිනන්ති යාවතා”

516. “ධීතු[1] තුය්හං මහාවීර පඤ්ඤවන්තාන ජුතින්ධර
බහුං ච දුක්කරං කම්මං කතං මෙ අතිදුක්කරං.

517. උප්පලස්සෙව මෙ වණ්ණො නාමෙනුප්පලනාමිකා
සාවිකා තෙ මහාවීර පාදෙ වන්දති චක්ඛුම.

518. රාහුලො ච අහඤ්චෙව නෙකජාතිසතෙ බහූ
එකස්මිං සම්භවෙ ජාතා සමානච්ඡන්දමානසා.

519. නිබ්බත්ති එකතො හොති ජාතිසු බහුසො මම[2]
පච්ඡිමභවෙ[3] සම්පත්තෙ උභොපි නානාසම්භවා.

520. පුත්තො ච රාහුලො නාම ධීතා උප්පලසව්හයා
පස්ස වීර මමං ඉද්ධිං බලං දස්සෙමි සත්ථුනො.

521. මහාසමුද්දෙ චතුරො පක්ඛිපි හත්ථපාතියං
තෙලං හත්ථගතං[4] චෙව වෙජ්ජො[5] කොමාරකො යථා.

522. උබ්බත්තයිත්වා පථවිං පක්ඛිපි හත්ථපාතියං
චිත්තමුඤ්ජං[6] යථා නාම ලුඤ්චි කොමාරකො යුවා.

523. චක්කවාළසමං පාණිං ඡාදයිත්වාන මත්ථකෙ
වස්සාපෙත්වාන ඵුසිතං නානාවණ්ණං පුනප්පුනං.

524. භූමිං උදුක්ඛලං කත්වා ධඤ්ඤං කත්වාන සක්ඛරං
සිනෙරු මුසලං කත්වා මද්දී කොමාරිකා යථා.

525. “ධීතා’හං බුද්ධසෙට්ඨස්ස නාමෙනුප්පලසව්හයා
අභිඤ්ඤාසු වසීභූතා තව සාසනකාරිකා.

526. නානා විකුබ්බනං කත්වා දස්සෙත්වා ලොකනායකං
නාමගොත්තඤ්ච සාවෙත්වා[7] පාදෙ වන්දාමි චක්ඛුම.

1. ධීතා - මජසං.
2. ජාතියාපිච එකතො - මජසං., සයා, PTS.
3. පච්ඡිමෙ භවෙ - මජසං,
4. වත්ථිගතං - සීමු.
5. තිංධඩා - මජසං.
6. චිත්තං මුඤ්ජං - මජසං.
7. පකාසෙත්වා - සයා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

515. (බුදුහු) "මාගේ අනුසසුන් කරන්න, සෘද්ධි ද දක්වව, යම් පමණ සිවුපිරිස් වේ ද, අද (ඔවුන්ගේ) සැක සිඳුව."

516. (උපපලවණ්ණා) "ප්‍රඥාවත් ද්‍යුතින්ධර මහාවීරයාණනි, ඔබගේ දුහිතෘ වූ මා විසින් බෙහෙවින් අපහසු වූ බොහෝ දුෂ්කර වූ ක්‍රියා කරන ලදී.

517. මාගේ (සිවි) පැහැය උපුලක පැහැ බඳු වෙයි. චක්ෂුර්මත් මහාවීරයාණනි, නමින් උත්පලා නම් වූ ශ්‍රාවිකා තොමෝ ඔබ පා වඳියි.

518. රාහුලත්, මමත් නොයෙක් බොහෝ සියගණන් ජාතිවලැ එක ම කුලයෙකැ උපනුම්හ, සමාන රිසි හා මනස් ඇත්තෝ ද වූම්හ.

519. බෙහෙවින් (ඒ ඒ) ජාතිවලැ මාගේ ඉපැත්ම (රාහුල) හා එක් වැ වෙයි. පැසුළු භවය පැමිණි කල්හි දෙදෙන ම වෙන වෙන උපත් ඇත්තෝ වූම්හ.

520. පුත් රාහුල නම් විය, දූ උත්පල නම් වූ. වීරයන් වහන්ස, මාගේ සෘද්ධි බලනු මැනැවි. ශාස්තෘන් වහන්සේට (මාගේ) බලය දක්වමි.

521. කෝමාරභච්ච නම් වෛද්‍යයා අතට පත්, තෙලයක් සෙයින් සිව්සයුරු අත් නමැති තලියෙහි බහාලූ යැ.

522. තරුණ කෝමාරක යම් පරිදි මුද්‍රතණ සින්දේ ද එසෙයින් පොළොව උපුරා අත් නමැති තලියෙහි බහාලූ යැ.

523. සක්වළ සම් කොට අත්ලෙන් මස්තකය වසා නැවත නැවත නන්වැදෑරුම් පැහැපත් වැසිපොද වර්ෂා කරවා–

524. පොළොව වනක් කොට සකුරු (–වැලි කැට) ධාන්‍ය කොට මේරුව මොහොලක් කොට දූරියක මෙන් මැඩලූ යැ.

(උත්පලවර්ණා මෙසේ කියයි:)

525. මම බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේගේ දුහිතෘ වෙමි. නමින් උපපලවණ්ණා නමු. අභිඥාහි වශීභූත වූ මම ඔබගේ අනුසසුන් කරන්නක් වෙමි.

526. නොයෙක් සෘද්ධිවිකුර්වණ කොට ලෝකනායකයන් වහන්සේට දක්වා නම්ගොත් ද අස්වා පසැස් ඇති උතුමාණනි, ඔබ) පා වඳිමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

527. ඉද්ධියා ච වසී හොමි දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී හොමි මහාමුනෙ.

528. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවා පරික්ඛීණා[1] නත්ථිදානි පුනබ්භවො.

529. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
ඤාණං මෙ විමලං සුද්ධං පභාවෙන මහෙසිනො.

530. පුරිමානං ජිනග්ගානං සම්මුඛා ච පරම්මුඛා[2]
අධිකාරං බහුං මය්හං තුය්හත්ථාය මහාමුනි.

531. යං මයා පූරිතං[3] කම්මං කුසලං සර මෙ[4] මුනි
තවත්ථාය මහාවීර පුඤ්ඤං උපචිතං මයා.

532. අභබ්බට්ඨානෙ වජ්ජෙත්වා පරිවජ්ජෙන්තී[5] අනාචාරං[6]
තවත්ථාය මහාවීර චත්තං ජීවිතමුත්තමං.

533. දසකොටිසහස්සානි අදාසිං මම[7] ජීවිතං
පරිච්චත්තං[8] ච මෙ හොතු[9] තවත්ථාය මහාමුනි.''

534. තදත්තිවිම්හිතා සබ්බා සිරසාව කතඤ්ජලි
අවොච'ය්‍යා කථං ආසි අතුලිද්ධිපරක්කමා.

535. සතසහස්සෙ ඉතො[10] කප්පෙ නාගකඤ්ඤා අහුං[11] තද
විමලා නාම නාමෙන කඤ්ඤානං සාධුසම්මතා.

536. මහොරගො මහානාගො පසන්නො ජිනසාසනෙ
පදුමුත්තරං මහාතෙජං නිමන්තෙසි සසාවකං.

537. රතනාමයං[12] මණ්ඩපඤ්ච පල්ලඞ්කං රතනාමයං
රතන[13]වාලුකාකිණ්ණං උපභොගං රතනාමයං

538. මග්ගං ච පටියාදෙසි රතනද්ධජභූසිතං
පච්චුග්ගන්ත්වාන සම්බුද්ධං වජ්ජන්තො තුරියෙහි[14] සො

1. සබ්බාසවපරික්ඛීණා – මජසං.
2. සඞ්ගමං තෙ නිදස්සිතං – මජසං.
3. පූරිමං – සයා, PTS
4. සංසාරෙ – PTS.
5. වාරයන්තො – මජසං. පරිපාචෙන්තො – සයා.
6. අනාචරං – මජසං, සයා.
7. මයා – සීමු.
8. පරිච්චත්තා – මජසං.
9. හොමි – මජසං.
10. සතසහස්සිතො – මජසං.
11. අහං – මජසං.
12. රතනම්යං – මජසං.
13. රතනං – මජසං.
14. තුරියෙහි – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

527. මහාමුනිතුමනි, (මම) ඍද්ධියෙහි ද වශී වෙමි, දිබ්බසොත ධාතුයෙහි ද චෙතොපරියඤාණයෙහි ද වශී වෙමි.

528. පෙරවිසූ කඳපිළිවෙළ දනිමි, දිවැස පිරිසුදු කරන ලද, සියලු ආස්‍රව ගෙවී ගියේ යැ, දැන් පුනර්භවයෙක් (-යළි ඉපැත්මෙක්) නැත.

529. මහර්ෂීන් වහන්සේගේ ප්‍රභාවයෙන් අර්ථ – ධර්ම – නිරුක්ති-යෙහි ද, එසේ මැ ප්‍රතිභානයෙහි ද මගේ ඤානය නිර්මල යැ, පරිශුද්ධ යැ.

530. මහාමුනිතුමනි, තොප සඳහා පෙර බුදුවරයන්ගේ සම්මුඛ-යෙහි ද පරාම්මුඛයෙහි ද මාගේ අධිකාරය (-කුසල් රැස් කිරීම) බොහෝ යැ.

531. මා විසින් යම් කුශල කර්මයක් පූරන ලද ද, මාගේ ඒ කර්මය සිහි කරනු මැනැවි, මහාවීරයන් වහන්ස තොප පිණිස මා විසින් පින් රැස් කරන ලද යැ.

532. අභව්‍යස්ථාන හැරපියා අනාචාරය බැහැර ලන්නක් වූමු. මහාවීරයන් වහන්ස, තොප පිණිස මාගේ උතුම් ජීවිතය ද පරිත්‍යාග කළමු.

533. මහාමුනිතුමනි, තොප පිණිස දසකෙළදහසක් (ධනය) දුන්මු. මා විසින් මාගේ ජීවිතය ද පරිත්‍යාග කරන ලද වෙයි.''

534. එකල්හි අතිවිස්මිත වූ සියලු පිරිස මුදුනින් බැඳිලි වැ "ආයර්‍යාවනි, කෙසේ නම් (මෙබඳු) අසම වූ ඍද්ධි පරාක්‍රම ඇතිවූ දැ''යි පිළිවිසී.

(උත්පලවර්‍ණා පිළිතුරු දෙයි:)

535. මෙයින් සුවහස්වන කප්හි නාගකන්‍යාවක් වූමු. එකලැ නමින් විමලා නම් වූ මම කන්‍යාවන් අතර සාධුසම්මත වූවා වෙමි.

536. මහොරග නම් වූ මහනාරජ තෙමේ බුදුසසුන්හි පහන් වූයේ ශ්‍රාවකයන් සහිත වූ මහත් තෙද ඇති පදුමුත්තර මුනිරජුන් නිමන්ත්‍රණය කෙළේ යි.

537–538. රුවන්මුවා මණ්ඩපයක් ද, රුවන්මුවා පළඟක් ද, රුවන් මුවා උපභොග ඇද, රුවන් දදින් සැරහුණු රුවන්වැලි විසුරුණු මඟ ද පිළියෙළ කෙළේ ය. භේ තූර්‍යයන් වයනු ලබන්නේ පෙර ගමන් කොට සම්බුදුරදුන් (වැඩම කරවූයේ යි.)

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

539. පරිසාහි චතූහි[1] සො සහිතො[2] ලොකනායකො
මහොරගස්ස භවනෙ නිසීදි පරමාසනෙ.

540. අන්නං පානං ඛාදනීයං භොජනීයං[3] මහාරහං
වරං වරඤ්ච පාදාසි නාගරාජා මහායසො.[4]

541. භුඤ්ජිත්වාන සම්බුද්ධො පත්තං ධොවිය[5] යොනිසො
අනුමොදනීයං'කාසි නාගරඤ්ඤො මහිද්ධිනො.[6]

542. සබ්බඤ්ඤුං ඵුල්ලිතං[7] දිස්වා නාගකඤ්ඤා මහායසා[8]
පසන්නා[9] සත්ථුනො චිත්තං සුනිබද්ධඤ්ච මානසං.

543. මමඤ්ච චිත්තමඤ්ඤාය ජලජුත්තමනායකො
තස්මිං ඛණෙ මහාවීරො භික්ඛුනිං දස්සයිද්ධියා.

544. ඉද්ධී අනෙකා දස්සෙසි භික්ඛුනී සා විසාරද
පමොදිතා වෙදජාතා සත්ථාරං ඉදමබ්‍රවිං:[10]

545. අද්දසාහං ඉමං ඉද්ධිං සුමනායිතරායපි[11]
'කථං අහොසි සා වීර ඉද්ධියා සුවිසාරද ?

546. "ඔරසා මුඛතො ජාතා ධීතා මම මහිද්ධිකා
මමානුසාසනීකරා ඉද්ධියා සුවිසාරද."

547. බුද්ධස්ස වචනං සුත්වා එවං පත්ථෙසහං තද[12]
"අහම්පි තාදිසා හොමි ඉද්ධියා සුවිසාරද."

548. පමොදිතා'හං සුමනා පත්තඋත්තමමානසා[13]
අනාගතම්හි අද්ධානෙ ඊදිසා හොමි නායක.

549. මණිමයම්හි පල්ලඞ්කෙ මණ්ඩපස්මිං පභස්සරෙ
අන්නපානෙන තප්පෙත්වා සසඞ්ඝං ලොකනායකං.

---

1. පරිසාහි ච චතූහි – මජසං.,
   පරිසාහි චතසෙසාහි - PTS.
2. පරිවුතො – මජසං.,
   එරිතො – සයා.
   පරෙතො – PTS.
3. භොජනඤ්ච – මජසං.
4. මහායසං – මජසං.
5. ධොවිත්වා – මජසං., PTS.
6. නාගකඤ්ඤා මහිද්ධිකා – මජසං – සයා., PTS.
7. සබ්බඤ්ඤුඵුල්ලිතං – සිමු.
8. මහායසං මජසං.
9. පසන්නං – මජසං.
10. ඉදමබ්‍රවි – මජසං.
11. සුමනං ඉතරායපි – මජසං.
12. තුට්ඨා එවං අවොචහං – සයා.
13. පත්ත උත්තම මානසා – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

539. ඒ ලෝකනාථයන් වහන්සේ සිවු පිරිස් සහිත වූ සේක් මහෝරග නා රජුගේ භවනෙහි උතුම් අස්නෙකැ වැඩහුන්සේකැ.

540. මහායසස් ඇති නාරජ ආහාර ද පාන ද කෑයුතු දෑ ද බිදියයුතු දෑ ද මාඇති උතුම් උතුම් දෑ ද දුන්නේ යැ.

541. සම්බුදුරජාණන් වහන්සේ අහරකිස නිමවා පා දෙවා මහත් සෘද්ධි ඇති නාරජුගේ නුවණ පමණින් අනුමෝදනා කළසේකැ.

542. මහත් යශස් ඇති නාගකන්‍යා තොමෝ විකසිත පියුමක් බඳු සර්වඥයන් දක ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුනා, මොනොවට බඳනා ලද සිත් ඇති වූ,

543. එකෙණෙහි පියුම්තුරා බුදුරජාණන් වහන්සේ මාගේ සිත දැන සෘද්ධියෙන් අගතැන්පත් මෙහෙණක දක්වූ සේකැ.

544. විශාරද වූ ඒ මෙහෙණ නොයෙක් සෘද්ධි දක්වූ. ප්‍රමුදිත වූ හටගත් ප්‍රීති ඇති මම ශාස්තෲන් වහන්සේට මෙය කීමු:

545. වීරයන් වහන්ස, සතුටුසිත් ඇති මම ඒ මෙහෙණගේ මේ සෘද්ධිය දිටිමි. ඕ තොමෝ කිසෙයින් සෘද්ධියෙහි සුවිසාරද වූ ද?

546. "මහත්සෘද්ධි ඇති මෝ මාගේ අනුසාසනා කරන සෘද්ධියෙහි අතිශයින් විශාරද වූ (දෙසුම් අසා සවුබවට පත් හෙයින්) මුවින් උපන් මාගේ ඖරස දුහිතෘ වෙයි."

547. බුදුරදුන්ගේ වදන් අසා එවිටැ මම මෙසේ ප්‍රාර්ථනා කළමු: මම්දු සෘද්ධියෙහි සුවිශාරද වැ ඇය බඳු වෙමි.

548. නායකයන් වහන්ස, ප්‍රමුදිත වූ සුමනස් ඇති මම අනාගත යෙහි (සෘද්ධි) ප්‍රාප්ත උත්තම මනස් ඇති වැ මැය බඳු වන්නෙමි.

549. ප්‍රභා විහිදෙන මණ්ඩපයෙක්හි මිණිමුවා පළහෙකැ සඞ්ඝයා සහිත ලොකනාථයන් වහන්සේ වඩා හිඳුවා ආහාරපානයෙන් සන්තර්පණය කොට –

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

550. නාගානං පවරං පුප්ඵං අරුණං නාම උප්පලං
'වණ්ණං මෙ ඊදිසං හොතු' පූජෙසිං ලොකනායකං.

551. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡ'හං.

552. තතො චුතා'හං මනුජෙ උපපන්නා සයම්භුනො
උප්පලෙහි පටිච්ඡන්නං පිණ්ඩපාතමදාසහං.

553. එකනවුතෙ ඉතො කප්පෙ විපස්සී නාම නායකො
උප්පජ්ජි චාරුනයනො සබ්බධම්මෙසු චක්ඛුමා.

554. සෙට්ඨි ධීතා තදා හුත්වා බාරාණසිපුරුත්තමෙ
නිමන්තෙත්වාන සම්බුද්ධං සසඞ්ඝං ලොකනායකං.

555. මහාදානං දදිත්වාන උප්පලෙහි විනායකං
පූජයිත්වා චෙතසාච[1] වණ්ණසොභං අපත්ථයිං.

556. ඉමම්හි භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධු මහායසො
කස්සපො නාම ගොත්තෙන[2] උප්පජ්ජි වදතං වරො.

557. උපට්ඨාකො මහෙසිස්ස තදා ආසි නරිස්සරො
කාසිරාජා කිකී නාම බාරාණසිපුරුත්තමෙ.

558. තස්සා'සිං දුතියා ධීතා සමණගුත්තසව්හයා
ධම්මං සුත්වා ජිනග්ගස්ස පබ්බජ්ජං සමරොචයිං.

559. අනුජානි න නො තාතො අගාරෙව තදා මයං
වීසං වස්සසහස්සානි විචරිම්හ අතන්දිතා.

560. කොමාරිබ්‍රහ්මචරියං රාජකඤ්ඤා සුඛෙධිතා
බුද්ධුපට්ඨානනිරතා මුදිතා සත්තධීතරො.

561. සමණී සමණගුත්තා ච භික්ඛුනී භික්ඛුදසිකා[3]
ධම්මා චෙව සුධම්මා ච සත්තමී සඞ්ඝදසිකා.[3]

562. අහං ඛෙමා ච සප්පඤ්ඤා පටාචාරා ච කුණ්ඩලා
කිසාගොතමී ධම්මදින්නා විසාඛා හොති සත්තමී.

---

1. ච තෙනෙව - සයා, PTS.
2. නාමෙන් - සිමු.
3. දයිකා - මජසං, PTS

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

550. නාගයන්ගේ උතුම් පුෂ්පයක් වූ අරුණ නම් උපුලෙක් වෙයි. "මාගේ පැහැය මෙසේ වේව" යි (එයින්) ලොකනාථයන් වහන්සේ පිදූමු.

551. මම එ කුශලකර්මයෙන් ද චෙතනාප්‍රණිධියෙන් ද මිනිස්කය හැරපියා තව්තිසා දෙව්ලොවට ගියමු.

552. එයින් ච්‍යුත වූ මම මිනිසුන් කෙරෙහි උපත් විසින් පැමිණියා වෙමි. පසේබුදු නමකට මම උපුලින් වැසුණු පිණ්ඩාහාර-යක් දුනුමු.

553. මෙයින් එකානුවන කප්හි සොඳුරු නුවන් ඇති (ලොවී ලොව්තුරු) සියලු දහම්හි චක්‍ෂුර්මත් වූ විපස්සී නම් සර්වඥයන් වහන්සේ පහළ වූ සේක.

554. එකලැ බරණැස් පුරවරයෙහි සිවු දුවක් වැ සඞ්ඝයා සහිත වූ ලෝකනාථ සම්බුදුරජාණන් වහන්සේ නිමන්ත්‍රණය කොට-

555. මහදන් දී විනායක වූ මුනිරජුන් උපුලින් පුද සිතින් ම වර්ණශොභා ප්‍රාර්ථනා කළමු.

556. මේ භද්‍ර කල්පයෙහි මහායශස් ඇති ගොත්‍රයෙන් කාශ්‍යප නම් වූ දේශකයන් අතර ශ්‍රේෂ්ඨ වූ සම්බුදුරජාණන් වහන්සේ පහළ වූ සේක.

557. එකලැ මහර්ෂීන් වහන්සේට උපස්ථායක නරදෙවු වූ කිකී නම් කසීරජෙක් බරණැස් පුරවරයෙහි වූයේ යැ.

558. (මම) ඔහුට සමණගුත්තා නම්වූ දෙවැනි දූ වූමු. ජිනේන්ද්‍රයන් වහන්සේගේ ධර්මය අසා පැවිද්ද රිසි කළමු.

559-560. පිය තෙමේ අප පැවිද්ද නො අනුදත්තේ යැ. රාජකන්‍යා වූ සුවසේ වැඩුණු ප්‍රමුදිත වූ අපි දියණිවරු සත්දෙන එකලැ බුද්ධොපස්ථානයෙහි නිරත වූවමෝ ගෙහි මැ (හිද) අනලස් වැ විසිදහසක් හවුරුදු මුළුල්ලෙහි කුමරි බඹසර සැරූම්හ.

561. (උහු නම :) සමණී ය සමණගුත්තා යැ භික්ඛුණී යැ භික්ඛුණිදසිකා යැ ධම්මා යැ සුධම්මා යැ, සත්වැනී සඞ්ඝදසිකා යි.

562. (මෙකලැ පිළිවෙළින්) මම් යැ සප්‍රාඥ ඛෙමා යැ පටාචාරා යැ කුණ්ඩලා යැ කිසාගොතමී යැ ධම්මදින්නා යැ (යන අපි වෙමු.) විශාඛා සත්වැනි වෙයි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

563. තෙහි කම්මෙහි සුකතෙහි චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

564. තතො චුතා මනුස්සෙසු උපපන්නා මහාකුලෙ
පීතමට්ඨං[1] වරං දුස්සං අදං අරහතො අහං.

565. තතො චුතා'රිට්ඨපුරෙ ජාතා විප්පකුලෙ අහං
ධීතා තිරිටවච්ඡස්ස[2] උම්මාදන්ති[3] මනොහරා.

566. තතො චුතා ජනපදෙ කුලෙ අඤ්ඤතරෙ අහං
පසූතා නාතිඵීතම්හි සාලිං ගොපෙමහං තදා.

567. දිස්වා පච්චෙකසම්බුද්ධං පඤ්චලාජාසතානි'හං
දත්වා පදුමච්ඡන්නානි පඤ්චපුත්තසතානිපි.

568. පත්ථයිං තෙපි පත්ථෙසුං මධුං දත්වා සයම්භුනො
තතො චුතා අරඤ්ඤෙ'හං අජායිං පදුමොදරෙ.

569. කාසිරඤ්ඤො මහෙසී'හං හුත්වා සක්කතපූජිතා
අජනිං රාජපුත්තානං අනූනං සතපඤ්චකං.

570. යදා තෙ යොබ්බනප්පත්තා කීළන්තා ජලකීළිතං
දිස්වා ඔපත්තපදුමං ආසුං පච්චෙකනායකා.

571. සාහං තෙහි විනාභූතා සුතවරෙහි සොකිනී
චුතා ඉසිගිලිපස්සෙ ගාමකම්හි අජායිසං.

572. යදා බුද්ධා සුතමතී සුතානං භත්තුනොපි ච
යාගුමාදාය ගච්ඡන්ති අට්ඨපච්චෙකනායකෙ.

573. භික්ඛාය ගාමං ගච්ඡන්තෙ දිස්වා පුත්තෙ අනුස්සරිං
ඛීරධාරා විනිග්ගච්ඡි තදා මෙ පුත්තපෙමසා.

574. තතො තෙසං අදං යාගුං පසන්නා සෙහි පාණිහි
තතො චුතා'හං තිදසෙ නන්දනං උපපජ්ජහං.

575. අනුභොත්වා සුඛං දුක්ඛං සංසරිත්වා භවාභවෙ
තවත්ථාය මහාවීර පරිච්චත්තඤ්ච ජීවිතං.

576. එවං බහුවිධං දුක්ඛං සම්පත්ති ච බහුබ්බිධා
පච්ඡිමෙ භවෙ සම්පත්තෙ ජාතා සාවත්ථියං පුරෙ.

---

1. පීතං මට්ඨං – මජසං,
2. තිරිටිවච්ඡස්ස – මජ්ඣං
3. උම්මාදෙන්ති – සීමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

563. එ කුශලකර්මහේතුයෙන් ද, චේතනාප්‍රණිධි හේතුයෙන් ද, මම මිනිස්කය හැරපියා තව්තිසාවට පැමිණියා වෙමි.

564. එයින් සැවැ මිනිසුන් කෙරෙහි මහාකුලයෙකැ උපන් මම රන්වන් මටසිලිටි උතුම් වස්ත්‍රයක් රහත් නමකට දුන්මූ.

565. එයින් ච්‍යුත වූ මම අරිට්ඨපුරයෙහි බමුණු කුලයෙකැ තිරිටවච්ඡ නමැත්තහුගේ උම්මාදන්ති නම් මනහර දුහිතෘ වැ උපන්මූ.

566. මම එ අත්බවින් ච්‍යුත වූයෙම් (එරට එක්) දනව්වකැ ඉතා සමෘද්ධිමත් නො වූ එක්තරා කුලෙක්හි උපන්මූ. එකලැ මම හැල් කෙතක් රකිමි.

567-568. මම පසේබුදු කෙනෙකුන් දක පියුමෙන් වසන ලද පන්සියයක් ලාජා (විළඳ ඔබට) දී පන්සියයක් පුතුන් ද පැතූමූ. ඔහු ද පසේබුදුරදුනට මී දන් දී (එය ම) පැතූහු. මම ඒ දයින් ච්‍යුත වූයෙම් අරණ්‍යයෙහි පියුම්ගැබෙකැ උපනුමූ.

569. මම කසීරට රජුගේ මෙහෙසිය වී සත්කාර - පූජා කරන ලදුයෙම් රාජපුත්‍රයන් පන්සියයක් නො අඩු වැ ප්‍රසූත කළමූ.

570. යම් කලෙකැ ඔහු යොවුන්බවට පැමිණියාහු ද ජලක්‍රීඩා කරන්නාහු පත් ගිලිහුණු පියුමක් දක පසේබුදු වූහු.

571. ඒ මම ඒ උතුම් පුතුන්ගෙන් වෙන් වූවා (එහෙයින් ම) ශොක ඇති වූයෙම් ඒ අත්බවින් ච්‍යුත වැ ඉසිගිලි පසැ එක්තරා ගමෙකැ උපන්මූ.

572-573. යම් කලෙකැ වැඩිවියපත් වූවා දරුවන් ඇති මම පුතුනට ද සැමියාට ද හුළුකැන් රැගෙන යන්නෙම් පසේබුදුරදුන් අට නමක් පිඩු පිණිස ගමට වඩිනු දක පුතුන් සිහි කළමු ද, එකලැ මාහට පුත්‍රප්‍රෙමයෙන් ක්ෂිරධාරා නිකුත්වි.

574. ඉක්බිති පහන් වූයෙම් ඔබට සියතින් හුළුකැන් දුන්මූ. මම එයින් ච්‍යුත වූයෙම් දෙව්ලොව නන්දන උයන්හි උපනුමූ.

575. මහාවීරයාණනි, (අනතුරුව) කුදුමහත් බෙවෙහි සරා සුව දුක් අනුභව කොට තොප පිණිස ජීවිත පරිත්‍යාග කළා ද වෙමි.

576. මෙසේ බහුප්‍රකාර වූ දුක්විඳ බහුප්‍රකාර වූ සම්පත් ද ලැබ පශ්චිම භවය පැමිණි කල්හී සැවැත් නුවර උපන්මූ.

T 7

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

577. මහාධනෙ සෙට්ඨිකුලෙ සුඛිතෙ සජ්ජිතෙ තථා
නානාරතනපජ්ජොතෙ සබ්බකාමසමිද්ධිනී.

578. සක්කතා පූජිතා ආසිං මානිතා'පචිතා තථා
රූපසොභග්ගසම්පන්නා කුලෙසු අභිසම්මතා.

579. අතීව පත්ථිතා චා'සිං රූපභොග සිරීහි ච
පත්ථිතා සෙට්ඨිපුත්තෙහි අනෙකෙහි සතෙහි ච.

580. අගාරං පජහිත්වාන පබ්බජිං අනගාරියං
අඩ්ඪමාසෙ අසම්පත්තෙ අරහත්තමපාපුණිං.

581. ඉද්ධියා අභිනිම්මිත්වා චතුරස්සරථං අහං
බුද්ධස්ස පාදෙ වන්දිස්සං ලොකනාථස්ස සිරීමතො.

582. සුපුප්ඵිතග්ගං උපගම්ම භික්ඛුනී එකා තුවං තිට්ඨසි සාලමූලෙ
න ච'ත්ථි තෙ දුතියා වණ්ණධාතු බාලෙ න ත්වං
භායසි ධුත්තකානං.

583. සතං සහස්සානපි ධුත්තකානං ඉධාගතා තාදිසකා භවෙය්‍යුං
ලොමං න ඉඤ්ජාමි න සන්තසාමි න මාර භායාමි
තමෙකිකාපි.

584. එසා අන්තරධායාමි කුච්ඡිං වා පවිසාමි තෙ
පඛුමන්තරිකායම්පි තිට්ඨන්තිං මං න දක්ඛසි.

585. චිත්තම්හි වසීභූතම්හි ඉද්ධිපාද සුභාවිතා
සබ්බබන්ධනමුත්තාම්හි න තං භායාමි ආවුසො.

586. සත්තිසූලූපමා කාමා ඛන්ධා'සං අධිකුට්ටනා
යං ත්වං කාමරතිං බ්‍රෑසි අරතී'දනි සා මම.

587. සබ්බත්ථ විහතා නන්දි තමොඛන්ධො පදළිතො
එවං ජානාහි පාපිම නිහතො ත්වමසි අන්තක.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

577. මහත් වූ ධන සම්පත් ඇති සුඛිත වූ සුසැදුණු දිලිසෙන නන්රුවන් ඇති සිටුකුලයෙකැ ඉපද සියලු කාමයෙහි සමෘද්ධ වූ (මම).

578. (ලෝකයා විසින්) සත්කාර කරන ලද පුදන ලද වූමු. එසේ මැ, බුහුමන් කරන ලද අපචායන කරන ලද වූමු, අග්‍ර වූ රූපශොභායෙන් යුක්ත වැ කුලයෙහි අභිසම්මත වූමු.

579. රූප ය භෝග ය ශ්‍රී යැ යන මේ කරණ කොටගෙන අතිශයින් ප්‍රාර්ථනා කරන ලද ද වූමු, නොයෙක් සිය ගණන් සිටු පුත්‍රයන් විසිනුදු ප්‍රාර්ථනා කරන ලද ද වූමු.

580. ගිහිගෙය හැරපියා ශාසනයෙහි පැවිදි වූමු, අඩ මසක් නො පත් කල්හි රහත්බවට පැමිණියා වෙමි.

581. මම ඍද්ධියෙන් සියුරස් රියක් නිර්මාණය කොට ලොකනාථ වූ ශ්‍රීමත් වූ බුදුරදුන්ගේ පාසඟුළුවන් වැන්දෙමි.

582. මෙහෙණියනි, තෙපි අග දක්වා පිපුණු මල් ඇති රුකක් කරා එළැඹැ (එ) සල්රුක්මුල එකලාව සිටිනාව. පැහැසටහනින් තොපට දෙවැන්නක් නො ද ඇති, බාලාව, තෙපි ධූර්තයනට බියපත් නො වවු ද?

583. මෙහි පැමිණි කා බඳු වූවෝ වන්නාහු නම්, (එබඳු) සියදහස් ගණන් ධූර්තයනට ද බියපත් නො වෙමි, ලොම් නො සලමි, නො තැතිගනිමි. මාරය, එකලා වූව ද තට බියපත් නො වෙමි.

584. තෙල මම අතුරුදහන් වෙමි, තාගේ කුසතුළට හෝ පිවිසෙමි, ඇසිපිය අතුරෙහි සිටිනා වූ ද මා තෝ නො දක්නෙහි.

585. සිත වසඟ වූ කල්හි ඍද්ධිපාදයෝ මා විසින් මොනොවට වඩන ලදහ, සියලු බන්ධනයෙන් මිදුණා වෙමි. ඇවැත, තට බියපත් නො වෙමි.

586. කාමයෝ අඩයටිහුල් බන්දුහ, ස්කන්ධයෝ ඔවුන්ගේ ප්‍රහාරයෝ යැ, තෙපි යමක් කාමරති යයි කියවූ ද ඒ මට දැන් අරති යයි.

587. සියලු භවයෙහි නන්දි සංඛ්‍යාත තෘෂ්ණාව නසන ලද, චතුස්සත්‍යප්‍රතිච්ඡාදක තමස්කන්ධය පළන ලද, පාපිමය, මෙසේ දනගනු, අන්තකය, තෝ මා විසින් නසන ලද.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

588. ජිනො තම්හි ගුණෙ තුට්ඨො එතදග්ගෙ ඨපෙසි මං
'අග්ගා ඉද්ධිමතීන'න්ති පරිසාසු විනායකො.

589. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා.

590. යස්සත්ථාය පබ්බජිතා අගාරස්මා'නගාරියං
සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයො.

591. චීවරං පිණ්ඩපාතං ච පච්චයං සයනාසනං
ඛණෙන උපනාමෙන්ති සහස්සානි සමන්තතො.

592-594. කිලෙසා ඣාපිතා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං උප්පලවණ්ණා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

**උප්පලවණ්ණා ථෙරියාපදානං නවමං.**

## 20. පටාචාරාපදානං.

595. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මානපාරගූ,
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

596. තදහං හංසවතියං ජාතා සෙට්ඨිකුලෙ අහුං
නානාරතනපජ්ජොතෙ මහාසුඛසමප්පිතා.

597. උපෙත්වා තං මහාවීරං අස්සොසිං ධම්මදෙසනං
තතො ජාතප්පසාද'හං උපෙසිං සරණං ජිනං.

598. තතො විනයධාරීනං අග්ගං වණ්ණෙසි නායකො
භික්ඛුනිං ලජ්ජිනිං තාදිං කප්පාකප්පවිසාරදං.

599. තදා මුදිතචිත්තා'හං තං ඨානමභිකඞ්ඛිනී
නිමන්තෙත්වා දසබලං සසඞ්ඝං ලොකනායකං.

600. භොජයිත්වාන සත්තාහං දදිත්වා ච තිචීවරං[1]
නිපච්ච සිරසා පාදෙ ඉදං වචනමබ්‍රවිං:

1. දදිත්වාච තිචීවරං - මජ්ඣසං.,
දදිත්වා පත්තචීවරං - සංයා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

588. ජිතපඤ්චමාරයන් වහන්සේ ඒ ගුණයෙහි තුටු වූවාහු විනායකයන් වහන්සේ පිරිස් මැද සෘද්ධිමත් මෙහෙණන් කෙරෙහි මෝ) අග්‍ර යයි මා එතදග්‍රයෙහි තැබූ සේක.

589. මා විසින් ශාස්තෲන් වහන්සේ ඇසුරු කරන ලදහ. බුදුසසුන් කරන ලද, ගුරු වූ ස්කන්ධභාරය බහා තබන ලද. භවතෘෂ්ණාව සමූලඝාතනය කරන ලද.

599. යම් අර්ථයක් සඳහා ගිහිගෙන් නික්මැ බුදුසසුන්හි පැවිදි වූම ද සර්වසංයෝජනක්ෂය සංඛ්‍යාත ඒ අර්ථය මා විසින් ලබන ලද වේ.

591. සිවුරු ද පිඬුවා ද ගිලන්පස ද සෙනසුන් ද දහස් ගණන් ඇසිල්ලෙක හාත්පසින් එළවත්.

592–594. මා විසින් ක්ලේශයෝ දවන ලදහ ... බුදුසසුන් කරන ලද.

උත්පලවර්ණා මෙහෙණ, මෙ ගාථා කිවූ යැයි.

## නවවැනි උපපලවණ්ණා ථේරී අපදන යි.

## 20. පටාචාරාපදනය.

595. මෙයින් සුවහස්වන කප්හි සියලු ධර්මයන්ගේ පාරයට ගිය ලෝකනායක වූ පදුමුත්තර නම් ජිනේන්ද්‍රයන් වහන්සේ ලොවැ පහළ වූ සේකැ.

596. එකලැ මම හංසවතී නුවර නොයෙක් රුවනින් දිලෙන සිටුකුලෙකැ උපනෙම් මහත් සුවයෙන් සමර්පිත වූමු.

597. ඒ මහාවීරයන් වහන්සේ වෙතැ එළඹැ දම් දෙසුම් ඇසුමු එයින් පහන් වූ මම බුදුන් සරණ කොට එළඹුණමු.

598. නායකයන් වහන්සේ ලජ්ජා ඇති තාදී ගුණ ඇති කප්පිය අකප්පිය දෙක්හි විශාරද වූ මෙහෙණක විනයධර මෙහෙණන් අතර අග්‍ර කොට වර්ණනා කළසේකැ.

599. එකල්හි ප්‍රමුදිත සිත් ඇති මම ඒ තනතුර කැමැති වන්නෙම් සඞ්ඝයා සහිත වූ ලෝකනායක දශබලධාරීන් වහන්සේ නිමන්ත්‍රණ කොට–

600. සත්දිනක් මුළුල්ලෙහි වළඳවා තුන්සිවුරු ද පුද (ඔබ) පා මුල සිරසින් වැද වැටී මෙවදන් පැවසුමු:

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

601. “යා තයා වණ්ණිතා වීර ඉතො අට්ඨමකෙ’හනි[1]
තාදිසා’හං භවිස්සාමි යදි සිජ්ඣති නායක.”

602. තදා අවොච මං සත්ථා “භද්දෙ මා භායි අස්සස
අනාගතම්හි අද්ධානෙ ලච්ඡසෙ තං මනොරථං.

603. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො
ගොතමො නාම ගොත්තෙන[2] සත්ථා ලොකෙ භවිස්සති.

604. තස්ස ධම්මෙසු දායාදා ඔරසා ධම්මනිම්මිතා
පටාචාරාති නාමෙන හෙස්සසි සත්ථුසාවිකා.”

605. තදා’හං මුදිතා හුත්වා යාවජීවං තතො[3] ජිනං.
මෙත්තචිත්තා පරිචරිං සසඞ්ඝං ලොකනායකං.

606. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

607. ඉමම්හි භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධු මහායසො
කස්සපො නාම ගොත්තෙන[4] උප්පජ්ජි වදතං වරො.

608. උපට්ඨාකො මහෙසිස්ස තදා ආසි නරිස්සරො
කාසිරාජා කිකී නාම බාරාණසිපුරුත්තමෙ.

609. තස්සා’සිං තතියා ධීතා භික්ඛුනී ඉති විස්සුතා
ධම්මං සුත්වා ජිනග්ගස්ස පබ්බජ්ජං සමරොචයිං.

610. අනුජානි න නො තාතො අගාරෙව තදා මයං
වීසං වස්සසහස්සානි විචරිම්හ අතන්දිතා

611. කොමාරිබ්‍රහ්මචරියං රාජකඤ්ඤා සුඛෙධිතා
බුද්ධුපට්ඨාන නිරතා මුදිතා සත්ත ධීතරො.

612. සමණී සමණගුත්තා ච භික්ඛුනී භික්ඛුදාසිකා
ධම්මා චෙව සුධම්මා ච සත්තමී සඞ්ඝදායිකා.

613. අහං උප්පලවණ්ණා ච ඛෙමා භද්දා ච භික්ඛුනී
කිසාගොතමී ධම්මදින්නා විසාඛා හොති සත්තමී.

---

1. මුනී – මජසං, සයා.
2. නාමෙන – සීමු.
3. තදා – මජසං.
4. කාමෙන – සීමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

601. "වීරයන් වහන්ස, මෙයින් අටවැනි දින ඔබ විසින් යම් මෙහෙණක් වර්ණිත වූවා ද, නායකයන් වහන්ස, ඉදින් (මාගේ ප්‍රාර්ථනා) සමෘද්ධ වේ නම් මම ඇය බඳු වන්නෙමි."

602. එකල්හි ශාස්තෘන් වහන්සේ මට (මෙසේ) වදාළසේක: "භද්‍රාවනි, නොබව, සන්හුන්වව, මතුකල්හි ඒ අදහස ලබන්නෙහි.

603. මෙයින් සියක්දහස්වන කප්හි ඔක්කාක කුලය සම්භව කොට ඇති ගෝත්‍රයෙන් ගෞතම නම් වූ ශාස්තෘහු ලොවැ පහළ වන්නාහ.

604. ඔබගේ ධර්මයට හිමි වූ ඖරස වූ ධර්මනිර්මිත වූ නමින් පටාචාරා යි ප්‍රසිද්ධ වන ශාස්තෘශ්‍රාවිකාවක් වන්නෙහි"

605. එකල්හි මම ප්‍රමුදිත වැ මෙත් සිත් ඇතියෙම් සඞ්ඝයා සහිත වූ ලෝකනායක ජිනේන්ද්‍රයන් වහන්සේට දිවිහිමියෙන් උපස්ථාන කළෙමි. ඉක්බිති-

606. එ කුශලකර්මහේතුයෙන් ද චේතනාප්‍රණිධි හේතුයෙන් ද මිනිස්කය හැරපියා මම තව්තිසා දෙව්ලොවට ගියෙමි.

607. මෙ භද්‍රකල්පයෙහි බ්‍රාහ්මණවංශික මහායශස් ඇති ගෝත්‍රයෙන් කාශ්‍යප නම් වූ සර්වඥයන් වහන්සේ ලොවැ පහළ වූ සේක.

608. එ සමයෙහි මහර්ෂීන් වහන්සේට උපස්ථායක වූ නරපති වූ කිකී නම් කසීරජෙක් බරණැස් පුරවරයෙහි වූයේ යැ.

609. එ රජුහට භික්ඛුනී යයි ප්‍රසිද්ධ තෙවැනි දූ වූමු. ජිනේන්ද්‍රයන්ගේ දහම් අසා (මම) පැවිද්ද රිසි වූමු.

610-611. පිය තෙමෙ අපගේ පැවිද්ද නො අනුදත්තේ යැ. එකල්හි අපි ගිහිගෙහි මැ (වෙසෙමින්) හවුරුදු විසිදහසක් මුළුල්ලෙහි අනලස් වූවමෝ කුමරි බඹසර සැරූමහ. රාජකන්‍යා වූ සුවසේ වැඩුණු බුද්ධොපස්ථානයෙහි නිශ්ශෙෂයෙන් ඇලුණු ප්‍රමුදිත වූ සප්ත දුහිතෘහු නම්:

612, සමණී යැ, සමණගුත්තා යැ, භික්ඛුනී යැ, භික්ඛුදාසිකා යැ, ධම්මා යැ, සුධම්මා යැ සත්වැනි සඞ්ඝදාසිකා යැ යන අපි වෙමු.

613. (ඔහු මෙකලැ) මම යැ, උප්පලවණ්ණා යැ, ඛෙමා යැ, භද්‍රා භික්ඛුනී (කුණ්ඩලකෙසා) යැ, කිසාගොතමී යැ, ධම්මදින්නා යැ යන අපි වෙමු. විශාකා සත්වැනි වෙයි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

614. තෙහි කම්මෙහි සුකතෙහි චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

615. පච්ඡිමෙ ච භවෙ දානි ජාතා සෙට්ඨිකුලෙ අහං
සාවත්ථියං පුරවරෙ ඉද්ධෙ ඵීතෙ මහද්ධනෙ.

616. යදා ච යොබ්බනූපෙතා විතක්කවසගා අහං
නරං ජානපදං[1] දිස්වා තෙන සද්ධිං අගච්ඡ'හං.

617. එකපුත්තපසූතා'හං දුතියො කුච්ඡියං මම
තදා'හං මාතාපිතරො දක්ඛාමීති[2] සුනිච්ඡිතා.

618. න රොචෙසි පති[3] මය්හං තදා තම්හි පවාසිතෙ
එකිකා නිග්ගතා ගෙහා ගන්තුං සාවත්ථිමුත්තමං.

619. තතො මෙ සාමි ආගන්ත්වා සම්භාවෙසි පථෙ මමං
තදා මෙ කම්මජා වාතා උප්පන්නා අතිදාරුණා.

620. උට්ඨිතො ච මහාමෙඝො පසූතිසමයෙ මම
දබ්බත්ථාය තදා ගන්ත්වා සාමි සප්පෙන මාරිතො.

621. තදා විජාතදුක්ඛෙන අනාථා කපණා අහං
කුන්නදිං පූරිතං දිස්වා ගච්ඡන්තී සකුලාලයං.

622. බාලං ආදාය අතරිං පාරකූලෙ ච එකකං
සායෙත්වා බාලකං පුත්තං ඉතරං තාරණාය'හං.

623. නිවත්තා උක්කුසො'හාසි තරුණං විලපන්තකං
ඉතරඤ්ච වහී සොතො සා'හං සොකසමප්පිතා.

624. සාවත්ථිනගරං ගන්ත්වා අස්සොසිං සජනෙ මතෙ
තදා අවොචං සොකට්ටා මහාසොකසමප්පිතා.

625. "උභො පුත්තා කාලකතා පන්ථෙ මය්හං පතී මතො
මාතා පිතා ච භාතා ච එකචිතකම්හි ඩය්හරෙ."

626. තදා කිසා ච පණ්ඩූ ච අනාථා දීනමානසා
ඉතො තතො භමන්තීහං[4] අද්දසං නරසාරථිං.

1. ජාරපතිං - මජසං.
2. ඔක්ඛාමි - මජසං, PTS.
ඉච්ඡාමි - ස්‍යා.
3. නාරොචෙසිං පතිං - මජසං, ස්‍යා.
4. ගච්ඡන්තීහං - ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

614. එ කුශලකර්ම හේතුයෙන් ද චේතනාප්‍රණිධි හේතුයෙන් ද මිනිස්සිරුර හැරපියා තව්තිසාවට ගියමු.

615. දුන් පැසුලු බෙවෙහි මම සැවැත් පුරවරයෙහි සමෘද්ධි මත් ධනාඪ්‍ය එහෙයින් ම මහත් ධන ඇති සිටු කුලයෙකැ උපන්මු.

616. යම් කලෙකැ යොවුන් බැවින් යුතු වූමු ද එකලැ මම (කාම) විතර්කවශයට ගියා වෙමි, මම දනවුවැසි මිනිසකු දැක ඔහු සමග (පලා) ගියමු.

617. මම එක් පුතකු ප්‍රසූත කළමු. මාගේ කුසෙහි දෙවැනි පුත් වෙයි, එකල්හි මම් මවුපියන් දක්නෙමැ යි දැඩි නිශ්චය ඇති කළමු.

618. මාගේ සැමියා (එය) රුචි නො කෙළේ යැ. ඔහු බැහැරක ගිය කල්හි උතුම් සැවැතට යනු පිණිස එකලා වැ නික්මුණුමු.

619. ඉක්බිති මාගේ සැමියා අවුත් මඟ දී මා හමු වූයේ යැ, එවිටැ ඉතා දරුණු කර්මජවාතයෝ මට උපන්හ.

620. මාගේ ප්‍රසූති සමයෙහි මහාමේඝය නැඟී සිටියේ යැ, එකල්හි ස්වාමිපුරුෂ දව සඳහා ගොස් සර්පයකු විසින් (ඩැහැ) මරණ ලද්දේ යි.

621. එකල්හි ප්‍රසූත දුඃඛයෙන් අනාථ වූ බැගෑ වූ මම සිය නෑ නිවසට යන්නෙම් කුඩා නදියක් පිරීතිබෙනු දැක –

622–623. බාලයා රැගෙන (ගඟ) තරණය කළමු. (ඒ) කුඩා පුතු පරතෙර එකලා කොට හොවා අනෙක් පුතු එතෙර කරවනු පිණිස මම හැරී ආවා වෙමි. (එකල්හි) උකුස්සෙක් කුඩා දරුවා වැල පෙන්නහු පැහැර ගෙන ගියේ යැ. අනෙක් පුතු ගඟෙහි සැඩ පහර හැරගෙන ගියේ යි. ඒ මම් ශෝකයෙන් මුසපත් වූවා –

624. සැවැත්නුවරට ගොස් මළ සියනෑයන් ගැන ඇසුමු. එවිටැ ශෝකයෙන් පෙළුණෙම් මහසොවින් මුසපත් වූයෙම් (මෙසේ) කීමු:

625. "දෙපුත්හු කලුරිය කළහ, මාගේ ස්වාමිපුරුෂ තෙමෙ මහමගැ මෙළේ ය. මවත් පියාත් බෑයාත් එක් දරසෑයෙකැ දැවෙත්" යි.

626. එ අවසථායෙහි කෘශ වැ පඬුවන් වැ අනාථ වැ බැගෑ මනස් ඇති වැ ඔබ මොබ දිවැ ඇවිදින මම නරසාරථී වූ මුනිරජුන් දුටුමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

627. තතො අවොච මං සත්ථා "පුත්තෙ මා සොචි අස්සස
අත්තානං තෙ[1] ගවෙසස්සු කිං නිරත්ථං විහඤ්ඤසි.

628. න සන්ති පුත්තා තාණාය න පිතා නපි බන්ධවා
අන්තකෙනාධිපන්නස්ස නත්ථි ඤාතිසු තාණතා."

629. තං සුත්වා මුනිනො වාක්‍යං පඨමං ඵලමජ්ඣගං
පබ්බජිත්වාන න චිරං අරහත්තමපාපුණිං.

630. ඉද්ධීසු ච වසී හොමි දිබ්බාය සොතධාතුයා
පරචිත්තානි ජානාමි සත්ථුසාසනකාරිකා.

631. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං
ඛෙපෙත්වා ආසවෙ සබ්බෙ විසුද්ධාම්හි සුනිම්මලා.

632. තතො'හං විනයං සබ්බං සන්තිකෙ සබ්බදස්සිනො
උග්ගණ්හිං සබ්බවිත්ථාරං ව්‍යාහරිං ච යථාතථං.

633. ජිනො තස්මිං ගුණෙ තුට්ඨො එතදග්ගෙ ඨපෙසි මං
"අග්ගා විනයධාරීනං පටාචාරාව එකිකා."

634. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා.

635. යස්සත්ථාය පබ්බජිතා අගාරස්මා'නගාරියං
සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයො.

636-638. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං පටාචාරා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

පටාචාරාථෙරියාපදානං දසමං.

1. තෙ - සබ්බත්ථ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

627. ඉක්බිති ශාස්තෲන් වහන්සේ මට (මෙසේ) වදාළසේක: "දියණියනි, ශෝක නො කර, සැනසෙව, තෝ තමා ගැන සොය, කුමක් හෙයින් නිරර්ථක සේ පෙළෙන්නෙහි ද?

628. මරහු විසින් මඩනා ලද සත්ත්වයාහට ආරක්ෂා පිණිස පුත්තු නො වන්නාහ, පියා ආරක්ෂා පිණිස නො වන්නේ යැ, (සෙසු) නෑයෝ ද ආරක්ෂා පිණිස නො වන්නාහු යැ, නෑයන් කෙරෙහි පිහිටෙක් නැත්තේ යි."

629. මුනිඳුන්ගේ ඒ දේශනාව අසා පළමු වැනි ඵලය අවබෝධ කළමු. පැවිදි වැ නොබෝ කලකින් රහත්බවට පැමිණියමු.

630. ශාස්තෲන් වහන්සේගේ අනුසසුන් කරන මම සෘද්ධියෙහි ද දිබ්බසෝතධාතුයෙහි ද වශී වෙමි, පරසිත් දනිමි.

631. පෙර විසූ කඳපිළිවෙළ දන්මි, දිවැස පිරිසිදු කරන ලද යැ. සියලු ආසුවයන් ක්ෂය කොට මොනොවට කෙලෙස් මල රහිත වැ විශුද්ධ වූවා වෙමි.

632. ඉක්බිති මම සියල්ල දක්නා බුදුරදුන් වෙතැ සියලු විනය උගතුමු. ඇති සැටියෙන් සියල්ල විස්තර කොට දේසනා ද කළමු.

633. ඒ ගුණයෙහි සතුටු වූ ජිනේන්ද්‍රයන් වහන්සේ එක මැ පටාචාරාව විනයධර මෙහෙණන් අතුරැ අග්‍ර යයි මා ඒතදග්‍රයෙහි තබා වදාළසේකැ.

634. මා විසින් ශාස්තෲහු ඇසුරු කරන ලදහ. බුදුසසුන් කරන ලද යැ. ගුරු වූ කෙලෙස්බර බහා තබන ලද යැ, තෘෂ්ණාව නසන ලදී.

635. යම් අර්ථයක් පිණිස ගිහිගෙන් නික්මැ බුදුසසුන්හි පැවිදි වූවා නම් සියලු සංයෝජනයන්ගේ ක්ෂය වීම වූ ඒ අර්ථය මා විසින් අනුප්‍රාප්ත යැ.

636-638. මා විසින් කෙලෙස්හු දවන ලදහ ... බුදුසසුන් කරන ලදී.

මෙසෙයින් පටාචාරා මෙහෙණ මේ ගාථා පැවැසූ.

දසවැනි පටාචාරා ථෙරාපදාන යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 21. කුණ්ඩලකෙසාපදානං.

639. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මාන පාරගූ
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

640. තදහං හංසවතියං ජාතා සෙට්ඨිකුලෙ අහුං
නානාරතනපජ්ජොතෙ මහාසුඛසමප්පිතා.

641. උපෙච්ච තං මහාවීරං අස්සොසිං ධම්මදෙසනං
තතො ජාතප්පසාද'හං උපෙසිං සරණං ජිනං.

642. තදා මහාකාරුණිකො පදුමුත්තරනාමකො
ඛිප්පාභිඤ්ඤානමග්ගතං ඨපෙසි භික්ඛුනිං සුභං

643. තං සුත්වා මුදිතා හුත්වා දානං දත්වා මහෙසිනො
නිපච්ච සිරසා පාදෙ තං ඨානං අභිපත්ථයිං.

644. අනුමොදි මහාවීරො භද්දෙ යං තෙ'භිපත්ථිතං
සමිජ්ඣිස්සති තං සබ්බං සුඛිනී හොහි නිබ්බුතා.

645. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො
ගොතමො නාම ගොත්තෙන[1] සත්ථා ලොකෙ භවිස්සති

646. තස්ස ධම්මෙසු දායාද ඔරසා ධම්මනිම්මිතා
භද්ද කුණ්ඩලකෙසාති හෙස්සසි සත්ථුසාවිකා.

647. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

648. තතො චුතා යාමමගා තතො'හං තුසිතං ගතා
තතො ච නිම්මාණරතිං වසවත්තිපුරං තතො.

649. යත්ථ යත්ථුපපජ්ජාමි තස්ස කම්මස්ස වාහසා
තත්ථ තත්ථෙව රාජූනං මහෙසිත්තමකාරයිං.

---

1. නාමෙන - සීමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 21. කුණ්ඩලකේසාපදානය

639. මෙයින් සියක්දහස්වන කප්හි ලොවට නායක වූ සියලු ධර්මයන්ගේ පාරයට පැමිණි පදුමුත්තර නම් ජිනේන්ද්‍රයන් වහන්සේ (ලොවැ) පහළ වූ සේක.

640. එකල්හි මම හංසවතී නුවර නොයෙක් රුවනින් දිලියෙන මහත්සුඛයෙන් සමර්පිත වූ සිටුකුලයෙකැ උපන්මු.

641. ඒ මහාවීර වූ බුදුරදුන් වෙතැ එළැඹැ (ඔබ) දම්දෙසුන් ඇසූමු. එයින් උපන් පැහැදීම් ඇති මම් ජිනේන්ද්‍රයන් සරණ කොට ගියමු.

642. එකලැ මහාකාරුණික වූ පදුමුත්තර නම් සර්වඥයන් වහන්සේ සුභ නම් මෙහෙණ ඛිප්පාභිඤ්ඤ (ධර්මය වහා අවබොධ කළ) මෙහෙණනන් අතරැ අගතන්හි තබා වදළසේකැ.

643. එ අසා ප්‍රමුදිත වැ මහර්ෂිබුදුරදුනට දන් දී පාමුල මස්තකයෙන් නමස්කාර කොට ඒ තනතුර ප්‍රාර්ථනා කළමු.

644. "භද්‍රාවනි, තොප විසින් යමක් පතනලද නම් ඒ සියල්ල සමෘද්ධ වන්නේ යැ, සැප ඇති වවු, නිවුණා වවු" යි මහා වීරයන් වහන්සේ අනුමෝදනා කළසේකැ.

645. මෙකපින් සුවහස්වන කප්හි ඔක්කාක කුලය උපත් කොට ඇති ගෝත්‍රයෙන් ගෞතම නම් වූ ශාස්තෘහු ලෝකයෙහි පහළ වන්නාහ.

646. ඔබ දහම්හි දයාද (හිමි) වූ (දහම් පසක් කොට රහත් වූ හෙයින්) ධර්මනිර්මිත වූ (එහෙයින් මැ) ඖරස (දුහිතෘ) වූ 'භද්ද කුණ්ඩලකේසා' යි බුද්ධශ්‍රාවිකාවක් වන්නෙහි.

647. ඒ කුශලකර්මහේතුයෙන් ද චෙතනාප්‍රණිධි හේතුයෙන් ද මිනිස්කය හැරපියා (උපත් විසින්) තව්තිසාවට ගියමු.

648. එතැනින් ච්‍යුත වූවා යාම දෙව්ලොවට ගියමු. මම එයින් තුසිතයට ද, එයින් නිර්මාණරතියට ද, එයින් වසවර්ත්තිපුරයට ද ගියා වෙමි.

649. ඒ කුශලකර්මයාගේ ශක්තියෙන් යම් යම් තෙනෙකැ (උපත් විසින්) යෙමි ද ඒ ඒ තෙනැ දෙව්රජුනට මෙහෙසිබව කරවූමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

650. තතො චුතා මනුස්සෙසු රාජූනං වසවත්තිනං
මණ්ඩලිනඤ්ච රාජූනං මහෙසිත්තමකාරයිං.

651. සම්පත්තිං අනුභොත්වාන දෙවෙසු මානුසෙසු ච
සබ්බත්ථ සුඛිතා හුත්වා නෙකකප්පෙසු සංසරිං.

652. ඉමම්හි භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධු මහායසො
කස්සපො නාම ගොත්තෙන[1] උප්පජ්ජි වදතං වරො.

653. උපට්ඨාකො මහෙසිස්ස තදා ආසි නරිස්සරො
කාසිරාජා කිකී නාම බාරාණසිපුරුත්තමෙ.

654. තස්ස ධීතා චතුත්ථා'සිං භික්ඛුදාසීති විස්සුතා
ධම්මං සුත්වා ජිනග්ගස්ස පබ්බජ්ජං සමරොචයිං.

655. අනුජානි න නො තාතො අගාරෙව තදා මයං
වීසං වස්සසහස්සානි විචරිම්හ අතන්දිතා.

656. කොමාරිබ්‍රහ්මචරියං රාජකඤ්ඤා සුඛෙධිතා
බුද්ධුපට්ඨානනිරතා මුදිතා සත්ත ධීතරො.

657. සමණී සමණගුත්තා ච භික්ඛුනී භික්ඛුදාසිකා
ධම්මා චෙව සුධම්මා ච සත්තමී සඞ්ඝදාසිකා.

658. ඛෙමා උප්පලවණ්ණා ච පටාචාරා අහං තථා
කිසාගොතමී ධම්මදින්නා විසාඛා හොති සත්තමී.

659. තෙහි කම්මෙහි සුකතෙහි චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

660. පච්ඡිමෙ ච භවෙදානි ගිරිබ්බජපුරුත්තමෙ
ජාතා සෙට්ඨිකුලෙ ඵීතෙ යද'හං යොබ්බනෙ ඨිතා.

661. චොරං වධත්ථං නීයන්තං දිස්වා රත්තා තහිං අහං
පිතා මෙ තං සහස්සෙන මොචයිත්වා වධා තතො.

662. අදාසි තස්ස මං තාතො විදිත්වාන මනං මම
තස්සාහමාසිං විස්සත්ථා[2] අතීව දයිතා හිතා.

663. සො මෙ භූසනලොභෙන බලිතජ්ඣාසයො[3] දිසො
චොරප්පපාතං නෙත්වාන පබ්බතං චෙතයී වධං.

---

1. නාමෙන – සිමු.
2. විස්සට්ඨා – මජසං.
3. බලිමජ්ඣාසයො – මජසං
බලිං පච්චාහරං – සයා.
මාලපච්චාහතං – PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

650. එයින් සැවැ මිනිසුන් කෙරෙහි සක්විතිරජුනට ද, මාණ්ඩලික රජුනට ද මෙහෙසිබව කරවූමු.

651. දෙවියන් කෙරෙහි ද මිනිසුන් කෙරෙහි ද සැපත් වළඳා සැමතන්හි සුඛිත වැ නොයෙක් කල්පයන්හි සැරුමු.

652. මේ භද්‍ර කල්පයෙහි බ්‍රාහ්මණවංශික මහායශස් ඇති ගෝත්‍රයෙන් කාශ්‍යප නම් වූ සර්වඥයන් වහන්සේ ලොවැ පහළ වූ සේක.

653. එකල්හි මහර්ෂි මුනිරජුනට උපස්ථායක නරපති වූ කිකී නම් කාසිරාජයෙක් බරණැස් පුරවරයෙහි වූයේ යැ.

654. එ රජුහට භික්ඛුදසී යි ප්‍රසිද්ධ වූ සිවුවැනි දුහිතෘ වූමු. ජිනේන්ද්‍රයන් වහන්සේගේ ධර්මය අසා පැවිද්ද රිසි කළමු.

655-656. පිය තෙමේ අප නො අනුදත්තේ යැ, එවිට අපි හවුරුදු විසිදහසක් මුළුල්ලෙහි අනලස් වැ කුමරිබඹසර සැරුමු. රාජකන්‍යා වූ සුවසේ වැඩුණු බුද්ධෝපස්ථානයෙහි නිරත ප්‍රමුදිත සප්තදුහිතෘහු නම්:

657. සමණී යැ, සමණගුත්තා යැ, භික්ඛුනී යැ, භික්ඛුනීදසිකා යැ, ධම්මා යැ, සුධම්මා යැ, සඞ්ඝදසිකා යැ යන මොහු වූහු.

658. (උහු මෙකලැ) ඛෙමා යැ, උප්පලවණ්ණා යැ, පටාචාරා යැ, එසේ ම මම යැ, කිසාගොතමී යැ, ධම්මදින්නා යැ යන අපි වෙමු. විශාඛා සත්වැනි වෙයි.

659. මම ඒ කුශලකර්මයෙන් ද චෙතනාප්‍රණිධියෙන් ද මිනිස් කය හැරපියා තාවතිංසාවට ගියමු.

660. දන් පැසුළු බෙවෙහි සමෘද්ධිමත් සිටුකුලයෙකැ උපන් මම යම් කලෙකැ තුරුණු වියෙහි සිටියා වමු ද, (එකලැ)

661-662. වධ (මරනු) පිණිස ගෙනයනු ලබන සොරකු දැක මම ඔහු කෙරෙහි ඇලුණුමු. මාගේ පිය තෙමේ දහසකින් ඔහු ඒ වධයෙන් මුදා මාගේ සිත දැන මා ඔහුට (සරණ කොට) දුන්නේ යැ. මම ඔහුට නිසැක වූමු, අතිශයින් ප්‍රිය වූමු. හිත වූමු.

663. කිළිටි අදහස් ඇති ඒ සොරා මාගේ අබරණවලට ලොබින් චොරප්‍රපාත (සොරුන් හෙළා මරන) පර්වතයට ගෙන ගොස් (මා) මරන්නට සිතුයේ යැ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

664. තද'හං පණාමයිත්වාන හත්ථකං පුකතකඤ්ජලී
රක්ඛන්ති අත්තනො පාණං ඉදං වචනමබ්‍රවිං:

665. "ඉදං සුවණ්ණං කෙයූරං මුත්තා වෙළුරියා බහූ
සබ්බං හරස්සු භද්දන්ත මඤ්ච දාසීති සාවය."

666. ඔරොපයස්සු කල්‍යාණි මා බාළ්හං පරිදෙවසි
න චා'හං අභිජානාමි අහන්ත්වා ධනමාහතං."

667. යතො සරාමි අත්තානං යතො පත්තාස්මි විඤ්ඤුතං
න චා හං අභිජානාමි අඤ්ඤං පියතරං තයා.

668. එහි තං උපගූහිස්සං කස්සඤ්ච[1] තං පදක්ඛිණං
න චදානි පුනො අත්ථි[2] මම තුය්හඤ්ච සඞ්ගමො.

669. න හි[3] සබ්බෙසු ඨානෙසු පුරිසො හොති පණ්ඩිතො
ඉත්ථීපි පණ්ඩිතා හොති තත්ථ තත්ථ විචක්ඛණා.

670. න හි[3] සබ්බෙසු ඨානෙසු පුරිසො හොති පණ්ඩිතො
ඉත්ථීපි පණ්ඩිතා හොති ලහුං අත්ථවිචින්තකා.[4]

671. ලහුඤ්ච වත ඛිප්පඤ්ච නිකට්ඨෙ[5] සමචෙතයිං
මිගමුණ්ණා[6] යථා එවං[7] තද'හං සත්තුකං වධිං.

672. යො ච උප්පතිතං අත්ථං න ඛිප්පමනුබුජ්ඣති
සො හඤ්ඤතෙ මන්දමති චොරොව ගිරිගබ්භරෙ.

673. යො ච උප්පතිතං අත්ථං ඛිප්පමෙව නිබොධති
මුච්චතෙ සත්තුසම්බාධා තද'හං සත්තුකා යථා.

674. තද තං පාතයිත්වාන ගිරිදුග්ගම්හි සත්තුකං
සන්තිකං සෙතවත්ථානං උපෙත්වා පබ්බජිං අහං.

675. සණ්ඩාසෙන ච කෙසෙ මෙ ලුඤ්චිත්වා සබ්බසො තද
පබ්බාජෙත්වා සසමයං ආචික්ඛිංසු නිරන්තරං.

---

1. කත්වාන - සිමු, මජසං.
2. තං වදමි පුන නත්ථි - සහා.
3. සො - මනො.
4. මුහුත්තමපි චින්තයෙ - මනො.
5. නිකට්ඨෙ - සි, PTS.
නෙකට්ඨෙ - සිමු.
6. මිගං උණ්ණා - මජසං.
7. චිත්තපුණ්ණායතානෙව - සහා,
මිගං පුණ්ණාය තෙනෙව - PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

664. එවිට, මම සැමියා ප්‍රණාම කොට මොහොවට බැදැදිලි වැ සියදිවි රක්නෙම් මෙවදන් කීමු:

665. "ස්වාමීනි, මේ අභූපළදනා ද, බොහෝ මුතු හා වෙරළුමිණි ද යන සියල්ල ගනු මැනැවැ, මාද දසසකැයි අස්වනු මැනැවි" යි.

(එවිට සොරා)

666. "භද්‍රාව, (අබරණ) මුදනු, දැඩි වැ නො වැළපෙනු, තෝ නසා ධන පැහැර ගැනීමක් මම නො ද දත්මි."

(භද්‍රා)

667. "යම් කලෙක පටන් තමා සරණුයෙම් ද යම් කලෙක පටන් දත්තාබවට පැමිණියා වෙම් ද, තොපට වඩා අන් ප්‍රියතරයෙක් මම නො ද දනිමි.

668. එව, තොප වැළදගන්නෙමි, තොප ප්‍රදක්ෂිණා කරන්නෙමි, මාගේ ත් තොපගේ ත් සඩගමයෙක් දූන් යලි නො ද ඇත්තේ යි." (මෙසේ කියා සොරා ප්‍රපාතයට පෙරළා හැරියා යැ.)

(මෙය දක දෙවියෙක් මෙසේ කියයි:)

669. "සියලු තන්හි පුරුෂ තෙමේ පණ්ඩිත නො වේ මැ යි, ස්ත්‍රී ද පණ්ඩිත වෙයි, ඒ ඒ කරුණෙහි විචක්ෂණ ද වේ.

670. සියලු තන්හි පුරුෂ තෙමේ පණ්ඩිත නො වේ මැ යි, ස්ත්‍රී ද පණ්ඩිත වෙයි, වහා අරුත් සිතන්නී ද වේ."

671. ඒකාන්තයෙන් නිකෘෂ්ඨයා කෙරෙහි මැනැවින් සිතීමි. මෘගරොමයෙකින් යමසේ ද, එසෙයින් එකල්හි මම සතුරා නැසීමි.

672. යමෙක් උපන් කරුණ වහා වටහා නො ගනී ද, හේ ගිරිගුහායෙහි නැසුණු අනුවණ සොරු මෙන් නැසෙයි.

673. යමෙකුත් උපන් කරුණ වහා වටහාගනී ද, හේ යමසේ එදවිසැ මම සතුරාගෙන් මිදිණුමු ද, එසේ සතුරු උවදුරින් මිදෙයි.

674. එදවසැ මම ඒ සතුරා ගිරිදුර්ගයෙහි හෙළා ශේවතාම්බරයන් (සුදුවත් හඳනා නිවටුන්) වෙතැ එළැඹැ පැවිදි වූමු.

675. එකල්හි (ඔහු) හඩුවකින් මාගේ කෙහෙ සව්ප්‍රකාරයෙන් උදුරා පැවිදි කොට නිරතුරු ස්වසමය කීහු.

T 8

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

676. තතො තං උග්ගහෙත්වාන නිසීදිත්වාන එකිකා
සමයං තං විචින්තෙසිං සුචානො මානුසං කරං.

677. ජිනග්ගං ගය්හ සම්පෙ මෙ පාතයිත්වා අපක්කමි
දිස්වා නිමිත්තමලභිං හත්ථං තං පුළවාකුලං.

678. තතො වුට්ඨාය සංවිග්ගා අපුච්ඡිං සහධම්මිකෙ
තෙ අවොචුං: 'විජානන්ති තමත්ථං[1] සක්‍යභික්ඛවො.'

679. සාහං තමත්ථං පුච්ඡිස්සං උපෙත්වා බුද්ධසාවකෙ
තෙ මමාදාය ගච්ඡිංසු බුද්ධසෙට්ඨස්ස සන්තිකං.

680. සො මෙ ධම්මමදෙසෙසි 'ඛන්ධායතනධාතුයො
අසුභානිච්චා දුක්ඛා'ති[2] අනත්තා'ති ච නායකො.

681. තස්ස ධම්මං සුණිත්වා'හං ධම්මචක්ඛුං[3] විසොධයිං
තතො විඤ්ඤාතසද්ධම්මා පබ්බජ්ජං උපසම්පදං.

682. ආයාචිං සො[4] තදා ආහ 'එහි භද්දෙ'ති නායකො
තද'හං උපසම්පන්නා පරිත්තං[5] තොයමද්දසං.

683. පාදපක්ඛාලනෙනා'හං ඤත්වා සඋදයං වයං[6]
තථා සබ්බෙපි සඞ්ඛාරා ඉති සංචින්තයිං[7] තදා

684. තතො චිත්තං විමුච්චි මෙ අනුපාදාය සබ්බසො
ඛිප්පාභිඤ්ඤානමග්ගං මං තදා පඤ්ඤපයි[8] ජිනො.

685. ඉද්ධීසු ච වසී හොමි දිබ්බාය සොතධාතුයා
පරචිත්තානි ජානාමි සත්ථුසාසනකාරිකා.

686. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛුවිසොධිතං
ඛෙපෙත්වා ආසවෙ සබ්බෙ විසුද්ධා'සිං සුනිම්මලා.

687. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා.

---

1. තං අත්ථං – මජසං.
2. අසුභානිච්චදුක්ඛාති – මජසං.
3. ධම්මචක්ඛු – මජසං.
4. ආයාචිතො – මජසං.
5. ගච්ඡන්ති – සී.
6. සඋදයබ්බයං – මජසං.
7. සඞ්ඛාරෙ ඊදිසං චින්තයිං – මජසං.
8. තදා ච ඨපයී – සී.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

676-677. ඔවුන්ගෙන් එය ඉගෙන එකලා වැ හිඳ ඒ සමය විමසාලූමු (එවිටැ) සුනඛයෙක් සුන් මිනිස් අතක් ඩැහැගෙන අවුත් මා වෙතැ මෙහළා ඉවත් වැ ගියේ යැ. පණුවන් පිරුණු ඒ අත දැක අසුබනිමිති ලදුමු.

678. එතැනින් නැගැ සංවිග්න වැ සහධැමියන් පුළුවුත්මු. උහු 'එහි අරුත ශාක්‍යභික්‍ෂූහු දනිතැ' යි කීහු.

679. 'බුද්ධශ්‍රාවකයන් වෙතැ එළැඹැ එහි අරුත පුළුවුස්නෙමි'යි ඒ මම (ඔවුනට කීමු.) ඔහු මා කැදවාගෙන බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේ වෙතැ ගියාහු යැ.

680. ඒ නායකයන් වහන්සේ 'ස්කන්ධ - ආයතන – ධාතූහු අශුභහ, අනිත්‍යහ, දුඃඛහයි ද අනාත්මහ' යි ද දහම් දෙසූ සේකැ.

681-682. ඔබගේ දහම් අසා මම ධම්චක්‍ෂුස (සොතාපත්ති මග්ගඥාණය) පිරිසිදු කළමු. ඉක්බිති දත් සදහම් ඇතියෙම් පැවිද්ද හා උපසම්පදව යාච්ඤා කළමු. එකල්හි ඒ නායකයන් වහන්සේ 'භද්‍රාවනි, එව' යි වදළසේකැ. එවිටැ උපසම්පන්න වූ මම මද ජලයක් දුටුමු.

683. එකල්හි මම පා දෙව්මෙන් (ඒ ජලය) උදයව්‍යය (ඇති වීම හා නැතිවීම) සහිත යයි දැන සියලු සංස්කාරයෝ ද එසෙයින් මැ ඇති වැ නැති වන්නාහ යි මෙසේ සිතුමු.

684. එයින් මාගේ සිත උපාදන විසින් ග්‍රහණය නො කොට සැමඅයුරින් (කෙලෙසුන්ගෙන්) සිත මිදුනේ යැ. එකල්හි ජිනේන්ද්‍රයන් වහන්සේ ඛිප්පාභිඤ්ඤ (වහා දහම් අවබොධ කළ) මෙහෙණන් අතර මා අග්‍ර කොට පැනවූ සේකැ.

685. බුදුරදුන්ගේ අනුසසුන් කරන මම ඍද්ධීන්හි ද දිබ්බසෝතධාතුයෙහි ද වශී වෙමි පරසිත් දනිමි.

686. පෙර විසූ කඳපිළිවෙළ දනිමි, දිවැස පිරිසිදු කරන ලද යැ, සියලු ආශ්‍රව ක්‍ෂය කොට මොනොවට කෙලෙස්මල රහිත වැ විශුද්ධ වූමු.

687. මා විසින් ශාස්තෘහු ඇසුරු කරන ලදහ, බුදුසසුන් කරන ලද යැ, ගුරු වූ කෙලෙස්බර බහා තබන ලද යැ, තෘෂ්ණාව නසන ලදී

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

688. යස්සත්ථාය පබ්බජිතා අගාරස්මානගාරියං
සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයො.

689. අත්ථධම්මනිරුත්තීසු පටිභාණෙ තථෙව ච
ඤාණං මෙ විපුලං සුද්ධං බුද්ධසෙට්ඨස්ස සාසනෙ.[1]

690. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා
නාගීව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවා.

691. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ[2]
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

692. පටිසම්භිද චතස්සො ච[3] විමොක්ඛාපි ච අට්ඨිමෙ
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං භද්ද කුණ්ඩලකෙසා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

කුණ්ඩලකෙසාථෙරියාපදානං පඨමං.

## 22. කිසාගොතමී අපදානං.

693. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මාන පාරගූ
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

694. තද'හං හංසවතියං ජාතා අඤ්ඤතරෙ කුලෙ
උපෙත්වා තං නරවරං සරණං සමුපාගමිං.

695. ධම්මඤ්ච තස්ස අස්සොසිං චතුසච්චූපසංහිතං
මධුරං පරමස්සාදං වට්ටසන්ති[4] සුඛාවහං.

696. තද ච[5] භික්ඛුනිං වීරො ලූඛචීවරධාරිනිං
ඨපෙන්තො එතදග්ගම්හි වණ්ණයී පුරිසුත්තමො.

697. ජනෙත්වානප්පකං පීතිං සුත්වා භික්ඛුනියා ගුණං
කාරං කත්වාන බුද්ධස්ස යථාසත්ති යථාබලං.

698. නිපච්ච මුනිවීරං තං තං ඨානමභිපත්ථයිං
තදනුමොදි සම්බුද්ධො ඨානලාභාය නායකො.

1. වාහසා – PTS.
2. මම බුද්ධස්ස සාසනෙ – මජසං.
3. චතස්සො – මජසං.
4. විත්තසන්ති – සයා.
5. කදචි – PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

688. යම් අර්ථයක් පිණිස ගිහිගෙන් නික් මැ බුදුසසුන්හි පැවිදි වූවා නම් සියලු සංයෝජනයන්ගේ ක්‍ෂය වීම වූ ඒ අර්ථය මා විසින් අනුප්‍රාප්ත යැ.

689. අර්ථ – ධර්ම – නිරුක්තියෙහි ද ප්‍රතිභාණයෙහි ද එසේ මැ බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේගේ අනුශාසනයෙහි ද මාගේ ඥානය පැතිර පවත්නේ යැ, විශුද්ධ වැ සිටුනේ යි.

690. මා විසින් ක්ලේශයෝ දවන ලද්දහ. සියලු භවයෝ නසන ලදහ. බැඳුම් සිඳ සරන ඇත් රැජිනක සෙයින් ආස්‍රව රහිත වූවා වාස කරමි.

691. බුදුරජාණන් වහන්සේ වෙතැ ඒකාන්තයෙන් මට ස්වාගත-යෙක් (යහපතෙක්) වීයැ. ත්‍රිවිද්‍යා අනුප්‍රාප්ත යැ. බුදුසසුන් කරන ලදී.

692. මේ සිවුපිළිසැඹියා ද අෂ්ටවිමොක්‍ෂ ද ෂඩ් අභිඥා ද සාක්‍ෂාත් කරන ලද යැ, බුදුසසුන් කරන ලදී.

මෙසෙයින් භද්‍ද කුණ්ඩලකේසා මෙහෙණ මේ ගාථා පැවසූ.

පළමුවැනි කුණ්ඩලකේසා ස්ථවිරාපදාන යි.

## කිසාගෝතමී අපදානය

693. (තුන්ලොවට) නායක වූ සියලු ධර්මයන්ගේ පරතෙරට පැමිණි පදුමුත්තර නම් ජිනේන්ද්‍රයන් වහන්සේ (ලොවැ) පහළ වූ සේකැ.

694. එකල්හි මම හංසවතී නුවර එක්තරා කුලයෙකැ උපන්-නෙම් ඒ නරොත්තමයන් වහන්සේ කරා එළැඹැ (ඔවුන්) සරණ කොට ගියෙමි.

695. ඔබගේ චතුස්සත්‍යයෙන් යුක්ත වූ මධුර වූ පරමාස්වාද-ජනක වූ වෘත්ත (දුඃඛොපසම සඞ්ඛ්‍යාත) ශාන්ති සුඛය එළවන ධර්මය ද ඇසීමි.

696. එකල්හි වීර වූ පුරුෂොත්තමයන් වහන්සේ ඒතදග්‍රයෙහි තබමින් රූක්‍ෂචීවර ධරන මෙහෙණක වර්ණනා කළ සේකැ.

697. මෙහෙණගේ ගුණ අසා අපමණ ප්‍රීතිය උපදවා ශක්ති පමණින් බල පමණින් බුදුරජාණන් වහන්සේට සත්කාර කොට

698. ඒ මුනිවරයන් වහන්සේ ප්‍රණාම කොට ඒ තනතුර ප්‍රාර්ථනා කළෙමි. එකල්හි නායක වූ සම්බුද්ධයන් වහන්සේ අනු-මෝදනා කළ සේකැ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

699. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො
ගොතමො නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

700. "තස්ස ධම්මෙසු දායාද ඔරසා ධම්මනිම්මිතා
ගොතමී නාම නාමෙන[1] හෙස්සසි සත්ථු සාවිකා."

701. තං සුත්වා මුදිතා හුත්වා යාවජීවං තදා ජිනං
මෙත්තචිත්තා පරිචරිං පච්චයෙහි විනායකං.

702. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

703. ඉමස්මිං භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධු මහායසො
කස්සපො නාම ගොත්තෙන උප්පජ්ජි වදතං වරො.

704. උපට්ඨාකො මහෙසිස්ස තදා ආසි නරිස්සරො
කාසිරාජා කිකී නාම බාරාණසි පුරුත්තමෙ.

705. පඤ්චමී තස්ස ධීතා'සිං ධම්මා නාමෙන විස්සුතා
ධම්මං සුත්වා ජිනග්ගස්ස පබ්බජ්ජං සමරොචයිං.

706. අනුජානි න නො තාතො අගාරෙව තදා මයං
වීසං වස්සසහස්සානි විචරිම්හ අතන්දිතා.

707. කොමාරිබ්‍රහ්මචරියං රාජකඤ්ඤා සුඛෙධිතා
බුද්ධුපට්ඨානනිරතා මුදිතා සත්තධීතරො.

708. සමණී සමණගුත්තා ච භික්ඛුනී භික්ඛුදාසිකා
ධම්මා චෙව සුධම්මා ච සත්තමී සඞ්ඝදාසිකා.

709. ඛෙමා උප්පලවණ්ණා ච පටාචාරා ච කුණ්ඩලා
අහං චෙව ධම්මදින්නා විසාඛා හොති සත්තමී.

710. තෙහි කම්මෙහි සුකතෙහි චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

711. පච්ඡිමෙ ච භවෙ දානි ජාතා සෙට්ඨිකුලෙ අහං
දුග්ගතෙ අධනෙ නට්ඨෙ[2] ගතා ච සධනං කුලං.

712. පතිං ඨපෙත්වා සෙසා දිස්සන්ති[3] අධනා ඉති
යදා ච සසූතා[4] ආසිං සබ්බෙසං දයිතා තදා.

1. කිසාගොතමී නාමෙන - මජසං.
2. නීචෙ - සතා.
නිද්ධෙ - PTS.
3. දෙස්සන්ති - මජසං.
4. පසූතා - මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

699. මෙකපින් සියදහස්වන කප්හි ඔක්කාක කුලය උපත් කොට ඇති ගෝත්‍රයෙන් ගෞතම නම් වූ ශාස්තෘහු ලොව පහළ වන්නාහ.

700. "තෝ ඔබ දහම්හි දයාද වූ ඖරස වූ ධර්මනිර්මිත වූ නමින් ගෝතමී නම වූ ශාස්තෘශ්‍රාවිකාවක් වන්නෙහි."

701. එ අසා මෑඳූ වැ විනායක වූ ජිනේන්ද්‍රයන් වහන්සේ දිවිහිම් කොට සිවුපසයෙන් උවටැන් කළමු.

702. එ කුශලකර්මයෙන් ද චෙතනාප්‍රණිධි හේතුයෙන් ද මම මිනිස්කය හැරපියා තව්තිසාවට ගියමු.

703. මේ භද්‍ර කල්පයෙහි බ්‍රහ්මබන්ධු වූ මහායශස් ඇති ගෝත්‍රයෙන් කාශ්‍යප නම් වූ සර්වඥයන් වහන්සේ ලොවැ පහළ වූ සේකැ.

704. එ සමයෙහි මහර්ෂි බුදුරජාණන් වහන්සේට උපස්ථායක වූ නරෙශ්වර කිකී නම් කසීරජෙක් බරණැස් පුරවරයෙහි වූයේ යැ.

705. ඒ රජුට ධම්මා යන නමින් විශ්‍රුත වූ පස්වැනි දූහිතෘ වූමු. ජිනේන්ද්‍රයන් වහන්සේගේ ධර්මය අසා ප්‍රව්‍රජ්‍යාව කැමැති වූමු.

706-707. පියතෙමේ අපට පැවිද්ද නො අනුදත්තේ යැ, එකල්හි අපි ගෙහි මැ හවුරුදු විසිදහසක් මුළුල්ලෙහි අනලස් වූවමෝ කුමරි බඹසර සැරූම්හ. රාජකන්‍යා වූ සුවසේ වැඩුණු බුදුවටන්හි නියැලි ප්‍රමුදිත වූ සප්තදුහිතෘහු නම්:

708. සමණී යැ, සමණගුත්තා යැ, භික්ඛුනී යැ, භික්ඛුදසිකා යැ, ධම්මා යැ. සුධම්මා යැ, සත්වැනි සඞසදසිකා යැ යන මොහු වෙති.

709. (මෙකලැ) ඛෙමා යැ, උප්පලවණ්ණා යැ, පටාචාරා යැ, කුණ්ඩලා යැ, මම් යැ, ධම්මදින්නා යැ යන අපි වෙමු. විශාඛා සත්වැනි වෙයි.

710. එ කුශලකර්මයෙන් ද චෙතනාප්‍රණිධියෙන් ද මම මිනිස් කය හැරපියා තව්තිසා දෙව්ලොවට ගියමු.

711. මෙකලැ පැසුලු බෙවෙහි මම දුගී ධන නැති ධනය නැසුණු සිවු කුලයෙකැ උපන්මු. ධන ඇති (පති) කුලයකට ගියා ද වෙමි.

712. සැමියා තබා සෙස්සෝ 'නිර්ධන එකැකැ' යි මට අවඥ කරත්. යම් කලෙකැ සපුත්‍ර වූවා ද එකලැ සියල්ලන්ට ප්‍රිය වූමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

713. යදා සො තරුණො භද්දො[1] කොමලඞ්ගො[2] සුඛෙධිතො
සපාණමිව කන්තො මෙ තදා යමවසං ගතො.

714. සොකට්ටා දීනවදනා අස්සුනෙත්තා රුදම්මුඛා
මතං කුණපමාදාය විලපන්තී භමාමහං.

715. තදා එකෙන සන්දිට්ඨා උපෙත්වා භිසක්කුත්තමං.[3]
අවොචං "දෙහි භෙසජ්ජං පුත්තසඤ්ජීවනන්ති භො."

716. "න විජ්ජන්තෙ මතා යස්මිං ගෙහෙ සිද්ධත්ථකං තතො
ආහරා"ති ජිනො ආහ විනයොපායකොවිදෙ.

717. තදා ගමිත්වා සාවත්ථිං න ලභිං තාදිසං ඝරං
කුතො සිද්ධත්ථකං තස්මා තතො ලද්ධා සතිං අහං.

718. කුණපං ඡඩ්ඩයිත්වාන උපෙසිං ලොකනායකං
දූරතොව මමං දිස්වා අවොච මධුරස්සරො.

719. "යො ච වස්සසතං ජීවෙ අපස්සං උදයබ්බයං
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො උදයබ්බයං.

720. න ගාමධම්මො නො නිගමස්ස ධම්මො
නචාපයං එකකුලස්ස ධම්මො
සබ්බස්ස ලොකස්ස සදෙවකස්ස
එසොව ධම්මො යදිදං අනිච්චතා."

721. සාහං සුත්වානිමා ගාථා ධම්මචක්ඛුං විසොධයිං
තතො විඤ්ඤාතසද්ධම්මා පබ්බජිං අනගාරියං.

722. තථා පබ්බජිතා සන්තී යුඤ්ජන්තී ජිනසාසනෙ
න චිරෙනෙව කාලෙන අරහත්තමපාපුණිං.

723. ඉද්ධීසු ච වසී හොමි දිබ්බාය සොතධාතුයා
පරචිත්තානි ජානාමි සත්ථුසාසනකාරිකා.

724. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛුං විසොධිතං
ඛෙපෙත්වා ආසවෙ සබ්බෙ විසුද්ධාසිං සුනිම්මලා.

---

1. පුත්තකො – සීමු.
2. කොමලකො – මජසං.
කොමාරකො – සහා.
3. භිසක්කුත්තමං – මජසං.
භිසඤ්ඤුත්තමං – සීමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

713. යම් කලෙක්හි මෙහේ (පුත්) තරුණ ද, හද්‍ර ද, කොමළ අවයව ඇත්තේ ද, සුවසේ වැඩුණේ වේද, සිය පණ මෙන් මට කාන්ත ද, එකල්හි මරුවශයට ගියේ යි.

714. සොවින් පෙළුණු මම බැගෑ මූහුණු ඇති වැ කඳුළු පිරුණු නෙත් ඇති වැ හඬන මුව ඇති වැ මළකුණ රැගෙන වැලපෙමින් (ඒ ඒ තෙනැ) ඇවිද්දෙමි.

715. එවිටැ එකකු විසින් දක්වනු ලදුයෙම් වෛද්‍යරාජයන් (බුදුරදුන්) වෙතැ පැමිණ "පින්වත් උතුමාණනි, පුතු ජීවත් කරන බෙහෙදක් දෙනු මැනැවැ"යි කීමු.

716. "යම් ගෙයෙකැ මළාහු නො වෙත් ද, එබඳු ගෙයකින් සිදුහතු (අබ) සුහක් ගෙන එව" යි හික්මවීමෙහි උපායෙහි දක්ෂ ජිනේන්ද්‍රයන් වහන්සේ වදළසේකැ.

717-718. එවිටැ සැවතට ගොස් (ඇවිද) එබඳු ගෙයක් නො ලත්මු. සිදුහතු කොතැනින් ලබම් ද? කුමක් හෙයින් ද? එයින් මම සිහිය ලැබ මළකුණ හැරදමා ලෝකනායකයන් වහන්සේ වෙතැ එළැඹුණමු. මධුරස්වර ඇති ඔබ දුර දී මැ මා දක මෙසේ වදළාහ:

719. පඤ්චස්කන්ධයාගේ උදයව්‍යය (ඇතිවීම හා නැතිවීම) නො දක්නා යමෙක් හවුරුදු සියයක් ජීවත්වන්නේ නමුදු (ඔහුගේ ජීවත් වීමට වඩා) උදයව්‍යය නුවණින් දක්නහුගේ එක් දවසක් ජීවත්වීම උතුම් වෙයි.

720. මේ මරණ දහම එක් ගමකට අයත් ස්වභාවයෙක් නො වෙයි, එක් නියම් ගමකට අයත් ස්වභාවයෙක් ද නො වෙයි, එක් කුලයකට අයත් ස්වභාවයකුදු නො වෙයි, තෙල දහම සදේවක ලෝකයාට මැ අයත් ස්වභාවයෙකි. එනම් අනිත්‍යතාව යි.

721. ඒ මම මේ ගාථා අසා සොතාපත්තිමග්ගඤාණය පිරිසිදු කළමු. ඉක්බිති දත් සදහම් ඇත්තෙම් බුදුසසුනෙහි පැවිදි වූමු.

722. එසේ පැවිදි වූවා මැ ජිනසසුන්හි යෙදෙන්නෙම් (විවසුන් වඩනුයෙම්) නොබෝ කලකින් මැ රහත්බවට පැමිණියමු.

723. ශාස්තෲශාසනකාරිණී වූයෙම්, සෘද්ධියෙහි ද දිව්‍යශොත්‍ර ධාතුයෙහි ද වශී වෙමි. පරසිත් දනිමි.

724. පෙර විසූ කඳපිළිවෙළ දනිමි, දිවැස පිරිසිදු කරන ලදී. සියලු ආශ්‍රව නසා අතිශයින් නිර්මල වූයෙම් විශුද්ධ වූමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

725. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා.

726. යස්සත්ථාය පබ්බජිතා අගාරස්මානගාරියං
සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයො.

727. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
ඤාණං මෙ විමලං සුද්ධං බුද්ධසෙට්ඨස්ස වාහසා.

728. සඞ්කාරකූටා ආහත්වා සුසානා රථියාපි ච
තතො සඞ්ඝාටිකං කත්වා ලූඛං ධාරෙමි චීවරං.

729. ජිනො තස්මිං ගුණෙ තුට්ඨො ලූඛචීවරධාරණෙ
ඨපෙසි එතදග්ගම්හි පරිසාසු විනායකො.

730–732. කිලෙසා ඣාපිතා මය්හං –පෙ– කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං කිසාගොතමී භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

**කිසාගොතමීථෙරියාපදානං දුතියං.**

## 23. ධම්මදින්නාපදානං

733. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මාන පාරගූ
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

734. තදා'හං හංසවතියං කුලෙ අඤ්ඤතරෙ අහුං
පරකම්මකරී ආසිං නිපකා සීලසංවුතා.

735. පදුමුත්තර බුද්ධස්ස සුජාතො අග්ගසාවකො
විහාරා අභිනික්ඛම්ම පිණ්ඩපාතාය ගච්ඡති.

736. ඝටං ගහෙත්වා ගච්ඡන්ති තදා උදකහාරිකා
තං දිස්වා අදදිං[1] පූවං[2] පසන්නා සෙහි පාණිභි.

1. අදදං – මජසං.
2. පූපං – PTS

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

725. ශාස්තෘහු මා විසින් ඇසුරු කරන ලදහ. බුදුසසුන් කරන ලදී. මහත් කෙලෙස් බර බහා තබන ලද්දේ වෙයි. තෘෂ්ණාව මුලිනුපුටා නසන ලදී.

726. යම් අර්ථයක් පිණිස ගිහිගෙන් නික්මැ බුදුසසුන්හි පැවිදි වූවා වෙම් ද, සියලු සංයොජනයන්ගේ ක්‍ෂය යවීම වූ ඒ අර්ථය මා විසින් අනුප්‍රාප්ත යි.

727. අර්ථ – ධර්ම - නිරුක්තියෙහි ද එසේ මැ ප්‍රතිභාණයෙහි ද බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේගේ අනුබලයෙන් මාගේ ඥානය නිර්මල යැ. පිරිසිදු යැ.

728. කසළගොඩින් ද සොහොනෙන් ද වීථියෙන් ද (රෙදි කඩ) අවුලාගෙන අවුත් එයින් සඟළක් කොට රූක්‍ෂ සිවුරු ධරමි,

729. (තමන්හට නායකයකු නැති හෙයින්) විනායක වූ බුදුරජාණන් වහන්සේ රූක්‍ෂ චීවර ධැරීම වූ ඒ ගුණයෙහි සතුටු වූ සේක් පිරිස් මධ්‍යයෙහි මා ඒතදග්‍රයෙහි තැබූසේකැ.

730–732. මා විසින් කෙලෙස්හු දවන ලදහ... බුදුසසුන් කරන ලදී.

මෙසෙයින් කිසාගොතමී මෙහෙණ මේ ගාථා පැවැසූ.

දෙවැනි කිසාගොතමී ස්ථවිරාපදන යි.

## 23. ධම්මදින්නාපදනය

733. මෙ කපින් සුවහස් වන කප්හි සියලු ධර්මයන්ගේ පාරයට පැමිණි ලෝකනායක වූ පියුමතුරා නම් බුදුරජාණන් වහන්සේ ලොවැ පහළ වූ සේකැ.

734. එ සමයෙහි මම හංසවතී නුවර එක්තරා කුලයෙකැ උපන්මු. නුවණැති ශීලයෙන් සංවර වූ මෙරමා වැඩ කරන්නක් (දැස්සක්) වූමු.

735. පියුමතුරා බුදුරදුන්ගේ සුජාත නම් අග්‍රශ්‍රාවකයාණෝ වෙහෙරින් නික්මැ පිඩු පිණිස වඩනාහ.

736. එකලැ ඝටවෙට්කාවක් (කළදැස්සක්) වූ මම කළයක් රැගෙන යන්නෙම් ඔබ දැක ස්වකීය ප්‍රාණපරිත්‍යාගයෙන් ප්‍රසන්න වැ පූපයක් දුනුමු.

737. පටිග්ගහෙත්වා තත්ථෙව නිසින්නකා පරිභුඤ්ජි සො
තතො නෙත්වාන තං ගෙහං අදාසිං තස්ස භොජනං.

738. තතො මෙ අය්‍යකො තුට්ඨො අකරි සුණිසං සකං
සස්සුයා සහ ගන්ත්වාන සම්බුද්ධං අභිවාදයිං.

739. තදා සො ධම්මකථිකං භික්ඛුනිං පරිකිත්තයං
ඨපෙසි එතදග්ගස්මිං තං සුත්වා මුදිතා අහං

740. නිමන්තයිත්වා සුගතං සසඞ්ඝං ලොකනායකං
මහාදානං දදිත්වාන තං ඨානං අභිපත්ථයිං.

741. තතො මං සුගතො ආහ ඝනනින්නාදසුස්සරො
“මමුපට්ඨානනිරතෙ සසඞ්ඝං පරිවෙසිකෙ.

742. සද්ධම්මසවණෙ යුත්තෙ ගුණවඩ්ඪිතමානසෙ
භද්දෙ භවස්සු මුදිතා ලච්ඡසෙ පණිධීඵලං.

743. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො
ගොතමො නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

744. තස්ස ධම්මෙසු දායාදා ඔරසා ධම්මනිම්මිතා
ධම්මදින්නාති නාමෙන හෙස්සසි සත්ථුසාවිකා”.

745. තං සුත්වා මුදිතා හුත්වා යාවජීවං මහාමුනිං
මෙත්තචිත්තා පරිචරිං පච්චයෙහි විනායකං.

746. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

747. ඉමස්මිං භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධු මහායසො
කස්සපො නාම ගොත්තෙන උප්පජ්ජි වදතං වරො.

748. උපට්ඨාකො මහෙසිස්ස තදා ආසි නරිස්සරො
කාසිරාජා කිකී නාම බාරාණසිපුරුත්තමෙ.

749. ජට්ඨා තස්සාසහං ධීතා සුධම්මා ඉති විස්සුතා
ධම්මං සුත්වා ජිනග්ගස්ස පබ්බජ්ජං සමරොචයිං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

737. ඔබ (එය) පිළිගෙන එහි මැ හිද වැළඳූහ. ඉක්බිති ඒ කෙරණුවන් ගෙට කැඳවා ගෙන ගොස් ඔබට බොජුන් පිළිගැන්වූමු.

738. එයින් මාගේ ස්වාමි තෙමේ සතුටු වූයේ (මා) සිය ලෙහෙළිය කෙළේ යැ. නැන්දනිය සමග (අරමට) ගොස් සම්බුදු රදුන් අභිවාදන කළමු.

739–740. එකල්හි උත්වහන්සේ ධර්මකථික මෙහෙණක ගුණ කථනය කරනසේක් එතදග්‍රයෙහි තැබූසේක. එ අසා ප්‍රමුදිත වූ මම සඞ්ඝයා සහිත ලෝකනායක වූ සුගතයන් වහන්සේ නිමන්ත්‍රණ කොට මහදන් දී ඒ තනතුර ප්‍රාර්ථනා කළමු.

741–742. ඉක්බිති සුගත වූ බුදුරජාණන් වහන්සේ ගැඹුරු නින්නාද සහිත මනාහඬ ඇති වැ මට මෙසේ වදළසේක: "උපස්ථාන කිරීමෙහි ඇලුණු, සඞ්ඝයා සහිත මා වළඳවන, සදහම් ඇසීමෙහි යෙදුණු, ගුණයෙන් වැඩුණු සිත් ඇති භද්‍රාවනි, ප්‍රමුදිත වව, ප්‍රාර්ථනාඵලය ලබන්නෙහි.

743. මෙයින් සුවහස්වන කප්හි ඔක්කාක කුලය උපත් කොට ඇති ගෝත්‍රයෙන් ගෞතම නම්වූ ශාස්තෘහු ලොවැ පහළ වන්නාහ.

744. (තෝ) ඔබ දහම්හි දයාද වූ ඖරස වූ ධර්මනිර්මිත වූ නමින් ධම්මදින්නා යි ප්‍රසිද්ධ ශාස්තෘ ශ්‍රාවිකාවක් වන්නෙහි"යි.

745. එ අසා සතොස් වැ විනායක වූ මහාමුනිවරයන් වහන්සේ මෙත්සිත් ඇතියෙම් දිවිහිම් කොට ප්‍රත්‍යයෙන් උපස්ථාන කළමු.

746. ඒ කුශලකර්ම හේතුයෙන් ද චේතනාප්‍රණිධි හේතුයෙන් ද මිනිස් කය හැරපියා තවතිසා දෙව්ලොවට ගියමු.

747. මේ භද්‍ර කල්පයෙහි බ්‍රාහ්මණවංශික මහා යශස් ඇති ගොත්‍රයෙන් කාශ්‍යප නම් වූ වක්තෘවර සර්වඥයන් වහන්සේ (ලොකයෙහි) පහළ වූ සේක.

748. එකලැ මහර්ෂි බුදුරජුනට උපස්ථායක වූ නරෙශ්වර කිකී නම් කාශිරාජයෙක් බරණැස් පුරවරයෙහි වූයේ යැ.

749. මම ඒ රජුට සුධම්මා යි ප්‍රසිද්ධ සවැනි දුහිතෘ වූමු. ජිනේන්ද්‍රයන් වහන්සේගේ ධර්මය අසා ප්‍රව්‍රජ්‍යාව කැමැති වූමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

750. නානුජානාසි[1] මං තාතො අගාරෙ'නාලයා[2] මයං
වීසං වස්සසහස්සානි විචරිම්හ අතන්දිතා.

භාණවාරං තතියං.

751. කොමාරිබ්‍රහ්මචරියං රාජකඤ්ඤා සුඛෙධිතා
බුද්ධුපට්ඨාන නිරතා මුදිතා සත්ත ධීතරො.

752. සමණී සමණගුත්තා ච භික්ඛුනී භික්ඛුදාසිකා
ධම්මා චෙව සුධම්මා ච සත්තමී සඞ්ඝදාසිකා.

753. ඛෙමා උප්පලවණ්ණා ච පටාචාරා ච කුණ්ඩලා
ගොතමී ච අහං චෙව විසාඛා හොති සත්තමී.

754. තෙහි කම්මෙහි සුකතෙහි චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

755. පච්ඡිමෙ ච භවෙ දානි ගිරිබ්බජපුරුත්තමෙ
ජාතා සෙට්ඨිකුලෙ ඵීතෙ සබ්බකාමසමිද්ධකෙ.[3]

756. යදා රූපගුණොපෙතා පඨමෙ යොබ්බනෙ ඨිතා
තදා පරකුලං ගන්ත්වා වසිං සුඛසමප්පිතා.

757. උපෙත්වා ලොකසරණං සුණිත්වා ධම්මදෙසනං
අනාගාමිඵලං පත්තො සාමිකො මෙ සුබුද්ධිමා.

758. තදා තං අනුජානෙත්වා පබ්බජිං අනගාරියං
න චිරෙනෙව කාලෙන අරහත්තමපාපුණිං.

759. තදා උපාසකො සො මං උපගන්ත්වා අපුච්ඡථ
ගම්භීරෙ නිපුණෙ පඤ්හෙ තෙ සබ්බෙ ව්‍යාකරිං අහං.

760. ජිනො තස්මිං ගුණෙ තුට්ඨො එතදග්ගෙ ඨපෙසි මං
භික්ඛුනිං ධම්මකථිකං නාඤ්ඤං පස්සාමි එදිසං.

761. ධම්මදින්නා යථා ධීරා එවං ධාරෙථ භික්ඛවො
එවාහං පණ්ඩිතා ජාතා නායකෙනානුකම්පිතා.

762. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා.

763. යස්සත්ථාය පබ්බජිතා අගාරස්මානගාරියං
සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයො.

---

1. අනුජානි න නො - මජසං.
2. සමිද්ධිනෙ - මජසං.
3. සබ්බකාමිසමිද්ධනෙ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

750-751. පිය තෙමේ මා නො අනුදත්තේ යැ. අපි ගිහිගෙහි අනාලය වූවමෝ විසිදහසක් හවුරුදු අනලස් වැ කුමරිබඹසර සැරූම්හ. රාජකන්‍යා වූ සුවසේ වැඩුණු බුද්ධොපස්ථානයෙහි නිරත ප්‍රමුදිත සත් දූහිතෘහු නම්:

752. සමණී යැ, සමණගුත්තා යැ, භික්ඛුනී යැ, භික්ඛුනීදසිකා යැ, ධම්මා යැ, සුධම්මා යැ, සත්වැනි සඞ්ඝදසිකා යැ යන මොහු වෙත්.

753. (මෙකලැ) ඛෙමා යැ, උප්පලවණ්ණා යැ, පටාචාරා යැ, කුණ්ඩලකෙසා යැ, කිසාගොතමී යැ, මම යැ යන අපි වෙමු, විශාඛා සත්වැනි වෙයි.

754. මම ඒ කුශල කර්මයෙන් ද, චේතනාප්‍රණිධියෙන් ද, මිනිස්කය හැරපියා තව්තිසා දෙව්ලොවට ගියමු.

755. දන් පශ්චිම භවයෙහි ගිරිව්‍රජ (-රජගහ) පුරවරයෙහි ධනාඪ්‍ය සියලු කම්සැපතින් සමෘද්ධ වූ සිටු කුලයෙකැ උපන්මු.

756. යම් කලෙකැ රූපයෙන් ගුණයෙන් යුතුවැ පළමු යොවුන් වියෙහි සිටියා වෙම් ද එකලැ පර (-පති) කුලයට ගොස් සැපයෙන් සමර්පිත වූමු.

757. වෙසෙසින් බුද්ධිමත් වූ මාගේ ස්වාමිපුරුෂ (-විශාඛ) තෙමේ ලෝකනාථයන් වහන්සේ වෙතැ එළැඹැ දම් දෙසුම් අසා අනාගාමී ඵලයට පැමිණියේ යි.

758. එකල්හි ඔහු අනුදන්වා බුදුසසුන්හි පැවිදි වූමු. නොබෝ කලකින් මැ රහත්බවට පැමිණියමු.

759. ඒ උවසු මා වෙතැ අවුත් ගැඹුරු සියුම් පැන විචාළේ යැ. මම ඒ සියල්ල විසඳා කීමු.

760-761. ඒ ගුණයෙහි සතුටු වූ බුදුහු "තෙල මෙහෙණ බඳු ධර්මකථික අනෙකක නො දක්මි, ධම්මදින්නා යම් හෙයෙකින් දිර ද මහණෙනි, එසේ ධරවූ" යි මා ඒතදග්‍රයෙහි තබාලූහ. මෙසේ ලෝක-නාථයන් වහන්සේ විසින් අනුකම්පිත වූ මම නුවණැති වූමු.

762. මා විසින් ශාස්තෲහු ඇසුරු කරන ලදහ, බුදුසසුන් කරන ලද යැ, ගුරු වූ කෙලෙස් බර බහා තබන ලදයැ, තෘෂ්ණාව සමූල කොට නසන ලදී.

763. යම් ඵලයක් සඳහා ගිහිගෙන් නික්මැ බුදුසසුන්හි පැවිදි වූමු නම් සියලු සංයෝජනයන්ගේ ක්‍ෂය වීම වූ ඒ ඵලය මාහට අනු පිළිවෙළින් පැමිණියේ වෙයි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

764. ඉද්ධීසු ච වසී හොමි දිබ්බාය සොතධාතුයා
පරචිත්තානි ජානාමි සත්ථු සාසනකාරිකා.

765. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං
ඛෙපෙත්වා ආසවෙ සබ්බෙ විසුද්ධාම්හි සුනිම්මලා.

766–768. කිලෙසා ඣාපිතා මය්හං –පෙ– කතං බුද්ධස්ස
සාසනං.

ඉත්ථං සුදං ධම්මදින්නා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

ධම්මදින්නාථෙරියාපදානං තතියං.

## 24. සකුලාපදානං.

769. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මානපාරගූ
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

770. හිතාය සබ්බසත්තානං සුඛාය වදතං වරො
අත්ථාය පුරිසාජඤ්ඤො පටිපන්නො සදෙවකෙ.

771. යසග්ගප්පත්තො සිරිමා වණ්ණකිත්තිභතො[1] ජිනො
පූජිතො සබ්බලොකස්ස දිසා සබ්බාසු විස්සුතො.

772. උත්තිණ්ණවිචිකිච්ඡො සො වීතිවත්තකථංකථො
සම්පුණ්ණමනසඞ්කප්පො පත්තො සම්බොධිමුත්තමං.

773. අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා නරුත්තමො
අනක්ඛාතඤ්ච අක්ඛාසි අසඤ්ජාතඤ්ච සඤ්ජනී.

774. මග්ගඤ්ඤූ ච මග්ගවිදූ මග්ගක්ඛායී නරාසභො
මග්ගස්ස කුසලො සත්ථා සාරථීනං වරුත්තමො.

775. මහාකරුණිකො සත්ථා[2] ධම්මං දෙසෙසි නායකො
නිමුග්ගෙ කාමපඞ්කම්හි සමුද්ධරති පාණිනො.

1. කිත්තිවණ්ණගතො – මජසං.
2. තද මහාකාරුණිකො – සිමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

764. ශාස්තෘන් වහන්සේගේ අනුසසුන් කරන මම ඍද්ධියෙහි ද දිබ්බසොතධාතුයෙහි ද වශී වෙමි. පරසිත් ද දනිමි.

765. පෙර විසූ කඳපිළිවෙළ දනිමි, දිවැස පිරිසිදු කරන ලදී. සියලු ආස්‍රවයන් නසා වෙසෙසින් මල රහිත වැ විශුද්ධ වෙමි.

766–768. මා විසින් කෙලෙස්හු දවන ලදහ...... බුදුසසුන් කරන ලදී.

**මෙසෙයින් ධම්මදින්නා** මෙහෙණ මෙ ගාථා පැවැසූ

**තෙවැනි ධම්මදින්නා ථෙරාපදන යි.**

## 24. සකුලාපදනය

769. මෙකපින් සියක්දහස් වන කප්හි (ලොවී ලොව්තුරු) සියලු දහම්හි පරතෙර පැමිණි (ලොවට) නායක වූ **පියුමතුරා** නම් සම්බුදු රජාණන් වහන්සේ (ලොවැ) පහළ වූ සේක.

770. වක්තෘන් (දේශකයන්) අතර උත්තම වූ ආජානෙය (උතුම්) පුරුෂ වූ බුදුරජාණන් වහන්සේ දෙවියන් සහිත ලෝකයෙහි සියලු සත්නට හිත පිණිස සුව පිණිස වැඩ පිණිස පිළිපන් සේක.

771. ජිනේන්ද්‍රයන් වහන්සේ යශසින් අගපත් සේක, ශ්‍රීමත් සේක, කීර්ති ප්‍රශංසා දරූ සේක, සියලු ලොකයා විසින් පූජිත සේක, සියලු දිශායෙහි (සර්වඥහ යි) ප්‍රකට වූ සේක.

772. ඔබ විචිකිච්ඡායෙන් නැගී සිටිසේක, ඉක්මැවූ සැක ඇති සේක, පිරිපුන් චිත්තසඞ්කල්පනා ඇති සේක, උතුම් සම්බොධියට පැමිණි සේක.

773. නරොත්තමයන් වහන්සේ නූපන් (නිවන්) මග උපදවාලූ සේක, (අන් ශාස්තෘවරයන්) ප්‍රකාශ නො කළ දැ ප්‍රකාශ කළ සේක, නූපන් (ආවෘත) ලොවුතුරු දහම් උපදවාලූ (අනාවරණය) කළ සේක.

774. නරශ්‍රේෂ්ඨයන් වහන්සේ නිවන්මග දත් සේක, නිවන් මග අවබෝධ කළ සේක, නිවන් මග ප්‍රකාශ කළසේක, නිවන් මගෙහි දක්ෂ සේක, ශාස්තෘ සේක, උත්තම පුරුෂදම්‍යසාරථී සේක.

775. (ලොක) නායක ශාස්තෘ වූ මහාකාරුණිකයන් වහන්සේ දහම් දෙසූ සේක, කාම නැමැති මඩවගුරෙහි එරුණු ප්‍රාණීන් නඟා සිටුවන සේක.



* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

776. තදා'හං හංසවතියං ජාතා ඛත්තියනන්දනා
සුරූපා සධනා චාසිං දයිතා ච සිරිමතී.

777. ආනන්දස්ස මහාරඤ්ඤො ධීතා පරමසොභනා
වෙමාතු[1]භගිනී චාපි පදුමුත්තරනාමිනො.

778. රාජකඤ්ඤාහි සහිතා සබ්බාභරණභූසිතා
උපගම්ම[2] මහාවීරං අස්සොසිං ධම්මදෙසනං.

779. තදා හි සො ලොකගරු භික්ඛුනිං දිබ්බචක්ඛුකං
කිත්තයං පරිසාමජ්ඣෙ[3] අග්ගට්ඨානෙ ඨපෙසි තං.

780. සුණිත්වා තමහං හට්ඨා දානං දත්වාන සත්ථුනො
පූජෙත්වාන[4] ච සම්බුද්ධං දිබ්බචක්ඛුං අපත්ථයිං.

781. තතො[5] අවොච මං සත්ථා "නන්දෙ ලච්ඡසි පත්ථිතං
පදීපධම්මදානානං ඵලමෙතං සුනිච්ඡිතං,

782. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො
ගොතමො නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

783. තස්ස ධම්මෙසු දායාදා ඔරසා ධම්මනිම්මිතා
සකුලා නාම[6] නාමෙන හෙස්සසි සත්ථුසාවිකා."

784. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡ'හං.

785. ඉමම්හි භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධු මහායසො
කස්සපො නාම ගොත්තෙන උප්පජ්ජි වදතං වරො.

786. පරිබ්බාජිකිනී ආසිං තදා'හං එකචාරිනි
භික්ඛාය විචරිත්වාන අලභිං තෙලමත්තකං.

787. තෙන දීපං පදීපෙත්වා උපට්ඨිං සබ්බසංවරිං
චෙතියං දිපදග්ගස්ස[7] විප්පසන්නෙන චෙතසා.

788. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡ'හං.

1. වෙමාතා – මජසං.
2. උපාගම්ම – මජසං.
3. චතුපරිසාය මජ්ඣෙ – ස්‍යා.
4. පූජිත්වාන – මජසං.
5. තදා – සීමු.
6. සකුලාති ච – ස්‍යා.
7. ද්විපදග්ගස්ස – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

776 එසමයෙහි මම හංසවතී නුවර කැත් දුවක් ව ඉපැද මනාරූ ඇති ධනඇත්තක් වූමු, ප්‍රිය ද ශ්‍රීමත් ද වූමු.

777. ආනන්ද මහරජුගේ අතිශය ශොභා ඇති දුහිතෘ වූමු. පියුමතුරා බුදුරජාණන් වහන්සේගේ වෛමාතෘක (අන් මවකගෙන් උපන්) නැගණි ද වූමු.

778. රාජකන්‍යාවන් සහිත වූවා සර්වාභරණභූෂිත වැ මහාවීරයන් වහන්සේ වෙතැ එළැඹැ ධර්මදේශනා ශ්‍රවණ කළමු.

779. එකල්හි ඒ ලෝකගුරු තථාගතයන් වහන්සේ දිවැස් ඇති මෙහෙණක කීර්තනය (-ගුණ කථා) කරන සේක් පර්ෂද්මධ්‍යයෙහි ඇය අග්‍රස්ථානයෙහි තබාලූ සේක.

780. එ අසා මම ප්‍රීතිමත් වූවා ශාස්තෘ වූ සම්බුදුරජාණන් වහන්සේට දන් දී පූජා ද කොට දිවැස ප්‍රාර්ථනා කළමු.

781. ඉක්බිති ශාස්තෘන් වහන්සේ නන්දවතී, පැතූ දෑ ලබන්නෙහි, ප්‍රදීපදන-ධර්මදානයන්ගේ මේ සුනිශ්චිත වූ ප්‍රතිඵල යි මට වදළහ.

782. මෙයින් සුවහස්වන කප්හි ඔක්කාක කුලය උපන් කොට ඇති ගෝත්‍රයෙන් ගෞතම නම් ශාස්තෘහු ලො වැ පහළ වන්නාහ.

783. ඔබ දහම්හි දයාද වූ ධර්මනිර්මිත වූ එහෙයින් ම ඖරස වූ නමින් සකුලා නම් වූ බුද්ධශ්‍රාවිකාවක් වන්නෙහි''යි.

784. ඒ කුශල කර්මයෙන් ද චෙතනාප්‍රණිධියෙන් ද මිනිස් කය හැරපියා තව්තිසා දෙව්ලොවට (උපත් විසින්) ගියමු.

785. මේ භද්‍ර කල්පයෙහි බ්‍රහ්මබන්ධු වූ මහායශස් ඇති ගෝත්‍රයෙන් කාශ්‍යප නම් වූ ශාස්තෘන් වහන්සේ ලොවැ පහළ වූ සේක.

786. එකලැ මම එකලා වැ හැසිරෙන පිරිවැජ්ජක් වූමු. භික්ෂා යෙහි හැසිර තෙල් සුහක් ලත්මු.

787. එ තෙලින් පහනක් දල්වා වෙසෙසින් පහන් වූ සිතින් ද්විපදෙත්තමයන් වහන්සේගේ සෑය මුළු රැයෙකැ උවටැන් කළමු.

788. මම ඒ කුශල කර්මයෙන් ද චෙතනාප්‍රණිධියෙන් ද මිනිස් කය හැරපියා තව්තිසාවට ගියමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

789. යත්‍ථ යත්‍ථූපපජ්ජාමි තස්ස කම්මස්ස වාහසා
පජ්ජලන්ති[1] මහාදීපා තත්‍ථ තත්‍ථ ගතාය මෙ.

790. තිරොකුඩ්ඩං තිරොසෙලං සමතිග්ගය්හ පබ්බතං
පස්සාම'හං[2] යදිච්ඡාමි දීපදානස්සිදං ඵලං

791. විසුද්ධනයනා හොමි යසසා ච ජලාම'හං.
සද්ධාපඤ්ඤාවතී චෙව දීපදානස්සිදං ඵලං.

792. පච්ඡිමෙ ච භවෙ දානි ජාතා විප්පකුලෙ අහං
පහූතධනධඤ්ඤම්හි මුදිතෙ රාජපූජිතෙ.

793. අහුං[3] සබ්බඞ්ගසම්පන්නා සබ්බාභරණභූසිතා
පුරප්පවෙසෙ සුගතං වාතපානෙ ඨිතා අහං.

794. දිස්වා ජලන්තං යසසා දෙවමානුස[4]සක්කතං
අනුබ්‍යඤ්ජන[5]සම්පන්නං ලක්ඛණෙහි විභූසිතං.

795. උදග්ගචිත්තා සුමනා පබ්බජ්ජං සමරොචයිං
න චිරෙනෙව කාලෙන අරහත්තමපාපුණිං.

796. ඉද්ධීසු ච වසී හොමි දිබ්බාය සොතධාතුයා
පරචිත්තානි ජානාමි සත්‍ථුසාසනකාරිකා.

797. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං
ඛෙපෙත්වා ආසවෙ සබ්බෙ විසුද්ධාසිං සුනිම්මලා.

798. පරිචිණ්ණො මයා සත්‍ථා කතං බුද්ධස්ස සාසනං
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා.

799. යස්සත්‍ථාය පබ්බජිතා අගාරස්මානගාරියං
සො මෙ අත්‍ථො අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයො.

800. තතො මහාකාරුණිකො එතදග්ගෙ ඨපෙසි මං
"දිබ්බචක්ඛුකීනං අග්ගා සකුලා"ති නරුත්තමො.

801-803. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්‍ථං සුදං සකුලා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්‍ථාති.

සකුලාථෙරියාපදානං චතුත්‍ථං.

---

1. සංජලන්ති -- සයා.
සංචරන්ති - PTS.
2. පස්සාමිහං - සිමු.
3. අහං - මජසං.
4. දෙවමනුස්ස - මජසං.
5. අනුව්‍යඤ්ජන - සිමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

789. යම් යම් තෙනෙකැ උපදිම් ද ඒ කම්වෙගයෙන් ඒ ඒ තෙනැ ගිය මට මහාප්‍රදීපයෝ දල්වෙත්.

790. මම යමක් (දක්නට) රිසියෙම් ද, (එය) පවුර සරසැ, ශෛලය සරසැ පර්වතය ඉක් මැ ගෙන දක්මි. මේ (චූකලි) ප්‍රදීප දනයාගේ ඵල යි.

791. මම වෙසෙසින් පහන් නුවන් ඇතියෙමි, යශසින් ද දිලියෙමි, ශ්‍රද්ධා-ප්‍රඥා ද ඇති වෙමි. මේ (වනාහි) ප්‍රදීප දනයාගේ ඵල යි.

792. මම මෙකලැ පැසුලු බෙවෙති බොහෝ ධන ධාන්‍ය ඇති ප්‍රමුදිත වූ රාජපූජිත බ්‍රාහ්මණ කුලයෙකැ උපන්නෙම් –

793–794. සර්වාඞ්ග සම්පන්න සර්වාභරණභූෂිත වූමු. මම වාකවුළුව වෙතැ සිටියා යශසින් දිළියෙන, දෙවිමිනිසුන් විසින් සත්කෘත, (සත්කාර කරන ලද) අසූ අනුව්‍යඤ්ජනයෙන් හා දෙතිස් මහපුරිස් ලකුණෙන් සෙබි සුගතයන් වහන්සේ නගරයට පිවිසෙන වේලෙහි දුකැ –

795. ඔදවැඩි සිත් ඇතියෙම් සුමනස් වැ පැවිද්ද රිසි කළමු. (පැවිද්ද ලබා) නොබෝ කලෙකින් මැ රහත්බවට පැමිණියමු.

796. ශාස්තෘශාසනකාරී වූ මම සෘද්ධියෙහි ද දිබ්බසොතධාතු-යෙහි ද වශී වෙමි, මෙරමා සිත් දනිමි.

797. පෙරවිසූ කඳපිළිවෙළ දනිමි. දිවැස පිරිසිදු කරනලදී. සියලු ආශ්‍රවයන් නසා මොනොවට මල රහිත වැ විශුද්ධ වූමු.

798. මා විසින් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරන ලදහ. බුදු සසුන් කරන ලද යැ, මහත් කෙලෙස්බර බහා තබන ලද යැ, තෘෂ්ණාව මුලිනුපුටා හරන ලදී.

799. යම් අර්ථයක් පිණිස ගිහිගෙන් නික්මැ බුදුසසුන්හි පැවිදි වූවා වෙම් ද, සියලු සංයොජනයන්ගේ ක්‍ෂයය වූ ඒ අර්ථය මා විසින් අනුප්‍රාප්ත යි.

800. ඉක්බිති මහාකාරුණික නරොත්තමයන් වහන්සේ ''සකුලා දිවැස් ඇති මෙහෙණන් අතරැ අග්‍රය''යි මා එතදග්‍රයෙහි තබා වදළ සේක.

801–803. මා විසින් කෙලෙස්හු දවන ලදහ... බුදුසසුන් කරන ලදී.

මෙසෙයින් සකුලා මෙහෙණ මේ ගාථා පැවසූ.

සතරවැනි සකුලා ස්ථවිරාපදන යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 25. නන්දජනපදකල්‍යාණී අපදානං

804. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මානපාරගූ
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

805. ඔවාදකො විඤ්ඤාපකො තාරකො සබ්බපාණිනං
දෙසනාකුසලො බුද්ධො තාරෙසි ජනතං බහුං.

896. අනුකම්පකො කාරුණිකො හිතෙසී සබ්බපාණිනං
සම්පත්තෙ තිත්ථියෙ සබ්බෙ පඤ්චසීලෙ පතිට්ඨහි.

807. එවං නිරාකුලං ආසි සුඤ්ඤතං තිත්ථියෙහි ච
විචිත්තං අරහන්තෙහි වසීභූතෙහි තාදිහි.

808. රතනානට්ඨපඤ්ඤාසං උග්ගතො සො මහාමුනි
කඤ්චනග්ඝියසඞ්කාසො බාත්තිංසවරලක්ඛණො.

809. වස්සසතසහස්සානි ආයු විජ්ජති තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

810. තදා'හං හංසවතියං ජාතා සෙට්ඨිකුලෙ අහුං
නානාරතනපජ්ජොතෙ මහාසුඛසමප්පිතෙ.

811. උපෙත්වා තං මහාවීරං අස්සොසිං ධම්මදෙසනං
අමතං පරමස්සාදං පරමත්ථනිවෙදකං.

812. තදා නිමන්තයිත්වාන සසඞ්ඝං ලොකනායකං[1]
දත්වා තස්ස මහාදානං පසන්නා සෙහි පාණිහි.

813. ඣායිනීනං භික්ඛුනීනං අග්ගට්ඨානං අපත්ථයිං
නිපච්ච සිරසා වීරං සසඞ්ඝං ලොකනායකං.

814. තදා අදන්තදමකො තිලොකසරණො පභූ
ව්‍යාකාසි නරසද්දූලො[2] ලච්ඡසෙ තං සුපත්ථිතං.

815. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො
ගොතමො නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

1. තිභවන්තගං – PTS.
2. බ්‍යාකාසි නරසාරථී – මජසං
— සාරථී P.T.S

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 25. නන්ද ජනපදකල්‍යාණී අපදානය

804. සියලු ධර්මයන්ගේ පාරයට පැමිණි ලෝකනායක වූ පදුමුත්තර ජිනේන්ද්‍රයන් වහන්සේ මෙයින් සුවහස්වන කප්හි (ලොවැ) පහළවී වදළ සේක.

805. සියලු ප්‍රාණීන්ට අවවාද කරන, (දහම්) අවබෝධ කරවන (සසරින්) එතර කරවන, දේශනාකුශල වූ බුදුරජාණන් වහන්සේ බොහෝ ජනතාව (සසරින්) එතෙර කරවූ සේක.

806. සියලු ප්‍රාණීන්ට අනුකම්පා කරන කරුණා ඇති හිතෛෂී වූ ශාස්තෲන් වහන්සේ වෙතැ පැමිණි සියලු අන්තොටුවන් පන් සිල්හි පිහිට වූ සේකි.

807. මෙසේ (ලොව) නිරවුල් වියැ, අන්තොටුවන්ගෙන් සිස් ද වියැ, චිත්තවශී වූ මැදහත් ගුණ ඇති රහතුන්ගෙන් විසිතුරු වී.

808. ඒ මහාමුනිහු අටපනස් රියනක් උස් වූහ, රන්ඇඟැයක් බඳු වූහ, දෙතිස් මහාපුරිස් ලකුණින් යුතු වූහ.

809. එකලැ (මිනිස්නට) හවුරුදු සියක්දහසක් ආයු වෙයි. එ පමණ කල් වැඩසිටිමින් ඔබ බොහෝ ජනතාව සසරින් ගොඩ නඟාලූහු.

810. එකලැ මම හංසවතී නුවර නන් රුවනින් බබළන මහත් සුවයෙන් සමර්පිත සිටුකුලෙකැ උපන්මි.

811. ඒ (පියුමතුරා) මහාවීරයන් වහන්සේ වෙතැ එළැඹැ අමෘත වූ පරම ආස්වාදකර පරමාර්ථප්‍රකාශක ධර්මදේශනා ශ්‍රවණ කළෙමි.

812-813. එකල්හි සඞ්ඝයා සහිත ලෝකනායකයන් වහන්සේ නිමන්ත්‍රණ කොට ඔබට මහදන් දී සිය දිව්හිමියෙන් ප්‍රසන්න වූවා සඞ්ඝයා සහිත ලෝකනායක වීරයන් වහන්සේ (වෙත) මස්තකයෙන් වැඳ වැටී ඣායිනී (ධ්‍යාන කරන) භික්ෂුණීන් අතර අග්‍ර ස්ථානය ප්‍රාර්ථනා කළෙමි.

814. එවිට අදන්තදමක වූ තිලොකසරණ වූ ප්‍රභූ වූ නර ශ්‍රේෂ්ඨයන් වහන්සේ 'ඒ මනා ප්‍රාර්ථනාව ලබන්නෙහි'යි ප්‍රකාශ කළ සේකැ. (වැළිදු)

815. ''මෙයින් සුවහස්වන කප්හි ඔක්කාක කුලය උපත් කොට ඇති ගොත්‍රයෙන් ගෞතම නම් වූ ශාස්තෲහු ලොවැ පහළ වන්නාහ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

816. තස්ස ධම්මෙසු දායාදා ඔරසා ධම්මනිම්මිතා
නන්දති නාම නාමෙන හෙස්සසි සත්ථුසාවිකා.

817. තං සුත්වා මුදිතා හුත්වා යාවජීවං තදා ජිනං
මෙත්තචිත්තා පරිචරිං පච්චයෙහි විනායකං.

818. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

819. තතො චුතා යාමමගං තතො'හං තුසිතං අගං[1]
තතො ච නිම්මාණරතිං වසවත්තිපුරං තතො.[2]

820. යත්ථ යත්ථූපපජ්ජාමි තස්ස කම්මස්ස වාහසා
තත්ථ තත්ථෙව රාජානං මහෙසිත්තමකාරයිං.

821. තතො චුතා මනුස්සත්තෙ රාජානං චක්කවත්තිනං
මණ්ඩලිනඤ්ච රාජානං මහෙසිත්තමකාරයිං.

822. සම්පත්තිං අනුභොත්වාන දෙවෙසු මනුජෙසු ච
සබ්බත්ථ සුඛිතා හුත්වා නෙකකප්පෙසු සංසරිං.

823. පච්ඡිමෙ භවෙ සම්පත්තෙ පුරම්හි[3] කපිලව්හයෙ
රඤ්ඤො සුද්ධොදනස්සාහං ධීතා ආසිං අනින්දිතා.

824. සිරිංච[4] රූපිනිං දිස්වා නන්දිතං ආසි තං කුලං
තෙන නන්දති මෙ නාමං සුන්දරොපපදං[5] අහු.

825. යුවතීනඤ්ච සබ්බාසං කල්‍යාණීති ච විස්සුතා
තස්මිම්පි නගරෙ රම්මෙ ඨපෙත්වා ච[6] යසොධරා.

826. ජෙට්ඨො භාතා තිලොකග්ගො පච්ඡිමො[7] අරහා තථා
එකාකිනී ගහට්ඨාහං මාතරා පරිචොදිතා:

827. "සාකියම්හි කුලෙ ජාතා පුත්තෙ බුද්ධානුජා තුවං
නන්දෙනපි විනා භූතා අගාරෙ කින්නු වච්ඡසි?

1. ගතා - මජසං.
2. ගතා - සයා.
3. සුරම්මෙ - සිමු, මජසං.
4. සිරියා - මජසං.
5. සුන්දරං පවරං - මජසං, PTS.
සුන්දරා පවරා - සයා.
6. ඨපෙත්වා තං - මජසං.
7. මජ්ඣිමො - සි, PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

816. ඔබ දහමෙහි දායාද වූ ඖරස වූ ධර්මනිර්මිත වූ නමින් නන්ද නම් වූ ශාස්තෘශ්‍රාවිකාවක් වන්නෙහි'' යි (ප්‍රකාශ කළසේක.)

817. එ අසා ප්‍රමුදිත වැ මෙත්සිත් ඇතිව විනායක වූ ජිනේන්ද්‍රයන් වහන්සේ දිවිහිමි කොට (සිවු) පසින් උවටැන් කළමු.

818. මම ඒ කුශලකර්ම හේතුයෙන් ද චෙතනාප්‍රණිධි හේතු-යෙන් ද මිනිස්කය හැරපියා තව්තිසා දෙව්ලොවට ගියමු.

819. මම එයින් ච්‍යුත වූවා යාම දෙව්ලොවට ගියමු, එයින් තුෂිතයට ද, එයින් නිර්මාණරතියට ද එයින් වශවර්ති පුරයට ද ගියමු.

820. ඒ කර්මබලයෙන් යම් යම් තෙනෙකැ උපන්මු ද, ඒ ඒ තැන (දෙව්) රජුනට මෙහෙසිබව කරවූමු.

821. ඒ දෙව්ලොවින් ච්‍යුත වූවා මිනිසත්බෙහි සක්විති රජුනට ද පෙදෙසි රජුනට ද මෙහෙසිබව කරවූමු.

822. සැපත් වළඳා දෙවියන් කෙරෙහි ද මිනිසුන් කෙරෙහි ද සුඛිත වැ නොයෙක් කප්හි සැරිසැරූමු.

823. පශ්චිම භවය පැමිණිකල්හි මම කිඹුල්වත් නුවර සුදොවුදන රජුහට අනිඳිත වූ දුහිතෘ වූමු.

824. සිරිකතවන් රූමත් මා දක එකුලය ප්‍රීතිමත් වියැ, ඒ හෙතුයෙන් නන්ද යන මාගේ නාමය 'සුන්දරි' යන උපපද ඇති වී.

825. ඒ රම්‍ය වූ නගරයෙහි යශොධරාව තබා සියලු යුවතීන් අතර 'කල්‍යාණී' යි ප්‍රකට වූමු.

826. (මාගේ) දෙටු බෑයා තුන්ලොවට අග්‍ර වූ බුදුරජාණෝ යැ, එසෙයින් මැ කණිටු බෑයා රහත් නමකි. එකලා වැ ගිහිගෙහි සිටුනා මම මව විසින් චෝදනා කරන ලදමු:

827. ''දියණිනි, තෝ ශාක්‍යකුලයෙහි උපන්හි, බුදුරදුන්ගෙ බුහුන වෙහි, නන්දයන්ගෙනුදු වෙන් වූවා කුමක් හෙයින් ගෙහි වසනෙහි ද?

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

828. ජරාවසානං යොබ්බඤ්ඤං රූපං අසුචිසම්මතං
රොගන්තමපි ච ආරොග්‍යං ජීවිතං මරණන්තිකං.

829. ඉදම්පි තෙ සුභං රූපං සසිකන්තං මනොහරං
භූසනානමලඞ්කාරං සිරිසඞ්ඝාතසන්නිභං.

830. පිණ්ඩිතං[1] ලොකසාරංව නයනානං රසායනං
පුඤ්ඤානං කිත්තිජනනං ඔක්කාකකුල[2] නන්දනං.

831. න චිරෙනෙව කාලෙන ජරා සමභිභොස්සති[3]
විහාය ගෙහං කාරුඤ්ඤ[4] චර ධම්මමනින්දිතෙ.

832. සුත්වා'හං මාතුවචනං පබ්බජිං අනගාරියං
දෙහෙන නතු චිත්තෙන රූපයොබ්බනලාලිතා.[5]

833. මහතා ච පයත්තෙන ඣානජ්ඣෙනපරං මමං[6]
කාතුං ච වදතෙ මාතා න චාහං තත්‍ථ උස්සුකා.

834. තතො මහාකාරුණිකො දිස්වා මං කාමලාලසං[7]
නිබ්බින්දනත්‍ථං රූපස්මිං මම චක්ඛුපථෙ ජිනො.

835. සකෙන අනුභාවෙන[8] ඉත්ථිං මාපෙසි සොභනිං
දස්සනීයං සුරුචිරං මමතොපි සුරූපිනිං.

836. තමහං විම්හිතා දිස්වා අතිවිම්හිතදෙහිනිං
චින්තයිං 'සඵලං මෙති නෙත්තලාභඤ්ච මානුසං'.

837. තමහං එහි සුභගෙ යෙනත්‍ථො තං වදෙහි මෙ
කුලං තෙ නාමගොත්තඤ්ච වද මෙ යදි තෙ පියං.

838. න පඤ්හකාලො[9] සුභගෙ උච්ඡඞ්ගෙ මං නිවෙසය[10]
සීදන්තීව[11] මමඞ්ගානි සුපසුප්පය මුහුත්තකං.

839. තතො සීසං මමඞ්කෙ සා කත්වා සයි සුලොචනා
තස්සා නලාටෙ පතිතා ලූතා[12] පරමදාරුණා.

---

1. පුඤ්ජිතං – සී, මජසං, PTS.
2. උක්කාක – මජසං.
3. සමධිභොස්සති – මජසං, PTS.
4. කාරුඤ්ඤෙඤ – සී, මජසං, PTS.
5. ලාළිතා – මජසං.
6. මම – මජසං.
7. කමලානනං – ස්‍යා.
8. ආනුභාවෙන – මජසං.
9. වඤ්චකාලො – මජසං.
10. නිවාසය – මජසං.
11. නිසීදන්ති – ඉ, PTS.
12. ලුද්ධා – මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

828. යොවුන්බව ජරාව අන්ත කොට ඇත්තේ යැ, රූපය අපවිත්‍ර යයි සම්මත යැ, නිරෝගී බව රෝගය අන්ත කොට ඇත්තේ යැ, ජීවිතය මරණය අන්ත කොට ඇත්තේ යි.

829–830. චන්ද්‍රයා සේ කාන්ත වූ මනහර වූ භූෂණයනට වඩා අලඞ්කාර වූ ශ්‍රී සමූහයක් බඳු වූ ලෝකසාරය පිඩු කළාක් වැනි වූ නෙත්‍රරසායන වූ තොපගේ මේ ශුභ වූ රූපය ද –

831. නොබෝ කලකින් ම ජරාව (මහලු බව) මැඩලන්නේ යැ (ජරාවෙන් රූපය මඩිනු ලැබේ.) අනින්දිත දියණියනි, ගෙය හැරපියා තුරුණුවියෙහි දී ධර්මචාරී වව'' යි.

832. රූපලාවණ්‍ය යොබ්බනලාලන පරවශ වූ මම මවුගේ බස් අසා බුදුසසුන්හි කයින් පැවිදි වූමු, එසේ වුවද සිතින් පැවිදි නුවූමු.

833. මවු තොමෝ මහත්ප්‍රයත්නයෙන් මා ධ්‍යාන ඉගැන් මෙහි යෙදුනක කරන්නට කථා කරයි, මම එහි නොද උත්සුක වූමු.

834–835. ඉක්බිති මහාකාරුණික ජිනේන්ද්‍රයන් වහන්සේ කාමයෙහි ලොල්වූ මා දැක රූපයෙහි කළකිරවනු පිණිස මා ඇස් හමුයෙහි ස්වකීය අනුභාවයෙන් ශොභා ඇති දකුම්කලු ඉතා මනහර මාහටත් වඩා අතිශයින් රූමත් වූ ස්ත්‍රියක මැවූසේක.

836. අතිවිස්මයජනක සිරුරු ඇති ඇය දැක විස්මයට පැමිණි මම ''මාගේ නෙත්‍රලාභයත් මිනිසත්බවත් සඵලැ'' යි සිතූමු.

(මම)

837. ''ප්‍රියාවනි, එව, යමකින් ප්‍රයොජන ඇත් ද එය මට කියව, ඉදින් තොපට ප්‍රිය වේ නම් තොපගේ නාමගොත්‍ර ද කියව'' යි කීමු.

(නිර්මිත ස්ත්‍රිය)

838. ''ප්‍රියාවනි, ප්‍රශ්න කිරීමට කල් නො වෙයි මා (තොපගේ) ඇකයට ගනු, මාගේ අවයව කිඳා බස්නාක් මෙනි, මොහොතක් (මා) හොවව'' යි කිවු.

839. ඉක්බිති ශොභන නෙත් ඇති ඕ මාගේ ඇකයෙහි හිස තබා ශයනය කළා යැ. (එ වේලෙහි) ඉතා දරුණු මකුළු-වෙක් ඇයගේ නලළෙහි වැටුණි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

840. සහ තස්සා නිපාතෙන පිළකා උපපජ්ජථ
පග්ඝරිංසු පභින්නා ච කුණපා පුබ්බලොහිතා.

841. පභින්නං වදනං චාසි කුණපං පූතිගන්ධිකං[1]
උද්ධුමාතං විනීලඤ්ච විපුබ්බඤ්ච[2] සරීරකං.

842. සා පවෙධිතසබ්බඞ්ගී නිස්සසන්තී මුහුං මුහුං
වෙදයන්තී සකං දුක්ඛං කරුණං පරිදෙවයී.

843. “දුක්ඛෙන දුක්ඛිතා හොමි ඵුසයන්ති ච වෙදනා
මහාදුක්ඛෙ නිමුග්ගාම්හි සරණං හොහි මෙ සඛී.”

844. “කුහිං වදනසොභා තෙ කුහිං තෙ තුඞ්ගනාසිකා
තම්බබිම්බවරොට්ඨං තෙ වදනං තෙ කුහිං ගතං.

945. කුහිං සසිනිභං වත්තං[3] කම්බුගීවා කුහිං ගතා
දොලාලොලා ච[4] තෙ කණ්ණා වෙවණ්ණං සමුපාගතා.

846. මකුළම්බුරුහාකාරා[5] කලසාව[6] පයොධරා
පභින්නා පූතිකුණපා දුග්ගන්ධිත්තමාගතා.

847. තනුමජ්ඣා පුථුස්සොණී[7] සූනා වණිතකිබ්බිසා[8]
ජාතා අමෙජ්ඣභරිතා අහො රූපං අසස්සතං

848. සබ්බං සරීරසඤ්ජාතං පූතිගන්ධං භයානකං
සුසානමිව බීභච්ඡං රමන්ති යත්ථ බාලිසා[9]”

849. තදා මහාකාරුණිකො භාතා මෙ ලොකනායකො
දිස්වා සංවිග්ගචිත්තං මං ඉමා ගාථා අභාසථ.

850. “ආතුරං අසුචිං පූතිං පස්ස නන්දෙ සමුස්සයං
අසුභාය චිත්තං භාවෙහි එකග්ගං සුසමාහිතං.

851. යථා ඉදං තථා එතං යථා එතං තථා ඉදං
දුග්ගන්ධං පූතිකං වාපි බාලානං අභිනන්දිතං.

---

1. පූතිගන්ධනං - මජසං.
2. පුබ්බඤ්චාපි - මජසං.
සබ්බඤ්චාපි - PTS.
3. වණ්ණං - මජසං.
4. දොළාලොලාව - මජස.
දමාමාලඤ්ච - ස්‍යා.
5. මකුළකාරකාකාරා - මජසං.
මකුළපදුමාකාරා - ස්‍යා.
6. කලිකාව - මජසං.
7. වෙදිමජ්ඣාව පුස්සොණී - මජසං.
වෙදිමජ්ඣා පුථුස්සොණී - PTS.
8. සූනාව නීතකිබ්බිසා - මජසං.
9. බාලියා - සිමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

840. ඒ මකුළුවා වැටීම සමගම පොළක් නැඟුණේ ය. (පොළ) බිඳිණ. (පුපුලේ යැ) කුණු වූ පූයා ලෙහෙ වැගිරිණි.

841. මුව ද බිඳුණේ කුණු දුගඳ ඇති වියැ, සිරුර ඉදිමී නිල් වැ පූයා වගුරුවාලී යැ.

842. වෙව්ළන සියලු අවයව ඇති ඕ වරින් වර නිශ්වාස කරන්නී සිය දුක හඟවමින් බැගෑයේ වැලපුණා යැ.

843. "දුකින් දුක්ඇති වෙමි, වේදනාවෝ (මා) පහසිත්, මහ-දුක්හි එවිට මම ගැලුණා වෙමි, යෙහෙළිය, මට පිහිට වව" යි.

844. "තොපගේ මුඛශෝභාව කොහි ද? තොපගේ තුඟු නැහැය කොහි ද? තොපගේ තඹවන් බිඹුපල බඳු ලවන් කොහි ද? තොපගේ මුව කොහි ගියේ ද?

845. ඉඳුවන් උවන කොහි ගියේ ද? රන් මිහිඟු බෙරයක් බඳු ග්‍රීවා ව කොහි ගියා ද? රනෝවිලි වන් ලෙලදෙන කර්ණයෝ විවර්ණයට එළැඹියාහ.

846. පද්මකුඩ්මලාකාර (පියුම් කැකුළු බඳු) කලස් වැනි පයෝධරයෝ බිඳුණාහු කුණු වැ ගියාහු දුගඳ ඇතිබවට පැමිණියාහු යැ.

847. සිගිනිඟ හා පුළුලුකුල ඇති ඕ ඉදිමුණි වූණයෙන් කිලිටි වූවා අසුචියෙන් හරිත වූවා යැ. රූපය අශාශ්වත යැ ආශ්වයභ් යි.

848. මුළා වූවෝ යම් තෙනෙකැ ඇලෙත් ද, සිරුරෙහි හටගත් ඒ සියල්ල දුහඳ යැ, බිහිසුණු යැ, සොහොනක් සෙයින් පිළිකුලැ"යි. කීමු.

849. එවේලෙහි මහාකාරුණික මාගේ බෑයා වූ ලෝකනාථයන් වහන්සේ කලකිරුණු සිතැති මා දැක මේ ගාථා වදළසේකැ:

850. "නාණුවෙනි ලෙඩ වන, කුණු වන, වැගිරෙන අපිරිසිදු (මෙය) බලව. සිත අසුභ වශයෙන් වඩා එකඟ කරගනුව.

851. දුගඳ වහනය වන, මළ වැගිරෙන, නුනුවණ අයගේ මන වඩන. මෙය යම්සේ ද එය මෙසේ යි. එය යම්සේ ද මෙය එසේ යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

852. එවමෙතං අවෙක්ඛන්ති රත්තින්දිවමතන්දිතා
තතො සකාය පඤ්ඤාය අභිනිබ්බිජ්ජ දක්ඛසි.''

853. තතො'හං අතිසංවිග්ගා[1] සුත්වා ගාථා සුභාසිතා
තත්‍රට්ඨිතා විපස්සන්ති[2] අරහත්තමපාපුණිං.

854. යත්ථ යත්ථ නිසින්නාහං සදා ඣානපරායනා
ජිනො තස්මිං ගුණෙ තුට්ඨො එතදග්ගෙ ඨපෙසි මං.

855-857. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- කතං බුද්ධස්ස සාසනං

ඉත්ථං සුදං නන්දා භික්ඛුනී ජනපදකල්‍යාණී ඉමා ගාථායො අභාසිත්ථාති.

නන්දාථෙරියාපදානං පඤ්චමං.

## 26. සොණාපදානං

858. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මාන පාරගූ
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

859. තදා සෙට්ඨිකුලෙ ජාතා සුඛිතා පූජිතා පියා
උපෙත්වා තං මුනිවරං අස්සොසිං මධුරං වචං.

860. ආරද්ධවීරියානග්ගං වණ්ණෙසි[3] භික්ඛුනිං ජිනො
තං සුත්වා මුදිතා හුත්වා කාරං කත්වාන සත්ථුනො.

861. අභිවාදිය සම්බුද්ධං තං ඨානං පත්ථයිං තදා
අනුමොදි මහාවීරො ''සිජ්ඣතං පණිධී තව.

862. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො
ගොතමො නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

863. තස්ස ධම්මෙසු දායාදා ඔරසා ධම්මනිම්මිතා
සොණාති නාම නාමෙන හෙස්සසි සත්ථුසාවිකා.

864. තං සුත්වා මුදිතා හුත්වා යාවජීවං තදා ජිනං
මෙත්තචිත්තා පරිචරිං පච්චයෙහි විනායකං.

1. තතොහමාසිං සංවිග්ගා – ස්‍යා, PTS.
2. තත්‍රට්ඨිතාවහං සන්ති – මජසං.
3. වණ්ණෙති – ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

852. රෑ දවල් අනලස් වැ මෙසේ සිතන්නී, ඒ නිසාම සිය නැණින් එළඹ දකුව.''

853. මනාව දේශනා කළ ඒ ගාථා අසා, අතිශය වශයෙන් සංවේගයට පැමිණි මම, එහි ම සිටැ විදසුන් වඩා රහත් වීමි.

854. ඒ ඒ තන්හි සියලු කල්හි මැ ධ්‍යානපරවශ වැ, පිළිපන් මා, මාගේ ගුණය දක බුදුරජාණන් වහන්සේ එතදග්‍රයෙහි තැබූ සේක.

855-857. මා විසින් ක්ලේශයෝ දවන ලදහ ... බුදුසසුන් කරන ලදී.

මෙසෙයින් නන්ද ජනපදකල්‍යාණී මෙහෙණ මේ ගාථා පැවසූ.

පස්වැනි නන්ද ස්ථවිරාපදන යි.

## 26. සොණාපදනය

858. මෙකපින් සුවහස්වන කප්හි සියලු දහම්හි සරතෙර පැමිණි (ලොවට) නායක වූ පියුමතුරා බුදුරජාණන් වහන්සේ පහළ වූ සේකැ.

859. එකල්හි සිටුකුලෙකැ සුඛිත වැ පූජිත වැ ප්‍රිය වැ උපන් තෙම් ඒ මුනීන්ද්‍රයන් වහන්සේ වෙතැ එළැඹැ මිහිරි වදන් ඇසූමු.

860. ජිනේන්ද්‍රයන් වහන්සේ පිරිපුන් වැර ඇති මෙහෙණන් අතරැ එක් මෙහෙණක අග්‍ර කොට වර්ණනා කළසේකැ, ඒ අසා ප්‍රමුදිත වැ ශාස්තෘන් වහන්සේට සත්කාර කොට –

861. සම්බුදුරජාණන් වහන්සේ සකසා වැද එවෙලෙහි ඒ තනතුර ප්‍රාර්ථනා කළමු. මහාවීරයන් වහන්සේ ''තොපගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වේවා''යි අනුමෝදනා කළසේකැ, (වැළිදු වදරනසේක්)

862. මෙයින් සුවහස්වන කප්හි ඔක්කාක කුලය උපත් කොට ඇති ගොත්‍රයෙන් ගෞතම නම් වූ ශාස්තෘහු ලොවැ පහළ වන්නාහ.

863. ඔබ දහම්හි දයාද (හිමි) වූ (ලොවතුරු දහමින් උපන් හෙයින්) ධර්මනිර්මිත වූ නමින් සෝණා නම් වූ ඖරස ශාස්තෘශ්‍රාවිකා වක් වන්නනු'' යි.

864. එවිටැ ඒ අසා සතුටු වැ මෙත්සිත් ඇතිවයම විනායක වූ ජිනෙන්ද්‍රයන් වහන්සේ දිවිහිමි කොට ප්‍රත්‍යයෙන් උපස්ථාන කළමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

865. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගඤ්ඡහං.

866. පච්ඡිමෙ ච භවෙදානි ජාතා සෙට්ඨිකුලෙ අහං
සාවත්ථියං පුරවරෙ ඉද්ධෙ ඵීතෙ මහද්ධනෙ.

867. යදා ච යොබ්බනප්පත්තා ගන්ත්වා පතිකුලං අහං
දසපුත්තානි අජනිං සුරූපානි විසෙසතො.

868. සුඛෙධිතා ච තෙ සබ්බෙ ජනනෙත්තමනොහරා
අමිත්තානම්පි තෙ රුචිතා මමං පගෙව[1] තෙ පියා.

869. තතො මය්හං අකාමාය දසපුත්තපුරක්ඛතො
පබ්බජිත්ථ ස මෙ භත්තා දෙවදෙවස්ස සාසනෙ.

870. තදෙකිකා විචින්තෙසිං ජීවිතෙනාලමත්ථු මෙ
චත්තාය[2] පතිපුත්තෙහි වුඩ්ඪාය ච වරාකියා.

871. අහම්පි තත්ථ ගච්ඡිස්සං සම්පත්තො යත්ථ මෙ පති''
එවා'හං චින්තයිත්වාන පබ්බජිං අනගාරියං.

872. තතො ච මං භික්ඛුනියො එකං භික්ඛුනුපස්සයෙ
විහාය ගච්ඡුමොවාදං ''තාපෙහි උදකං'' ඉති.

873. තදා උදකමාහිත්වා ඔකිරිත්වාන කුම්භියා
චුල්ලියං[3] ඨපෙත්වා ආසීනා තතො චිත්තං සමාදහිං.

874. ඛන්ධෙ අනිච්චතො දිස්වා දුක්ඛතො ච අනත්තතො
ජෙත්වාන[4] ආසවෙ සබ්බෙ අරහත්තමපාපුණිං.

875. තදා'ගන්ත්වා භික්ඛුනියො උණ්හොදකමපුච්ඡිසුං
තෙජොධාතුං අධිට්ඨාය ඛිප්පං සන්තාපයිං ජලං.

876. විම්හිතා තා ජිනවරං එතමත්ථමසාවයුං
තං සුත්වා මුදිතො නාථො ඉමං ගාථං අභාසථ:

1. පගෙහි - සී.
2. ජිනාය - සී, සයා, PTS.
3. චුල්ලෙ - සී, මජසං, සයා, PTS.
4. ඛෙපෙත්වා - සයා, PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

865. ඒ කුශලකර්මහේතුයෙන් ද චෙතනාප්‍රණිධි හේතුයෙන් ද මිනිස්කය හැරපියා තව්තිසාවට ගියමු.

866. මම දුන් පැසුළු බෙවෙහි ද සැවැත් පුරවරයෙහි සමෘද්ධි මත් ධනාඪ්‍ය මහත් ධන ඇති සිටුකුලෙකැ උපන්මු.

867–868. යම් කලෙකැ යොවුන්බවට පැමිණියා වෙම් ද, එකලැ මම පතිකුලයට ගොස් සුරූපී දසපුත්කෙනෙකුන් දනවූමු. සුවසේ වැඩුණු ඔහු සියල්ලෝ වෙසෙසින් දනමනනුවන් හරනාහු වූහ. අභිතුරනට ද රිසි වූහු. උහු මට ප්‍රිය වෙත් යනු කවර කථා යැ.

869. ඉක්බිති අකැමැති මා නොතකා දසපුතුන් විසින් පෙරටු කරන ලද මාගේ ඒ ස්වාමිපුත්‍ර දෙවියන්ට දෙව් වූ බුදුරදුන් සසුන්හි පැවිදි වූයේ යි.

870. එකල්හි එකලා වූවා (මෙසේ) සිතූමු: "සැමියා හා පුතුන් විසින් හැරදමනලද මහලු ද වූ පින්මද මට ජීවිතයෙන් කමෙක් නැති.

871. යම් තෙනකැ මාගේ ස්වාමිපුත්‍ර පැමිණියේ ද, මම ද එහි යන්නෙමි." මම මෙසේ සිතා බුදුසසුන්හි පැවිදි වූමු.

872. ඉක්බිති භික්ෂුණීහු "ජලය රත් කරවයි" යි මෙහෙණ-වරෙහි එකලා වූ මා හැරපියා භික්ෂුනොවාදය අසන්නට ගියාහු යැ.

873. එකල්හි දිය ගෙනවුත් සැලෙකැ වත් කොට උදුනෙහි තබා ඉක්බිති හුන්නෙම් සිත සමාධිගත කළමු.

874. ස්කන්ධ අනිත්‍ය වශයෙන් දුඃඛවශයෙන් අනාත්ම වශයෙන් දැක සියලු ආස්‍රව සිඳපියා රහත්බවට පැමිණියමු.

875. එවිටැ භික්ෂුණීහු අවුත් හුණුදිය පුළුවුත්හු. (මම) තෙජෝ ධාතුව ඉටා ජලය වහා හුණු කළමු.

876. විස්මයට පත් ඔහු තෙල කරුණ ජිනවරයන් වහන්සේට ඇස්වූහ. එ අසා සතුටු වූ නාථයන් වහන්සේ මේ ගාථාව වදළ සේකැ.

T 10

877. යො ච[1] වස්සසතං ජීවෙ කුසීතො හීනවීරියො
එකාහං ජීවිතං සෙය්‍යො විරියමාරභතො දළ්හං.'

878. ආරාධිතො මහාවීරො මම[2] සුප්පටිපත්තියා
ආරද්ධවිරියානග්ගං මමාහ ස[3] මහාමුනි.

879-881. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං සොණා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

සොණාථෙරියාපදානං ඡට්ඨං.

## 27. භද්දකාපිලානි අපදානං

882. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මෙසු චක්ඛුමා[4]
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

883. තදා'හු හංසවතියං විදෙහො නාම නාමතො[5]
සෙට්ඨී පහූතරතනො තස්ස ජායා අහොස'හං.

884. කදාචි සො නරාදිච්චං උපෙච්ච සපරිජ්ජනො[6]
ධම්මමස්සොසි බුද්ධස්ස සබ්බදුක්ඛක්ඛයාවහං.[7]

885. සාවකං ධුතවාදනං අග්ගං කිත්තෙසි නායකො
සුත්වා සත්තාහිකං දනං දත්වා බුද්ධස්ස තාදිනො.

886. නිපච්ච සිරසා පාදෙ තං ඨානං අභිපත්ථයි
ස හාසයන්තො පරිසං තද හි නරපුඞ්ගවො.

887. සෙට්ඨිනො අනුකම්පාය ඉමා ගාථා අභාසථ:
"ලච්ඡසෙ පත්ථිතං ඨානං නිබ්බුතො හොහි පුත්තක.

888. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො
ගොතමො නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

1. ච - සීමු, මජසං.
2. මයා - සීමු, මජසං.
3. මමං ආසි - සීමු.
4. සබ්බධම්මානපාරගූ - මජසං.
5. නාමකො - සයා, PTS.
නායකො - ථෙඅ.
6. සපරිජනො - ථෙඅ.
7. සබ්බදුක්ඛභයපහං - සීමු, මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

877. "වත්පිළිවෙත් ආදියෙහි මැලි හෙයින් කුසීත වූ කායික චෛතසික වීර්‍ය්‍ය රහිත යමෙක් ඉදින් හවුරුදු සියයක් ජීවත් වේ ද, ඔහුගේ ජීවත් වීමට වඩා දැඩි සේ වැරවඩන පුහුල්හුගේ එක්දවසක් ජීවත් වීම උතුම්."

878. මාගේ මනා පිළිවෙතින් මහාවීරයන් වහන්සේ ආරාධිතහ (සතුටු කරන ලද). ඒ මහාමුනිවරයන් වහන්සේ මා රැකුළු වැර ඇති මෙහෙණන් අතර අග්‍ර කොට වදාළ සේක.

879–881. මා විසින් ක්ලේශයෝ දවන ලද්දහ... බුදුසසුන් කරන ලදී.

මෙසෙයින් සොණා මෙහෙණ මේ ගාථා පැවසූ යැ.

සවැනි සොණා ස්ථවිරාපදන යි.

## 27. භද්දකාපිලානි අපදනය

882. සියලු ධර්මයන්හි චක්ෂුර්මත් වූ (සියලු ධර්ම දක්) (ලොවට) නායක වූ පියුමතුරා බුදුරජාණන් වහන්සේ මෙයින් ලක්ෂයක් වන කප්හි (ලොවැ) පහළ වූ සේකැ.

883. එසමයෙහි හංසවතී නුවර නමින් විදේහ නම් වූ බොහෝ රත්රුවන් ඇති සිටුවරයෙක් වියැ, මම ඔහුගේ භාර්‍ය්‍යා වූමු.

884. කිසියම් දිනෙකැ හේ පිරිවරජනයා සහිත වැ නරාදිත්‍ය යන් (බුදුරදුන්) වෙතැ එළැඹැ නිවන්සුව එළවන බුදුදහම් ශ්‍රවණ කෙළේ යැ.

885. බුදුරජාණෝ ධුතවාදී භික්ෂූන් අතර එක් ශ්‍රාවකයකු අග්‍ර කොට වදළහ. එ අසා සිටු තෙමේ තාදී ගුණ ඇති බුදුරදුනට සත්දිනක දනක් දී –

886–887. දෙහොත් මුදුන් නඟා සිරිපා නැමැද ඒ තනතුර ප්‍රාර්ථනා කෙළේ යි. එවිට නරෝත්තම බුදුරජාණන් වහන්සේ පිරිවර ජනයා ප්‍රීතිමත් කරවමින් සිටුහට අනුකම්පා පිණිස මේ ගාථා වදළසේකැ: 'දරුව නිවුනෙක් වන්න, පැතූ තනතුර මතු ලබන්නෙහි.

888. මෙකපින් සුවහස්වන කප්හි ඔක්කාක කුලය සම්භව කොට ඇති ගොතින් ගෞතම නම් වූ සතරහු (ලොවැ) පහළ වන්නාහ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

889. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො
කස්සපො නාම නාමෙන හෙස්සති සත්ථුසාවකො.''

890. තං සුත්වා මුදිතො හුත්වා යාවජීවං තදා ජිනං
මෙත්තචිත්තො පරිචරිං පච්චයෙහි විනායකං.

891. සාසනං ජොතයිත්වාන[1] මද්දිත්වා ච කුතිත්ථියෙ
වෙනෙය්‍යෙ[2] විනයිත්වා ච නිබ්බුතො සො සසාවකො.

892. නිබ්බුතෙ තම්හි ලොකග්ගෙ පූජනත්ථාය සත්ථුනො
ඤාතිමිත්තෙ සමානෙත්වා සහ තෙහි අකාරයිං.

893. සත්තයොජනිකං ථූපං උබ්බිද්ධං රතනාමයං
ජලන්තං සතරංසීව සාලරාජංව ඵුල්ලිතං.

894. සත්තසතසහස්සානි පාතියො[3] තත්ථ කාර'යිං
නළග්ගී විය ජොතන්ති[4] රතනෙහෙව සත්තහි.

895. ගන්ධතෙලෙන පූරෙත්වා දීපානුජාලයිං තහිං
පූජත්ථාය[5] මහෙසිස්ස සබ්බභූතානුකම්පිනො.

896. සත්ත සතසහස්සානි පුණ්ණකුම්භානි කාරයිං
රතනෙහෙව පුණ්ණානි පූජත්ථාය මහෙසිනො.

897. මජ්ඣෙ අට්ඨට්ඨ කුම්භීනං උස්සිතා කඤ්චනග්ඝියා
අතිරොචන්ති වණ්ණෙන සරදෙව දිවාකරො.

898. චතුද්වාරෙසු සොභන්ති තොරණා රතනාමයා
උස්සිතා ඵලකා රම්මා සොභන්ති රතනාමයා.

899. විරොචන්ති පරික්ඛිත්තා අවටංසා[6] සුනිම්මිතා
උස්සිතානි පටාකානි රතනානි විරොචරෙ.

900. සුරත්තං සුකතං චෙතං[7] චෙතියං රතනාමයං
අතිරොචති වණ්ණෙන සසඤ්ඣාව[8] දිවාකරො.

---

1. ජොතයිත්වා සො – සිමු, ලෙඅ.
2. වෙනෙය්‍යං – මජසං.
3. චාතියො – ස්‍යා.
4. ජොතන්තෙ – ස්‍යා, PTS.
5. පූජනත්ථාය – මජසං.
පූජාය – ස්‍යා.
6. අවටංසො – මජසං.
7. චිතකං – මජසං.
8. සසඤ්ඣාව – ස්‍යා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

889. ඔබ දහමට හිමි වූ දහමින් නිපන් නමින් කසුප් නම් වූ උරෙහි ද සාර සවුවෙක් වන්නෙහි.''

890. එවිටැ එ අසා ප්‍රමුදිත වැ විනායක ජිනේන්ද්‍රයන් වහන්සේ මෙත් සිත් ඇතියේ සිවුපසයෙන් දිවිහිම් කොට උවටැන් කෙළේ යි.

891. ඒ තථාගතයන් වහන්සේ අත්තොටුවන් ද මැඩ විනෙදනා ද විනයනය කොට සසුන් බබුළුවා සවුවන් සහිත වැ පිරිනිවිසේකි.

892-893. ලෝකනාථයන් වහන්සේ පිරිනිවි කල්හි ශාස්තෘ වූ ඔබ පුදනු පිණිස නෑ - මිතුරන් කැඳවා ඔවුන් සමග දිලියෙන සූර්‍ය්‍යයා වැනි පිපුණු ශාලවෘක්‍ෂ රාජයකු වැනි සත් යොත්නක් උස් වූ රත්නමය ස්තූපයක් කරවූයෙ යැ.

894. ඒ සෑයෙහි හඩාග්නියක් (ඇවිලගත් හුණවනයක්) සෙයින් දිලියෙන සත් සියදහසක් පාත්‍රාකෘතිහු සත්රුවනින් මැ කරවූයෙ යැ.

895. සියලු සත්නට අනුකම්පා කරන මහර්ෂීන් වහන්සේට පූජා පිණිස සුවඳ තෙලින් (පාත්‍ර) පුරවා එහි පහන් දල්වූයෙ යැ.

896. මහර්ෂීන් වහන්සේට පූජා පිණිස රුවනින් මැ පිරුණු සත් සියදහසක් පුන්කුඹු කරවූයෙ යැ.

897. කුඹු මධ්‍යයෙහි අටෙත් අටෙත් රන්ඇගෑහු ඔසවනලදහ. සරා කල්හි හිරුසෙයින් (ඔහු) පැහැයෙන් වෙසෙසින් බබළුයි.

898. සිවුදෙරහි රුවන්මුවා තොරණහු හොබිති, ඔසවන ලද රුවන්මුවා සිත්කලු පුවරුහු ද හොබිත්.

899. (සෑය) වටා බඳනාලද මනාසේ නිමවනලද අවතංසයෝ බබළති, ඔසවනලද රුවන් පතාක ද බබළත්.

900. ඉතා රතු මොනොවට කළ රුවන්මුවා තෙලසෑය සෑදැ වලා සහිත හිරුසේ පැහැයෙන් වෙසෙසින් බබළයි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

901. ථූපස්ස වෙදියො තිස්සො[1] හරිතාලෙන පූරයිං
එකං මනොසිලායෙකං අඤ්ජනෙන ච එකිකං.

902. පූජාමෙතාදිසං රම්මං කාරෙත්වා වරවාදිනො
අදාසිං දානං සඞ්ඝස්ස යාවජීවං යථාබලං.

903. සහා'හං සෙට්ඨිනා තෙන තානි පුඤ්ඤානි සබ්බසො.
යාවජීවං කරිත්වාන සහාව සුගතිං ගතා.

904. සම්පත්තියොනුභොත්වාන දෙවත්තෙ අථ මානුසෙ
ජායා විය සරීරෙන සහ තෙනෙව සංසරිං.

905. එකනවුතෙ ඉතො කප්පෙ විපස්සී නාම නායකො
උප්පජ්ජි චාරුනයනො[2] සබ්බධම්මවිපස්සකො

906. තදා'යං බන්ධුමතියං බ්‍රාහ්මණො සාධුසම්මතො
අඩ්ඪො සත්ථාගමෙනා'සි[3] ධනෙන ච සුදුග්ගතො.

907. තදපි තස්ස'හං ආසිං බ්‍රාහ්මණී සමචෙතසා
කදාචි සො දිජවරො සංගමෙසි මහාමුනිං.

908. නිසින්නං ජනකායස්මිං දෙසෙන්තං අමතං පදං
සුත්වා ධම්මං පමුදිතො අදාසි එකසාටකං.

909. ඝරමෙකෙන වත්ථෙනාගන්ත්වානෙතං[4] මම'බ්‍රවි[5]
අනුමොද මහාපුඤ්ඤං[6] දින්නං බුද්ධස්ස සාටකං.

910. තදා'හං අඤ්ජලිං කත්වා අනුමොදිං සුපීණිතා[7]
සුදින්නො සාටකො සාමි බුද්ධසෙට්ඨස්ස තාදිනො.

911. සුඛිතො සජ්ජිතො හුත්වා සංසරන්තො භවාභවෙ
බාරාණසිපුරෙ රම්මෙ රාජා ආසි මහීපති.

912. තදා තස්ස මහෙසීහං ඉත්ථිගුම්බස්ස උත්තමා
තස්සාතිදයිතා ආසිං පුබ්බස්නෙහෙන භත්තුනො.[8]

---

1. ථූපසිම වේදියා තිසෙසා – සී, ස්‍යා.
ථූපසිම දිප-දිවයා – ථෙඅ.
2. උප්පජ්ජි චාරුදස්සනො – මජසං.
3. අඩ්ඪො සන්තො ගුණෙනාපි – මජසං.
4. වත්ථෙන ගන්ත්වානෙතං – මජසං, සිමු.
5. ස මබ්‍රවි – මජසං.
6. මහාපු.ඤ්ඤ – ථෙඅ.
මහාපුඤ්ඤං – මජසං, PTS.
7. සුපීතියා – ථෙඅ.
8. වුත්තරි – ස්‍යා, PTS.
හත්තරි – ථෙඅ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

901. ස්තූපයාගේ වෙදිකා තුනෙකි. එකක් හිරියෙලින් (රත් වන් ගෛරිකයෙන්) ද එකක් මනොසිලා (රතුගෛරික)යෙන් ද, එකක් අඤ්ජන (කළු ගෛරික)යෙන් ද පිරවී.

902. උත්තමවාදී වූ බුදුරදුනට තෙල බඳු රම්‍ය පූජා පවත්වා සඟනට දිවිහිමි කොට ශක්තිපමණින් දන් දුන්නේ යි.

903. මම ඒ සිටුහු සමග දිවි ඇති තාක් සර්වප්‍රකාරයෙන් ඒ පුණ්‍යකම් සිදු කොට එක් වැ මැ සුගතියට ගියමු.

904. දෙව් බවෙහි ද වැළි මිනිස් බවෙහි ද සැපත් වළඳා සිරුරින් සෙවනැල්ල මෙන් ඔහු සමග මැ සැරුමු.

905. මෙකපින් එක් අනූවන කප්හි මනහර නුවන් ඇති සියලු දහම් වෙසෙසින් දක්නා ලොකනායක විදර්ශි බුදුරජාණන් වහන්සේ (ලොවැ) පහළ වූ සේක.

906. එසමයෙහි මේ සිටු තෙමේ බන්ධුමතී නගරයෙහි ශාස්ත්‍රාගම යෙන් ආඪ්‍ය, ධනයෙන් ඉතා දුගී වූ බමුණෙක් වී.

907-908. එකල්හි ද මම සම අදහස් ඇති ඔහුගේ බැමිණි (බිරිය) වූමු, ඒ බමුණු උතුමා කිසියම් දිනෙක පිරිස් මැද වැඩ හුන් අමා දහම් දෙසන මහමුනිඳුන් හමු වියැ. දහම් අසා තුටුපත් වූයේ (හැඳ පෙරෑ වූ දෙවතින්) එක්වතක් (මුනිඳුනට) දුන්නේ යැ.

909. එක්වතකින් යුතු වැ ගෙට අවුත් තෙල මට කී: "මහා නුවණැත්ත, (මා විසින්) බුදුරදුනට සළුවක් දෙන ලදි. (එපින්) අනුමොදන් වව" යි.

910. එසඳ මම් අතිශයින් ප්‍රීතියට පැමිණියා ඇඳිලි බැඳ "හිමියනි, තාදී ගුණ ඇති බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේට සළුව මොනොවට දෙන ලද" යි අනුමෝදන් වූමු.

911. (හෙ) සුඛිත වූයේ සව්සැපතින් සැදුණේ කුදුමහත් බවෙහි සරතුයේ (එක් කලෙකැ) සිත්කලු බරණැස් පුරයෙහි රජ වූයේ යැ.

912. එසමයෙහි මම ඔහුට මෙහෙසි වූමු, ඔහුගේ (අන්තඃපුර) ස්ත්‍රීසමූහයාට උතුම් වූමු. පූර්වජාතිසෙනහ හේතුයෙන් ස්වාමියාට ප්‍රිය වූමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

913. පිණ්ඩාය විචරන්තො සො[1] අට්ඨ පච්චෙකනායකෙ
දිස්වා පමුදිතො හුත්වා දත්වා පිණ්ඩං මහාරහං.

914. පුනො නිමන්තයිත්වාන කත්වා රතනමණ්ඩපං
කම්මාරෙහි කතං ඡත්තං[2] සොවණ්ණං සතහත්ථකං.[3]

915. සමානෙත්වාන තෙ සබ්බෙ තෙසං දානමදාසි සො
සොණ්ණසනොපවිට්ඨානං[4] පසන්නො සෙහි පාණිහි.

916. තම්පි දානං සහා'දාසිං කාසිරාජෙන'හං තදා
පුනා'හං බාරාණසියං අජායිං ද්වාරගාමකෙ[5]

917. කුටුම්බිකකුලෙ ඵීතෙ සුඛිතො සො සභාතුකො
ජෙට්ඨස්ස භාතුනො ජායා අහොසිං සුපතිබ්බතා.

918. පච්චෙකබුද්ධං දිස්වාන මම භත්තු කනීයසි[6]
භාගන්නං තස්ස දත්වාන ආගතෙ තම්හි පාවදි[7]

919. නාභිනන්දිත්ථ සො දානං තතො තස්ස අදාස'හං
උබ්භා ආනීය තං අන්නං පුනො තස්සෙව සො අදා.

920. තදන්නං ඡඩ්ඩයිත්වාන දුට්ඨා බුද්ධස්ස'හං තදා
පත්තං කලලපුණ්ණං තං අදාසිං තස්ස තාදිනො.

921. දානෙ ච ගහණෙ චෙව අමෙජ්ඣෙ පදුමෙ යථා[8]
සමචිත්තමුඛං දිස්වා තදාහං සංවිජිං භුසං.

922. පුනො පත්තං ගහෙත්වාන සොධයිත්වා සුගන්ධිනා
පසන්නචිත්තා පූරෙත්වා සඝතං සක්ඛරං අදං.

923. යත්ථ යත්ථූපපජ්ජාමි සුරූපා හොමි දානතො
බුද්ධස්ස අපකාරෙන[9] දුග්ගන්ධා වදනෙන ච.

924. පුන කස්සපවීරස්ස නිධායන්තම්හි[10] චෙතියෙ
සොවණ්ණඉට්ඨකවරං අදාසිං මුදිතා අහං.

1. තෙ – මජසං, ථෛඅ.
2. ඡත්තං – මජසං, PTS. කතමට්ඨං – සයා.
3. වත ඡත්තකං – මජසං.
4. සොණ්ණාසනෙ පවිට්ඨානං – මජසං. සෙනාසනෙ පවිට්ඨානං – සයා. සෙනාසනොපවිට්ඨානං – ථෛඅ.
5. ජාතා කාසිකගාමකෙ – මජසං, සයා.
6. කණියස්ස මම භත්තුනො – සීමු, මජසං, කණියසො – සයා, PTS.
7. පාවදිං – සීමු, මජසං.
8. අපෙව පදුමෙසමි ච – මජසං, සයා, PTS. මජ්ඣත්තමනසො දුජු – ථෛඅ.
9. අපසාදෙන – ථෛඅ.
10. නිට්ඨාපෙන්තම්හි – ථෛඅ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

913. මේ පිඬු පිණිස හැසිරෙන අට පසේබුදු කෙනකුන් දැක සොම්නස් වැ මහාර්හ පිණ්ඩාහාරයක් දී –

914–915. යළි නිමන්ත්‍රණ කොට රත්නමය මණ්ඩපයක් තනා තරහලුන් විසින් කරන ලද රන්මුවා සියහත් සැතක් (නඟා) ඒ සියලු පසේබුදුන් වහන්සේ එහි වැඩම කරවා රන් අසුන්හි වැඩ හුන් ඔබට සියතින් දන් දුන්නේ යි.

916. එසඳ මම ඒ දන් ද කසීරජු හා එක් වැ දුන්මු. යළි මම බරණැස දෙරගමෙකැ උපනුමු.

917. මේ (බරණැස් රජ) සමෘද්ධිමත් කෙළෙඹි කුලෙකැ බෑයන් සහිත වූයේ සුඛිත වැ උපන්නේ යැ. මම දෙටු බෑයාගේ මනා පතිව්‍රත ඇති භාර්‍ය්‍යා වූමු.

918. පසේබුදු කෙනකුන් දැක මාගේ සැමියාගේ කණිටු බුහුන ඔහුගේ අහර කොටස (පසේබුදුනට) දී ඔහු ආකල්හි (එය) කීවා යැ.

919. මේ දනය අභිනන්දන නො කෙළේ යැ. (සතුටු නො වියැ) මම එ අහර (පසේමුනිඳුන්ගේ පාත්‍රයෙන්) උකහා ගෙන ඔහුට දුන්මු. මේ යළි ඔබට මැ දුන්නේ යි.

920. එකල්හි මම දෙව්ෂිත වූවා එ අහර ඉවතැ ලා පසේ බුදුරදුන්ගේ පාත්‍රය කලලින් පිරුණක් කොට අකම්ප්‍ය ගුණ ඇති ඔබට දුන්මු.

921. දීමෙහිත් ගැනීමෙහිත් අමෙධ්‍යයෙහි හා පද්මයෙහි යම්සේ ද එසේ සමසිත් ඇති මුහුණ දැක එකල්හි මම බෙහෙවින් සංවෙගයට පැමිණියමු.

922. නැවත පාත්‍රය ගෙන සුවඳ දියෙන් සෝධා පහන්සිත් ඇති වැ පාත්‍රය පුරා ගිතෙල් සහිත සකුරු දුන්මු.

923. යම් යම් තෙනෙකැ උපදනෙම් ද දන හේතුයෙන් සුරූප වෙමි. පසේබුදුනට (කළ) අපකාර හේතුයෙන් දුගඳ මුව ඇති වෙමි.

924. යළි කසුප් බුදුරදුන්ගේ සෑය නිමවන කල්හි ප්‍රමුදිත වූ මම රන්මුවා ගඩොලක් දුන්මු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

925. චතුජ්ජාතෙන ගන්ධෙන නිචයිත්වා[1] තමට්ඨකං
මුත්තා දුග්ගන්ධදෙසම්හා සබ්බඞ්ගසුසමාගතා.

926. සත්තපාතිසහස්සානි රතනෙනෙව සත්තහි
කාරෙත්වා සතපූරානී වට්ටියො[2] ච සහස්සසො.

927. පක්ඛිපිත්වා පදීපෙත්වා ඨපයිං[3] සත්තපන්තියො
පූජත්ථං[4] ලොකනාථස්ස විප්පසන්නෙන චෙතසා.

928. තදපි තම්හි පුඤ්ඤම්හි භාගිනී'හං විසෙසතො
පුන කාසිසු සඤ්ජාතො සුමිත්තො ඉති විස්සුතො

929. තස්සා'හං භරියා ආසිං සුචිතා සජ්ජිතා පියා
තදපි පච්චෙකමුනිනො අදාසිං[5] ඝනවෙඨනං.

930. තස්සා'පි භාගිනී ආසිං මොදිත්වා දානමුත්තමං
පුනා'පි කාසිරට්ඨම්හි ජාතො කොලියජාතියා.

931. තදා කොලියපුත්තානං සතෙහි සහ පඤ්චහි
පඤ්ච පච්චෙකබුද්ධානං සතානි සමුපට්ඨහි.

932. තෙමාසං තප්පයිත්වාන[6] අදාසි ච තිචීවරං[7]
ජායා තස්ස තදා ආසිං පුඤ්ඤකම්මපථානුගා.

933. තතො චුතො අහූ රාජා නන්දො නාම මහායසො
තස්සාපි මහෙසී ආසිං සබ්බකාමසමිද්ධිනී.

934. තදා ච සො[8] භවිත්වාන බ්‍රහ්මදත්තො මහීපති
පදුමවතීපුත්තානං පච්චෙකමුනිනං තදා.

935. සතානි පඤ්ච'නූනානි යාවජීවං උපට්ඨහි
රාජුය්‍යානෙ නිවාසෙත්වා නිබ්බුතානි ච පූජයි.

936. චෙතියානි ච කාරෙත්වා පබ්බජිත්වා උභො මයං
භාවෙත්වා අප්පමඤ්ඤායො බ්‍රහ්මලොකං අගම්හසෙ.

937. තතො චුතො මහාතිත්ථෙ සුජාතො පිප්ඵලායනො
මාතා සුමනදෙවීති කොසියගොත්තො දිජො පිතා.

---

1. නෙමයිත්වා – සභා, රෙඅ.
2. වට්ටිනි – මජස , රෙඅ.
3. ඨපයිං – මජසං,
4. පූජනත්ථං – මජසං.
5. අදාසිං – මජසං,
6. වාසයිත්වාන – සභා, PTS.
7. පත්තචීවරෙ – රෙඅ.
8. තදා රාජා – මජසං,
තතො චුතො – සිළු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

925. සිවුදැගදින් ඒ ගඩොල තබා දූගදදෙසින් මිදුණි සියල් අඟින් මොනොවට යුතු වූමු.

926-927. (මාගේ ස්වාමිපුරුෂ) සත්රුවනින් මැ ගිතල් පුරාලූ (පහන්) තැටි සත්දහසක් කරවා දහස්ගණනින් වැටි ද බහා (එ පහන් දල්වා වෙසෙසින් පහන් වූ සිතින් යුතු වැ ලෝකනාථයන් වහන්සේට පූජා පිණිස පඞක්ති (පේළි) සතක් සතක් කොට තැබුයේ යි.

928. එදවසැ ද මම එපින්කම්හි වෙසෙසින් සහභාගිනී වූමු. යළි (ස්වාමිපුරුෂ) කසි දනවුහි උපන්නේ සුමිත්‍ර යයි ප්‍රසිද්ධ වූයේ යැ.

929. මම ඔහුට භාර්‍යා වූමු. සුඛිත වූවා සර්වාකාරයෙන් සජ්ජිත වූවා ප්‍රිය වූමු. එකල්හි දු (ස්වාමිපුරුෂ) පසේ බුදුකෙනෙකුන්හට ඝන (රන්) තළල්පටක් දුන්නේ යැ.

930. උතුම් දනය අනුමෝදන් වැ ඒ පුණ්‍යකර්මයට ද සහභාගිනී වූමු. යළිදු (ස්වාමිපුරුෂ) කසිරට කොලිය ජාතියෙහි උපන්නේ යැ.

931. එසඳ (හේ) කොලියපුතුන් පන්සියයක් සමග පන්සියයක් පසේබුදුන් වහන්සේට උපස්ථාන කෙළේ යැ.

932. තෙමසක් මුළුල්ලෙහි (බොජුනෙන්) සතප්වා තුන්සිවුරු ද දුන්නේ යි. එකලැ (මම) පුණ්‍යකර්මපථානුගත වූ ඔහුගේ භාර්‍යා වූමු.

933. (හේ) එතැනින් ච්‍යුත වූයේ මහායශස් ඇති නන්ද නම් රජ වූයේ යැ. (මම ද) ඔහුට සියලුකාමයෙන් සමෘද්ධ වූ මෙහෙසි වූමු.

934-935. එකලැ හේ බ්‍ඹදත් රජ වැ පදුමවතීගේ පුතුන් වූ පන්සියයක් පසේමුනිඳුන් රාජෝද්‍යානයෙහි නිවාසග්‍රහණ කරවා දිවිහිම් කොට උපස්ථාන කෙළේ යැ. පිරිනිවන් පෑ කල්හි දු ඔබ පිදුයේ යි.

936. චෛත්‍ය ද කරවා අපි දෙදෙන පැවිදි වැ අප්පමඤ්ඤ වඩා බඹලොව ගියෙමු.

937. (හේ) එයින් ච්‍යුත වූයේ මහාතිස්ස බමුණුගම පිප්ඵලායන නමින් උපන්නේ යැ. මවු සුමනාදෙවී නම් වූ. කොසියගොත්‍ර බමුණු පියා වියැ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

938. අහං මද්දජනපදෙ සාගලායං පුරුත්තමෙ
කපිලස්ස දිජස්සා'සිං ධීතා මාතා සුචීමතී.

939. ඝනකඤ්චනබිම්බෙන නිම්මිණිත්වාන මං පිතා
අද කස්සපධීරස්ස කාමාසාවජ්ජිතස්ස[1] මං.

940. කදාචි සො කාරුණිකො ගන්ත්වා කම්මන්තපෙක්ඛිතං[2]
කාකාදිකෙහි ඛජ්ජන්තෙ පාණෙ දිස්වාන සංවිජි.

941. ඝරෙ චා'හං තිලෙ ජාතෙ දිස්වානාතපතාපනෙ
කිමී කාකෙහි ඛජ්ජන්තෙ සංවෙගමලභිං තදා.

942. තදා සො පබ්බජී ධීරො අහං තමනුපබ්බජිං
පඤ්ච වස්සානි නිවසිං පරිබ්බාජවතෙ[3] අහං.

943. යදා පබ්බජිතා ආසි ගොතමී ජිනපොසිකා
තදා'හං තමුපාගන්ත්වා බුද්ධෙන අනුසාසිතා.

944. න චිරෙනෙව කාලෙන අරහත්තමපාපුණිං
අහො කල්‍යාණමිත්තත්තං කස්සපස්ස සිරීමතො.

945. සුතො බුද්ධස්ස දායාදො කස්සපො සුසමාහිතො
පුබ්බෙනිවාසං යො වෙදී සග්ගාපායඤ්ච පස්සති.

946. අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤාවොසිතො මුනි
එතාහි තීහි විජ්ජාහි තෙවිජ්ජො හොති බ්‍රාහ්මණො.

947. තථෙව භද්දා කාපිලානී තෙවිජ්ජා මච්චුහායිනී
ධාරෙති අන්තිමං දෙහං ජෙත්වා මාරං සවාහිනිං.

948. දිස්වා ආදීනවං ලොකෙ උභො පබ්බජිතා මයං
ත්‍යම්හා ඛීණාසවා දන්තා සීතිභූතාම්හ නිබ්බුතා.

949-951. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- කතං බුද්ධස්ස
සාසනං.

ඉත්ථං සුදං භද්දකාපිලානී භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

භද්දකාපිලානි ථෙරියාපදානං සත්තමං.

1. කාමෙහි වජ්ජිතස්ස – මජසං, සහ්‍යා, ථෙඅ.
2. පෙක්ඛිතො – මජසං, සහ්‍යා, PTS.
3. පරිබ්බාජපථෙ – සහ්‍යා, PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

938. මම මද්‍ර දනවුහි සාගල පුරවරයෙහි කපිල බමුණුහුගේ දුහිතෘ වූමු. මවු සුචීමතී නම් වූ.

939. පිය තෙමේ සනරන් ප්‍රතිබිම්බයකින් මා පිළිරුව නිමවා කාමාසාගයෙන් තොර වූ කස්සප ධීරයන් (පිප්ඵලි මාණවකයන්) හට මා (සරණ කොට) දුන්නේ යි.

940. කිසියම් දිනෙක හේ (මාගේ ස්වාමිපුරුෂ) කර්මාන්ත ස්ථානය දක්නට ගොස් කාකාදීන් විසින් කනු ලබන පණුවන් දැක සංවෙගයට පත් වීයැ.

941. මම ද එවේලෙහි ගෙහි වූ තල අව්වෙහි ලා වියලන කල්හි කවුඩන් විසින් කනුලබන කෘමීන් දැක සංවෙග ලත්මු.

942. එකල්හි ඒ ධීර වූ කාශ්‍යප පැවිදි වූයේ යැ. මම ඔහු අනු වැ පැවිදි වූමු. මම හවුරුදු පසක් මුළුල්ලෙහි පිරිවැජි-වක්හි වුසුමු.

943. යම් කලෙක බුදුරදුන් හැදූ වැඩූ මවු වූ **මහාපජාපතී ගොතමී** පැවිදි වූවා ද, එකලැ මම බුදුරදුන් විසින් අනුශාසිත වූවා ඔබ කරා එළැඹැ (මහණ මහලු පැවිදි ලත්මු).

944. නොබෝකලෙකින් ම රහත්බවට පැමිණියමු. කාශ්‍යප ශ්‍රීමත්හුගේ කළ්‍යාණමිත්‍රතාව ආශ්චර්‍ය්‍ය යි.

945. බුදුහු අනුජාත පුත්‍ර වූ එහෙයින් ම බුද්ධදායාද වූ මොනොවට සමාහිත වූ යම් කාශ්‍යප ස්ථවිර කෙනෙක් පෙරවිසූ කඳපිළිවෙළ දනිත් ද ස්වර්ගය හා අපාය හා (දිවැසින්) දකිත් ද.

946. වැළි අර්හත්වයට පැමිණියාහු ද මාර්ගඥානයෙන් දූන කරණී අවසන් කළ ඒ ක්ෂීණාසුව මුනිහු තෙල ත්‍රිවිද්‍යා හේතුකොට ගෙන ත්‍රිවිද්‍යාප්‍රාප්ත බ්‍රාහ්මණ වෙත්.

947. එසෙයින් ම භද්දකාපිලානී ත්‍රිවිද්‍යාප්‍රාප්ත යැ, මරු පලවා හරනාසුලු යැ. සෙනා සහිත මරු දිනා පැසුළු කය ධරන්නී වෙයි.

948. ලොකයෙහි ආදීනව දැක අපි දෙදෙනා පැවිදි වූම්හ, ඒ අපි ක්ෂීණාසුවයම්හ, දන්තයම්හ, ශීතිභූතයම්හ, නිර්වෘතයම්හ.

949-951. මා විසින් ක්ලේශයෝ දවන ලද්දහ ... බුදුසසුන් කොට නිමවන ලදී.

මෙසෙයින් භද්දකාපිලානී මෙහෙණ මෙ ගාථා පැවසූ යැ.

**සත්වැනි භද්දකාපිලානී ස්ථවිරාපදාන යි.**

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 28. යසොධරාපදානං

952. එකස්මිං සමයෙ රම්මෙ ඉද්ධෙ රාජගහෙ පුරෙ
පබ්භාරම්හි වරෙකස්මිං වසන්තෙ නරනායකෙ.

953. වසන්තියා තම්හි නගරෙ රම්මෙ භික්ඛුනුපස්සයෙ
යසොධරා භික්ඛුනියා එවං ආසි විතක්කිතං;

954. "නන්දො රාහුලභද්දො ච සාවකග්ගා තථෙව ච
සුද්ධොදනො මහාරාජා ගොතමී ච පජාපතී.

955. අභිඤ්ඤාතා ච මහාථෙරා ථෙරියො ච මහිද්ධිකා
සන්තිං ගතාව ආසුං තෙ දීපච්චීව නිරාසවා.

956. ලොකනාථෙ ධරන්තෙව අහම්පි ච සිවං පදං
ගමිස්සාමී''ති චින්තෙත්වා පස්සන්ති ආයුමත්තනො.

957. පස්සිත්වා ආයුසඞ්ඛාරං තදහෙව ඛයං ගතං
පත්තචීවරමාදාය නික්ඛමිත්වා සකස්සමා.

958. පුරක්ඛතා භික්ඛුනීහි සතෙහි සහස්සෙහි සා[1]
මහිද්ධිකා මහාපඤ්ඤා සම්බුද්ධං උපසඞ්කමි.

959. සම්බුද්ධං අභිවාදෙත්වා සත්ථුනො චක්කලක්ඛණෙ
නිසින්නා එකමන්තම්හි ඉදං වචනමබ්‍රවි:

960. "අට්ඨසත්තතිවස්සා'හං[2] පච්ඡිමො වත්තතෙ වයො[3]
පබ්භාරං හි[4] අනුප්පත්තා ආරොචෙමි මහාමුනෙ.

961. පරිපක්කො වයො මය්හං පරිත්තං මම ජීවිතං
පහාය වො ගමිස්සාමි කතං මෙ සරණමත්තනො.

962. වයං හි[5] පච්ඡිමෙ කාලෙ මරණං උපරුජ්ඣති[6]
අජ්ජ රත්තිං මහාවීර පාපුණිස්සාමි නිබ්බුතිං.

---

1. සතෙහි සහ පඤ්චහි – සිමු, PTS.
2. වස්සාම්හි – සිමු.
3. පච්ඡිමා වත්තන්ති වයා – සතා.
4. පබ්භාරම්හි – මජසං.
5. වයම්හි – මජසං.
6. උපරුද්ධති – මජසං.
   උපරුජ්ඣති – පුජා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 28. යසොධරාපදනය.

952. එක්සමයෙක්හි රම්‍ය වූ සමෘද්ධිමත් රජගහ නුවර එක්තරා ගිරිගුහායෙක්හි නරනායක වූ තථාගතයන් වහන්සේ වැඩ වෙසෙන සෙමෙහි -

953. එනුවර මනරම් මෙහෙණවරෙකැ වෙසෙන යශොධරා තෙරණියනට මෙබඳු විතර්කයෙක් වූයේ යැ:

954-955. "නන්ද යැ, රාහුලභද්‍ර යැ; එසෙයින් මැ අග්‍රශ්‍රාවක යැ, සුද්දොදන මහරජ යැ, පජාපතිගොතමී යැ, ප්‍රසිද්ධ මහතෙරණුවෝ යැ, මහත් සෘද්ධි ඇති තෙරණියෝ යැ යන ඔබ ආසුව රහිත වූවාහු (තෙල් රහිත) පහන්සිළු සෙයින් ශාන්තියට ගියාහු මැ වූහු.

956. ලෝකනාථයන් වහන්සේ ධ්‍රියමාන කල්හි මැ මම ද ශාන්තියට යන්නෙමි" යි සිතා තමන් ආයු පමණ බලන්නී -

957. එදවසැ මැ ක්ෂයයට ගිය අයුසසංස්කාර දක පා සිවුරු ගෙන සිය අසපුවෙන් නික්මැ -

958. සිය ගණන් දහස්ගණන් මෙහෙණන් විසින් පෙරටු කරනලද මහත් සෘද්ධි ඇති මහත් ප්‍රඥා ඇති ඒ යශොධරාවෝ සම්බුදුරජුන් කරා එළැඹුණාහ.

959. සම්බුදුහු වැද සක් ලකුණු ඇති සථරහු වෙතැ එකත් පසෙකැ හුන්නා මෙවදන් බිණූහු:

960. "මහාමුනිතුමනි, (ඔබට) සැලකරමි: මම අටසැත්තෑ හැවිරිදි වෙමි. (මම) පැසුළු වයස වෙයි, මරණ නමැති ප්‍රපාතයට පැමිණ සිටියා වෙමි.

961. මාගේ වයස මුහුකුරා සිටුනේ යැ, මාගේ ජීවිතය මද කල් පවත්නේ යැ, තොප හැර යන්නෙමි, මා විසින් තමහට පිහිට කරගන්නා ලදී.

962. මරණ තෙම පශ්චිමකාලයෙහි ආයු පෙළ යී, මහාවීරයන් වහන්ස අද රැය නිවනට පැමිණෙන්නෙමි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

963. නත්ථි ජාති ජරා ව්‍යාධි මරණඤ්ච යහිං මුනෙ[1]
තත්ථ ගච්ඡාම'හං වීර ගතො යත්ථ න දිස්සති.[2]

964. යාවතා පරිසා එත්ථ[3] සමුපාසන්ති සත්ථුනො
අපරාධං පජානන්ති[4] ඛමන්තං සම්මුඛා මුනෙ.

965. සංසරිත්වා ච සංසාරෙ ඛලිතං චෙ මමං තයි
ආරොචෙමි මහාවීර අපරාධං ඛමස්සු මෙ.

966. සුත්වාන තස්සා වචනං මුනින්දො ඉදමබ්‍රවි
කිමුත්තරං තෙ වක්ඛාමි නිබ්බානාය වජන්තියා.

967. ඉද්ධිං චාපි නිදස්සෙහි මම සාසනකාරිකෙ
පරිසානඤ්ච සබ්බාසං කඞ්ඛං ඡින්දස්සු සාසනෙ.

968. සුත්වා තං මුනිනො වාචං භික්ඛුනී සා යසොධරා
වන්දිත්වා මුනිරාජං තං ඉදං වචනමබ්‍රවි:

969. "යසොධරා අහං වීර අගාරෙ තෙ පජාපති
සාකියම්හි කුලෙ ජාතා ඉත්ථියඞ්ගෙ පතිට්ඨිතා.

970. ඊනං සතසහස්සානං නවුතීනං ඡළුත්තරි[5]
අගාරෙ තෙ අහං වීර පාමොක්ඛා සබ්බඉස්සරා.

971. රූපාචාරගුණූපෙතා යොබ්බනට්ඨා පියංවදා
සබ්බා මං අපචායන්ති දෙවතා විය මානුසා.

972. කඤ්ඤාසහස්සපමුඛා සක්‍යපුත්තනිවෙසනෙ
සමානසුඛදුක්ඛා තා දෙවතා විය නන්දනෙ.

973. කාමධාතුමතික්කන්තා[6] සණ්ඨිතා රූපධාතුයා
රූපෙන සදිසා නත්ථි ඨපෙත්වා ලොකනායකං."

974. එවමාදීනි වත්වාන උප්පතිත්වාන අම්බරං
ඉද්ධි අනෙකා දස්සෙසි බුද්ධානුඤ්ඤා යසොධරා.*

1. මහාමුනෙ – මජසං.
2. අජරාමරං සන්තිපුරං ගමිස්සාමි අසඞ්ඛතං – සිමු.
අජරාමරං පුරං – මජසං.
3. නාම – සිමු, මජසං.
4. සචෙ මෙත්ථි – සිමු.
අපරාධමජානන්ති – මජසං.
5. ඡදුත්තරි – මජසං.
6. කාමධාතුමතික්කම්ම – මජසං.
* මජසං – එතා ගාථා න දිස්සන්ති, අපිච අයං ගාථා දිස්සතෙ:
"සම්බුද්ධං අභිවාදෙත්වා ඉද්ධිං දස්සෙසි සත්ථුනො
නෙකා නානාවිධාකාරා මහාඉද්ධිපි දස්සයි."

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

963. මුනිවරයන් වහන්ස, යම් තැනෙකැ ජාති – ජරා – ව්‍යාධි – මරණ නැත් ද, යම් තැනෙකැ ගිය සත්ව නො පැමෙත් ද, වීරයන් වහන්ස, මම එහි යන්නෙමි.

964. මෙහි යම් පමණ පිරිස් කෙනෙක් ශාස්තෘෂන් වහන්සේ වෙතැ රැස් වැ හිඳිත් ද, (ඔහු මා කළ) දෙසක් දනිත් නම් මුනිඳුන් හමියෙහි කමත්වා!

965. මහාවීරයාණනි, සැලකරමි: සසරැ සරා ඇවිදුනා සෙමෙහි තොප කෙරෙහි ඉදින් මාගේ දෙසෙක් වී නම් එය ක්‍ෂමා කරව.''

966. ඇගේ වදන් අසා මුනීන්ද්‍රයන් වහන්සේ මෙය වදළසේකැ : ''නිවනට යන තොපට මතු කුමක් නම් කියම් ද?

967. මාගේ අනුසසුන් කරන්න, ඍද්ධි ද දක්ව, සසුන්හි ලා සියලු පිරිස් හි සැක ද සිඳලව'' යි.

968. මුනිඳුන්ගේ එවදන් අසා ඒ යශොධරා මෙහෙණ එ මුනිරජුන් වැඳ මේ වචන කිවූ:

969. වීරයන් වහන්ස, ශාක්‍යකුලයෙහි උපන් ස්ත්‍රීලක්‍ෂණයෙහි පිහිටි මම යශොධරා වෙමි, ගිහිගෙහි දී තොපගේ ප්‍රජාපති (භාර්‍ය්‍යා) වූමු.

970. වීරයාණනි, මම තොපගේ නිවෙසෙහි එක්ලක්‍ෂයයානූ- දහසක් කාන්තාවනට ප්‍රමුඛ වූමු. සියල්ලට ඉසුරු ද වූමු.

971. රූප – ආචාර ගුණයෙන් යුතු යොවුන් වියෙහි සිටි මම ප්‍රියතෙපුල් ඇති වූමු, මිනිසුන් දෙවියන් පුදනු සෙයින් සියල්ලෝ මා පුදත්.

972. ශාක්‍යපුත්‍රයන්ගේ නිවෙස්හි සහස්‍රකන්‍යාවනට ප්‍රමුඛ වූමු. සමාන සුවදුක් ඇති උහු (ඒ කන්‍යාවෝ) නඳුනුයනෙහි දේවතා බඳු වූහු.

973. කාමධාතු ඉක්මැ වූවා රූපධාතුහි සිටියා වෙමි. ලෝක නායකයන් තබා රූපයෙන් (මට) සමාන වූවක් නැති.

974. යශොධරාවෝ මේ ආදිය කියා අහසට පැන නැඟැ බුදුරදුන්ගේ අනුදන්මෙන් නොයෙක් ඍද්ධි දක් වූහ.



* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

975. චක්කවාළසමං කායං සීසං උත්තරතො කුරූ
උභො පක්ඛා දුවෙ දීපා ජම්බුදීපො[1] සරීරතො

976. දක්ඛිණඤ්ච සරං පිඤ්ජං නානාසාඛා තු පත්තකා
චන්දඤ්ච සුරියො අක්ඛී[2] මෙරුපබ්බතතො සිඛා.[3]

977. චක්කවාළගිරි[4] තුණ්ඩං[5] ජම්බුරුක්ඛං සමූලකං
විජමානා උපාගන්ත්වා වන්දතෙ ලොකනායකං.

978. හත්ථිවණ්ණං තථෙව'ස්සං පබ්බතං ජලධිං තථා
චන්දිමං සුරියං මෙරුං[6] සක්කවණ්ණඤ්ච දස්සයි.

979. "යසොධරා අහං වීර පාදෙ වන්දාමි චක්ඛුම"
සහස්සං ලොකධාතූනං ඵුල්ලපදුමෙන[7] ඡාදයි.

980. බ්‍රහ්මවණ්ණඤ්ච මාපෙත්වා ධම්මං දෙසෙසි සුඤ්ඤතං
"යසොධරා අහං වීර පාදෙ වන්දාමි චක්ඛුම.

981. ඉද්ධීසු ච වසී හොමි දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී හොමි මහාමුනි.

982. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

983. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
ඤාණං මය්හං මහාවීර උප්පන්නං තව සන්තිකෙ.

984. බුද්ධානං ලොකනාථානං සඞ්ගමං තෙ[8] සුදස්සිතං[9]
අධිකාරං බහුං මය්හං තුය්හත්ථාය මහාමුනෙ.

985. යං මය්හං පුරිමං කම්මං කුසලං සරසෙ මුනෙ
තුය්හත්ථාය මහාවීර පුඤ්ඤං උපචිතං මයා.

986. අභබ්බට්ඨානෙ වජ්ජෙත්වා වාරයිත්වා අනාචරං
තුය්හත්ථාය මහාවීර සඤ්චත්තං ජීවිතං මයා

1. ජම්බුදීපං – සබ්බෙසු.
2. චන්දඤ්ච සුරියඤ්චක්ඛී – මජ්ඣං, සී, ස්‍යා.
චන්දසුරියවිසාලක්ඛී – පුජා.
3. සිඛං – මජ්ඣං, පුජා.
4. ගිරිං – මජ්ඣං.
5. තුණ්ඩා – පුජා.
6. චන්දසුරියමහංමෙරුං – පුජා.
7. ඵුල්ලපාදෙන – පුජා.
8. සඞ්ගමෙනෙත සු – සී.
9. නිදස්සිතා – මජ්ඣං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

975. කය සක්වළ හා සම යැ, හිස උතුරුදෙයින් වූ කුරු දිවයින යැ, පියාපත් යුවළ (පූර්වවිදෙහ-අපරගොයාන යන) දෙ දිව යැ, සිරුරින් දඹදිව යැ.

976. පිල්කළඹ දකුණු සයුර යැ, පියාපත් නානා (වෘක්ෂ) ශාඛා යැ, දෙයැස සඳහිර යැ, මෙරුපර්වතයෙන් ශිඛා යැ.

977. කුඩ සක්වළ ගිර යැ (මෙබඳු ළිහිණි රුවක් මවා දඹදිවට සලකුණු වූ) දඹරුක මුල් සහිත වැ උපුටා (එයින්) පවන් සලමින් එළැඹැ ලෝකනායකයන් වහන්සේ වඳිති.

978. ඇත්රුවක් ද, එසෙයින් ම අස්රුවක් ද, පව්වක් ද, මහසයුර ද, එසේ ම සඳු ද හිරු ද මෙරුව ද සක්රුව ද දක්වූහ.

979. වීරයන් වහන්ස, මම යශොධරා යැ, චක්ෂුර්මතුන් වහන්ස, (තොප) පා වඳිමි යි (කියමින්) දහසක් ලොධා විකසිත පද්මයකින් වැසූහ.

980. බ්‍රහ්මවෙශ ද මවා ශූන්‍යතාප්‍රතිසංයුක්ත ධර්මදේශනා කළාහ. (යළි මෙසේ ද කියයි:) වීරයාණනි, මම යශොධරා යැ, චක්ෂුර්මතාණනි, (තොප) පා වඳිමි.

981. මහාමුනිතුමනි, ඍද්ධියෙහි ද, දිබ්බසොතධාතුයෙහි (දිව කන්හි) ද වසී වෙමි. පෙරමාසිත් දන්නා නුවණෙහි ද වශී වෙමි.

982. පෙර විසූ කඳපිළිවෙළ දන්මි, දිවැස් පිරිසිඳු කරනලදී. සියලු ආශ්‍රව ක්ෂීණ යැ, දැන් පුනර්භවයෙක් නැති.

983. මහාවීරයන් වහන්ස, අර්ථ – ධර්ම – නිරුක්තියෙහි ද, එසෙයින් ම ප්‍රතිභානයෙහි ද ඥානය තොප හමියෙහි දී මට උපන.

984. මහාමුනිතුමනි, ලෝකනාථ වූ බුදුවරයන්ගේ සඩගමය තොප විසින් මොනොවට දක්වන ලද යැ, තොප පිණිස මාගේ අධිකාර ද බොහෝ යි.

985. මුනිතුමනි, පෙරදැහි (කළ) මාගේ යම් කුශලකර්මයෙක් වේ ද එය සිහි කරනු මැනවි, මහාවීරයාණනි, තොප පිණිස මා විසින් පින් රැස්කරනලද යැ.

986. මහාවීරයාණනි, අභව්‍යස්ථාන හැරපියා අනාචාර දුරු කොට තොප සඳහා මා විසින් ජීවිතපරිත්‍යාග කරනලදී.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

987. නෙකකොටිසහස්සානං භරියත්ථාය'දාසි මං
න තත්ථ විමනා හොමි තුය්හත්ථාය මහාමුනි.

988. නෙකකොටිසහස්සානං[1] උපකාරාය'දාසි මං
න තත්ථ විමනා හොමි තුය්හත්ථාය මහාමුනි.

989. නෙකකොටිසහස්සානං භොජනත්ථාය'දාසි මං
න තත්ථ විමනා හොමි තුය්හත්ථාය මහාමුනි.

990. නෙකකොටිසහස්සානි ජීවිතානි පරිච්චජිං
භයමොක්ඛං කරිස්සං ති චජාමි[2] මම ජීවිතං.

991. අඞ්ගගතෙ අලඞ්කාරෙ වත්ථෙ නානාවිධෙ බහූ
ඉත්ථිමණ්ඩ න ගූහාමි තුය්හත්ථාය මහාමුනි.

992. ධනධඤ්ඤපරිච්චාගං ගාමානි නිගමානි ච
ඛෙත්තා[3] පුත්තා ච ධීතා ච පරිච්චත්තා මහාමුනෙ.

993. හත්ථී අස්සා ගවා චාපි දාසියො පරිචාරිකා
තුය්හත්ථාය මහාවීර පරිච්චත්තා අසඞ්ඛියා.

994. යං මය්හං පටිමනෙතසි[4] දානං දස්සාමි යාචකෙ
විමනං මෙ න පස්සාමි දදතො දානමුත්තමං.

995. නානාවිධං බහුං දුක්ඛං සංසාරෙ ච බහුබ්බිධෙ
තුය්හත්ථාය මහාවීර අනුභූතං අසඞ්ඛියං.

996. සුඛප්පත්තා න මොදමි න ච දුක්ඛෙසු දුම්මනා
සබ්බත්ථ තුලිතා හොමි තුය්හත්ථාය මහාමුනෙ.

997. අනුමග්ගෙන සම්බුද්ධො යං ධම්මං අභිනීහරි
අනුභුත්වා සුඛං දුක්ඛං පත්තො බොධිං මහාමුනි.

998. බ්‍රහ්මදෙවඤ්ච සම්බුද්ධං ගොතමං ලොකනායකං
අඤ්ඤෙසං ලොකනාථානං සඞ්ගමා තෙ බහූ මයා.

---

1. සහස්සානි – මජ්ඣ., සුජා.
2. දදමි – මජ්ඣ.
3. ඛෙත්තං – මජ්ඣ.
4. පති මනෙතසි – සිමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

987. මහාමුනිතුමනි, නොයෙක් කෙළදහස්ගණන් දැහි භාය්‍යා පිණිස මා දුන්නාහු. තොපට වැඩ පිණිස එහිලා දෙම්නස් නො ද වෙමි.

988. නොයෙක් කෙළදහස් අත්බවහි (අනුනට) උපකාර පිණිස මා දුන්නාහු, මහාමුනිතුමනි, තොපට වැඩ සඳහා එහිලා නො ද දෙම්නස් වෙමි.

989. මහාමුනීන්ද්‍රයන් වහන්ස, අනේකකොටි සහස්‍රජාතීන්හි ආහාර සඳහා මා (යක්‍ෂ රාක්‍ෂසාදීන්ට) දුන්නාහු, තොපට අභී පිණිස එහිලා විරුද්ධමනස් ඇති නො වෙමි.

990. නොයෙක් කෙළදහස්ගණන් ජාතිවලැ (තොප සඳහා මාගේ) ජීවිතය පරිත්‍යාග කළෙමු. (සිංහව්‍යාඝ්‍රාදීන්ගෙන් වන) බියෙන් (තොප) මුදවන්නෙමැ යි මාගේ ජීවිතය (ඔවුනට) දුන්මු.

991. ශරීරගත පලඳනා ද නන්වැදෑරුම් බොහෝ වස්ත්‍ර ද ස්ත්‍රී ආභරණ ද මහාමුනිතුමනි, තොප පිණිස නො ද සඟවා තබමි. (යදිනට දෙමි).

992. මහාමුනිතුමනි, (තොප පිණිස) ධනධාන්‍ය පරිත්‍යාග කළෙමු. ගම් නියම්ගම් ද කෙත් ද දූපුත්හු ද පරිත්‍යාග කරන ලදහ.

993. මහාවීරයාණනි, සංඛ්‍යා රහිත ඇත්තු ද අස්හු ද ගවයෝ ද දාස්සෝ ද සේවිකාවෝ ද තොප සඳහා මා විසින් පරිත්‍යාග කරන ලදහ.

994. ‘යදියනට දන් දෙමි’ යි යම් බසක් මට පවසන්නාහු ද (එලෙසින්) උතුම් දන් දෙන තොප පිළිබඳ වූ මාගේ දෙම්නසෙක් නො ද දක්මි.

995. මහාවීරයාණනි, සසරැ විවිධ ජාතිවලැ අපමණ වූ නන් වැදෑරුම් බොහෝ දුක් තොප පිණිස විඳිනා ලද යැ.

996. මහාමුනිතුමනි, සුවපත් වූවා (උදම් වැ) නො ද සතුටු වෙමි, දුකෙහි දී නො ද දුම්නස් ඇති වෙමි. තොප සඳහා සැම තැන්හි තුලා බඳු (සම) වෙමි.

997. සම්බුදුරජාණන් වහන්සේ මගපිළිවෙළින් යම් ධර්මයක් ගෙනහැර වදළසේක් ද, මහාමුනීන්ද්‍රයන් වහන්සේ සුවදුක් අනුභව කොට (ඒ) සම්මා සම්බොධියට පැමිණි සේකැ.

998. බ්‍රහ්මදේව නම් වූ ලෝකනායක (පුරාණ) ගෞතම සම්බුදුරජාණන් වහන්සේ අපි දෙදෙනාමෝ දුටුම්හ. (අපරභාගයෙහි පහළ වූ) අන්‍ය ලෝකනාථයන් වහන්සේගේ සමාගම් ද තොප විසිනුදු මා විසිනුදු ලබන ලද යැ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

999. අධිකාරං බහුං මය්හං තුය්හත්ථාය මහාමුනෙ
ගවෙසන්තො බුද්ධධම්මෙ අහං තෙ පරිචාරිකා.

1000. කප්පෙ සතසහස්සෙ ච චතුරො ච අසඞ්ඛියෙ
දීපඞ්කරො මහාවීරො උප්පජ්ජි ලොකනායකො.

1001. පච්චන්තදෙසවිසයෙ නිමන්තෙත්වා තථාගතං
තස්ස ආගමනං මග්ගං සොධෙන්ති තුට්ඨමානසා.

1002. තෙන කාලෙන සො ආසි සුමෙධො නාම බ්‍රාහ්මණො
මග්ගඤ්ච පටියාදෙසි ආයතො[1] සබ්බදස්සිනො.

1003. තෙන කාලෙන'හං ආසිං කඤ්ඤා බ්‍රාහ්මණසම්භවා
සුමිත්තා නාම නාමෙන උපගඤ්ඡිං සමාගමං.

1004. අට්ඨ උප්පලහත්ථානි පූජනත්ථාය සත්ථුනො
ආදාය ජනසම්මජ්ඣා[2] අද්දසං ඉසිමුග්ගතං.

1005. චිරානුපරි ආසිතං[3] අතිකන්තං මනොහරං
දිස්වා තද අමඤ්ඤිස්සං "සඵලං ජීවිතං මම."

1006. පරක්කමං තං සඵලං අද්දසං ඉසිනො තද
පුබ්බකම්මෙන සම්බුද්ධෙ චිත්තඤ්චාපි පසීදි මෙ.

1007. භීය්‍යො චිත්තං පසාදෙසිං ඉසෙ උග්ගතමානසෙ[4]
දෙය්‍යං අඤ්ඤං න පස්සාමි දෙමි පුප්ඵානි තෙ ඉසෙ.

1008. පඤ්ච හත්ථා තව හොන්තු තයො හොන්තු මමං ඉසෙ
තෙන සිද්ධි[5] සමා හොතු[6] බොධත්ථාය තවං ඉසෙ.

භාණවාරං චතුත්ථං.

1009. ඉසි ගහෙත්වා පුප්ඵානි ආගච්ඡන්තං මහායසං
පූජෙසි ජනසම්මජ්ඣෙ[7] බොධත්ථාය මහාඉසිං[8].

1010. පස්සිත්වා ජනසම්මජ්ඣෙ දීපඞ්කරො මහාමුනි
වියාකාසි මහාවීරො ඉසිං උග්ගතමානසං.*

---

1. ආයතං — සිමු.
2. ජනතාමජ්ඣෙ — සිමු.
3. චිරානුගතං දයිතං — මජසං, සයා.
4. ඉසිමුග්ගතමානසෙ — සිමු.
5. සද්ධිං — මජසං, සයා.
6. හොන්තු - මජසං.
7. ජනතාමජ්ඣෙ — සිමු.
8. මහාඉසි — සිමු, මජසං.

* ඉමිස්සානන්තරං සිමු, මජසං, පොත්ථකෙසු අයං ගාථා දිස්සතෙ, න තු ස්‍යාම්ලිපිං:
"අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ දීපඞ්කරො මහාමුනි
මම කම්මං වියාකාසි උජ්ජුභාවං මහාමුනි."

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

999. මහාමුනිතුමනි, තොප පිණිස මා විසින් කරනලද අධි-කාර බෙහෙව, බුදුකුරුදහම සොයන තොපට මම පරිචාරිකා වූමු.

1000. (මෙ කපින්) චතුරාසඞ්ඛ්‍යයක් අධික කොට ඇති සුව-හස්වන කප්හි ලෝකනායක වූ දීපඞ්කර බුදුරජාණන් වහන්සේ ලොවැ පහළ වූ සේකැ.

1001. පසල් දනව්වෙකැ (දනෝ) තථාගතයන් වහන්සේට නිමන්ත්‍රණ කොට ඔබ වඩනා මඟ තුටුසිත් ඇත්තාහු පිරිසිදු කෙරෙත්.

1002. එ සමයෙහි සුමෙධ නම් බ්‍රාහ්මණයෙක් වූයේ යැ, හේ සියල්ල දක්නාසුලු වඩනා බුදුරදුනට මඟ ද සකසා දුන්නේ යි.

1003. එකල්හි මම බමුණුකුලෙහි උපන්නෙම් නමින් සුමිත්‍රා නම් වූ කන්‍යාවක් වූමු. (තථාගත) සමාගමයට ද එළැඹුණුමු.

1004. ශාස්තෲන් වහන්සේ පුදනු සඳහා උපුල් අටමිටක් රැගෙන (ගිය මම) ජනසමාගම මධ්‍යයෙහි (හුන්) උග්‍ර තපොවුන ඇති සෘෂි කෙනෙකුන් දුටුමු.

1005. එසඳ වැහැරි මතුයෙහි හුන් අතිකාන්ත වූ මනොහර වූ සෘෂිහු දැක “මාගේ ජීවිතය සඵල යැ” යි සිතුමු.

1006. එදවසැ (සුමෙධ) සෘෂිහුගේ ඵල සහිත ඒ (ජීවිත පරිත්‍යාග සඞ්ඛ්‍යාත) පරාක්‍රමය දුටුමු. පූර්වපුණ්‍යකර්ම හේතුයෙන් සම්බුද්ධයන් වහන්සේ කෙරෙහි මාගේ සිත ද ප්‍රසන්න වී.

1007. උදර මනස් ඇති සෘෂිවරයා කෙරෙහි බෙහෙවින් සිත පහදවාලූමු. (මෙසේ ද කීමු:) තපස්වීතුමනි, දියයුතු අන්දෑයක් නො දක්මි, තොපට (මේ) මල් දෙමි.

1008. තවුසාණනි, (මේ උපුල් අට මිටෙන්) පස් මිටෙක් තොපට වේවා. තුන් මිටෙක් මට වේවා. එයින් (අපගේ ප්‍රාර්ථනා) සිද්ධිය සම වේවා. සෘෂි තුමනි, තොපගේ බුද්ධත්වය පිණිස ද වේවා.

1009. සුමෙධ තවුස් තෙමේ ඒ මල් රැගෙන බුදුබව පිණිස (එයින්) ජනසන්නිපාත මධ්‍යයෙහි වැඩම කරන මහායශස් ඇති මහර්ෂි බුදුරජාණන් වහන්සේ පිදුයේ යි.

1010. ජනසමාගම මධ්‍යයෙහි (සිටුනා) උදරසිත් ඇති සෘෂිහු දැක මහාවීර වූ දීපඞ්කර මුනීන්ද්‍රයන් වහන්සේ මෙසේ වදළසේකැ:

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1011. සමචිත්තා සමකම්මා සමකාරී භවිස්සති
පියා හෙස්සති කම්මෙන තුය්හත්ථාය මහාමුනෙ.[1]

1012. සුදස්සනා සුප්පියා[2] ච මනාපා පියවාදිනී
තස්ස ධම්මෙසු දායාද පියා හෙස්සති[3] ඉද්ධිකා,

1013. යථාපි භණ්ඩසාමුග්ගං අනුරක්ඛන්ති[4] සාමිනො
එවං කුසලධම්මානං අනුරක්ඛිස්සතෙ අයං.

1014. තස්ස තෙ[5] අනුකම්පන්තී පූරයිස්සති පාරමී
සීහොව පඤ්ජරං හෙත්වා[6] පාපුණිස්සති බොධියං.

1015. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ යං මං බුද්ධො වියාකරි
තං වාචං අනුමොදන්තී එවංකාරී භවිං අහං.

1016. තස්ස කම්මස්ස සුකතස්ස තත්ථ චිත්තං පසාදයිං
දෙවමානුසකං යොනිං උපපජ්ජ[7] අසඞ්ඛියං.

1017. අනුභොත්වා සුඛං දුක්ඛං දෙවෙසු මානුසෙසු ච
පච්ඡිමෙ භවෙ සම්පත්තෙ අජායිං සාකියෙ කුලෙ.

1018. රූපවතී භොගවතී යසසීලවතී තථා
සබ්බඞ්ගසම්පද හොමි කුසලෙසු අතිසක්කතා.

1019. ලාභං සිලොකං සක්කාරං ලොකධම්මසමාගමං
චිත්තඤ්ච දුක්ඛිතං නත්ථි වසාමි අකුතොභයා.

1020. නිබ්බින්දිත්වාන සංසාරෙ පබ්බජිං අනගාරියං
සහස්සපරිවාරෙන පබ්බජිත්වා අකිඤ්චනා.

1021. අගාරං විජහිත්වාන පබ්බජිං අනගාරියං
අඩ්ඪමාසෙ අසම්පත්තෙ චතුසච්චං අපාපුණිං.

1022. චීවරං පිණ්ඩපාතං ච පච්චයං සයනාසනං
උපනෙන්ති බහූ නෙකෙ සාගරස්සෙව ඌම්මියො.

1. මහාමුනි – සිමු.
2. සුපියා – මජසං.
3. විහරිස්සති – මජසං.
4. අනුරක්ඛති – මජසං.
5. මං – සහා.
6. හිත්වා – සි, සහා.
භෙත්වා – PTS.
7. අනුභොත්වා – සිමු, මජසං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1011. (මෝ තොප හා) සමසිත් ඇති, සමකර්ම ඇති සම වැ ක්‍රියා කරන්නක් වෙයි, මහානුවුස, තොපට වැඩ පිණිස ක්‍රියා යෙන් ප්‍රිය ද වේ.

1012. මනාදකුම් ඇති, මොනොවට ප්‍රිය වූ, මන වඩන, ප්‍රිය තෙපුල් බණනා, ඒ තොපගේ ධර්මයට දයාද වූ ප්‍රිය භායභාවක් වෙයි.

1013. යමසේ ධනහිමියෝ භාණ්ඩසමුද්ගය (ධනාගාරය) රකිත් ද, එසෙයින් කුසල්දහම් පිළිබඳ සමුද්ගය මෝ තොමෝ රක්නී යෑ.

1014. ඒ තොපට අනුකම්පා කරමින් පාරමී ධර්ම පුරන්නී යෑ, පඤ්ජරය (කුඩුව) බිඳ පියා පලායන සිංහයකු සෙයින් මෝ අර්හත්වයට පැමිණෙයි.

1015. මෙකපින් පෙර අපරිමෙය කපෙක්හි (දීපඞ්කර) බුදු රජාණන් වහන්සේ මට යමක් ප්‍රකාශ කළසේක් ද, එවදන් අනුව සතුටුවන මම් එසේ කරන්නක් වූමු.

1016-1017. එ බුදුන් කෙරෙහි සිත පහදවා ලූමු. ඒ කුශල කර්ම බලයෙන් අපමණ දෙව්මිනිස්දෑහි උපත ලබා දෙවියන් කෙරෙහි දු මිනිසුන් කෙරෙහි දු සුවදුක් වළඳ කොට පැසුළු භවය එළැඹැ සිටි කල්හි ශාක්‍ය කුලයෙහි උපන්මු.

1018. රූ ඇති වෙමි, භෝග ඇති වෙමි, යශස් හා සිල් ඇති වෙමි. එසෙයින් සර්වාඞ්ග සම්පත් ඇති වෙමි. කුසල් දහම්හි අතිසත්කෘත ද, (බෙහෙවින් කරනලද සත්කාර ඇති) වෙමි.

1019. ලාභ යෑ, ගුණකර්ම යෑ, සත්කාර යෑ, ලෝකධර්ම සමාගම යෑ යන සියල්ල ලබමි. දූෂිත වූ ද සිතෙක් නැති. බිය රහිත වැ වෙසෙමි.

1020. සසරැ කලකිරි දහසක් පිරිවරින් යුක්ත වැ ශාසනයෙහි පැවිදි වූමු. පැවිදි වැ පළිබෝධ රහිත වූමු.

1021. ගිහිගෙය හැරපියා අනගාරිය සංඛ්‍යාත ශාසනයෙහි පැවිදි වූමු, අඩමසක් නො පත් කල්හි සිව්සස් අවබොධ කළමු.

1022. බොහෝ දෙන සාගරයාගේ රළ මෙන් නොයෙක් සිවුරු ද පිණ්ඩපාතය ද ගිලන්පස ද සෙනසුන් ද එළවත්.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1023. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා
නාගීව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවා.

1024. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

1025. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

1026. එවං බහුවිධං දුක්ඛං සම්පත්ති ච බහුබ්බිධා
විසුද්ධභාවං සම්පත්තා ලභාමි සබ්බසම්පදා.

1027. සා දදති සකත්තානං පුඤ්ඤක්ඛාය මහෙසිනො
සහායසම්පදා හොන්ති නිබ්බානපදමසඞ්ඛතං.

1028. පරික්ඛීණං අතීතං ච පච්චුප්පන්නං අනාගතං
සබ්බං කම්මං මමං ඛීණං පාදෙ වන්දාමි චක්ඛුම.

ඉත්ථං සුදං යසොධරා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථා'ති.

යසොධරාථෙරියාපදානං අට්ඨමං.

## 3-9. දසභික්ඛුනීසහස්සාපදානං

1029. කප්පෙ ච සතසහස්සෙ චතුරො ච අසඞ්ඛියෙ
දීපඞ්කරො නාම ජිනො උප්පජ්ජි ලොකනායකො.

1030. දීපඞ්කරො මහාවීරො ව්‍යාකාසි විනායකො
සුමෙධං ච සුමිත්තං ච සමානසුඛදුක්ඛිතං.

1031. සදෙවකං ච පස්සන්තා විචරන්තා සදෙවකං
තෙසං පකිත්තනෙ අම්හ උපගම්ම සමාගමං[1].

1032. අම්හං සබ්බපති හොති[2] අනාගතසමාගමෙ
සබ්බාව තුය්හං භරියා මනාපා පියවාදිකා.

1033. දානසීලමයං සබ්බං භාවනා ච සුභාවිතා[3]
දීඝරත්තං ච නො[4] සබ්බං පරිවඩ්ඪිතං මහාමුනෙ.

1. සදෙවකෙ – සිමු.
2. සබ්බා පතිහොන්ති – PSS.
3. භාවනං ච සුභාවිතං – PTS.
4. මයං – PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1023. මා විසින් ක්ලේශයෝ දවන ලදහු. සියලු භවයෝ නසන ලදහු, බැඳුම් සිඳ ඇතින්නක මෙන් ආශ්‍රව රහිත වැ වෙසෙමි.

1024. බුද්ධශ්‍රේෂ්ඨයන් සමීපයෙහි ඒකාන්තයෙන් මාගේ ස්වාගතය විය, ත්‍රිවිද්‍යාවෝ ලබන ලදහු, බුදුන්ගේ අනුසසුන් කරන ලදී.

1025. සිවු පිළිසිඹියාවෝ ද මේ අෂ්ට විමොක්‍ෂයෝ ද ෂඩ-භිඥාවෝ ද පසක් කරන ලදහු, බුදුන්ගේ අනුසසුන් කරන ලදී.

1026. මෙසේ බහුවිධ වූ දුකට ද බහුප්‍රකාර වූ සම්පත්තීන්ට ද විශුද්ධභාවයට ද පැමිණියමු, සියලු සම්පත් ලබමි.

1027. ඕ යසෝධරා පින් සඳහා මහර්ෂීන්ට සිය අත්බැව දෙයි, ඇට සහායසම්පත්තීහු වෙති, නිර්වාණපදය අසංඛත යි.

1028. අතීත වූ ද ප්‍රත්‍යුත්පන්න වූ ද අනාගත වූ ද කර්මය ගෙවී ගියේය, මාගේ සියලු කර්ම ක්‍ෂය වී, පසැස් ඇති සර්වඥ-යෙනි, ඔබගේ පාසඟුළුවන් වඳිමි.

මෙසේ යසෝධරා මෙහෙණ මේ ගාථා කිවු යැ.

අටවැනි යසොධරා ථෙරි අපදාන යි.

## 3–9 දසදහසක් භික්‍ෂුණීන්ගේ අපදානය

1029. මෙයින් පෙර සාරාසංඛ්‍යකල්පලක්ෂයෙහි ලෝකනායක වූ දීපංකර නම් ජිතපඤ්චමාරයෝ උපන්හ.

1030. සත්‍වයන් විනයනය කරන මහාවීර වූ දීපඞ්කර සර්වඥයන් වහන්සේ සුමේධ ද සුමිත්‍රා ද යන මොවුන් සමාන සුවදුක් ඇතිබව ප්‍රකාශ කළසේක.

1031. ඒ ප්‍රකීර්තනයෙහි දී දෙවියන් සහිත ලෝවැසියන් දක්-නමෝ සදේවක ලෝකයෙහි හැසිරෙන්නමෝ අපි ඔවුන්ගේ සමාගමයට පැමිණ –

1032. අනාගත සමාගමයෙහි අප සියල්ලන්ට ස්වාමි වුව මැනැව, අප සියල්ලෝ ම ඔබට මනවඩන ප්‍රියවදන් කියන භාර්‍යා වම්හ.

1033. මහාමුනි වූ සර්වඥයෙනි, අප විසින් දාන – සීලමය වූ සියලු කුසල් කරනලද, භාවනා ද මොනොවට වඩන ලදු. බොහෝ කලක් සියල්ල පරිත්‍යාග කරන ලදී.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1034. ගන්ධං විලෙපනං මාලං දීපං ච රතනාමයං
යං කිඤ්චි පජ්ජිතං සබ්බං පරිච්චත්තං මහාමුනෙ.

1035. අඤ්ඤං වා'පි කතං කම්මං පරිභොගං ච මානුසං
දීඝරත්තං හි නො සබ්බං පරිච්චත්තං මහාමුනෙ.

1036. අනෙකජාතිසංසාරං බහුං පුඤ්ඤං හි නො කතං
ඉස්සරමනුභොත්වාන සංසරිත්වා භවාභවෙ.

1037. පච්ඡිමභවෙ සම්පත්තෙ සක්‍යපුත්තනිවෙසනෙ
නානාකුලුප්පපන්නායො අච්ඡරාකාමවණ්ණිනී.

1038. ලාභග්ගෙන යසං පත්තා පූජිතා සබ්බසක්කතා
ලාභියො අන්නපානානං සදා සම්මානිතා මයං.

1039. අගාරං පජහිත්වාන පබ්බජිත්වානගාරියං
අඩ්ඪමාසෙ අසම්පත්තෙ සබ්බා පත්තාම්හ නිබ්බුතිං.

1040. ලාභියො අන්නපානානං වත්ථසෙනාසනානි ච
උපෙන්ති පච්චයා සබ්බෙ සදා සක්කතපූජිතා.

1041. කිලෙසා ඣාපිතාම්හාකං භවා සබ්බෙ සමූහතා
නාගීව බන්ධනං ඡෙත්වා විහරාම අනාසවා.

1042. ස්වාගතං වත නො ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

1043. පටිසම්භිද චතස්සො ච –පෙ– කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං යසොධරාපමුඛානි දසභික්ඛුනිසහස්සානි
භගවතො සම්මුඛා ඉමා ගාථායො අභාසිත්ථාති.

**දසභික්ඛුනීසහස්සාපදානං නවමං.**

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1034. මහාමුනි වූ සර්වඥයෙනි, සුවඳ විලෙවුන් මල් හා පහන් ද පතන ලද රුවන්මුවා වූ යම් කිසිවක් ඇද්ද, ඒ සියල්ල පරිත්‍යාග කරන ලදී.

1035. මහාමුනි වූ සර්වඥයෙනි, අන්‍ය වූ ද කුශලකර්ම කරන ලද, මානුෂික වූ පරිභෝග වස්තු ද යන සියල්ල අප විසින් බොහෝ කලක් පරිත්‍යාග කරන ලදී.

1036. නොයෙක් ජාති ඇති සංසාරයෙහි අප විසින් බොහෝ පින්කම් කරන ලදි. ඓශ්වර්‍ය්‍ය වළඳා කුදුමහත් භවයෙහි සැරිසරා–

1037. පශ්චිම භවය පැමිණි කල්හි කැමැති වර්ණ ඇති අප්සරාවෝ නානාකුලයෙහි උපන්නාහු ශාක්‍යපුත්‍ර වූ සිදුහත් කුමරුන්ගේ නිවෙසනයෙහි –

1038. අග්‍ර වූ ලාභයෙන් යුක්ත ව පුදනු ලැබූ සියල්ලන් විසින් සත්කාර කරන ලද හැම කල්හි සම්මානිත වූ අපි ආහාර පාන ලබනසුලු වූම්හ.

1039. ගිහිගෙය හැර ශාසනයෙහි පැවිදි ව අඩමසක් නො පත් කල්හි සියල්ලෝ නිවනට පැමිණියම්හ.

1040. ආහාර පාන ද වස්ත්‍ර හා සෙනසුන් ද ලාභී වූම්හ. සියලු ප්‍රත්‍යයෝ ලැබෙත්. හැම කල්හි සත්කෘත පූජිත වූම්හ.

1041. අප විසින් ක්ලේශයෝ දවන ලදහ, සියලු භවයෝ නසන ලදහ, බැඳුම් සිඳ ඇතින්නන් මෙන් ආස්‍රව රහිත ව වාස කරම්හ.

1042. බුද්ධශ්‍රෙෂ්ඨයන්ගේ ශාසනයට ඒකාන්තයෙන් අපගේ මනා පැමිණීම විය, ත්‍රිවිද්‍යාවෝ ලබන ලදහ, බුදුසසුන් කරන ලද.

1043. සිවුපිළිසිඹියාවෝ ද ... බුදුසසුන් කරන ලදී.

මෙසේ යසොධරාවන් ප්‍රමුඛ දසදහසක් භික්‍ෂුණීහු භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි මේ ගාථා ප්‍රකාශ කළාහ.

**නවවැනි දසදහසක් භික්ෂුණීන්ගේ අපදාන යි.**

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 3-10. අට්ඨාරසභික්ඛුනීසහස්සාපදානං

1044. අට්ඨාරසසහස්සානි භික්ඛුනී සක්‍යසම්භවා
යසොධරාපමුඛානි සම්බුද්ධං උපසඞ්කමුං.

1045. අට්ඨාරසසහස්සානි සබ්බා හොන්ති මහිද්ධිකා
වන්දන්ති මුනිනො පාදෙ ආරොචෙන්ති යථාබලං.

1046. ජාති ඛීණා ජරා ව්‍යාධි මරණං ච මහාමුනි
අනාසවං පදං සන්තං අමතං යාම නායක.

1047. ඛලිතං චෙ පුරෙ අත්ථි සබ්බාසම්පි මහාමුනි
අපරාධමජානන්තී[1] ඛම අම්හං විනායක.

1048. "ඉද්ධිං චාපි නිදස්සෙථ මම සාසනකාරිකා
පරිසානං ච සබ්බාසං කඞ්ඛං ඡින්දථ යාවතා."

1049. යසොධරී මහාවීර මනාපා පියදස්සනා
සබ්බා තුය්හං මහාවීර අගාරස්මිං පජාපතී.

1050. ඊනං සතසහස්සානං නවුතීනං ඡළුත්තරි
අගාරෙ තෙ මයං වීර පාමොක්ඛා සබ්බඉස්සරා.

1051. රූපාචාරගුණූපෙතා යොබ්බනට්ඨා පියංවදා
සබ්බායො අපචායන්ති දෙවතා විය මානුසා.

1052. අට්ඨාරසසහස්සානි සබ්බා සාකියසම්භවා
යසොධරා[2] සහස්සානි පාමොක්ඛා ඉස්සරා තදා.

1053. කාමධාතුමතික්කන්තා සණ්ඨිතා රූපධාතුයා
රූපෙන සදිසා නත්ථි සහස්සානං මහාමුනි,

1054. සම්බුද්ධං අභිවාදෙත්වා ඉද්ධිං දස්සෙසු සත්ථුනො
නෙකා[3] නානාවිධාකාරා මහාඉද්ධීපි දස්සයුං.

1055. චක්කවාළසමං කායං සීසං උත්තරතො කුරු
උභො පක්ඛා දුවෙ දීපා ජම්බුදීපං සරීරතො.

1056. දක්ඛිණං ච සරං පිඤ්ඡං නානාසාඛා තු පත්තකා
චන්දසූරවිසාලක්ඛා[4] මෙරුපබ්බතතො සිඛා.

1. අපරාධං පජානන්ති – PTS.
2. යසොවතී – සී, PTS.
3. ලොකෙ – සීමු.
4. චන්දං ච සූරියං චක්ඛී – මජසං, PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 10. යසොධරා ප්‍රමුඛ අටළොස්දහසක් භික්ෂුණීන්ගේ අපදානය

1044. යසොධරාවන් ප්‍රමුඛ ශාක්‍යවංශයෙහි උපන් අටළොස් දහසක් භික්ෂුණීහු සම්බුදුන් කරා පැමිණියාහු ය.

1045. අටළොස්දහසක් භික්ෂුණීහු සියල්ලෝ මහත් සෘද්ධි ඇත්තාහු වෙති, මුනීන්ද්‍රයන්ගේ පාසඟුළුවන් වඳිති, ශක්ති පරිදි දන්වා සිටිත්,

1046. මහාමුනිතුමනි, ජාතිය ද ජරාව ද ව්‍යාධිය ද මරණය ද ක්ෂය විය, නායකයාණෙනි, අනාශ්‍රව වූ ශාන්ත වූ අමෘතපදයට යම්හ.

1047. මහාමුනීන්ද්‍රයෙනි, ඉදින් පෙර සියල්ලන්ගේ මැ යම් දෙසෙක් ඇද්ද, විනායකයෙනි, ඒ අපරාධය නො දන්නා වූ අපට කමා කළ මැනැව.

1048. මාගේ සසුන් කරන මෙහෙණියනි. සෘද්ධිය ද දක්වවු, යම්පමණ පිරිස් වැසියන්ගේ සැකය ද සිඳිවු.

1049. මහාවීරයන් වහන්ස, යශස් දරන මනවඩන ප්‍රියදර්ශන ඇති සියල්ලෝ ගිහිගෙයි දී නුඹ වහන්සේගේ ප්‍රජාපතී වූම්හ.

1050. වීරයන් වහන්ස, අපි නුඹ වහන්සේගේ භවනයෙහි සියදහසක් ස්ත්‍රීන්ට ද, සයක් අධික වූ අනුවකට ද ප්‍රමුඛව සියල්ලන්ට ඉසුරු ඇති වූම්හ.

1051. රූපයෙන් හා ආචාරගුණයෙන් යුක්ත වූ යොවුන් වියෙහි සිටි ප්‍රියවදන් ඇති සියල්ලෝ මිනිස්ලොවැ දෙවියකුට මෙන් පුදත්.

1052. ශාක්‍යකුලයෙහි උපන් සියල්ලෝ අටළොස්දහසක් වූහ, (ඔවුනතුරෙහි) යශස්ධර වූ දහසක් දෙන එකල්හි ප්‍රමුඛ වූවාහු ඉසුරුඇති වූහ.

1053. මහාමුනීන්ද්‍රයෙනි, කාමධාතුව ඉක්මවූවාහු, රූපධාතුයෙහි සිටියාහු ඒ දහසක් ස්ත්‍රීන්ට රූපයෙන් සදෘශ වූවාහු නැති.

1054. සම්බුදුන් වැද ශාස්තෘන් වහන්සේට සෘද්ධි දක්වූහ, ලොවැ නන්වැදෑරුම් වූ මහත් සෘද්ධි ද දක්වූහ.

1055. සක්වළ සම වූ කය ඇති උතුරුකුරුයෙහි හිස ඇති (විදෙහ ගොයාන යන) දෙදිවයිනැ දෙපියා ඇති ශරීරයෙන් දඹදිව වසා සිටි –

1056. දකුණු සයුර විල්කලබ ඇති නානාශාඛා බඳු පතු ඇති සඳු හිරු මෙන් විශාල දැස් ඇති මෙරුපර්වතයෙහි සිළ ඇති–

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1057. චක්කවාළගිරිතුණ්ඩා ජම්බුරුක්ඛං සමූලකං
විජමානා උපගන්ත්වා වන්දන්ති ලොකනායකං.

1058. හත්ථිවණ්ණං තථෙවස්සං පබ්බතං ජලධිං තථා
චන්දං ච සූරියං මෙරුං සක්කවණ්ණං ච දස්සයුං.

1359. යසොධරා මයං වීර පාදෙ වන්දාම චක්ඛුම
තව වීර පභාවෙන නිප්ඵන්නා නරනායක.

1060. ඉද්ධීසු ච වසී හොම දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී හොම මහාමුනෙ.

1061. පුබ්බෙ නිවාසං ජානාම දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවා පරික්ඛීණා නත්ථි'දානි පුනබ්භවො.

1062. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
ඤාණං අම්හං මහාවීර උප්පන්නං තව සන්තිකෙ

1363. පුබ්බානං ලොකනාථානං සඞ්ගමං නො නිදස්සිතං
අධිකාරා බහූ අම්හං තුම්හත්ථාය මහාමුනෙ.

1064. යං අම්හං පුරිමං කම්මං කුසලං සරසෙ මුනෙ
තුම්හත්ථාය මහාවීර පුඤ්ඤඤ්චුපචිතානි නො.

1065. අභබ්බට්ඨානෙ වජ්ජෙත්වා වාරයිම්හ අනාචරං
තුය්හත්ථාය මහාවීර චත්තානි ජීවිතානි නො.

1066. නෙකකොටිසහස්සානං භරියත්ථාය'දසි නො
න තත්ථ විමනා හොම තුය්හත්ථාය මහාමුනෙ.

1067. නෙකකොටිසහස්සානං උපකාරාය'දසි නො
න තත්ථ විමනා හොම තුය්හත්ථාය මහාමුනෙ.

1068. නෙකකොටිසහස්සානං භොජනත්ථාය'දසි නො
න තත්ථ විමනා හොම තුය්හත්ථාය මහාමුනෙ.

1069. නෙකකොටීසහස්සානි ජීවිතානි චජිම්හ නො
'භයමොක්ඛං කරිස්සාම' ජීවිතානි චජිම්හ සෙ.

1070. අඞ්ගගතෙ අලඞ්කාරෙ වත්ථෙ නානාවිධෙ බහූ
ඉත්ථිභණ්ඩෙ න ගූහාම තුය්හත්ථාය මහාමුනෙ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1057. සක්වළගිරෙහි තුඩු ඇති ව (ගුරුළුවෙස් ගෙන) මුල් සහිත දඹරුක සලමින් සමීපයට පැමිණ ලෝකනායකයන් වඳිති.

1058. හස්තිවෙශය ද එසේ මැ අශ්වවෙශය ද පර්වත ද එසේ මැ සයුර ද සඳු ද හිරු ද මෙරගල් ද ශක්‍රවෙශය ද දක්වූහ.

1059. පසැස් ඇති වීරයන් වහන්ස, යශස්ධර වූ ඇපි පා සඟළුවන් වඳුම්හ. නරනායක වූ වීරයන් වහන්ස, ඔබගේ මහිම යෙන් නිෂ්පන්නයම්හ.

1060. මහාමුනීන්ද්‍රයන් වහන්ස, ඍද්ධිවිෂයෙහි ද දිව්‍යසෝධාහි ද වශී වම්හ, පරසිත් දන්නා නුවණෙහි වශී වම්හ.

1061. පෙර විසූ කඳපිළිවෙළ දනුම්හ, දිව ඇස පිරිසිදු කරනලද සියලු ආශ්‍රවයෝ ක්‍ෂය වූහ, දැන් පුනර්භවයෙක් නැති.

1062. මහාවීරයන් වහන්ස, නුඹ වහන්සේ සමීපයෙහි අපට අත්‍ථ ධම්ම නිරුත්ති විෂයෙහි ද පටිභානයෙහි ද නුවණ උපන.

1063. මහාමුනිවරය, පූර්වලෝකනාථයන්ගේ සංගමය අපට දක්වනලද, නුඹ වහන්සේ සඳහා අපගේ අධිකාරයෝ බොහෝ වූහ.

1064. මුනීන්ද්‍රයන් වහන්ස, අපගේ යම් පූර්වකුශලකර්මයක් සිහිකරන්නහු ද, මහාවීරයන් වහන්ස, නුඹ වහන්සේ සඳහා අප විසින් පුණ්‍යයෝ රැස්කරන ලදහ.

1065. අභව්‍යස්ථානයන් හැරපියා අනාචාරය වැළැකූම්හ., මහා වීරයන් වහන්ස, නුඹ වහන්සේ සඳහා අප විසින් දිවි පුදනලද.

1066. මහාමුනිවරය, නොයෙක් කෙළසුවහසුන්ට භායර්‍යා පිණිස අප දුන්නේ ය, එහි ලා නුඹ වහන්සේ සඳහා නො සතුටු නො වම්හ.

1067. නොයෙක් කෙළසුවහසුන්ට උපකාර පිණිස අප දුන්නේ ය, මහාමුනිවරය, එහි ලා නුඹ වහන්සේට නො සතුටු නො වම්හ.

1068. නොයෙක් කෙළසුවහසුන්ට භෝජන සඳහා අප දුන්නේ ය, මහාමුනිවරය, එහි ලා නුඹ වහන්සේට නො සතුටු නො වම්හ.

1069. අපගේ නොයෙක් කෙළ සුවහස් ජීවිතයන් පිදූම්හ, භයින් මිදීම කරම්හ'යි ජීවිතයන් ත්‍යාග කළම්හ.

1070. මහාමුනිවරය, නුඹ වහන්සේ සඳහා ශරීරගත ආභරණ ද නන්වැදෑරුම් බොහෝ වස්ත්‍ර ද ස්ත්‍රී භාණ්ඩ ද නො සඟවම්හ.



* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1071. ධනධඤ්ඤපරිච්චාගං ගාමානි නිගමානි ච
ඛෙත්තා පුත්තා ච ධීතා ච පරිච්චත්තා[1] මහාමුනෙ

1072. හත්ථී අස්සා ගවා චාපි[2] දසියො පරිචාරිකා
තුය්හත්ථාය මහාවීර පරිච්චත්තා අසඞ්ඛියා[3].

1073. යං අම්හෙ පටිමානෙසි දානං දස්සාම යාචකෙ
විමනං තෙ න පස්සාම දදතො දානමුත්තමං.

1074. නානාවිධං බහුං දුක්ඛං සංසාරෙ ච බහුබ්බිධෙ
තුය්හත්ථාය මහාවීර අනුභූතං අසඞ්ඛියං.

1075. සුඛප්පත්තා න මොදම[4] න ච දුක්ඛෙසු දුම්මනා
සබ්බත්ථ තුලිතා හොම තුය්හත්ථාය මහාමුනෙ.

1076. අනුමග්ගෙන සම්බුද්ධො යං ධම්මං අභිනීහරි
අනුභුත්වා සුඛං දුක්ඛං පත්තො බොධිං මහාමුනි,

1077. බ්‍රහ්මදෙවං ච සම්බුද්ධං ගොතමං ලොකනායකං
අඤ්ඤෙසං ලොකනාථානං සඞ්ගමා තෙහි තො බහූ.

1078. අධිකාරා බහූ අම්හං[5] තුය්හත්ථාය මහාමුනෙ
ගවෙසතො බුද්ධධම්මෙ මයං තෙ පරිචාරිකා.

1079. කප්පෙ ච සතසහස්සෙ චතුරො ච අසඞ්ඛියෙ
දීපඞ්කරො මහාවීරො උප්පජ්ජි ලොකනායකො,

1080. පච්චන්තදෙසවිසයෙ නිමන්තෙත්වා තථාගතං
තස්ස ආගමනං මග්ගං සොධෙන්ති තුට්ඨමානසා.

1081. තෙන කාලෙන සො ආසි සුමෙධො නාම බ්‍රාහ්මණො
මග්ගං ච පටියාදෙසි ආයතං[6] සබ්බදස්සිනො.

1082. තෙන කාලෙන ආසිම්හ සබ්බා බ්‍රාහ්මණසම්භවා
ථලූදජානී පුප්ඵානි ආහරිම්හ සමාගමං

1083. තස්මිං සො සමයෙ බුද්ධො දීපඞ්කරො මහායසො
ව්‍යාකාසි මහාවීරො ඉසිමුග්ගතමානසං.

1. ඛෙත්තං පුත්තං ච ධීතං ච පරිච්චත්තං – PTS.
2. හත්ථිඅස්සංගවං චාපි – PTS.
3. පරිච්චත්තං අසංඛියං – PTS.
4. නුමොදම – මජසං.
5. අධිකාරං බහුං අම්හෙ – PTS
6. ආයතො – මජසං, PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1071. මහාමුනිවරය, ධනධාන්‍ය පරිත්‍යාග කළෙමහ, ගම් ද නියම්ගම් ද කෙත් ද පුත්‍රයෝ ද දුහිතෲහු ද පරිත්‍යා කරන ලදහ.

1072. මහාවීරයන් වහන්ස, නුඹ වහන්සේ සඳහා අසංඛ්‍ය වූ ඇත් අස් ගවයෝ ද දසීහු ද පිරිවර ස්ත්‍රීහු ද පරිත්‍යාග කරන ලදහ.

1073. යම්හෙයකින් අප යාචකයන්ට දන් දෙම්හ යි ප්‍රතිඥ කෙළේ ද එකල්හි උතුම් දනය දෙන නුඹ වහන්සේට අපගේ නො සතුටක් නො දක්වම්හ.

1074. මහාවීරයන් වහන්ස, නුඹ වහන්සේ සඳහා බහුප්‍රකාර වූ සංසාරයෙහි අසංඛ්‍ය වූ නන්වැදෑරුම් බොහෝ දුක් විඳුනා ලද.

1075. මහාමුනිවරය, නුඹවහන්සේ සඳහා සුවපත් වූවමෝ සතුටු නො වම්හ, දුකෙහි නොවුසතු නො ද වම්හ, හැම තන්හි සම වම්හ.

1076. සම්බුද්ධයන් වහන්සේ (අන් බුදුවරයන්) ගියමඟින් යම් බෝසඹර දහමක් රැස් කළාහු ද, එයින් මහාමුනිහු සුවදුක් විඳ බුද්ධ බොධියට පැමිණියහ.

1077. බ්‍රහ්මදෙව සම්බුදුන් ද ගෞතම ලොකනායකයන් වහන්සේ ද අන්‍ය ලොකනාථයන් වහන්සේ ද යන ඒ බුදුවරුන් සමග අපගේ බොහෝ සංගමයෝ වූහ.

1078. මහාමුනිවරය, නුඹ වහන්සේ සඳහා අපගේ බොහෝ අධිකාරයෝ වූහ, බුද්ධධර්මයන් ගවෙෂණය කරන නුඹ වහන්සේට ඇපි පරිචාරිකා වූම්හ.

1079. සාරාසංඛ්‍යකල්පලක්‍ෂයකින් මතුයෙහි මහාවීර වූ දීපඞ්කර නම් ලෝකනායකයන් වහන්සේ පහළ වූ සේක.

1080. ප්‍රත්‍යන්ත දේශයෙහි (මනුෂ්‍යයෝ) තථාගතයන් වහන්සේ පවරා සතුටු සිත් ඇත්තාහු උන් වහන්සේ වඩනා මඟ ශුද්ධ කෙරෙත්.

1081. එකල්හි ඒ ගෞතම බුදුහු සුමේධ නම් බමුණු වූහ, සර්වදර්ශී වූ බුදුරදුන්ට දීර්ඝ වූ මාර්ගය ද පිළියෙළ කළහ.

1082. එකල්හි අප සියල්ලෝ බමුණු කුලයෙහි උපනුම්හ, දිය ගොඩ උපදනා මල් ඒ සමාගමයට ගෙන ආම්හ.

1083. එසමයෙහි මහායශස් ඇති මහාවීර වූ ඒ දිවකුරු බුදුහු උද්ගත වූ සිත් ඇති සෘෂිහුට විවරණ දුන්හ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1084. චලති රවති පඨවී සඞ්කම්පති සදෙවකං
තස්ස කම්මං පකිත්තෙන්තෙ ඉසිනුග්ගතමානසො[1]

1085. දෙවකඤ්ඤා මනුස්සා ච මයං චා'පි සදෙවකා
නානාපූජනියං භණ්ඩං පූජයිත්වාන පත්ථයුං.

1086. එතෙසං බුද්ධො ව්‍යාකාසි ජොතිදීපසනාමකො
“අජ්ජ මෙය පත්ථිතා අත්ථි තෙ භවිස්සන්ති සම්මුඛා.”

1087. අපරිමෙය්‍යො ඉතො කප්පෙ යං නො බුද්ධො ව්‍යාකරි
තං වාචමනුමොදන්ති එවඞ්කාරී අහුම්හ නො.

1088. තස්ස කම්මස්ස සුකතස්ස තත්ථ චිත්තං පසාදිය[2]
දෙවමානුසකං යොනි අනුභොත්වා අසඞ්ඛියං.

1089. සුඛදුක්ඛ'නුභොත්වාන දෙවෙසු මානුසෙසු ච
පච්ඡිමෙ භවෙ සම්පත්තෙ ජාතා'ම්හ සාකියෙ කුලෙ.

1090. රූපවතී භොගවතී යසසීලවතී තතො
සබ්බඞ්ගසම්පද හොම කුලෙසු අතිසක්කතා.

1091. ලාභං සිලොකං සක්කාරං ලොකධම්මසමාගමං
චිත්තං ච දුක්ඛිතං නත්ථි වසාම අකුතොභයා.

1092. වුත්තං හෙතං භගවතා රඤ්ඤො අන්තෙපුරෙ තදා
ඛත්තියානං පුරෙ වීරො උපකාරං ච නිද්දිසි.

1093. උපකාරා ච යා නාරී යා ච නාරී සුඛෙ දුඛෙ
අත්ථක්ඛායී ච යා නාරී යා ච නාරී'නුකම්පිකා.

1094. ධම්මං චරෙ සුචරිතං න නං දුච්චරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච.

1095. අගාරං විජහිත්වාන පබ්බජිම්හ'නගාරියං
අඩ්ඪමාසෙ අසම්පත්තෙ චතුසච්චං ඵුසිම්හ නො.

1096. චීවරං පිණ්ඩපාතං ච පච්චයං සයනාසනං
උපනෙන්ති බහුං අම්හ සාගරස්සෙව ඌමියො.

1. ඉසිමුග්ගත මානසං – මජ්සං, PTS.
2. පසාදයුං – සිමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1084. උද්ගත වූ සිත් ඇති ඒ ස්වාමිහුගේ අධිකාර කර්මය පවසන කල්හි මහ පොළොව සැලෙයි නාද කෙරෙයි සදෙව්ක ලොකය කම්පා වෙයි.

1085. දිව්‍යකන්‍යාවෝ ද මනුෂ්‍යයෝ ද ඇපි ද දෙවියන් සහිත ලෝවැසියෝ ද නානාපූජනීය භාණ්ඩ පුද ප්‍රාර්ථනා කළම්හ.

1086. දීපඞ්කර නම් බුදුහු ඔවුනට 'අද ප්‍රාර්ථනා කළ යම් කෙනෙක් ඇද්ද ඔහු සම්මුඛ වන්නාහ' යි ප්‍රකාශ කළ සේක.

1087. මෙයින් අපරිමෙය කල්පයෙහි දිවකුරු බුදුහු අපට යමක් ප්‍රකාශ කළසේක් ද, අපි ඒ බස අනුමෝදන් වෙමින් එ පරිදි කරනසුලු වූම්හ.

1088. එහි සිත් පහදවා මොනවට කළ ඒ කර්මයාගේ විපාකයෙන් අසංඛ්‍ය වූ දෙව්මිනිස් දෙගතිය ලබා –

1089. දෙව්ලොව ද මිනිස්ලොව ද සුවදුක් විඳ පශ්චිම භවය පැමිණි කල්හි ශාක්‍යකුලයෙහි උපනුම්හ.

1090. රූ ඇත්තමෝ භොග ඇත්තමෝ යශස් හා සිල් ඇත්තමෝ යළි සියලු ශරීර සම්පත් ඇත්තමෝ කුලයන්හි අතිශයින් සත්කාර කරන ලදුවම්හ.

1091. ලාභය ප්‍රශංසාය සත්කාරය ලොකධම්සමාගමය හා දුප්පත් සිත ද නැති, කොයිනුත් නො බිය වැ වාස කරම්හ.

1092. එකල්හි (සුදෙවුන්) රජුගේ ඇතොවුරෙහි දී භාග්‍ය-වතුන් විසින් තෙල වදරන ලද මැ යි, වීරයන් වහන්සේ ක්ෂත්‍රිය-යන්ගේ කිඹුල්වත් පුරෙහි දී, (පෙර ලද) උපකාරය ද ප්‍රකාශ කළහ.

1093. යම් ස්ත්‍රියක් උපකාර ඇති වූ ද යම් ස්ත්‍රියක් සුව දුක් දෙකෙහි සම වූ ද, යම් ස්ත්‍රියක් හිතවැඩ පවසන්නී ද යම් ස්ත්‍රියක් (ස්වාමියාට) අනුකම්පා කරන්නී ද –

1094. සුචරිත ධර්මයෙහි හැසිරෙන්නේ යැ, දුශ්චරිතයෙහි නො හැසිරෙන්නේ යැ, ධම්මචාරී පුද්ගල මෙලොවැ ද පරලොවැ ද සුවසේ හැසිරෙයි.

1095. ගිහිගෙය හැරපියා ශාසනයෙහි පැවිදි වූම්හ, අඩමසක් නො පත් කල්හි ඇපි සිවුසස් අවබොධ කළම්හ.

1096. සාගරයාගේ රළ මෙන් අපට බොහෝ දෙන සිවුරු ද පිඩුවා ද ගිලන්පස ද සෙනසුන් ද එළවත්.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1097. කිලෙසා ඣාපිතා අම්හං භවා සබ්බෙ සමූහතා
නාගීව බන්ධනං ඡෙත්වා විහරාම අනාසවා.

1098. ස්වාගතං වත නො ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

1099. පටිසම්භිදා චතස්සො ච -පෙ- කතං බුද්ධස්ස සාසනං

1100. එවං බහුවිධං දුක්ඛං සම්පත්ති ච බහුබ්බිධා
විසුද්ධභාවං සම්පත්තා ලභාම සබ්බසම්පදා.

1101. යා දදන්ති සකත්තානං පුඤ්ඤඤ් ඤාය මහෙසිනො
සහායසම්පදා හොන්ති නිබ්බානපදමසඞ්ඛතං

1102. පරික්ඛීණං අතීතං ච පච්චුප්පන්නං අනාගතං
සබ්බං කම්මම්පි නො ඛීණං පාදෙ වන්දාම චක්ඛුම.

1103. නිබ්බානාය වජන්තීනං කිං වො වක්ඛාම උත්තරිං
සන්තාසඞ්ඛතදෙසං හි පපොපාථ අමතං පදං.

ඉත්ථං සුදං යසොධරාපමුඛානි අට්ඨාරසභික්ඛුනී-
සහස්සානි භගවතො සම්මුඛා ඉමා ගාථායො අභාසිත්ථාති.

යසොධරාපමුඛඅට්ඨාරසභික්ඛුනිසහස්සාපදානං දසමං.

## කුණ්ඩලකෙසීවග්ගො තතියො.

තස්සුද්දානං :

කුණ්ඩලා ගොතමී චෙව ධම්මදින්නා ච සකුලා
වරනන්දා ච සොණා ච කාපිලානී යසොධරා,
දසසහස්සභික්ඛුනී අට්ඨාරසසහස්සකා
ගාථාසතානි චත්තාරි ඡ ච සත්තති මෙව ච.

1097. අප විසින් ක්ලේශයෝ දවන ලදහ, සියලු භවයෝ නසන ලදහ, බැඳුම් සිඳ ඇතිනියන් මෙන් ආස්‍රව රහිත වැ වාස කරම්හ.

1098. බුද්ධශ්‍රේෂ්ඨයන් සමීපයෙහි අපගේ ස්වාගතය විය, ත්‍රිවිද්‍යාවෝ පසක් කරන ලදහ, බුදුසසුන් කරන ලද.

1099. සිවුපිළිසිඹියාවෝ ද පසක් කරන ලදහ ... බුදුසසුන් කරන ලද.

1100. මෙසේ බහුප්‍රකාර දුක් විඳ බහුප්‍රකාර සම්පත් ලැබ විසුද්ධභාවයට පැමිණියමෝ සියලු සම්පත් ලබම්හ.

1101. යම් ස්ත්‍රී කෙනෙක් ස්වකීය ආත්මභාවය පින් සඳහා මහර්ෂීන්ට පුදත් ද ඔවුනට සභායසම්පත්තීහු වෙති, අසංඛත වූ නිවන ද වේ.

1102. අතීතය ද ප්‍රත්‍යුත්පන්නය ද අනාගතය ද ගෙවී ගියේ යැ, අපගේ සියලු කර්ම ද ක්‍ෂය වී, පසැස් ඇති සර්වඥයෙනි, ඔබගේ පාසඟුළුවන් වඳුම්හ.

1103. නිවනට වදනා වූ තොපට මතුයෙහි කුමක් කියන්-නෙම් ද, යම් හෙයෙකින් සන්හුන් සංඛතදෙස ඇති අමෘතපදයට පැමිණෙ වූ ද එහෙයිනි.

මෙසේ යශෝධරාවන් ප්‍රමුඛ වූ අටළොස්දහසක් භික්‍ෂුණීහු භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි මේ ගාථා ප්‍රකාශ කළාහු යැ.

**දසවැනි යසොධරා ප්‍රමුඛ අටළොස් මෙහෙණදහසුන්ගේ අපදාන යි.**

## තුන්වැනි කුණ්ඩලකෙසී වර්ග යි.

**එහි උද්දානය:**

කුණ්ඩලකෙසි අපදාන යැ, කිසාගොතමී අපදාන යැ, ධම්මදින්නා අපදාන යැ, සකුලාපදාන යැ, ජනපදකල්‍යාණී නන්‍දාපදාන යැ, සොණාපදාන යැ, කාපිලානී අපදාන යැ, යසොධරාපදාන යැ –

දසදහසක් භික්‍ෂුණීන්ගේ අපදාන යැ, අටළොස්දහසක් භික්‍ෂුණීන්ගේ අපදාන යැ යි දසයෙකි. ගාථා සාරසිය සැත්තෑසයෙක් ද වේ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 4-1. යසවතීපමුඛභික්ඛුනීනං අපදානං

1104. භවා සබ්බෙ පරික්ඛීණා භවසන්ධි විමොචිතා
සබ්බාසවා ච නො නත්ථි ආරොචෙම මහාමුනෙ.

1105. පුරිමං කුසලං කම්මං යං කිඤ්චි සාධු පත්ථිතං
පරිභොගමයං දින්නං තුය්හත්ථාය මහාමුනෙ.

1106. බුද්ධපච්චෙකබුද්ධානං බුද්ධානං සාවකාන ච
පරිභොගමියං දින්නං තුය්හත්ථාය මහාමුනෙ.

1107. උච්චනීචමයං කම්මං හිත්වාන සාධු පත්ථිතං
උච්චාකුලපරිකම්මං කතමෙතං මහාමුනෙ.

1108. තෙනෙව සුක්කමූලෙන චොදිතා කම්මසම්පද
මානුසිකමතික්කන්තා ජායිංසු ඛත්තියෙ කුලෙ.

1109. උපපත්තෙ ච කතෙ කම්මෙ ජාතියා වා'පි එකතො
පච්ඡිමෙ එකතො ජාතා ඛත්තියා කුලසම්භවා.

1110. රූපවතී භොගවතී ලාභසක්කාරපූජිතා
අන්තෙපුරෙ මහාවීර දෙවානං විය නන්දනෙ.

1111. නිබ්බින්දිත්වා අගාරම්හා පබ්බජිම්හ'නාගාරියං
කතිපාහං උපාදය සබ්බා පත්තා'ම්හ නිබ්බුතිං.

1112. චීවරං පිණ්ඩපාතං ච පච්චයං සයනාසනං
උපනෙන්ති බහූ අම්හෙ සද සක්කතපූජිතා

1113. කිලෙසා ඣාපිතා අම්හං භවා සබ්බෙ සමූහතා
නාගීව බන්ධනං ඡෙත්වා විහරාම අනාසවා.

1114-1115. ස්වාගතං වත නො ආසි -පෙ-
පටිසම්භිද චතස්සො ච -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං යසවතීපමුඛානි අට්ඨාරසඛත්තියකඤ්ඤා භික්ඛුනීසහස්සානි භගවතො සම්මුඛා ඉමා ගාථායො අභාසිත්ථාති.

යසවතීපමුඛඅට්ඨාරසභික්ඛුනීසහස්සාපදානං පඨමං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## යසවතීපමුඛ භික්ෂුණීන්ගේ අපදානය

1104. මහාමුනිවරය, ඔබට ආරොචනය කරම්හ., අපගේ සියලු භවයෝ ක්ෂය වූහ, භවසන්ධිය මුදනා ලදී, අපගේ සියලු ආස්‍රවයෝ නැති.

1105. මහාමුනිවරය, පූර්වකුශලකම් (ජනිත වූ) මනා කොට පතන ලද යම් කිසි පරිභොගාර්හ (වස්තුවක් ඇද්ද) එය නුඹ-වහන්සේ සඳහා දෙන ලද.

1106. මහාමුනිවරය, නුඹ වහන්සේ සඳහා බුදු පසේබුදුවර-යන්ට ද බුද්ධශ්‍රාවකයන්ට ද පරිභොගාර්හ වස්තු දෙන ලද.

1107. මහාමුනිවරය, භික්ෂූන්ට (පරිත්‍යාගයෙන්) කුඩුමහත් පින්කම් කොට මොනවට පතනලද උච්චාකුල (උපනට නිසි) වනාවත් කරන ලද.

1108. එ මැ කුශලමූලයෙන් මෙහෙයන ලද කර්මසම්පත්තියෙන් මානුෂික (රූපාදිය) ඉක්මවූවාහු නැත් කුලයෙහි උපන්හ.

1109. උපකෙහි ද පින්කම් කරන කල්හි ද ජාතියෙන් ද එක්ව විසූම්හ, පශ්චිම භවයෙහි එක්ව ක්ෂත්‍රිය කුලයෙහි උපනුම්හ.

1110. මහාවීරයන් වහන්ස, රූපවත් ව භොගවත් ව ලාභ-සත්කාරයෙන් පූජිත ව දෙවියන්ගේ නන්දනයෙහි මෙන් අන්තඃ පුරයෙහි විසූම්හ.

1111. ගිහිගෙයින් කලකිරී ශාසනයෙහි පැවිදි වූම්හ, කිහිප දවසක් ඉක්මැයැමෙන් ඇපි සියලුදෙන නිවනට පැමිණියම්හ.

1112. හැම කල්හි අපට සත්කාර පූජා කරන බොහෝ ජනයෝ සිවුරු පිඩුවා ගිලන්පස හා සෙනසුන් ද එළවත්.

1113. අප විසින් ක්ලේශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ, බැඳුම් සිඳ ඇතින්නන් මෙන් ආස්‍රව රහිත ව වාස කරම්හ.

1114. බුද්ධශ්‍රේෂ්ඨයන් සමීපයෙහි අපගේ පැමිණීම ස්වාගත විය ... බුදුසසුන් කරන ලද.

1115. සිවපිළිසිඹියා ලබන ලද ... බුදුසසුන් කරන ලදී.

මෙසේ යසවතී ප්‍රමුඛ අටලොස්දහසක් ක්ෂත්‍රියකන්‍යා භික්ෂුණීහු භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි මෙ ගාථා කීහු.

යසවතී ප්‍රමුඛ අටළොස් මෙහෙණදහසුන්ගේ අපදන යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 4–2 බ්‍රාහ්මණකඤ්ඤාභික්ඛුනීනං අපදානං

1116. චුල්ලාසීතිසහස්සානි බ්‍රහ්මඤ්ඤකුලසම්භවා
සුඛුමාලහත්ථපාද පුරෙ තුය්හං මහාමුනෙ.

1117. වෙස්සසුද්දකුලෙ ජාතා දෙවා නාගා ච කින්නරා
චාතුද්දීපා බහූ කඤ්ඤා පුරෙ තුය්හං මහාමුනෙ.

1118. කෙචි පබ්බජිතා අත්ථි සච්චදස්සාවිනො බහූ
දෙවා ච කින්නරා නාගා බුජ්ඣිස්සන්ති අනාගතෙ.

1119. අනුභොත්වා යසං සබ්බං පත්වාන සබ්බසම්පද
ත්වයි පසාදං පටිලද්ධා බුජ්ඣිස්සන්ති අනාගතෙ.

1120. අම්හෙ බ්‍රාහ්මණධීතා තු බ්‍රහ්මඤ්ඤකුලසම්භවා
පෙක්ඛතො නො මහාවීර පාදෙ වන්දාම චක්ඛුම.

1121. උපහතා භවා සබ්බෙ මූලතණ්හා සමූහතා
සමුච්ඡින්නා අනුසයා පුඤ්ඤසඞ්ඛාරා දලිතා.

1122. සමාධිගොචරා සබ්බා සමාපත්තිවසී තථා
ඣානෙන ධම්මරතියා විහරිස්සාම නො සදා.

1123. භවනෙත්ති අවිජ්ජා ච සඞ්ඛාරා'පි ච ඛෙපිතා
සුදුද්දසං පදං ගන්තුං අනුජානාථ නායක.

1124. උපකාරා මමං තුම්හෙ දීඝරත්තං කතාවිනො
බහුන්නං සංසයං ඡෙත්වා සබ්බා ගච්ඡන්තු[1] නිබ්බුතිං.

1125. වන්දිත්වා මුනිනො පාදෙ කත්වා ඉද්ධිවිකුබ්බණං
කාචි දස්සෙන්ති ආලොකං අන්ධකාරම්පථාපරා.

1126. දස්සෙන්ති චන්දසූරියෙ සාගරං ච සමච්ඡකං
සිනෙරුපරිභණ්ඩං ච දස්සෙන්ති පාරිජත්තකං.

1. ගච්ඡන්ත – PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## බ්‍රාහ්මණකන්‍යා භික්ෂුණීන්ගේ අපදානය

1116. මහාමුනිවරයන් වහන්ස, පෙර නුඹ වහන්සේට (සුළු) අසූදහසක් සියුමැලි අත්පා ඇති බමුණුකුලයෙහි උපන් (කන්‍යාවෝ වූහ.)

1117. මහාමුනිවරයන් වහන්ස, පෙර නුඹ වහන්සේට වෛශ්‍ය ශුද්‍ර කුලයෙහි උපන්නා වූ ද දේව නාග කින්නර වූ ද සිව්මහ දිවයින්හි, වූ බොහෝ කන්‍යාවෝ වූහ.

1118. කිසි කෙනෙක් පැවිදි වූවාහු ඇත, බොහෝ දෙන සිවුසස් දක්නාහුලු වෙති, දෙවියෝ ද කින්නරයෝ ද නාගයෝ ද අනාගතයෙහි සිවුසස් අවබෝධ කරන්නාහ.

1119. සියලු යශස් වළඳා සියලු සම්පතට පැමිණ නුඹ වහන්සේ කෙරෙහි ප්‍රසාදය උපදවා අනාගතයෙහි සත්‍යාවබෝධය කරන්නාහ.

1120. පසැස් ඇති මහාවීරයන් වහන්ස, බමුණු කුලයෙහි උපන් බ්‍රාහ්මණධීතෘ වූ අපි වැලිත් දක්නාවූ නුඹ වහන්සේගේ පාසඟුළුවන් වඳුම්හ.

1121. සියලු භවයෝ නසන ලදහ, තෘෂ්ණාමූලය මුලුසුන් කරන ලද, අනුශයයෝ සිඳින ලදහ, පුණ්‍යසංස්කාරයෝ බිඳින ලදහ.

1122. සියල්ලෝ සමාධි ගෝචර කොට ඇත්තාහ, එසේ මැ සමවත්හි වශී වූහ, හැම කල්හි ඇපි ධ්‍යානය හේතු කොට ධර්මරතියෙන් යුක්ත වැ වාසය කරම්හ.

1123. භවනෙත්ති වූ අවිද්‍යාව ද සංස්කාරයෝ ද ගෙවන ලදහ, නායකයන් වහන්ස, සුදුර්දශ වූ නිර්වාණ පදයට යන්නට අනුදන වදළ මැනැව.

1124. කළ කිස ඇති තෙපි බොහෝ කලක් මට උපකාර වූවහු යැ, බොහෝ දෙනාගේ සැක සිඳපියා සියල්ලෝ නිවනට යෙත්වා.

1125. මුනීන්ද්‍රයන්ගේ පාසඟුළුවන් වැඳ ඍද්ධිවිකුර්වණ කොට කිසි කෙනෙක් ආලෝකය දක්වති, යළි අන්‍යයෝ අන්ධකාරය දක්වත්.

1126. සඳහිරු දක්වති. මසුන් සහිත සයුර ද මහමෙර හා කුලපව් ද පරසතු රුක ද දක්වත්.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1127. තාවතිංසං ච භවනං යාමං දස්සෙන්ති ඉද්ධියා
තුසිතං නිම්මිතෙ දෙවෙ වසවත්ති මහිස්සරෙ.

1128. බ්‍රහ්මානො කාචි දස්සෙන්ති චඞ්කමං ච මහාරහං
බ්‍රහ්මවණ්ණං ච මාපෙත්වා ධම්මං දෙසෙන්ති සුඤ්ඤතං.

1129. නානාවිකුබ්බනං කත්වා ඉද්ධිං දස්සිය සත්ථුනො
දස්සයිංසු බලං සබ්බා පාදෙ වන්දිංසු සත්ථුනො.

1130. ඉද්ධීසු ච වසී හොම දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී හොම මහාමුනෙ.

1131. පුබ්බෙනිවාසං ජානාම දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

1132. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
ඤාණං අම්හං මහාවීර උප්පන්නං තව සන්තිකෙ.

1133. පුබ්බානං ලොකනාථානං සඞ්ගමං නො නිදස්සිතං
අධිකාරා බහූ අම්හං තුය්හත්ථාය මහාමුනෙ.

1134. යං අම්හෙහි කතං කම්මං කුසලං සරතං මුනෙ
තුය්හත්ථාය මහාවීර පුඤ්ඤ'නුපචිතානි නො

1135. සතසහස්සෙ ඉතො කප්පෙ පදුමුත්තරො මහාමුනි
පුරං හංසවතී නාම සම්බුද්ධස්ස කුලාලයං.

1136. ද්වාරෙන හංසවතියා ගඞ්ගා සන්දති සබ්බද
උබ්බාළ්හා නදියා භික්ඛූ ගමනං න ලභන්ති තෙ.

1137. දිවසං ද්වෙ තයො චෙව සත්තාහං මාසකං තතො
චතුමාසම්පි සම්පුණ්ණං ගමනං න ලභන්ති තෙ.

1138. තද අහු සත්තසාරො ජටිලො නාම රට්ඨිකො
ඔරුද්ධෙ භික්ඛවො දිස්වා සෙතුං ගඞ්ගාය කාරයි.

1139. තද සතසහස්සෙන සෙතුං ගඞ්ගාය කාරයි
සඞ්ඝස්ස ඔරිමෙ තීරෙ විහාරං ච අකාරයි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1127. තව්තිසා භවන ද යාමය ද තුසිතය ද නිර්මාණරති දෙවියන් ද මහත් ඉසුරු ඇති වසවර්ති දෙවියන් ද සෘද්ධියෙන් දක්වත්.

1128. කිසි කෙනෙක් බඹුන් දක්වති, මාහැඟි සක්මන ද කෙරෙති, බ්‍රහ්මවේශය ද මවා ශූන්‍යත ධර්මය දේශනා කෙරෙත්.

1129. නානා විකුර්වණ කොට ශාස්තෲන් වහන්සේට සෘද්ධි දක්වා සියල්ලෝ බලය දක් වූහ, ශාස්තෲන් වහන්සේගේ පාසඟුළු-වත් වැන්දහ.

1130. මහාමුනිවරය, සෘද්ධියෙහි ද වශී වම්හ, දිව්‍යශ්‍රොත්‍ර-ධාතුයෙහි ද චෙතොපරියඥානයෙහි ද වශී වම්හ.

1131. පෙර විසූ කඳපිළිවෙළ දනුම්හ, දිව ඇස පිරිසිදු කරන ලද, සියලු ආශ්‍රවයෝ ක්ෂය කරන ලදහ, දැන් පුනර්භව-යෙක් නැති.

1132. මහාවීරයන් වහන්ස, නුඹ වහන්සේ සමීපයෙහි අපට අර්ථධර්මනිරුක්තීන්හි ද ප්‍රතිභානයෙහි ද ඥානය උපන.

1133. මහාමුනිවරය, පූර්වලෝකනාථයන්ගේ සංගමය අපට දක්වන ලදු, නුඹ වහන්සේ සඳහා අපගේ බොහෝ අධිකාරයෝ වූහ.

1134. මුනිවරය, යම් කුශලකර්මයක් කරන ලද ද, එය සිහි කළ මැනැව, මහාවීරයන් වහන්ස, නුඹ වහන්සේ සඳහා අප විසින් පින් රැස්කරන ලද.

1135. මෙයින් සියදහස්වන කල්පයෙහි පියුමතුරා නම් මහා මුනිහු වූහ, ඒ සම්බුදුන්ට කුලභවන වූ නුවර හංසවතී නම් විය.

1136. හංසවතී නගරද්වාරයෙන් හැම කල්හි ගංගානදිය ගලයි, නදියෙන් බාධිත වූ ඒ භික්ෂූහු (පරතෙර) ගමන නො ලබත්.

1137. ඒ භික්ෂූහු දවසක් දෙකක් තුනක් ද සතියක් මාසයක් ද යළි සපුරා සාරමසක් ද (පරතෙර) ගමන නො ලබත්.

1138. එකල්හි සත්ත්වසාර වූ බෝසත් ජටිල නම් රැටියෙක් විය, හේ ඇවිරුණු භික්ෂූන් දැක ගඞ්ගායෙහි සෙතුවක් කැරැවී.

1139. එකල්හි සියදහසකින් ගඞ්ගායෙහි සෙතුවක් කැරැවී සඞ්ඝයාට (ගහින්) මෙතෙර විහාරයක් ද කැරැවී.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1140. ඉත්ථියො පුරිසා චෙව උච්චනීචකුලානි ච
තස්ස සෙතුවිහාරෙ ච[1] සම්භාගං අකංසු තෙ.

1141. අම්භෙ අඤ්ඤෙ ච මනුජා විප්පසන්නෙන චෙතසා
තස්ස කම්මෙසු දයාද නගරෙ ජනපදෙසු ච.

1142. ඉත්ථී පුරිසා කුමාරා ච බහූ චෙව කුමාරිකා
සෙතුතො ච විහාරස්ස වාලුකා ආකිරිංසු තෙ.

1143. වීථිසම්මජ්ජනං කත්වා කදලී පුණ්ණඝටෙ ධජෙ[2]
ධූපං චුණ්ණං ච[3] මාලං ච කාරං කත්වාන සජ්ජුතො.

1144. සෙතුවිහාරෙ කාරෙත්වා නිමන්තෙත්වා විනායකං
මහාදානං දදිත්වාන සම්බොධිං අභිපත්ථයී.

1145. පදුමුත්තරො මහාවීරො තාරකො සබ්බපාණිනං
අනුමොදනියං'කාසි ජටිලස්ස මහාමුනි.

1146. "සතසහස්සෙ අතික්කන්තෙ කප්පො හෙස්සති භද්දකො
භවාභවෙ'නුභොත්වාන පාපුණිස්සති බොධියං.

1147. යෙ කෙචි හත්ථපරිකම්මං කතාවී නරනාරියො
අනාගතස්මිං අද්ධානෙ සබ්බා හෙස්සන්ති සම්මුඛා.

1148. තෙන කම්මවිපාකෙන චෙතනාපණිධීහි ච
උප්පන්නා දෙවභවනං තුය්හං තා පරිචාරිකා.

1149. දිබ්බං සුඛං අසඞ්ඛෙය්‍යං මානුසං ච අසඞ්ඛියං
අනුභොන්ති චිරං කාලං සංසරිම්හ භවාභවෙ.

1150. සතසහස්සෙ ඉතො කප්පෙ සුකතං කම්මසම්පදං
සුඛුමාලී මනුස්සෙසු අථො දෙවපුරෙ වරෙ.

1151. රූපභොගයසෙ චෙව අථො කිත්තිං ච සක්කතං
ලභාම සතතං සබ්බං සුකතං කම්මසම්පදං.

1152. පච්ඡිමෙ භවෙ සම්පත්තෙ ජාතාම්හ බ්‍රාහ්මණෙ කුලෙ
සුඛුමාලහත්ථපාද සක්‍යපුත්තනිවෙසනෙ.

1. තෙසු සෙතුවිහාරෙසු - සිමු.
2. පුණ්ණඝටුද්ධජා - PTS.
පුණ්ණඝටා ධජා - මජසං.
3. ධූමචුණ්ණඤ්ච - PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1140. ස්ත්‍රීහු ද පුරුෂයෝ ද උස්පහත් කුලවැසියෝ ද යන ඔහු ඒ ගෙහයෙහි ද විහාරයෙහි ද සම කොටස් කළහ.

1141. ඇපිදූ නගරයෙහි ද ජනපදයෙහි ද වූ අන් මිනිස්සු ද පහන් සිතින් යුක්ත වැ ඔහුගේ කුශලකර්‍මයන්හි හිමිකරු වූමහ.

1142. බොහෝ ස්ත්‍රීපුරුෂයෝ ද කුමරු කුමරියෝ ද යන ඔහු ගෙහයට ද විහාරයට ද වැලි විසුළහ.

1143. වීදි හැමදූ රඹගස් පුන්කලස් හා ධජ ද සුවඳ දුම් හා සුණු ද මල්මාලා ද (යන මෙයින්) ශාස්තෘන් වහන්සේට සත්කාර කොට—

1144. ගෙහය හා විහාරය කරවා විනායක වූ බුදුරදුන් පවරා මහදන් දී සම්බොධිය ප්‍රාර්‍ථනා කෙළේ යි.

1145. මහාවීර වූ, සියලු ප්‍රාණීන් (සසරින්) තරණය කරවන පියුමතුරා මහාමුනිහු ජටිල රටියාට අනුමෙවෙනි කළහ.

1146. කප් සියදහසක් ඉක්මැගිය කල්හි භද්‍රකල්පයෙක් වන්නේ යැ, කුදුමහත් භවයෙහි සුවදුක් විඳ සම්බෝධියට පැමිණෙන්නේ යැ.

1147. යම්කිසි ස්ත්‍රී පුරුෂ කෙනෙක් එහි අත්කම් කළාහු ද, ඔහු සියල්ලෝ අනාගත කාලයෙහි (ඒ බුදුන්ට) හමු වන්නාහ.

1148. ඒ කර්‍මවිපාකයෙන් ද චිත්තප්‍රණිධියෙන් ද ඒ (අපි) දෙව්ලොවට පැමිණියමෝ තුඹ වහන්සේට පිරිවර වූමහ.

1149. අසංඛ්‍ය වූ දිව සුව ද අසංඛ්‍ය වූ මිනිස් සුව ද විඳි-මින් බොහෝ කලක් කුදුමහත් භවයෙහි සැරිසැරුම්හ.

1150. මෙයින් සියදහස්වන කපෙහි මොනොවට කළ යම් කර්‍මසම්පත්තියෙක් වී ද එයින් මිනිසුන් කෙරෙහි ද යළි උතුම් දෙව්ලොව ද සියුමැලි වැ උපනුම්හ.

1151. සුකෘත වූ යම් කර්‍මසම්පත්තියක් ඇද්ද එයින් රූප භොග යශස් ද යළි කීර්තිය ද සත්කාර ද යන සියල්ල නිරතුරු ලබම්හ.

1152. පශ්චිම භවය පැමිණි කල්හි බමුණුකුලෙහි උපනුම්හ, සියුමැලි අත්පා ඇතියමෝ ශාක්‍යපුත්‍රයන්ගේ මාළිගායෙහි විසූම්හ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1153. සබ්බකාලම්පි පථවිං න පස්සාම'නලඞ්කතං
චික්ඛල්ලභූමිමසුචිං න පස්සාම මහාමුනෙ.

1154. අගාරං වසතො අම්හෙ සක්කාරං සබ්බකාලිකං
උපනෙන්ති සදා සබ්බං පුබ්බකම්මබලෙන නො.

1155. අගාරං පජහිත්වාන පබ්බජිත්වා'නගාරියං
සංසාරපථනිත්තිණ්ණා වීතරාගා භවාමසෙ.

1156. චීවරං පිණ්ඩපාතං ච පච්චයං සයනාසනං
උපනෙන්ති සදා අම්හෙ සහස්සානි තතො තතො.

1157. කිලෙසා ඣාපිතා'ම්හාකං භවා සබ්බෙ සමූහතා
නාගීව බන්ධනං ඡෙත්වා විහරාම අනාසවා.

1158. ස්වාගතං වත නො ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

1159. පටිසම්භිද ... කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං චතුරාසීතිබ්‍රාහ්මණකඤ්ඤාදිභික්ඛුනීසහස්සානි භගවතො සම්මුඛා ඉමා ගාථායො අභාසිත්ථාති.

**චතුරාසීතිභික්ඛුනීසහස්සාපදානං දුතියං.**

## 4-3 උප්පලදායිකාපදානං

1160. නගරෙ අරුණවතියා අරුණො නාම ඛත්තියො
තස්ස රඤ්ඤො අහං භරියා එකජ්ඣං චාරයාමහං.

1161. රහොගතා නිසීදිත්වා එවං චින්තෙස'හං තදා
ආදාය ගමනීයං හි කුසලං නත්ථි මෙ කතං.

1162. මහාභිතාපං කටුකං ඝොරරූපං සුදාරුණං
නිරයං නූන ගච්ඡාමි එත්ථ මෙ නත්ථි සංසයො.

1163. එවාහං චින්තයිත්වාන පහංසෙත්වාන මානසං
රාජානං උපගන්ත්වාන ඉදං වචනමබ්‍රවිං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1153. මහාමුනිවරය, සියලු කල්හි මැ නො සැරැසූ පොළොවක් නො දකුම්හ, නො පිරිසුදු මඩඩිමක් නො දකුම්හ.

1154. ගිහිගෙයි වසන අපට සාර්වකාලික සත්කාරය විය, පූර්ව කර්මබලයෙන් අපට හැම කල්හි සියල්ල එළවත්.

1155. ගිහිගෙය හැරපියා ශාසනයට වැද සසරමහ තරණය කළමෝ වීතරාග වූම්හ.

1156. හැම කල්හි අපට ඒ ඒ තැනින් දහස්ගණන් සිවුරු පිඩුවා ගිලන්පස හා සෙනසුන් එළවත්.

1157. අප විසින් කෙලෙස්හු දවන ලදහ, සියලු භවයෝ නසන ලදහ, බැඳුම් සිඳ ඇතින්නන් සෙයින් ආස්‍රව රහිත වැ වාස කරම්හ.

1158. බුද්ධශ්‍රේෂ්ඨයන්ගේ සමීපයෙහි ඒකාන්තයෙන් අපගේ ස්වාගතය විය, ත්‍රිවිද්‍යා ලබන ලද, බුදුසසුන් කරන ලද.

1159. සිවුපිළිසිඹියා ලබන ලද ... බුදුසසුන් කරන ලදී.

මෙසේ සුවාසූදහසක් බමුණු කන්‍යා මෙහෙණහු භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි මෙ ගාථා කීවාහු යැ.

දෙවැනි සුවාසූ මෙහෙණදහසුන්ගේ අපදන යි.

## 4-3 උප්පලදායිකාපදනය

1160. අරුණවතී නගරයෙහි අරුණ නම් රජෙක් විය, එ රජුට භාර්‍යා වූ මම එක් තැනැ සිත් අලවා වෙසෙමි.

1161. එකල්හි මම රහොගත වැ හිඳ මෙසේ සිතීමි; යම් හෙයෙකින් මා විසින් කළ ගෙනයායුතු කුශලයක් නැද්ද, එහෙයින් –

1162. මහත් තැවුලි ඇති කටුක වූ කැකුළු පියවි ඇති ඉතා දරුණු වූ නිරයට ඒකාන්තයෙන් යෙමි, මෙහි ලා මට සැකයෙක් නැති.

1163. මම මෙසේ සිතා සිත පහදවාගෙන රජු සමීපයට ගොස් මෙවදන් කීමි:



* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1164. "ඉත්ථී නාම මයං දෙව පුරිසානුගතා සදා
එකං මෙ සමණං දෙහි භොජයිස්සාමි ඛත්තිය."

1165. අදාසි මෙ තදා රාජා සමණං භාවිතින්ද්‍රියං
තස්ස පත්තං ගහෙත්වාන පරමන්නෙන පූරයිං.

1166. පූරෙත්වා පරමං අන්නං සහස්සග්ඝනකෙනහං[1]
මහාචෙලෙන ඡාදෙත්වා අදාසිං තුට්ඨමානසා.

1167. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

1168. සහස්සං දෙවරාජූනං[2] මහෙසිත්තමකාරයිං
සහස්සං චක්කවත්තීනං මහෙසිත්තමකාරයිං.

1169. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං
නානාවිධං බහුං අඤ්ඤං තස්ස කම්මඵලං තතො.

1170. උප්පලස්සෙව මෙ වණ්ණො අභිරූපා සුදස්සනා
ඉත්ථී සබ්බඞ්ගසම්පන්නා අභිජාතා ජුතින්ධරා.

1171. පච්ඡිමභවෙ සම්පත්තෙ අජායිං සාකියෙ කුලෙ
නාරීසහස්සපාමොක්ඛා සුද්ධොදනසුතස්සහං.

1172. නික්ඛමිත්වා අගාරෙහං පබ්බජිං අනගාරියං
සත්තමිං රත්තිම්පත්වා චතුසච්චමපාපුණිං.

1173. චීවරං පිණ්ඩපාතං ච පච්චයං සයනාසනං
පරිමෙතුං න සක්කොමි පිණ්ඩපාතස්සිදං ඵලං.

1174. යං මය්හං පුරිමං කම්මං කුසලං සරසෙ මුනි
තුය්හත්ථාය මහාවීර පරිච්චත්තං බහුං මයා.

1175. එකතිංසෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා
දුග්ගතිං නාභිජානාමි පිණ්ඩපාතස්සිදං ඵලං.

1176. ද්වෙ ගතියො පජානාමි දෙවත්තං අථ මානුසං
අඤ්ඤං ගතිං න ජානාමි පිණ්ඩපාතස්සිදං ඵලං.

1177. උච්චෙ කුලෙ පජායාමි මහාසාලෙ මහද්ධනෙ
අඤ්ඤෙ කුලෙ න ජානාමි පිණ්ඩපාතස්සිදං ඵලං.

1. සහග්ඝනධෙලපත්තං — සීමු.
2. සහස්සදෙවරාජූනං — සීමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1164. "දේවයන් වහන්ස, ඇපි ස්ත්‍රීහු නම හැම කල්හි පුරුෂයන් අනුව ගියම්හ, ක්ෂත්‍රියය, මට එක් මහණකු දුන මැනැවැ, වළඳවින්නෙමි'' යි.

1165. එකල්හි රජ, වැඩූ ශ්‍රද්ධාදි ඉඳුරන් ඇති මහණකු මට දින, ඔබගේ පාත්‍රය ගෙන උතුම් අහරින් පිරවීමි.

1166. උතුම් අහර පුරවා මම දහසක් අගනා මහත් වස්ත්‍රයකින් වසා සතුටු සිත් ඇති වැ දිනිමි.

1167. මොනවට කළ ඒ පින්කම්න් ද චිත්තප්‍රණිධියෙන් ද මම මිනිස්කය හැරපියා තවුතිසා දෙව්ලොවට ගියෙමි.

1168. දහසක් දෙව්රජුන්ට මෙමෙහෙසිබව කළමු, දහසක් සක්විත්තනට මෙහෙසිබව කළමු.

1169. මහත් වූ ප්‍රදේශ රාජ්‍යය ගණනින් අසංඛ්‍ය වෙයි, ඒ කුශලයාගේ එයින් අන්‍ය වූ නන්වැදෑරුම් බොහෝ කම්ඵලය විය.

1170. මාගේ පැහැය උපුලකට බඳු වෙයි, අභිරූප වූ දකුම් කලු වූ සර්වාඞ්ග සම්පන්න අභිජාත වූ සෝභාවත් ස්ත්‍රියක් වෙමි.

1171. පැසුළු භවය පැමිණි කල්හි ශාක්‍යකුලයෙහි උපන්මු, මම ශුද්ධොදන පුත්‍රයාගේ ස්ත්‍රීන් දහසකට පාමොක් වූමු.

1172. මම ගිහිගෙයි කලකිරී ශාසනයෙහි පැවිදි වූමු, සත්වැනි රාත්‍රියට නො පැමිණ චතුස්සත්‍යාවබොධයට පැමිණියමු.

1173. සිවුරු පිඩුවා ගිලන්පස හා සෙනසුන් ද පමණ කරන්නට නො හැකි වෙමි, මේ පිණ්ඩපාතයාගේ අනුසසි.

1174. මුනිවරයන් වහන්ස, මාගේ යම් පූර්වකුශලකර්මයක් සිහි කරන්නහු ද මහාවීරයන් වහන්ස, නුඹ වහන්සේ සඳහා මා විසින් බොහෝ දෑ පරිත්‍යාග කරන ලද.

1175. මෙයින් එක්තිස්වැනි කපැ එකල යම් දනක් දුනුමු ද, එයින් දුගතිය නො දනිමි, පිණ්ඩපාතයාගේ මේ විපාක යි.

1176. දෙව්බව ද යළි මිනිස්බව ද යන දෙගතිය දනිමි, අන් ගතියක් නො දනිමි, මේ පිණ්ඩපාතයාගේ විපාක යි.

1177. මහාසාර වූ මහද්ධන ඇති උදිච්චකුලයෙහි උපදිමි, අන් කුලයක් නො දනිමි, පිණ්ඩපාතයාගේ මේ විපාක යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1178. භවාභවෙ සංසරිත්වා සුක්කමූලෙන චොදිතා
අමනාපං න පස්සාමි සොමනස්සකතං ඵලං.[1]

1179. ඉද්ධීසු ච වසී හොමි දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී හොමි මහාමුනි.

1180. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවා පරික්ඛීණා නත්ථි'දානි පුනබ්භවො.

1181. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
ඤාණං මම මහාවීර උප්පන්නං තව සන්තිකෙ.

1182-1184. කිලෙසා ඣාපිතා මය්හං ... කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං උප්පලදායිකා භික්ඛුනී භගවතො සම්මුඛා ඉමා ගාථායො අභාසිත්ථාති.

උප්පලදායිකාථෙරියාපදානං තතියං.

## 4-4 සිගාලමාතාපදානං

1185. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මාන පාරගූ
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

1186. තදහං හංසවතියං ජාතාමච්චකුලෙ අහුං
නානාරතනපජ්ජොතෙ ඉද්ධෙ ඵීතෙ මහද්ධනෙ.

1187. පිතුනා සහ ගන්ත්වාන මහාජනපුරක්ඛතා
ධම්මං බුද්ධස්ස සුත්වාන පබ්බජිං අනගාරියං.

1188. පබ්බජිත්වාන කායෙන පාපකම්මං විවජ්ජයිං
වචීදුච්චරිතං හිත්වා ආජීවං පරිසොධයිං.

1189. බුද්ධෙ පසන්නා ධම්මෙ ච සඞ්ඝෙ ච තිබ්බගාරවා
සද්ධම්මසවනෙ යුත්තා බුද්ධදස්සනලාලසා.

1190. අග්ගං සද්ධාධිමුත්තානං අසෙසාසිං භික්ඛුනිං තදා
තං ඨානං පත්ථයිත්වාන තිස්සො සික්ඛා අපූරයිං,
තතො මං සුගතො ආහ කරුණානුගතාසයො.

1. සොමනස්සකතංඵලං - සීමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1178. කුදුමහත් භවයෙහි සැරිසරා කුශලමූලයෙන් මෙහෙයන ලදු වැ අමනාප දැයක් නො දක්මි, සොම්නස් සහගියබැවිහි මෙ විපාක යි.

1179. සෘද්ධියෙහි ද දිව්‍යශෝත්‍රයෙහි ද වශී වෙමි, මහාමුනිවරය, චේතොපරියඥාණයෙහි වශී වෙමි.

1180. පෙර විසූ කඳපිළිවෙළ දනිමි, දිව ඇස පිරිසිදු කරන ලද සියලු ආස්‍රවයෝ ක්‍ෂය කරන ලදහ, දැන් පුනර්භවයෙක් නැති.

1181. මහාවීරයන් වහන්ස, නුඹ වහන්සේ සමීපයෙහි අර්‍ථ ධර්ම නිරුත්තීන්හි ද එසේ ම ප්‍රතිභානයෙහි ද මාගේ ඥාණය උපන.

1182–, 1184. මා විසින් කෙලෙස් දවන ලදහ ... බුදුසසුන් කරන ලද.

මෙසේ උපලදයිකා මෙහෙණ භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි මෙ ගාථා පැවසූ යැ යි.

තුන්වැනි උප්පලදයිකා මෙහෙණියගේ අපදන යි.

## 4–4 සිගාලමාතාපදනය

1185. මෙයින් සියදහස්වන කපෙහි ලෝකනායක වූ සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය පියුමතුරා නම් ජිතපඤ්චමාරයෝ පහළ වූහ.

1186. එකල්හි මම හංසවතියෙහි නන්රුවනින් බබළන සමෘද්ධ වූ ආඪ්‍ය වූ මහත් ධන ඇති ඇමැතිකුලයෙක උපන්මි.

1187. මහාජනයා විසින් පෙරටු කරන ලදු වැ පියා සමග ගොස් බුදුරදුන්ගේ දහම් අසා ශාසනයට පැමිණියෙමි.

1188. පැවිදි වැ කයින් පවකම් දුරු කළමි, වාක් දුසිරිත හැරපියා ආජීවය පිරිසුදු කළමි.

1189. බුදුන් කෙරෙහි පහන් වූවා දහම්හි ද සඟුන් කෙරෙහි ද දැඩි ගෞරව ඇති වැ බණ ඇසීමෙහි යෙදුණි, බුදුන් දැකීමෙහි ලොල් වූමි,

1190. එකල්හි සද්ධාධිමුක්ත වූවන් කෙරෙහි අග්‍ර වූ මෙහෙණක ඇසූමි, ඒ තනතුර පතා ත්‍රිවිධ ශික්‍ෂාවන් පිරූමි, ඉක්බිති කරුණා-යෙන් යුත් සිත් ඇති සුගතයන් වහන්සේ මට මෙ වදළහ.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1191. "යස්ස සද්ධා තථාගතෙ අචලා සුප්පතිට්ඨිතා
සීලං ච යස්ස කල්‍යාණං අරියකන්තං පසංසිතං.

1192. සඞ්ඝෙ පසාදෙ යස්සත්ථි උජුභූතං ච දස්සනං
අදළිද්දොති තං ආහු අමොඝං තස්ස ජීවිතං.

1193. තස්මා සද්ධං ච සීලං ච පසාදං ධම්මදස්සනං
අනුයුඤ්ජෙථ මෙධාවී සරං බුද්ධානසාසනං"

1194. තං සුත්වා'හං පමුදිතා අපුච්ඡිං පණිධිං මම
තද අනොමො අමිතො ව්‍යාකරිත්ථ විනායකො.

1195. බුද්ධෙ පසන්නා කල්‍යාණි ලච්ඡසෙ තං සුපත්ථිතං
සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

1196. තස්ස ධම්මෙසු දායාද ඔරසා ධම්මනිම්මිතා
සිගාලකස්ස මාතා ති හෙස්සති සත්ථු සාවිකා.

1197. තං සුත්වා මුදිතා හුත්වා යාවජීවං තද ජිනං
මෙත්තචිත්තා පරිචරිං පටිපත්තිහි නායකං.

1198. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

1199. පච්ඡිමෙ ච භවෙ'දානි ගිරිබ්බජපුරුත්තමෙ
ජාතා සෙට්ඨිකුලෙ ඵීතෙ මහාරතනසඤ්චයෙ.

1200. පුත්තො සිගාලකො නාම මමාසි විපථෙ රතො
දිට්ඨිගහනපක්ඛන්නො[1] දිසාපූජනතප්පරො.

1201. නානාදිසා නමස්සන්තං පිණ්ඩාය නගරං වජං
තං දිස්වා ඔවදී බුද්ධො මග්ගෙ ඨත්වා විනායකො.

1202. තස්ස දෙසයතො ධම්මං නිනාදො විම්හයො අහු
දෙවකොටිනරනාරීනං ධම්මා'භිසමයො අහු.

1203. තදහං[3] පරිසං ගන්ත්වා සුත්වා සුගතභාසිතං
සොතාපත්තිඵලං පත්තා පබ්බජිං අනගාරියං.

---

1. දිට්ඨිගහනපක්ඛන්තො – සීමු.
2. පසාදෙ – සීමු.
3. තදාහං – PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1191. "තථාගතයන් කෙරෙහි යමක්හුගේ ශ්‍රද්ධා නො සැලී පිහිටියා ද, යමක්හට (මාර්ගඵලසම්ප්‍රයුක්ත හෙයින්) ආයර්‍යකාන්ත වූ පසස්නා ලද කල්‍යාණ ශීලය ඇද්ද,

1192. යමක්හට සඞ්ඝයා කෙරෙහි ප්‍රසාදය ඇද්ද, ධර්මදර්ශනය සෘජු වූයේත් වේ ද, ඔහු නො දිළින්දෙකැ යි කියති, ඔහුගේ ජීවිතය නො සිස් වේ.

1193. එහෙයින් නුවණැතියේ බුදුන්ගේ අනුසසුන් සිහි කෙරෙමින් ශ්‍රද්ධාව ද ශීලය ද ප්‍රසාදය ද ධර්මදර්ශනය ද යන මෙහි යෙදෙන්නේ'' යයි.

1194. ඒ අසා මම සතුටුව මාගේ ප්‍රණිධිය (ගෙන) පුළුවුස්මු, එකල්හි අමිත ගුණ ඇති අනොම නම් විනායකයන් වහන්සේ මෙ ප්‍රකාශ කළහ.

1195. කල්‍යාණිය, (තෝ) බුදුන් කෙරෙහි පහන් වූවා තෙල පතන ලද්ද ලබන්නාව, මෙයින් ලක්ෂයක් වන කල්පයෙහි ඔක්කාක කුලයෙහි උපන් නමින් 'ගොතම' නම් වූ ශාස්තෘන් වහන්සේ ලොවැ පහළ වන්නාහ.

1196. ඔබගේ දහම්හි දයාද ඇති ඖරස වූ ධර්‍ම නිර්මිත වූ 'සිගාලමාතු' යන නම් ඇති ශාස්තෘශ්‍රාවිකාවක් වන්නී ය.

1197. ඒ අසා සතුටු වැ එකල්හි යාවජ්ජීවයෙන් මෙත් සිත් ඇති වැ ජින වූ ලෝකනායකයන් වහන්සේට පිළිවෙතින් පරිචරියා කළමු.

1198. මනා කොට කරන ලද ඒ පින්කමින් ද සිත පිහිටු-වීමෙන් ද මම මිනිස්කය හැරපියා තව්තිසා දෙව්ලොවට ගියමු.

1199. යළි දුන් පශ්චිම භවයෙහි ගිරිව්‍රජ (රජගහ) පුරවර-යෙහි මහත් රත්නසඤ්චය ඇති සමෘද්ධ වූ සිටුකුලයෙහි උපන්මු.

1200. මට විරුද්ධ මාර්ගයෙහි ඇලුණු දෘෂ්ටිගහනයට පිවිසි දිශාවන් පිදීමෙහි, තත්පර වූ, 'සිගාලක' නම් පිතෙක් වී.

1201. පිඬු සිඟා නුවරට වඩනා විනායක වූ බුදුහු නානා-දිශාවන් නමස්කාර කරන ඔහු දුක මාර්ගයෙහි සිට –

1202. ඔහුට දහම් දෙසන බුදුරදුන්ගේ නිනාදය විස්මය දනවනු විය, දෙකෙළක් ස්ත්‍රී පුරුෂයනට ධර්‍මාවබොධය වී.

1203. එකල්හි මම පිරිස කරා ගොස් සුගතයන්ගේ භාෂිතය අසා සොවත් ඵලයට පැමිණියා ශාසනයට පැමිණියමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1204. න චිරෙනෙව කාලෙන බුද්ධදස්සනලාලසා
අනුස්සතිං තං භාවෙත්වා අරහත්තං අපාපුණිං.

1205. දස්සනත්ථාය බුද්ධස්ස සබ්බදා වජාමහං
අතිත්තායෙව පස්සාමි රූපං නයනනන්දනං.

1206. සබ්බපාරමිසම්භූතං ලක්ඛීනිලයනං වරං
රූපං සබ්බසුභාකිණ්ණං අතිත්තා විහරාමහං.

1207. ජිනො තස්මිං ගුණෙ තුට්ඨො එතදග්ගෙ ඨපෙසි මං
''සිගාලකස්ස යා මාතා අග්ගා සද්ධාධිමුත්තිකා.''

1208. ඉද්ධීසු ච වසී හොමි දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී හොමි මහාමුනි.

1209. පුබ්බෙ නිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

1210. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
ඤාණං මම මහාවීර උප්පන්නං තව සන්තිකෙ.

1211-1213. කිලෙසා ඣාපිතා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං සිගාලමාතා භික්ඛුනී භගවතො සම්මුඛා ඉමා ගාථායො අභාසිත්ථාති.

සිගාලමාතාථෙරියාපදානං චතුත්ථං.

## 4-5 සුක්කාපදානං

1214. එකනවුතෙ ඉතො කප්පෙ විපස්සී නාම නායකො
උප්පජ්ජි චාරුනයනො[1] සබ්බධම්මවිපස්සකො.

1215. තදාහං බන්ධුමතියං ජාතා අඤ්ඤතරෙ කුලෙ
ධම්මං සුත්වාන මුනිනො පබ්බජිං අනගාරියං.

1216. බහුස්සුතා ධම්මධරා පටිභානවතී තථා
විචිත්තකථිකා චාපි ජිනසාසනකාරිකා.

1. චාරුදස්සනො – මජසං,

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1204. නොබෝ කලකින් ම බුදුන් දැකීමෙහි ලොල් වූ මම ඒ බුද්ධානුස්මෘතිය වඩා රහත්බවට පැමිණියෙමු.

1205. බුදුන් දැකීම පිණිස මම හැම දින මැ යමි, නයන නන්දන වූ බුද්ධරූපය තෘප්ති රහිත ව මැ දක්මි.

1206. සියලු පාරමීබලයෙන් හටගත් ලක්ෂ්මී නිවාස වූ සියලු ශුභ ලක්ෂණයෙන් ගැවැසීගත් උත්තම රූපය මම අතෘප්ත වැ (බලමින්) වෙසෙමි.

1207. ඒ ගුණයෙහි සතුටු වූ ජිත වූ බුදුහු 'සිගාලක' ගේ මාතෘ වූ මෙහෙණ අග්‍ර වූ ශ්‍රද්ධාධිමුක්ති ඇත්තී යයි මා එතද-ග්‍රයෙහි තැබූහ.

1208. මහාමුනීන්ද්‍රයන් වහන්ස, ඍද්ධි විෂයෙහි ද දිව්‍යශ්‍රොත්‍ර ධාතුයෙහි ද වශී වෙමි, පරසිත් දන්නා නුවණෙහි ද වශී වෙමි.

1209. පූර්වනිවාස දනිමි, දිවඇස පිරිසිදු කරන ලද සියලු ආස්‍රවයෝ ක්‍ෂය වූහ, දැන් පුනර්භවයෙක් නැති,

1210. මහාවීරයන් වහන්ස, ඔබවහන්සේ සමීපයෙහි අර්ථ ධම්ම නිරුත්තීන්හි ද එසේ මැ පටිභානයෙහි ද මාගේ ඥානය උපන.

1211-1213. මා විසින් ක්ලේශයෝ දවන ලදහු ... බුදුන්ගේ අනුසසුන් කරන ලද.

මෙසෙයින් සිගාලමාතා මෙහෙණ මේ ගාථා කීවූ යැ.

සතරවැනි සිගාලමාතෘ ස්ථවිරාපදාන යි.

## 4-5 සුකකාපදානය

1214. මෙයින් එක්අනුවන කපෙහි මනහර ඇස් ඇති සර්ව-ධර්මයන් දක්නා වූ විපස්සි නම් ලෝකනායකයන් වහන්සේ පහළ වූ සේක.

1215. එකල්හි මම බන්ධුමතී නුවර එක්තරා කුලයෙක්හි උපන්මු, මුනීන්ද්‍රයන්ගේ දහම් අසා ශාසනයෙහි පැවිදි වූමු.

1216. බහුශ්‍රැත වූ ධර්මධර වූ එසේම ම වැටහෙන නුවණැති බුදුසසුන් පිළිපදනා විචිත්‍ර ධර්මකථිකාවක් ද වූමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1217. තද ධම්මකථං සුත්වා ජනකාය හිතං බහුං
තතො චුතා'හං තුසිතං උපපන්නා යසස්සිනී.

1218. එකතිංසෙ ඉතො කප්පෙ සිඛී විය සිඛී ජිනො
තපන්තො යසසා ලොකෙ උප්පජ්ජි වදතං වරො.

1219. තදපි පබ්බජිත්වාන බුද්ධසාසනකොවිදා
ජොතෙත්වා ජිනවාක්‍යානි තතොපි තිදිවං ගතා.

1220. එකතිංසෙ ඉතො කප්පෙ වෙස්සභූ නාම නායකො
උප්පජ්ජිත්ථ මහාඤාණී තදපි ච තථෙවහං.

1221. පබ්බජිත්වා ධම්මධරා ජොතයිං ජිනසාසනං
ගන්ත්වා මරුපුරං රම්මං අනුභොසිං මහාසුඛං.

1222. ඉමම්හි භද්දකෙ කප්පෙ කකුසන්ධො ජිනුත්තමො
උප්පජ්ජි නරසද්දූලො[1] තදපි ච තථෙවහං.

1223. පබ්බජිත්වා මුනිමතං ජොතයිත්වා යථායුකං
තතො චුතා'හං තිදිවං අගං සභවනං යථා.

1224. ඉමස්මිං යෙව කප්පම්හි කොණාගමන නායකො
උප්පජ්ජි ලොකසරණො සබ්බසත්තානමුත්තමො.

1225. තදපි පබ්බජිත්වාන සාසනෙ තස්ස තාදිනො
බහුස්සුතා ධම්මධරා ජොතයිං ජිනසාසනං.

1226. ඉමස්මිංයෙව කප්පම්හි කස්සපො පුරිසුත්තමො
උප්පජ්ජි ලොකනයනො අරණො මරණන්තගූ.[2]

1227. තස්සාපි නරවීරස්ස පබ්බජිත්වාන සාසනෙ
පරියාපුතසද්ධම්මා පරිපුච්ඡාවිසාරදා.

1228. සුසීලා ලජ්ජිනී චෙව තීසු සික්ඛාසු කොවිදා
බහුං ධම්මකථං කත්වා යාවජීවං හිතාවහං[3].

1229. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

1. වරසද්දූලො - PTS.
2. අරණො අමතංගතො - සිමු.
3. මහාමුනෙ - සිමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1217. එකල ජනතාවට හිත වූ බොහෝ ධම්කථා කොට මම එයින් සැවැ යශස් ඇති වැ තුසිත දෙව්ලොවැ උපන්මු.

1218. මෙයින් එක්තිස්වන කපැ ගිනිසිළක් මෙන් දිලියෙන යශසින් යුත් දේශකයන් අතුරෙන් උතුම් වූ සිඛී නම් ජිනපඤඤ-මාරයන් වහන්සේ ලොවැ උපන්හ.

1219. එකල්හි ද පැවිදි වැ බුදුසසුන්හි නිපුණ වැ බුදුවදන් බහුළවා එයිනුදු සැවැ දෙව්ලො වැ උපන්මු.

1220. මෙයින් එක්තිස්වන කපැ මහත් ඥාන ඇති වෙස්සභූ නම් නායකයන් වහන්සේ උපන්හ, එකල්හි ද මම එසෙයින් මැ –

1221. පැවිදි වැ ධම්ධර වූවා බුදුසසුන හෙබැවීමි, (ඉනුදු සැවැ) සිත්කලු දෙව්ලොවට ගොස් මහත් සුව වින්දමු.

1222. මේ භද්‍රකල්පයෙහි නරශාර්දූල වූ කකුසන්ධ නම් ජිනොත්තමයන් වහන්සේ උපන්හ. එකල්හිදු මා එසෙයින් මැ –

1223. පැවිදි ව, ආයු පමණින් සිට බුද්ධමතය බහුළවා එයින් ච්‍යුත වූ මම සිය භවනයට මෙන් දෙව්ලොවට ගියමු.

1224. මේ කල්පයෙහි මැ ලොවට සරණ වූ සියලු සත්නට උතුම් වූ කොණාගමන නම් නායකයන් වහන්සේ උපන්හ.

1225. එකල්හි ද ඒ තාදී බුදුරදුන්ගේ සසුන්හි පැවිදි වැ බහුශ්‍රැත ව, ධර්මධර ව, බුදුසසුන බැබළවීමි.

1226. මේ කල්පයෙහි මැ කෙලෙස් රණ රහිත වූ මරණාන්ත-යට (නිවනට) පැමිණි ලෝකනායක වූ කාශ්‍යප නම් පුරුෂොත්තමයන් වහන්සේ උපන්හ.

1227. ඒ නරවීරයන්ගේ ද සසුන්හි පැවිදි වැ පුහුණු කළ සදහම් ඇති ව පරිපෘච්ඡායෙහි විශාරද වූවා –

1228. සුසිල ද ලජ්ජා ඇත්තී ද වී ත්‍රිවිධ ශික්ෂායෙහි නිපුණ වී යාවජ්ජීවයෙන් හිත එළවන බොහෝ ධර්මකථා කොට –

1229. මනා කොට කළ ඒ කර්මයෙන් ද චේතනා පිහිටු-වීමෙන් ද මම මිනිස්කය හැරපියා තවුතිසා දෙව්ලොවට ගියමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1230. පච්ඡිමෙ ච භවෙ'දානි ගිරිබ්බජපුරුත්තමෙ
ජාතා සෙට්ඨිකුලෙ ඵීතෙ මහාරතනසඤ්චයෙ.

1231. යදා භික්ඛුසහස්සෙන පරිතො ලොකනායකො
උපාගමි රාජගහං සහස්සක්ඛෙන වණ්ණිතො.

1232. "දන්තො දන්තෙහි සහ පුරාණජටිලෙහි විප්පමුත්තො විප්පමුත්තෙහි
සිඞ්ගීනික්ඛසවණ්ණො රාජගහං පාවිසි භගවා."

1233. දිස්වා බුද්ධානුභාවං තං සුත්වා ච ගුණසඤ්චයං
බුද්ධෙ චිත්තං පසාදෙත්වා පූජයිං තං යථාබලං.

1234. අපරෙන ච කාලෙන ධම්මදින්නාය සන්තිකෙ
අගාරා නික්ඛමිත්වාන පබ්බජිං අනගාරියං.

1235. කෙසෙසු ඡිජ්ජමානෙසු කිලෙසෙ ඣාපයිං අහං
උග්ගහිං සාසනං සබ්බං පබ්බජිත්වා 'චිරෙනහං.

1236. තතො ධම්මමදෙසෙසිං මහාජනසමාගමෙ
ධම්මෙ දෙසියමානම්හි ධම්මාභිසමයො අහු.

1237. නෙකපාණසහස්සානං තං විදිත්වා'තිවිම්හිතො
අභිප්පසන්නො මෙ යක්ඛො භමිත්වාන ගිරිබ්බජං.

1238. "කිං'මෙ කතා රාජගහෙ මනුස්සා මධු පීතාව අච්ඡරෙ
යෙ සුක්කං න උපාසන්ති දෙසෙන්තිං අමතං පදං.

1239. තඤ්ච අප්පටිවානීයං අසෙචනකමොජවං
පිවන්ති මඤ්ඤෙ සප්පඤ්ඤා වලාහකමිවද්ධගූ."

1240. ඉද්ධියා ච වසී හොමි දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී හොමි මහාමුනෙ.

1241. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවා පරික්ඛීණා නත්ථි'දානි පුනබ්භවො.

1242. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
ඤාණං මම මහාවීර උප්පන්නං තව සන්තිකෙ.

1243-1245. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- කතං
බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං සුක්කා භික්ඛුනී භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසිත්ථාති.

සුක්කාථෙරියාපදානං පඤ්චමං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1230. දුන් පශ්චිම භවයෙහි ගිරිව්‍රජ (රජගහ) පුරවරයෙහි සමෘද්ධ වූ මහත් රත්න සඤ්චය ඇති සිටුකුලයෙහි ජාත වූවා –

1231. යම් කලෙක භික්ෂූදහසුන් විසින් පිරිවරන ලද ලෝකනායකයන් වහන්සේ සහසැස්හු විසින් පසස්නා ලද්දහු රජගහ නුවරට වැඩිසේක් ද (කිසෙ යැ යත්:)

1232. රන්නිකක් සම වර්ණ ඇති භාග්‍යවතුන් වහන්සේ (තමන්) දමුණු 'සේක් (තමන්) විප්‍රමුක්ත සේක් (කෙලෙසුන් කෙරෙන්) වෙසෙසින් මිදුණු පුරාණ ජටිල වූ දහසක් රහතුන් සමග රජගහ නුවරට පිවිසි සේකැ යි.

1233. ඒ බුද්ධානුභාවය ද දැක ගුණ සමූහය ද අසා බුදුන් කෙරෙහි සිත පහදවා ශක්ති පරිදි උන්වහන්සේ පිදීමි.

1234. යළි පසුකලෙක ගිහිගෙන් නික්මැ ධම්මදින්නා මෙහෙණ සමීපයෙහි අනගාරිය සාසනයෙහි පැවිදි වීමි.

1235. මම කෙස් සිඳිනු ලබත් මැ කෙලෙසුන් දැවීමි, පැවිදි වැ නොබෝ කලෙකින් මම සියලු ශාසනය ඉගෙනගත්මි.

1236–1237. ඉක්බිති මහජන සමාගමයෙහි දහම් දෙසීමි, (මා) දහම් දෙසන කල්හි නොයෙක් දහස්ගණන් සත්ත්වයන්ට ධර්මාවබෝධය වී, ඒ දුන අතිශයින් විස්මයට පැමිණි මාගේ (දහමට) පැහැදුණු යක්ෂයෙක් රජගහනුවර හැසිරැ –

1238. "යම් කෙනෙක් අමෘතපදය දේශනා කරන සුක්කා මෙහෙණන් ඇසුරු නො කෙරෙත් ද, මේ රජගහනුවර මිනිස්සු කුමක් කළාහු සුරා පානය කළවුන් සෙයින් සිටිත් දැ" යි.

1239. බැහැර නො ලියැයුතු පියවින් මිහිරි වූ ඕජාවත් ඒ ධර්මය ද මැගියෝ වලාහකයක් මෙන් නුවණැත්තාහු පානය කෙරෙති සිතමි.

1240. මහාමුනිවරය, සෘද්ධියෙහි ද දිව්‍යශ්‍රෝත්‍රධාතුයෙහි ද වශී වෙමි, පරසිත් දන්නා නුවණෙහි ද වශී වෙමි.

1241. පෙර විසූ කඳපිළිවෙළ දනිමි, දිව ඇස පිරිසිදු කරන ලද, සියලු ආසුවයෝ ක්‍ෂය වූහ, දැන් පුනර්භවයෙක් නැති.

1242. මහාවීරයන් වහන්ස, නුඹ වහන්සේ සමීපයෙහි අර්ථ ධර්ම නිරුක්තීන්හි ද එසේ මැ පටිභානයෙහි ද මාගේ නුවණ උපන.

1243–1245. ක්ලේශයෝ දවන ලදහ ... බුදුසසුන් කරන ලදි. මෙසේ සුක්කා මෙහෙණ මේ ගාථා ප්‍රකාශ කළා යි.

පස්වැනි සුක්කා ථෙරාපදන යි.

පස්වැනි බණවරයි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 4-6. රූපනන්දාපදානං.

1246. එකනවුතෙ ඉතො කප්පෙ විපස්සී නාම නායකො
උප්පජ්ජි චාරුනයනො සබ්බධම්මෙසු චක්ඛුමා.

1247. තදා'හං බන්ධුමතියං ඉද්ධෙ ඵීතෙ මහාකුලෙ
ජාතා සුරූපා දයිතා පූජනීයා ජනස්ස ච.

1248. උපගන්ත්වා මහාවීරං විපස්සිං ලොකනායකං
ධම්මං සුණිත්වා සරණං උපෙසිං නරනායකං.

1249. සීලෙසු සංවුතා හුත්වා නිබ්බුතෙ ච නරුත්තමෙ
ධාතුථූපස්ස උපරි සොණ්ණච්ඡත්තං අපූජයිං.

1250. මුත්තචාගා සීලවතී යාවජීවං තතො චුතා
ජහිත්වා මානුසං දෙහං තාවතිංසූපගා අහං.

1251. තදා දසහි ඨානෙහි අධිභොත්වාන සෙසකෙ
රූපසද්දෙහි ගන්ධෙහි රසෙහි ඵුසනෙහි ච.

1252. ආයුනා'පි ච වණ්ණෙන සුඛෙන යසසාපි ච
තථෙවාධිපතෙය්‍යෙන අධිගය්හ විරොචහං.

1253. පච්ඡිමෙ ච භවෙ'දානි ජාතාහං කපිලව්හයෙ
ධීතා ඛෙමකසක්කස්ස නන්දානාමා'ති විස්සුතා.

1254. අභිරූපං උපපදං අහු මෙ කඤ්ඤිසුවකං
යදා'හං යොබ්බනප්පත්තා රූපලාවඤ්ඤභූසිතා.

1255. තදා මමත්ථං[1] සක්‍යානං විවාදෙ සුමහා අහු
පබ්බාජෙසි තතො තාතො මා සක්‍යා විනස්සිසුං'ති.[2]

1256. පබ්බජිත්වා තථාගතං[3] රූපදෙස්සිං නරුත්තමං
සුත්වාන නොපගච්ඡාමි මම රූපෙන ගබ්බිතා.

1257. ඔවාදම්පි න ගච්ඡාමි බුද්ධදස්සනභීරුකා
තදා ජිනො උපායෙන උපනෙත්වා සසන්තිකං.

1258. තිස්සො'ත්ථියො නිදස්සෙසි ඉද්ධියා මග්ගකොවිදො
අච්ඡරාරූපසදිසං තරුණිං ජරිතං මතං.

---

1. ඉදං මමත්ථෙ – මජසං, PTS.
2. විනස්සුං ඉති – මජසං, සී, PTS.
3. තථා චාහං – PTS.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 6. රූපනන්දපදානය

1246. මෙයින් එක්අනූවන කපෙහි මනහර ඇස් ඇති සියලු දහම් විසයෙහි නුවණැස් ඇති විපස්සී නම් නායකයන් වහන්සේ පහළ වූ සේක.

1247. එකල මම බන්ධුමතී නුවර සමෘද්ධ වූ ධනධාන්‍යයෙන් පිරුණු මහාකුලයෙහි උපන්නී මනා රූ ඇති මහජනයාට ප්‍රිය ද පූජනීය ද වූමු.

1248. මහාවීර වූ විපස්සී ලෝකනායකයන් වහන්සේ කරා එළඹැ බණ අසා නරනායක වූ බුදුන් සරණ ගියමු.

1249. සීලයෙන් සංවර වැ යළි බුදුන් පිරිනිවි කල්හි ධාතු ස්තූපය මතුයෙහි රන්සතක් පිදූමු.

1250. මුදන ලද ත්‍යාග ඇති ව යාවජීවයෙන් සිල්වත් වැ එයින් සැවැ මම මිනිස්කය හැරපියා තවතිසාවට පැමිණියමු.

1251–1252. එකල්හි මම රූපයෙන් ශබ්දයෙන් ගන්ධයෙන් රසයෙන් හා ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද – ආයුෂයෙන් ද වර්ණයෙන් සුඛයෙන් යශසින් ද එසේ මැ ආධිපත්‍යයෙන් ද යන දසකරුණෙන් සෙසු දෙවියන් යටපත් කොට අභිභවා බැබැළීමි.

1253. දැන් මම පශ්චිම භවයෙහි කිඹුල්වත් නුවර උපන්මු. ඛෙමක ශාක්‍ය රජුගේ දියණි වූ අතිශයින් ප්‍රසිද්ධ නන්ද නම් වූමු.

1254. කාන්තිය සූචනය කරන "අභිරූප" යන උපපදය මට විය, යම් කලෙක මම රූප ලාවණ්‍යයෙන් අලඞ්කාර වූ යොවුන් වියට පැමිණියම් ද –

1255. එකල මා සඳහා ශාක්‍යයන්ගේ ඉතා මහත් විවාදයෙක් විය, ඉක්බිති පියරජ තෙමේ ශාක්‍යයෝ නහමක් වැනසෙත්ව' යි මා පැවිදි කැරැවී.

1256. පැවිදි වැ නරෝත්තම වූ තථාගතයන් රූපයට ද්වේෂ වූහ යි අසා මාගේ රූපයෙන් ගර්විත වැ බුදුන් වෙත නො යමි.

1257. බුදුන් දක්මෙහි බියපත් වූවා අවවාදයට ද නො යමි, එකල බුදුහු උපායෙකින් තමන් වහන්සේ සමීපයට (මා) පමුණුවා –

1258. මාර්ගයෙහි නිපුණ වූ බුදුහු අප්සරා රූපයක් බඳු වූ තරුණියක ද ජරාවට පැමිණියක ද මළ එකක ද යන තුන් ස්ත්‍රී කෙනකුන් සෘද්ධියෙන් දක්වූ සේක.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1259. කායො දිස්වා සුසංවිග්ගා විරත්තා සෙ කලෙබරෙ
අට්ඨාසිං භවනිබ්බින්නා තදා මං ආහ නායකො

1260. "ආතුරං අසුචිං පූතිං පස්ස නන්දෙ සමුස්සයං
උග්ඝරන්තං පග්ඝරන්තං බාලානං අභිනන්දිතං.

1261. අසුභාය චිත්තං භාවෙහි එකග්ගං සුසමාහිතං
යථා ඉදං තථා එතං යථා එතං තථා ඉදං.

1262. එවමෙතං අවෙක්ඛන්තී රත්තින්දිවමතන්දිතා
තතො සකාය පඤ්ඤාය අභිනිබ්බිජ්ජ වච්ඡසි."

1263. තස්සා මෙ අප්පමත්තාය විහරන්තියා'ධ යොනිසො
යථාභූතං අයං කායො දිට්ඨො සන්තරබාහිරො.

1264. අථ නිබ්බින්ද'හං කායෙ අජ්ඣත්තං ච විරජ්ජ'හං
අප්පමත්තා විසංයුත්තා උපසන්තා'ම්හි නිබ්බුතා.

1265. ඉද්ධීසු ච වසී හොමි දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී හොමි මහාමුනෙ.

1266. පුබ්බෙ නිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

1267. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
ඤාණං මම මහාවීර උප්පන්නං තව සන්තිකෙ.

1268-1270. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- කතං
බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං රූපනන්දා භික්ඛුනී භගවතො සන්තිකෙ ඉමා ගාථායො අභාසිත්ථාති.

රූපනන්දාථෙරියාපදානං ඡට්ඨං.

## 4 - 7 අඩ්ඪකාසී අපදානං

1271. ඉමම්හි භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධු මහායසො
කස්සපො නාම නාමෙන උප්පජ්ජි වදතං වරො.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1259. ඔවුන් දැක අතිශයින් සංවේගයට පැමිණියා සිය සිරුරෙහි විරක්ත වැ භවයෙහි කලකිරී සිටියමු, එකල්හි මට නායකයන් වහන්සේ මේ වදළහ:

1260. "නන්දවෙනි, (රොගයෙන්) ආතුර වූ අපවිත්‍ර වූ කුණු වූ සෙම් සොටු නැගෙන මල මූ වැගිරෙන, බාලයන් විසින් අභිනන්දනය කළ ශරීරය බලව.

1261. අරමුණෙහි එකඟ වූ මොනොවට සමාහිත වූ සිත අසුභය නිමිති කොට වඩව, මේ කය යම්සේ ද තෙල කයත් එබඳු යැ, තෙල අසුභය යම්සේ ද මේ කයත් එබඳු යැ.

1262. ඊ දහවලැ නො මැලී වැ තෙල අසුභය මෙසේ බලමින් යළි ස්වකීය ප්‍රඥයෙන් නිර්වෙදයට පැමිණ වාසය කරන්නාව.

1263. මෙහි නො පමාව නුවණින් යුක්ත වැ වාසය කරන ඒ මා විසින් සාන්තර බාහිර වූ මේ කය තතුසේ දක්නා ලද්දේ ය.

1264. ඉක්බිති මම කයෙහි කලකිරීම්, මම අධ්‍යාත්මයෙහි ද නො ඇලුණිමි. අප්‍රමාද වැ සංයොග රහිත වූවා උපශාන්ත වැ (කෙලෙස් පිරිනිවනින්) පිරිනිවියා වෙමි.

1265. මහාමුනිවරය, මම සෘද්ධි විෂයෙහි ද දිව්‍යශ්‍රොත්‍රධාතුයෙහි ද වශී වෙමි. පරසිත් දන්නා නුවණෙහි ද වශී වෙමි.

1266. පෙර විසූ කඳපිළිවෙළ දනිමි, දිව ඇස පිරිසිදු කරන ලද, සියලු ආසුවයෝ ක්‍ෂය වූහ, දැන් පුනර්භවයෙක් නැති.

1267. මහාවීරයන් වහන්ස, නුඹ වහන්සේ සමීපයෙහි අත්‍ථ ධම්ම - නිරුත්තීන්හි ද එසේ මැ පටිභානයෙහි ද මාගේ ඥනය උපන.

1268-1270. ක්ලේශයෝ දවන ලදහ... බුදුසසුන් කරන ලදී. මෙසේ රූපනන්ද මෙහෙණ මේ ගාථාවන් කිවු යැ.

සවැනි රූපනන්ද ස්ථවිරාවදන යි.

## 7. අඩ්ඪකාසි අපදනය

1271. මේ භද්‍රකල්පයෙහි බ්‍රහ්මබන්ධු වූ මහා යශස් ඇති වාදීන් කෙරෙහි උතුම් වූ නමින් කස්සප නම් වූ බුදුරජාණන් වහන්සේ උපන්සේක.



* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1272. තදහං පබ්බජිත්වාන තස්ස බුද්ධස්ස සාසනෙ
සංවුතා පාතිමොක්ඛස්මිං ඉන්ද්‍රියෙසු ච පඤ්චසු.

1273. මත්තඤ්ඤූනී ච අසනෙ යුත්තා ජාගරියෙපි ච
වසන්තී යුත්තයොගා'හං භික්ඛුනිං විගතාසවං.

1274. අක්කොසිං දුට්ඨචිත්තාහං "ගණිකෙ"ති ච භණිං තදා
තෙන පාපෙන කම්මෙන නිරයම්හි අපච්චිසං.

1275. තෙනෙව කම්මසෙසෙන අජායිං ගණිකාකුලෙ
බහුසොව පරාධීනා පච්ඡිමාය ච ජාතියං.

1276. කාසිසු සෙට්ඨිකුලජා බ්‍රහ්මචරියඵලෙනහං
අච්ඡරා විය දෙවෙසු අහොසිං රූපසම්පද.

1277. දිස්වාන දස්සනීයං මං ගිරිබ්බජපුරුත්තමෙ
ගණිකත්තෙ නිවෙසෙසුං අක්කොසනඵලෙන මෙ.

1278. සා'හං සුත්වාන සද්ධම්මං බුද්ධසෙට්ඨස්ස දෙසිතං
පුබ්බවාසෙසම්පන්නා පබ්බජිං අනගාරියං.

1279. තතොපසම්පදත්ථාය ගච්ඡන්තී ජිනසන්තිකං
මග්ගෙ ධුත්තෙ ඨිතෙ සුත්වා ලභිං දූතොපසම්පදං.

1280. සබ්බං කම්මං පරික්ඛීණං පුඤ්ඤං පාපං තථෙව ච
සබ්බසංසාරමුත්තිණ්ණා ගණිකත්තං ච ඛෙපිතං.

1281. ඉද්ධීසු ච වසී හොමි දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී හොමි මහාමුනෙ.

1282. පුබ්බෙ නිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

1283. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
ඤාණං මම මහාවීර උප්පන්නං තව සන්තිකෙ.

1284-1286. කිලෙසා ඣාපිතා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං අඩ්ඪකාසී භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

අඩ්ඪකාසිථෙරියාපදානං සත්තමං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1272. එකල්හි මම ඒ බුදුන්ගේ ශාසනයෙහි පැවිදි වැ ප්‍රාති-මෝක්‍ෂයෙහි ද පඤ්චෙන්ද්‍රියයන්හි ද සංවෘත වැ –

1273–74. භෝජනයෙහි පමණ දන්නී නිදිවැරීමෙහි ද යෙදුණී, යෝගයෙහි යෙදී වාස කරන මම රහත් මෙහෙණකට ආක්‍රොශ කළමු. එකල මම දුෂ්ට සිත් ඇති වැ "ගණිකාවකැ" යි කීමි. ඒ පව් කැමින් නිරයෙහි පැසිණිමි.

1275. එ මැ කර්මාවශේෂයෙන් බෙහෙවින් මැ පරාධීන වැ ගණිකා කුලයෙහි උපන්මු. යළි පශ්චිම ජාතියෙහි –

1276. බඹසර ඵලයෙන් මම කාසිජනපදයෙහි සිටුකුලයෙකැ ඉපිද රූ සපුයෙන් දෙව්ලොවැ අප්සරාවක මෙන් වීමු.

1277. දර්ශනීය වූ මා දැක මාගේ ආක්‍රොශඵලය හේතු කොටගෙන රජගහ පුරවරයෙහි ගණිකා බැවිහි තබාපූහ.

1278. ඒ මම බුද්ධශ්‍රේෂ්ඨයන් විසින් දෙසනලද සදහම් අසා පූර්වවාසනායෙන් සමන්විත වැ ශාසනයෙහි පැවිදි වීමු.

1279. ඉක්බිති උපසම්පද වීම සඳහා බුදුන් සමීපයට යන්නී මඟැ ධූර්තයන් සිටියවුන් අසා දූතොපසම්පදව ලදීමු.

1280. සියලු කර්ම ද එසේ මැ පින්පව් ද ක්‍ෂය විය, සියලු සසර තරණය කළමු. ගණිකාබව ද ක්‍ෂය කරනලද.

1281. මහාමුනිවරය, ඍද්ධීන්හි ද දිවසෝධායෙහි ද වශී වෙමි, චෙතොපරියඥාණයාගේ ද වශී වෙමි.

1282. පෙර විසූ කඳපිළිවෙළ දනිමි, දිව ඇස පිරිසිදු කරනලද, සර්වාස්‍රවයෝ පරික්ෂීණයහ, දන් පුනර්භවයෙක් නැති.

1283. මහාවීරයන් වහන්ස, තුඹවහන්සේ සමීපයෙහි අත්ථ – ධම්ම – නිරුත්තීන්හි ද එසේ මැ පටිභානයෙහි ද මාගේ නුවණ උපන.

1284–1286. කෙලෙස්හු දවන ලදහ... බුදුසසුන කරන ලදී.

මෙසේ අඩ්ඪකාසී මෙහෙණ මෙ ගාථා කිවූ යැ.

**සත්වැනි අඩ්ඪකාසි ථෙරිඅපදාන යි.**

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 4-8 පුණ්ණාපදානං

1287. විපස්සිනො භගවතො සිඛිනො වෙස්සභුස්ස ච
කකුසන්ධස්ස මුනිනො කොණාගමනතාදිනො.

1288. කස්සපස්ස ච බුද්ධස්ස පබ්බජිත්වාන සාසනෙ
භික්ඛුනී සීලසම්පන්නා නිපකා සංවුතින්ද්‍රියා.

1289. බහුස්සුතා ධම්මධරා ධම්මත්ථපරිපුච්ඡිකා
උග්ගහෙතා ච ධම්මානං සොතා පයිරුපාසිකා.

1290. දෙසෙන්තී ජනමජ්ඣෙ'හං අහොසිං ජිනසාසනෙ
බාහුසච්චෙන තෙනා'හං පෙසලා අතිමඤ්ඤිසං.

1291. පච්ඡිමෙ ච භවෙ'දානි සාවත්ථියං පුරුත්තමෙ
අනාථපිණ්ඩිනො ගෙහෙ ජාතා'හං කුම්භදාසියා.

1292. ගතා උදකහාරිකං සොත්ථියං දිජමද්දසං
සීතට්ටං තොයමජ්ඣම්හි තං දිස්වා ඉදමබ්‍රවිං.

1293. උදහාරී අහං සීතෙ සදා උදකමොතරිං
අය්‍යානං දණ්ඩභයභීතා වාචාදොසභයට්ටිතා.

1294. කස්ස බ්‍රාහ්මණ ත්වං භීතො සදා උදකමොතරි
වෙධමානෙහි ගත්තෙහි සීතං වෙදයසෙ භුසං.

1295. ජානන්තී වත මං හොති පුණ්ණිකෙ පරිපුච්ඡසි
කරොන්තං කුසලං කම්මං රුන්ධන්තං කතපාපකං.

1296. යො ච වුඩ්ඪො දහරො වා පාපකම්මං පකුබ්බති
දකාභිසිඤ්චනා හොති පාපකම්මා පමුච්චති.

1297. උත්තරන්තස්ස අක්ඛාසිං ධම්මත්ථසංහිතං පදං
තං ච සුත්වා ස සංවිග්ගො පබ්බජිත්වා'රහා අහු.

1298. පූරෙන්තී ඌනකසතං ජාතා දාසිකුලෙ යතො
තතො 'පුණ්ණා'ති නාමං මෙ භුජිස්සං මං අකංසු'තෙ.

1299. සෙට්ඨිං තතොනුමොදෙත්වා පබ්බජිං අනගාරියං
න චිරෙනෙව කාලෙන අරහත්තං අපාපුණිං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

## 8. පුණ්ණාපදානය

1287. විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ ද, සිඛී - වෙස්සභූ - කකුසන්ධ යන මුනිවරයන්ගේ ද, කොණාගමන තාදීන් වහන්සේගේ ද-

1288. කස්සප බුදුරදුන්ගේ ද ශාසනයෙහි පැවිදි වැ සිල්සපන් නුවණැති සන්හුන් ඉඳුරන් ඇති මෙහෙණක් වැ -

1289. බහුශ්‍රුත වූ ධර්මධර වූ ධර්මාජීව පුළුවුස්නා වූ (මම) දහම් උගන්නී ද අසන්නී ද (ගුරුන්) ඇසුරුකරන්නී ද වීමි.

1290. ජනයා මැද දහම් දෙසන මම බුදුසසුන්හි (ප්‍රකට) වීමි, ඒ බහුශ්‍රුත භාවය හේතු කොටගෙන මම ප්‍රියසීල මෙහෙණන් ඉක්මවා සිතීමි.

1291. යළි දන් පශ්චිම භවයෙහි සැවැත් පුරයෙහි මම අනේපිඬු සිටුහුගේ ගෙයි කළදැස්සක කුස උපන්මු.

1292. දිය ගෙන එමට ගියා දියමැද සීතලෙන් වෙවුළන සොත්‍ථිය බමුණකු දිටිමි. ඔහු දක මෙය කීමි:

1293. හැම කලැ සීතයෙහි දිය ගෙන යන මම හිමියන්ගේ අඬුවම් බියෙන් බිය පත්වැ වාක් දෙෂ භයින් පීඩිත වැ ජලයට බස්මු.

1294. බමුණ, තෙපි කවරකුට බියපත් වැ හැම කල්හි වෙවුළන ගාත්‍රයෙන් යුක්ත වැ දියට බසිහු ද, අතිශයින් සීත විඳිනවු යැ.

1295. භවතිය පුණ්ණාවෙනි, කුශලකර්මයක් කරන කළ පව් වළහාලන මා එකාන්තයෙන් දනා දනා ම පුළුවුස්වී.

1296. භවතිය, මහලු වූ හෝ තරුණ වූ හෝ යමෙක් පව් කම් කෙරේ නම් උදකාභිෂේචනයෙන් පාපකර්මයෙන් මිදේ යයි.

1297. දියෙන් නැඟීසිටිනහුට ධර්මාර්ථයෙන් යුක්ත වූ වදනක් කීමි, එ ද අසා සංවෙගයට පත් හේ පැවිදි වැ රහත් වී.

1298. එකකින් ඌන වූ සියය පුරමින් යම් හෙයෙකින් දස් කුලෙහි උපන්මු ද, එහෙයින් "පුණ්ණා" යයි මාගේ නම වීය, ඔව්හු මා නිදස් කළහ.

1299. ඉක්බිති සිටාණන්ට අනුමෝදනා කොට ශාසනයෙහි පැවිදි වීමි, නොබෝ කලෙකින් මැ රහත්බවට පැමිණියමු.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1300. ඉද්ධීසු ච වසී හොමි දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී හොමි මහාමුනෙ.

1301. පුබ්බෙ නිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

1302. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
ඤාණං මෙ විමලං සුද්ධං බුද්ධසෙට්ඨස්ස වාහසා.

1303. භාවනාය මහාපඤ්ඤ සුතෙන ච සුතාවිනී
මානෙන නීචකුලජා න හි කම්මං විනස්සති.

1304–1306. කිලෙසා ඣාපිතා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං පුණ්ණා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

පුණ්ණාථෙරියාපදානං අට්ඨමං.

## 4-9. අම්බපාලී අපදානං

1307. යො රංසිඵුසිතාවෙලො ඵුස්සො නාම මහාමුනි
තස්සා'හං භගිනී ආසිං අජායිං ඛත්තියෙ කුලෙ.

1308. තස්ස ධම්මං සුණිත්වා'හං විප්පසන්නෙන චෙතසා
මහාදානං දදිත්වාන පත්ථයිං රූපසම්පදං.

1309. එකතිංසෙ ඉතො කප්පෙ සිඛී ලොකග්ගනායකො
උප්පජ්ජි ලොකපජ්ජොතො තිලොකසරණො ජිනො.

1310. තද'රුණපුරෙ රම්මෙ බ්‍රහ්මඤ්ඤකුලසම්භවා
විමුත්තචිත්තං කුපිතා භික්ඛුනිං අභිසාපයිං.

1311. “වෙසිකාව අනාචාරා ජිනසාසනදූසිකා”
එවං අක්කොසයිත්වාන තෙන පාපෙන කම්මුනා

1312. දරුණං නිරයං ගන්ත්වා මහාදුක්ඛසමප්පිතා
තතො චුතා මනුස්සෙසු උපපන්නා තපස්සිනී.

1313. දසජාතිසහස්සානි ගණිකත්තමකාරයිං
තම්හා පාපා න මුච්චිස්සං භුත්වා දුට්ඨවිසං යථා.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1300. මහාමුනිවරය, සෘද්ධීන්හි ද දිබ්බසොතධාතුයෙහි වසී වෙමි, චෙතොපරියඤාණයාගේ ද වසී වෙමි.

1301. පූර්වනිවාස දනිමි, දිව ඇස ශුද්ධ කරන ලද, සර්වාශ්‍රවයෝ පරික්ෂීණයහ, දැන් පුනර්භවයෙක් නැති.

1302. බුද්ධශ්‍රේෂ්ඨයන්ගේ අනුභසින් අර්ථ ධර්ම නිරුක්තීන්හි ද එසේ මැ ප්‍රතිභානයෙහි ද මාගේ ඥානය නිර්මල විය, පරිශුද්ධ වී.

1303. භාවනායෙන් මහාප්‍රඥා ඇතිවීමි, ශ්‍රැතය හේතු කොට ගෙන ශ්‍රැතාවිනී වමි, මානයෙන් නීචකුලයෙහි උපන්මු, එසේ මැය, කර්මය නො නැසෙන්නේ යි.

1304–1306. ක්ලේශයෝ දවන ලදහු .. ... බුදුසසුන් කරන ලදී.

මෙසේ පුණ්ණා මෙහෙණ මේ ගාථා කිවු යැ.

අටවැනි පුණ්ණා ස්ථවිරාවදන යි.

## 4–9. අම්බපාලී අපදානය

1307. රස් පහස් ලද රැළි ඇති යම් ඵුස්ස නම් මහාමුනි කෙනෙක් වූවාහු ද, මම ඔබට බුහුන වීමු. කැත්කුලෙහි උපන්මු.

1308. ඒ බුදුන්ගේ දහම් අසා වෙසෙසින් පහන් සිතින් යුක්ත වැ මහදන් දී රූප සම්පත් ප්‍රාර්ථනා කළමු.

1309. මොබින් එක්තිස්වන කපෙහි ලෝකාග්‍රනායක වූ ලොවට ප්‍රදීප වූ තුන්ලොවට සරණ වූ සිඛී නම් ජිනපඤ්චමාරයන් වහන්සේ පහළවූ සේක.

1310. එකල රම්‍ය වූ අරුණ පුරයෙහි බමුණු කුලයෙහි උපන්මු, කිපුණු සිත් ඇති වැ රහත් මෙහෙණකට ශාප කළමු.

1311. "වෛශ්‍යාවක මෙන් අනාචාර ඇති වැ බුදුසසුන දූෂණය කරන්නී" යයි මෙසේ ආක්‍රොශ කොට ඒ පව් කැමින් –

1312. දරුණු වූ නිරයට ගොස් මහත් වූ දුකින් මඩනා ලදුමු, එයින් සැවැ මිනිස් ලොවැ බැගැපත් වැ උපන්මු.

1313. දසදහසක් ජාතියෙහි ගණිකාබව කළමු, දුෂ්ට වූ විෂයක් වළඳා මෙන් ඒ පාපයෙන් නො මිදිණිමි,

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1314. බ්‍රහ්මචරියමසෙවිස්සං කස්සප ජින සාසනෙ
තෙන කම්මවිපාකෙන අජායිං තිදසෙ පුරෙ.

1315. පච්ඡිමභවෙ සම්පත්තෙ අහොසිං ඔපපතිකා
අම්බසාඛන්තරෙ ජාතා අම්බපාලීති තෙන හං.

1316. පරිවුතා පාණකොටීහි පබ්බජිං ජිනසාසනෙ
පත්තාහං අචලං ඨානං ධීතා බුද්ධස්ස ඔරසා.

1317. ඉද්ධීසු ච වසී හොමි සොතධාතුවිසුද්ධියා
චෙතොපරියඤාණස්ස වසී හොමි මහාමුනෙ.

1318. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

1319. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
ඤාණං මෙ විමලං සුද්ධං බුද්ධසෙට්ඨස්ස වාහසා.

1320-1322. කිලෙසා ඣාපිතා -පෙ- කතං බුද්ධස්ස සාසනං

ඉත්ථං සුදං අම්බපාලී භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

අම්බපාලීථෙරියාපදානං නවමං.

## 4-10. පෙසලාපදානං

1323. ඉමම්හි භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධුමහායසො
කස්සපො නාම නාමෙන උප්පජ්ජි වදතං වරො.

1324. සාවත්ථියං පුරවරෙ උපාසකකුලෙ අහං
පසූතා තං ජිනවරං දිස්වා සුත්වා ච දෙසනං.

1325. තං වීරං සරණං ගන්ත්වා සීලානි ච සමාදියිං
කදාචි සො මහාවීරො මහාජනසමාගමෙ.

1326. අත්තනො අභිසම්බොධිං පකාසෙසි නරාසභො
"අනනුස්සුතෙසු ධම්මෙසු පුබ්බෙ දුක්ඛාදිකෙසු ච.

1327. චක්ඛු ඤාණං ච පඤ්ඤා ච විජ්ජාලොකො ච ආසි මෙ"
තං සුත්වා උග්ගහෙත්වාන පරිපුච්ඡිං ච භික්ඛවො.

1328. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

1329. පච්ඡිමෙ ච භවෙ'දානි ජාතා සෙට්ඨිමහාකුලෙ
උපෙච්ච බුද්ධං සද්ධම්මං සුත්වා සච්චූපසංහිතං.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1314. කසුප් බුදුන්ගේ ශාසනයෙහි බඹසර විසීමි, ඒ කර්ම විපාකයෙන් දෙව්ලොවැ උපන්මු.

1315. පශ්චිම භවය පැමිණි කල්හි ඖපපාතිකා වීමි, අඹ අතු අතරැ උපන්නී එයින් මම 'අඹපාලී' නම් වීමු.

1316. ප්‍රාණකොටීන් විසින් පිරිවරන ලදු වැ බුදුසසුන්හි පැවිදි වීමි, අචල වූ (නිර්වාණ) ස්ථානයට පැමිණියා බුදුරඳුන්ට ඖරස වූ දියණියක් වීමු.

1317. දිව්‍යශ්‍රොත්‍රධාතු විශුද්ධියෙන් යුක්ත වැ ඍද්ධීන්හි ද වසී වෙමි, මහාමුනිවරය, චෙතොපරියඤාණයාගේ ද වසී වෙමි.

1318. පූර්වනිවාස දනිමි, දිව ඇස පිරිසිදු කරන ලද, සියලු ආශ්‍රවයෝ ක්‍ෂය කරන ලදහ, දන් පුනර්භවයෙක් නැති.

1319. බුද්ධශ්‍රෙෂ්ඨයන්ගේ අනුහසින් අත්‍ථ ධම්ම නිරුත්තීන්හි ද එසේ මැ පටිභානයෙහි ද මගේ ඥානය නිර්මල යැ, පරිශුද්ධ වී.

1320–1322. ක්ලේශයෝ දවන ලදහ... බුදුසසුන් කරන ලදි.

මෙසේ අඹපාලී මෙහෙණ මේ ගාථාවන් කිවු යැ.

නවවැනි අඹපාලී ස්ථවිරාවදන යි.

## 10. පෙසලාපදනය

1323. මේ භද්‍රකල්පයෙහි බ්‍රහ්මබන්ධු වූ මහායශස් ඇති වාදීන් කෙරෙහි උතුම් වූ නමින් කස්සප නම් බුදුහු උපන් සේක.

1324. මම සැවැත්පුරවරයෙහි උවසුකුලයෙක උපන්මු. ඒ ජිනවරයන් දක දේශනාව ද අසා –

1325–1326. ඒ වීරයන් සරණ ගොස් සිල් ද සමාදන් වීමි, කිසිකලෙක ඒ නරාසභ වූ මහාවීරයන් වහන්සේ මහාජන සමාගමයෙහි තමන් වහන්සේගේ අභිසම්බොධිය ප්‍රකාශ කළ සේක: "දුක්ඛ දි වූ පෙර නො ඇසූ විරූ ධර්මයන්හි –

1327. නුවණැස ද ඥානය ද ප්‍රඥාව ද මාගේ විද්‍යාලොකය ද වී" යයි ඒ අසා ඉගෙන යළි භික්ෂූන් විචාළමු.

1328. මොනොවට කළ ඒ කර්මයෙන් ද චේතනා පිහිටුවීමෙන් ද මම මිනිස්කය හැරපියා තවුතිසා දෙව්ලොවට ගියමු.

1329. දන් පශ්චිම භවයෙහි මහ සිටුකුලයෙහි උපන්මු. බුදුන් කරා එළැඹැ සත්‍යප්‍රතිසංයුක්ත වූ සද්ධර්මය අසා –

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1330. පබ්බජිත්වා චිරෙනෙව සච්චත්ථානි විචින්තයං
ඛෙපෙත්වා ආසවෙ සබ්බෙ අරහත්තං අපාපුණිං.

1331. ඉද්ධීසු ච වසී හොමි දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී හොමි මහාමුනෙ.

1332. පුබ්බෙ නිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවා පරික්ඛීණා නත්ථි'දානි පුනබ්භවො.

1333. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
ඤාණං මෙ විමලං සුද්ධං බුද්ධසෙට්ඨස්ස වාහසා.

1334. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා
නාගීව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවා.

1335. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

1336. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛා'පි ච අට්ඨි'මෙ
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං පෙසලා භික්ඛුනී ඉමා ගාථායො අභාසිත්ථාති.

පෙසලාථෙරියාපදානං දසමං.

## ඛත්තියාවග්ගො චතුත්ථො.

**තස්සුද්දානං:**

ඛත්තියා බ්‍රාහ්මණී චෙව තථා උප්පලදායිකා
සිගාලමාතා සුක්කා ච අභිරූපා අඩ්ඪකාසිකා,

පුණ්ණා ච අම්බපාලී ච පෙසලාති ච තා දස
ගාථායො ද්විසතානෙත්ථ ද්විචත්තාලීස චුත්තරි.

**අථ වග්ගුද්දානං:**

සුමෙධා එකූපොසථා කුණ්ඩලකෙසී ඛත්තියා
සහස්සං තිසතා ගාථා සත්තතාලීස පිණ්ඩිතා,

සහ උද්දානගාථාහි ගණිතායො විභාවිභි
සහස්සං තිසතා ගාථා සත්තපඤ්ඤාසමෙව චා'ති.

## ථෙරීඅපදානං සමත්තං.

# සමත්තා අපදානපාළි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

1330. පැවිදි වැ නොබෝ කලෙකින් මැ සත්‍යාර්ථයන් විමසමින් සියලු ආස්‍රවයන් ගෙවා රහත්බවට පැමිණියමු.

1331. මහාමුනිවරය, ඍද්ධීන්හි ද දිවසෝධාතුයෙහි ද වසී වෙමි, චෙතොපරියඥාණයාගේ ද වසී වෙමි.

1332. පූර්වනිවාස දනිමි, දිව ඇස විශොධිත යැ, සියලු ආස්‍රවයෝ ක්‍ෂය වූහ, දැන් පුනර්භවයෙක් නැති.

1333. බුද්ධශ්‍රෙෂ්ඨයන්ගේ අනුහසින් අත්‍ථ ධම්ම නිරුත්තීන්හි ද එසේ මැ පටිභානයෙහි ද මාගේ ඥානය විමල යැ, පරිශුද්ධ යි.

1334. මා විසින් කෙලෙස්හු දවන ලදහ, සියලු භවයෝ නසන ලදහ, නෙලෙස් බැඳුම් සිඳ ආස්‍රව රහිත වැ ඇතින්නක මෙන් වෙසෙමි.

1335. බුද්ධශ්‍රේෂ්ඨයන් සමීපයෙහි එකැතින් මාගේ ස්වාගතය විය, ත්‍රිවිද්‍යා අනුප්‍රාප්තයහ, බුදුසසුන් කරන ලද.

1336. සිව්පිළිසිඹියා ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥා ද පසක් කරන ලදහ, බුදුසසුන් කරන ලදි.

මෙසෙයින් පෙසලා මෙහෙණ මේ ගාථා කිවු යැ.

**දසවැනි පේසලා ස්ථවිරාවදන යි.**

## හතරවැනි ඛත්තියා වර්ග යි.

**එහි උද්දානය:**

කැත් මෙහෙණන්ගේ අපදන යැ, බැමිණි මෙහෙණන්ගේ අපදන යැ, උප්පලදයිකා යැ, සිගාලමාතු යැ, සුක්කා යැ, අභිරූපනන්‍ද යැ, අඩ්ඪකාසී යැ –

පුණ්ණා යැ, අම්බපාලී යැ, පෙසලා යැයි අපදන දසයක් වෙති, එහි ගාථා දෙසාලිසක් අධික කොට ඇති දෙසියයක් වෙත්.

**යළි වර්ග උද්දානය:**

සුමෙධා වර්ග යැ, එකූපොසථික වර්ග යැ, කුණ්ඩලකෙසී වර්ග යැ, ඛත්තියා වර්ග යි එහි ගාථා සත්සාලිසක් හා එක්දහස් තුන්සියයෙකි.

විභාවීන් විසින් උද්දාන ගාථා සමග ගණන ලද්දහු එක්දහස් තුන්සියසත්පනසෙකි.

**ථෙරීඅපදානය සමාප්ත යැ.**

## අපදානපාළි සමාප්ත යි.

* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

# ගාථාදිපාදනුක්කමණිකා


| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අක්කමිත්වාන සරසි | 8 |
| අක්කොසිං දුට්ඨචිත්තොහං | 210 |
| අක්ඛන්තෙ නාම ඛන්තබ්බං | 48 |
| අග්ගං සද්ධාධිමුත්තානං | 196 |
| අගාරං පජහිත්වාන | 172, 192 |
| අගාරං වසන්තො අම්හෙ | 192 |
| අගාරං විජහිත්වාන | 168, 180 |
| අඞ්ගගතෙ අලංකාරෙ | 164, 176 |
| අඞ්ගුලග්ගෙන ජාදෙසි | 56 |
| අච්ඡරානං සහස්සානි | 22 |
| අච්ඡරා සතසහස්සා | 26 |
| අඤ්ජලිං පග්ගහෙත්වාන | 30, 84 |
| අඤ්ඤස්සාපි කතං කම්මං | 172 |
| අඤ්ඤෙ නහාපෙන්ති භොජෙන්ති | 34 |
| අට්ඨ උප්පලහත්ථානි | 166 |
| අට්ඨසත්තතිවස්සාහං | 158 |
| අට්ඨාරස සහස්සානි | 174 |
| අතික්කන්තෙ ච සත්තාහෙ | 72 |
| අත්ථි ච පච්චීතාවාසිං | 98 |
| අත්තදීපා තතො හොථ | 70 |
| අත්තනො අභිසම්බොධිං | 216 |
| අත්ථධම්මනිරුත්තීසු | 70, 86, 90, 116, 118, 162, 176, 188, 196, 200, 204, 208, 216, 218 |
| අත්ථෙ ධම්මෙ ච නෙරුත්තෙ | 62 |
| අථ නිබ්බින්දහං කායෙ | 208 |
| අථො ජාතික්ඛයං පත්තා | 156 |
| අදසි තස්ස මං තාතො | 110 |
| අදසි මෙ තද රාජා | 194 |
| අදසි මෙ මහාරාජා | 10 |
| අද්දසාහං ඉමං ඉද්ධිං | 92 |
| අදස්සනෙන විබ්භාගා | 84 |
| අධිකාරා බහූ අම්හං | 178 |
| අධිකාරං බහුං මය්හං | 166 |
| අන්නං පානං ඛාදනීයං | 92 |
| අනිමිත්තං ච භාවෙහි | 82 |
| අනුකම්පකො කාරුණිකො | 134 |
| අනුජානි න නො තාතො | 76, 94, 102, 110, 118 |
| අනුප්පත්තස්ස මග්ගස්ස | 128 |
| අනුභොත්වා යසං සබ්බං | 186 |
| අනුභොත්වා සුඛං දුක්ඛං | 96 |
| අනුමග්ගෙන සම්බුද්ධො | 164, 168, 178 |


* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අනුමොදි මහාවීරො | 108 |
| අනෙකජාතිසංසාරං | 172 |
| අන්නං පානං ඛාදනීයං | 28 |
| අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ | 168, 180 |
| අපරෙන ච කාලෙන | 204 |
| අප්පසද්දමනාකිණ්ණං | 78 |
| අභබ්බට්ඨානෙ වජ්ජෙත්වා | 90, 162, 176 |
| අභිඤ්ඤාතා ච මහාථෙරා | 158 |
| අභිරූපං උපපදං | 206 |
| අභිවාදිය සම්බුද්ධං | 142 |
| අම්හෙ අඤ්ඤෙ ච මනුජා | 190 |
| අම්හං සබ්බපතී හොහි | 170 |
| අම්හෙ බ්‍රාහ්මණ ධීතාතු | 186 |
| අයං පච්ඡිමකො මය්හං | 34 |
| අයොසන හතමෙසච | 70 |
| අලං පුත්තා විසාදෙන | 64 |
| අවීතරාගා තං සුත්වා | 44 |
| අවුට්ඨිකා දිසා නත්ථි | 22 |
| අසඞ්ඛියානි දීපානි | 18 |
| අසජ්ජමානා අගමා | 54 |
| අසීති දෙවරාජූනං | 20, 34, 36 |
| අසුභාය චිත්තං භාවෙහි | 82, 208 |
| අස්මාහි පරිචිණ්ණාසි | 62 |
| අහම්පි තත්ථ ගච්ඡිස්සං | 144 |
| අහං උප්පලවණ්ණා ච | 76, 102 |
| අහං උපොසථං කත්වා | 26 |
| අහං ඛෙමා ච සප්පඤ්ඤා | 94 |
| අහං තෙන සමයෙන | 26 |
| අහං මද්දජනපදෙ | 156 |
| අහං සුගතමාතා තෙ | 46 |
| අහුං සබ්බඞ්ග සම්පන්නා | 136 |
| අහො අච්ඡරියං මය්හං | 70 |
| අහො'නුකම්පිකා අම්හං | 60 |
| අහො සම්මා උපායො තෙ | 84 |

| ආ | |
|---|---|
| ආකාසායතනඤ්චෙව | 64 |
| ආතුරං අසුචිං පූතිං | 82, 140, 208 |
| ආනන්දො ච තදා සෙඛො | 52 |
| ආයාචිං සො තදා ආහ | 114 |
| ආයුනාපි ච වණ්ණෙන | 206 |
| ආරද්ධවිරියානග්ගං | 142 |


* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

ආ

පිට්ඨඞ්කා


ආරද්ධවිරියෙ පහිතත්තෙ 52
ආරම්මණං මමං එතං 12
ආරාධිතො මහාවීරො 146
ආරාමං සුකතං කත්වා 2
ආසනං පරිවාරෙත්වා 18, 36
ආසීවිසාලයසමෙ 50


ඉ


ඉත්ථිකානඤ්ච පබ්බජ්ජං 48
ඉත්ථියො නාම ලොකග්ග 48
ඉත්ථියො පුරිසා චෙව 190
ඉත්ථී නාම මයං දෙව 192
ඉත්ථී පුරිසා කුමාරා ච 190
ඉදං පච්ඡිමකං මය්හං 62
ඉදං සුවණ්ණං කෙයූරං 112
ඉදම්පි තෙ සුභං රූපං 138
ඉද්ධිපාදෙසු කුසලා 16
ඉද්ධියා අභිනික්ඛිත්වා 98
ඉද්ධියා ච වසී ආසි 70
ඉද්ධියා ච වසී ආසිං 84
ඉද්ධියා ච වසී හොමි 90, 204
ඉද්ධිං චාපි නිදස්සෙථ 174
ඉද්ධිං චාපි නිදස්සෙහි 88, 160
ඉද්ධී අනෙකා දස්සෙසි 92
ඉද්ධී අනෙකා දස්සෙසුං 60
ඉද්ධීසු ච වසී හොම 62, 188
ඉද්ධීසු ච වසී හොමි 106, 114, 120, 128, 132, 162, 196, 200, 208, 210, 214, 216, 218
ඉධ සඤ්චිත කුසලා 2
ඉමම්හි භද්දකෙ කප්පෙ 130, 202, 208, 216
ඉමස්මිං භද්දකෙ කප්පෙ 74, 94, 102, 110, 118, 124
ඉමස්මිං යෙව කප්පම්හි 2, 76, 202
ඉසී ගහෙත්වා පුප්ඵානි 166


ඊ


ඊදිසෙහි වනෙ රම්මෙ 80


උ


උට්ඨිතො ච මහාමෙඝො 104
උණ්හං වා පරිළාහො වා 22
උච්චනීචමයං කම්මං 184
උච්චෙකුලෙ පජායාමි 194


* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

| උ | පිටඞ්කා |
|---|---|
| උත්තරන්තස්ස අක්ඛාසිං | 212 |
| උත්තිණ්ණා විචිකිච්ඡා සො | 128 |
| උදග්ගචිත්තා සුමනා | 16, 132 |
| උදහාරිං අහං සීතෙ | 212 |
| උපකාරා ච යා නාරී | 180 |
| උපකාරා මමං තුම්හෙ | 186 |
| උපගන්ත්වා මහාවීරං | 206 |
| උපට්ඨාකො මහෙසිස්ස | 2, 94, 102, 110, 118, 124 |
| උපස්සයෙ යාධිවත්ථා | 44 |
| උපහතා භවා සබ්බෙ | 186 |
| උප්පන්නෙ ච කතෙ කම්මෙ | 184 |
| උප්පලස්සෙව මෙ වණ්ණො | 16, 88, 194 |
| උබ්බත්තයිත්වා පඨවිං | 88 |
| උභො පුත්තා කාලකතා | 104 |
| **එ** | |
| එකකං සුඛමාසීනං | 80 |
| එකතිංසෙ ඉතො කප්පෙ | 16, 194 |
| එකනවුතෙ ඉතො කප්පෙ | 12, 24, 28, 30, 74, 94, 150, 200, 206 |
| එකද ලොකපජ්ජොතො | 40 |
| එකපුත්තපසූතාහං | 104 |
| එකස්මිං සමයෙ රම්මෙ | 158 |
| එකිකා අභිනිම්මිත්වා | 56 |
| එකිකා බහුධා ආසිං | 54 |
| එවමාදීනි වත්වාන | 160 |
| එවමෙතං අවෙක්ඛන්ති | 142, 208 |
| එවං නිරාකුලං ආසි | 134 |
| එවං බහුවිධං දුක්ඛං | 96, 170, 182 |
| එවං විලපමානං තං | 52 |
| එවං සම්මා විමුත්තානං | 70 |
| එවාහං චින්තයිත්වාන | 192 |
| එසා අන්තරධායාමි | 98 |
| එහි තං උපගූහිස්සං | 112 |
| **ඔ** | |
| ඔක්කාකවංසස්ස යසො | 46 |
| ඔචිනිත්වා නං සල්ලං | 30 |
| ඔරසා මුඛතො ජාතා | 92 |
| ඔරොපයස්සු කල්‍යාණී | 112 |
| ඔරොහිත්වාන ගගනා | 60 |
| ඔවාදකො විඤ්ඤාපකො | 134 |
| ඔවාදම්පි න ගච්ඡාමි | 206 |


* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

| ක | පිට්ඨඞ්කා |
|---|---|
| කකුධො විලසන්තොව | 14 |
| කඤ්ඤා සහස්සප්පමුඛා | 160 |
| කටච්ඡුභික්ඛං දත්වාන | 12 |
| කත්වා පඤ්චසත කුටී | 60 |
| කථං චරහි සම්බුද්ධා | 52 |
| කදාචි ධම්මං දෙසෙන්තො | 52 |
| කදාචි නීයමානාය | 16, 22 |
| කදාචි පිතුනා සද්ධිං | 56 |
| කදාචි සො කාරුණිකො | 156 |
| කදාචී සො නරාදිච්චො | 76, 146 |
| කප්පෙ ච සතසහස්සෙ | 170, 178 |
| කප්පෙ සතසහස්සෙ ච | 166 |
| කම්පිතො මෙරුරාජාපි | 64 |
| කරෙහි උරං පහන්ත්වා | 64 |
| කස්සපස්ස ච බුද්ධස්ස | 212 |
| කස්සබ්‍රාහ්මණ ත්වං හීතො | 212 |
| කාමධාතුමතික්කන්තා | 160, 174 |
| කාලපක්ඛම්හි දිවසෙ | 18, 36 |
| කාසි රඤ්ඤො මහෙසී'හං | 96 |
| කාසිසු සෙට්ඨිකුලජා | 210 |

කි

| | |
|---|---|
| කිලෙසා ඣාපිතා අම්හං | 62, 184 |
| කිලෙසා ඣාපිතා මය්හං | 4, 6, 8, 10, 14, 16, 20, 24, 28, 54, 218 |
| කිං මෙ ඉමාහි මාලාහි | 14 |
| කිං මෙ කතා රාජගහෙ | 204 |

කු

| | |
|---|---|
| කුටුම්බික කුලෙ ජීතෙ | 152 |
| කුණපං ඡඩ්ඩයිත්වාන | 120 |
| කුසලං විජ්ජතෙ මය්හං | 40 |
| කුසලාහං විරුද්ධෙසු | 86 |
| කුහිං වදන සොභා තෙ | 140 |
| කුහිං සසිනිභං වණ්ණං | 140 |

කූ

| | |
|---|---|
| කූටාගාරඤ්ච පාසාදං | 28 |
| කූටාගාරවරෙ රම්මෙ | 66 |
| කූටාගාරානි සබ්බානි | 68 |




* මෙම පොතේහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත.

| කෙ | පිට්ඨඞ්කා |
|---|---|
| කෙචි පබ්බජිතා අත්ථි | 186 |
| කෙසෙසු ඡිජ්ජමානෙසු | 204 |
| **කො** | |
| කොණාගමනස්ස මුනිනො | 6 |
| කොණ්ඩඤ්ඤනන්ද නන්දි | 46 |
| කොමාරි බ්‍රහ්මචරියං | 76, 94, 102, 110, 118, 126 |
| කොසෙය්‍ය කම්බලීයානි | 28 |
| **ඛ** | |
| ඛන්ධෙ අනිච්චතො දිස්වා | 144 |
| ඛලිතං චෙ පුරෙ අත්ථි | 174 |
| ඛෙමා උප්පලවණ්ණා ච | 110, 118 |
